# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2012 දෙසැම්බර් 06 වන බ්‍රහස්පතින්දා**
2012 டிசெம்பர் 06 வியாழக்கிழமை
Thursday 06th December 2012

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.30 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.30 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.30 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள் ] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# නිවේදනය
ANNOUNCEMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බස්නාහිර පළාත් සභාවේ ගරු අමාත්‍යතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් 2012.12.07 දින පෙ.ව. 8.00 ට බස්නාහිර පළාත් සභා කාර්යාල පරිශ්‍රයේදී උත්තම ශ්‍රම පූජා සෞඛ්‍ය සායනයක් පැවැත් වේ. එහිදී සාමාන්‍ය රෝග පරීක්ෂාව, ECG, BMI දර්ශකය පරීක්ෂාව, දියවැඩියා රුධිර පරීක්ෂාව, කොලෙස්ටරෝල් රුධිර පරීක්ෂාව සහ දන්ත සායනයක්ද පැවැත් වේ.

එම පරීක්ෂණ සඳහා සහභාගී වීමේදී කොලෙස්ටරෝල් සහ දියවැඩියා රුධිර පරීක්ෂණය සඳහා පැය 12 ක කාලයක් නිරාහාරව සිටිය යුතු බැවින් අවශ්‍ය පැය ගණන නිරාහාරව පැමිණෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2013 පූර්ණ කාරක සභාව
ANNUAL FINANCIAL STATEMENT - 2013
COMMITTEE OF THE WHOLE COUNCIL

***2013 වාර්ෂික මුදල් ප්‍රකාශයේ ප්‍රදානයන් සලකා බැලීම සඳහා පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු යැයි ගරු ජගත් අංගගේ සභා කටයුතු අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදුව, පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් විය.***

*Having stated by the Hon. Minister of Council Affairs, Jagath Angage that the Provincial Council be converted into a Committee of the Whole Council in order to consider the grants of the Annual Financial Statement of 2013, the provincial council converted itself into a Committee of the Whole Council.*

| | |
|---|---|
| **ශීර්ෂ අංක 100** | **- ආණ්ඩුකාරවරයා** |
| **ශීර්ෂ අංක 101** | **- බස්නාහිර පළාත් සභාව** |
| **ශීර්ෂ අංක 102** | **- පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව** |
| Head no 100 | - Governor |
| Head no 101 | - Western Province Provincial Council |
| Head no 102 | - Provincial Public Service Commission |

[ පූ.භා. 09.35 ]

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

ඔබතුමාට ඉතාමත් ගෞරවයෙන් ස්තුතිවන්ත වෙනවා, අද මේ විවාදය ආරම්භ කරන්න කාල වේලාව ලබා දීම ගැන. ඒ වාගේම ගරු සභාපතිතුමනි, 100, 101, 102 යන ශීර්ෂයන් යටතේ කථා කරන කොට විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ මට අතීතය පොඩ්ඩක් මතක් කරන්න වෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුකාරවරයාගේ වැය ශීර්ෂය 100 න් පටන් ගන්නේ. මට මතකයි පළාත් සභා මුල් කාලයේදී මේ වැය ශීර්ෂය සම්බන්ධව සාකච්ඡා කරන්න එදා අවස්ථාවක් ලැබුණේ නැහැ. ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව අභියෝග කරන්න අපේ සභාවේ කිසිම මන්ත්‍රීවරයෙකුට අයිතියකුත් නැහැ. එතුමා ජනාධිපතිතුමාගේ නියෝජිතයෙක් හැටියට පූර්ණ බලතල තියෙන ආණ්ඩුකාරවරයෙක් හැටියට කටයුතු කරන නිසා. ඒ වුණත් පසුගිය කාලය තුළදී කාරණා කිහිපයක් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ආණ්ඩුකාර වැය ශීර්ෂය පිළිබඳව ආණ්ඩුකාර කාර්යාලය පිළිබඳව අපට සාකච්ඡා කරන්න අවස්ථාව ලැබුණා.

විශේෂයෙන්ම අපි හැමදාම පෙන්වා දෙන දෙයක් තමයි, වර්තමාන ආණ්ඩුකාරතුමාගේ සේවා කාලය පිළිබඳව. ඒ පිළිබඳව අපි සෑහීමට පත් වෙන ගමන්ම එතුමාගේ සේවා කාලය - එතුමාගේ පමණක් නොවෙයි. ඉදිරිය ගැනත් අපි කල්පනා කරන්න වෙනවා. ආණ්ඩුකාරතුමාත් අවුරුදු ගණනාවක් තිස්සේ තැනින් තැනට ගිහිල්ලා වර්තමාන ආණ්ඩුකාර කාර්යාලය අද වෙනත් තැනකට මාරු වෙලා තියෙනවා. ස්ථාන මාරුවක් වාගේ ගිහිල්ලා තියෙනවා. තවම අපට ලිපි ලැබුණේත් නැහැ. කෙසේ වෙතත්, මේ ආණ්ඩුකාරවරයා, බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන පුද්ගලයා හැටියට අපි සලකන නිසා එතුමාට කියලා ස්ථිර ගොඩනැගිල්ලක් ඕනෑ. මෙය අපි හැම අවුරුද්දේම පෙන්වා දීලා තියෙනවා. ස්ථිර කාර්යාල ගොඩනැගිල්ලක් ඕනෑ. හැමදාම කුලියට ඉන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයේ අවධානයට යොමු කරනවා. විශේෂයෙන්ම ඉදිරි වර්ෂවලදී හරි - අපි විදේශ රටවල් සමග සම්බන්ධතා තියෙනවා. අපි විදේශ රටවල්වලට යනවා එනවා. ඒ වාගේම අපි ඊයේත් සාකච්ඡා කළා පළාත් පිළිබඳව. යම් යම් තැන්වල ඒ ඒ අයගේ අනන්‍යතාවය තහවුරු වෙලා තියෙනවා. විශේෂයෙන් ආණ්ඩුකාර කාර්යාලය ඔබතුමා යෝජනා කරලා තියෙන තට්ටු පහළොවේ ගොඩනැගිල්ලේ හරි කමක් නැහැ, ඒ ඉඩ ලබා දෙන්න. ආණ්ඩුකාරතුමාට පහසුකම් සහිත කාර්යාලයකුත් ඒ කාර්යාලය සකස් කරන විට ආණ්ඩුකාරතුමා හමු වෙන්න විදේශ නියෝජිතයෝ එනවා. විවිධ දේශපාලන පුද්ගලයෝ සහ විවිධ

ආගමික කටයුතු භාරව සිටින අය සම්බන්ධ වන නිසා විශේෂයෙන්ම ඒ පහසුකම් සලසා දෙන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ.

[ ගරු ඒ.එම්. යූසුෆ් ]

විශේෂයෙන්ම ආණ්ඩුකාර කාර්යලයත් එක්ක ආණ්ඩුකාර නිල නිවාසයක් අවශ්‍යයි. මට මතකයි 1987 රජයේ එවකට සිටි කැබිනට් මණ්ඩලයේ අවසර ඇතිව අපි ආණ්ඩුකාර නිල නිවාසයක් කොළඹ හතේ ලබා ගෙන තිබුණා. එම නිල නිවාසය පසුව රජය විසින් අරගෙන අගමැතිතුමාට ලබා දුන්නා. අගමැතිතුමාගෙන් පස්සේ එම කාර්යාලය හොඳ තත්ත්වයේ තියෙනවාද කියලා මට මතක නැහැ. නමුත් මුල් ආරම්භයේ තිබුණා. ආරම්භයේ තිබුණු එක තමයි අද නැති කර ගෙන තියෙන්නේ. ආණ්ඩුකාර කාර්යාලය නිල නිවාසයක අවශ්‍යතාව ඉතා වැදගත් බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මේ බස්නාහිර පළාත් සභාව කියන්නේ, විශේෂයෙන්ම ලෝකයත් එක්ක සම්බන්ධ වන ප්‍රධාන නගරයක්. ඒ නිසා මේ නගරයේ ආණ්ඩුකාර කාර්යාලය පමණක් නොවෙයි. මහ ඇමතිතුමා ප්‍රමාද වෙලා හරි නිල නිවාසයක් හදා ගත්තා. අපි සන්තෝෂ වෙනවා. ඒ වාගේ අනෙකුත් ඇමතිවරුන්ටත්, විශේෂයෙන්ම මූලාසනයේ සභාපතිවරයා හැටියට සිටින ඔබතුමාටත් නිල නාමයට විශේෂ කාර්යාලයකුත් එක්ක නිල නිවාසයක අවශ්‍යතාවය පෙන්වා දෙන්න වෙනවා. අපි අවුරුදු විසි ගණනක් පසු කර ගෙන ඇවිත් තියෙන්නේ. ඉදිරියටත් මේ පළාත් සභාව පවත්වා ගෙන යනවා නම්, ඒ එන පුද්ගලයාගේ අනන්‍යතාවය තහවුරු කරලා - අපි නිල ඇඳුමක් හඳුනාගත්තා වාගේම, යම් විදේශිකයෙක් මේ රටට පැමිණියාම, දේශපාලන වශයෙන් හෝ යම් අමුත්තෙක් පැමිණියාම, ඒ ගෞරවණීය භාවය බස්නාහිර පළාතට හිමි වෙන්න ඕනෑ. ඒ නිසා ඒ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන ගමන්ම මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අද ආණ්ඩුකාර කාර්යාලයේ ලේකම්තුමාත් ඉන්නවා. මේ මුදල් ප්‍රකාශය මේ සභාවේ සම්මත වුණායින් පස්සේ ගණන් දීමේ නිලධාරියා හැටියට නොවෙයි. නිසි බලධාරියා හැටියට ආණ්ඩුකාරතුමා තමයි මේකට අත්සන් කරන්නේ. එතුමාගේ අත්සනින් පසුව තමයි ජනවාරි 01 වැනිදා ඉඳලා මුදල් ගණුදෙනු කරන්න අපට අවස්ථාව ලැබෙන්නේ. එහෙම නම් මේ වියදම් කරන මුදල් පිළිබඳව, මේ ප්‍රකාශයට පත් වෙලා තියෙන ගණන් පිළිබඳව විශේෂයෙන්ම ආණ්ඩුකාරතුමාගේ අධීක්ෂණය ඉතා වැදගත් වෙනවා. ඒ අධීක්ෂණය වැදගත් වෙනවාය කියන්නේ, යම් යම් අවස්ථාවලදී, මතු වෙන්නා වූ යම් යම් මූල්‍යමය ගැටළු සහ පරිපාලනමය ගැටලු නිසා. විශේෂයෙන්ම ඔබතුමාගේ මාර්ගයෙන් මතක් කරනවා. මේ අධීක්ෂණ කටයුතු වෙනවා වාගේම, ආණ්ඩුකාරතුමා සහ පළාත් සභාවේ මන්ත්‍රීවරු අතර සාකච්ඡා ඇති වෙනවා නම්, සම්බන්ධ වෙනවා නම් ඊයේ සභාවේදී මතු කරපු ආදායම් පිළිබඳ ප්‍රශ්නයවත් මතු වෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපට චෝදනාවක් එල්ල වුණා. විපක්ෂයක් හැටියට නොවෙයි. මුළු සභාවටම. ආදායම් පිළිබඳව යෝජනා ඉදිරිපත් කරන්නේ නැහැයි කියලා. විපක්ෂයක් හැටියට අපට කිසිම ආරාධනාවක් තිබුණේ නැහැ. මෙන්න අපි 2013 අයවැය ලේඛනය සකස් කරනවා. ඒ අයවැය ලේඛනයට විපක්ෂයේ අදායම් ගැන අදහස් තියෙනවා සාකච්ඡා කරන්න එන්නය කියලා ආරාධනා කළේ නැහැ. මම මතක් කරනවා. පසුගිය වර්ෂයේ එවැනි ප්‍රශ්නයක් මතු වුණාම විපක්ෂ කණ්ඩායම නියෝජනය වන විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට ෆයිරෝස් මන්ත්‍රීතුමා යම් යෝජනාවක් ඉදිරිපත් කළාම, ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, අමාත්‍ය මණ්ඩලයත් ඒක ගෞරවයෙන් පිළිඅරගෙන ගම්මන්පිල ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආදායම් වර්ධනය කිරීමේ කමිටුවක් පත් කරන්න කටයුතු කළා. මම හිතන විධියට, ඒකේ ප්‍රතිලාභය දැන ගෙන තමයි B.T.T එකට අත තියන්න මුදල් අමාත්‍යාංශය කටයුතු කළේ. අපි යමක් කළා. අපේ ආදායම ඊට වඩා වර්ධන කර ගෙන යන්න තිබුණා. 5% නොවෙයි. 8% නොවෙයි. 12% ප්‍රගතියක් ඔබතුමාට පෙන්නුම් කරන්න පුළුවන්. ප්‍රාදේශීය සභාව පවා අණපනත් සම්මත කර ගෙන ආදායම් වර්ධනය කරනවා ගරු සභාපතිතුමනි. එහෙනම් පළාත් සභාවේ අනන්‍යතාවය තියා ගෙන අපට ප්‍රඥප්ති සම්මත කරන්න හැකියාව තියෙනවා. මුදල් උපයා ගැනීමේ නීතිමය බාධාවක් නැතිව අවස්ථාව ලැබිලා තියෙනවා. එහෙනම් මේ තත්ත්වය මත අපට ස්වාධීනව කටයුතු කරලා ආදායම් වර්ධනය කරගන්න පුළුවන් නම්, අපට මීට වඩා හොඳ ගමන් මාර්ගයක යන්න පුළුවන් වෙනවා. මම යෝජනා කරපු ගොඩනැගිල්ල, ඒ වාගේ අනන්‍යතාවය තහවුරු කර ගෙන මේ මන්ත්‍රීවරුන්ට අපට පළාත් සභාවක් හැටියට කටයුතු කරන්න පුළුවන් වෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම හිතන විධියට තවත් කාරණාවක් මතක් කරනවා මේ ශීර්ෂයේ නැති වුණත්. තවමත් මම හිතන විධියට මෙම සභාවේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා හැටියට ඉන්න ප්‍රධාන ලේකම්තුමිය තවමත් වැඩ බලන තත්ත්වයේ ඉන්නේ. එතුමිය අපේ ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් හැටියටත්, වැඩ බලන ප්‍රධාන ලේකම් හැටියටත් කටයුතු කරනවා. ඒ නිසා අපටයි කියලා බස්නාහිර පළාතටයි කියලා ප්‍රධාන ලේකම් කෙනෙකුගේ අවශ්‍යතාවය ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් නැවත වරක් මේ සභාවට මතක් කර සිටිනවා.

ඒ වාගේම සභා ලේකම් කාර්යාලය ගැන සාකච්ඡා කරනවා නම්, අපි දවස් දෙකකට වරක්වත් කෝල් එකක් දීලා බලනවා, අපේ සභා ලේකම්තුමාත් එතුමාගේ කණ්ඩායමත් ඉන්නවාද කියලා. අද රතු නිවේදන නිකුත් වෙලා තියෙන්නේ. නිවේදන පිට නිවේදන නිකුත් වෙලා තියෙන්නේ. ෆයිල් ටික ගැට ගහගෙන බලා ගෙන ඉන්නවා. කොයි වෙලාවේ එළියට යවයිද කියලා. පිස්කල් ඕඩරයක් එන්නේ. පිස්කල් ඕඩරය ලේකම්තුමාගේ අතට ගෙනත් දෙනකල් විතරයි ඉන්නේ. ඔබතුමාටත් එළියට බහින්න වෙනවා හිටි ගමන්ම. ඒ නිසා විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, අපේ ආයතන රජයේ ගොඩනැගිලිවල හිටියේ. පළාත් පාලන ආයතන. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. ඒ රජයේ ආයතන ටික. අද මේවා විවේචනාත්මකව පෙන්වන්න වෙනවා. රජයේ ආයතන

ටික යවලා. සියලු දේම අරගෙන. අද මොනවද කරන්නේ? රේස් කෝස් එක දිහා බැලුවාම රජයේ ආයතනයක් හැටියට තිබුණා. හමුදා කඳවුර පිහිටි ඉඩම අද පෞද්ගලික අංශයට විකුණලා නොවෙයි, චක්‍රව පවරා තියෙනවා වාගේම මම හිතන විධියට අපේ පළාත් සභා ගොඩනැගිලි කාර්යාලයත් අරගෙන සමහර විට මේක හෝටලයක් කරාවිද? බැංකුවක් කරයිද? විදේශිකයන්ගේ ප්‍රයෝජනය සඳහා තියේවිද කියන ගැටලුව මතු වෙනවා.

ඒ වාගේම සභා ලේකම් කාර්යාලයට කිසිම පහසුකමක් නැහැ. ඔබතුමාගේ කාර්යාලය ගත්තත්, සංවිධායක කාර්යාලය ගත්තත්, විපක්ෂ නායකතුමා ඇතුළු ඒ කාර්යාල ගත්තත්, වාඩි වෙලා ඉන්න විධියක් නැහැ. වැඩ කරන මිනිස්සුන්ට අපහසුතා තියෙනවා.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

L.T.T.E ප්‍රහාරය නිසා නේ ඒ තත්ත්වයට පත් වුණේ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

L.T.T.E එකට කලින් මෙයා කකුල් දෙක නැති කර ගත්තේ. කොහේදෝ ගමනක් ගිහිල්ලා. සභාපතිතුමනි, විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. බෝම්බ නිසා මේකට හානියක් වුණේ නැහැ ගරු මන්ත්‍රීතුමා. බෝම්බ ගැහැව්වාට කාර්යාලයට හානියක් වුණේ නැහැ. කාර්යාලය එහෙමම තියෙනවා. ගොඩනැගිල්ල එහෙම තියෙනවා. ඔබතුමා වැරදි ප්‍රකාශ කරන්න එපා. කාර්යාලයේ අභ්‍යන්තරයට එහෙම ප්‍රශ්නයක් ඇති වුණේ නැහැ. බෝම්බ නිසා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ යටතේ මේ සියලුම මන්ත්‍රීවරු අතර බැඳියාවක් තියෙනවා. සභාපතිවරයා හැටියට පළාත් සභාවේ මන්ත්‍රීවරු සියලු දෙනාම ආරක්ෂා කරන්න. සුභසාධනය දිහා බලන්න. ඔවුන්ට අවශ්‍ය කටයුතු කිරීම පහුගිය කාලයේ තිබුණා. නමුත් පහුගිය අවුරුද්දේ ඉඳලා පොඩි වෙනසක් අපි දකිනවා. මන්ත්‍රීවරු විදේශ ගමන් යාමේදී ඔවුන්ගේ අමාත්‍යාංශයට අනුයුක්ත කිරීම, උපදේශක කාරක සභාවට සම්බන්ධ කිරීම් සභාපතිවරයා හැටියට ඒ තිබුණු ප්‍රතිපාදන ටික ඔබතුමාගේ ඉවත් වීමෙන් මම හිතන්නේ, මන්ත්‍රීවරුන්ට ලොකු අපහසුතාවයක් තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මතක් කළේ ඒකයි. මම පිළිගන්නවා. සමාජයක් හැටියට කොතැන හිටියත් ඒ ඉන්න මන්ත්‍රීවරුන්ට මහජන නියෝජිතයෝ හැටියට සමාජය තුළ පහළ මට්ටමට - (බාධා කිරීමක්) සභාපතිතුමා ගැන කිව්වේ නැහැ. සභාපතිතුමාට අරමුදල් තියෙනවා. එතුමාට හෙට අනිද්දත් තියෙනවා, වාසනාව. විශේෂයෙන්ම මේ මන්ත්‍රීවරු උපදේශක කාරක සභාවේ ඉන්නවා. ඔබතුමා යටතේ පෙත්සම් කාරක සභාව තියෙනවා. මේ මන්ත්‍රීවරයෙක් එක තැනට එකයි කියලා සීමා කළාට පොදු සාමාන්‍ය දැනුමත් එක්ක ඒ අත්දැකීමක් ලබා ගන්න ඔබතුමා මගින් ප්‍රධාන අමාත්‍යතුමාට මා යොමු කරනවා. කලින් තිබුණ වාගේ වැඩ පිළිවෙළක් අවශ්‍යයි. දකුණේ මුළු වීම් එකම ගිහිල්ලා. හැම තැනම යනවා. එක දවසක් නොවෙයි. එක මන්ත්‍රීවරයෙකුට අවුරුදු පහකට නැත්නම් මන්ත්‍රීවරයෙකුට අවුරුද්දකට එක සංචාරයක් ගැන නොවෙයි මම කියන්නේ. අවශ්‍යතාවයන් අනුව ලෝකයේ මතුවන්නා වූ යම් යම් කරුණු සම්බන්ධව දැනුම ලබා ගන්න සහභාගි වෙන්න ඕනෑ. මේ මන්ත්‍රීවරු දැනුවත් කරලා තියෙන්න ඕනෑ. පොතපතට සීමා නොකර. රටක මෙන්න මේ වාගේ තත්ත්වයක් කියලා. අද නැවත වරක් අපට අධ්‍යයනය කරන්න අවශ්‍යතාවයක් තියෙනවා. පළාත් සභා ක්‍රමය ගැන සංවාදයක් වන කොට - අද පළාත් සභා ක්‍රමය ගැන හෙළ උරුමයෙන් සම්මේලනයක් පවත්වනවා, අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ. මම අහගෙන හිටියා News වලට ගියා. එවැනි තත්ත්වයක් මත පළාත් සභා ක්‍රමය වාගේම, පෙත්සම් කාරක සභාව, ඒ වාගේම පඤ්චායත් ක්‍රමය. ග්‍රාමීය මට්ටමේ ග්‍රාම රාජ්‍යයකට යනවා නම්, එසේ ග්‍රාම වැඩ පිළිවෙළකට යනවා නම් ඒ පිළිබඳවත් අපේ මන්ත්‍රීවරු දැනුවත් කිරීමේ අවශ්‍යතාවය උඩ මන්ත්‍රීවරුන් පිළිබඳව මීට වඩා නැමියාවක්, අවධානයක් යොමු කරන්න කියලා ඔබතුමා මාර්ගයෙන් ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම විශේෂයෙන්ම මම මතක් කළේ, පළාත් සභාවට කොයි වෙලාවේ එළියට යන්න වේවිද කියන එක. රජයේ තිබුණු දේවල්. පළාත් සභාව කොහාටද යන්නේ? ගරු සභාපතිතුමනි, දැනට යෝජනා වෙලා තියෙනවා. සාකච්ඡා වෙමින් පවතිනවා අපට දැනගන්න ලැබී තියෙන විධියට මාසයට ලක්ෂ 12 ක් ඕනෑ. අවුරුද්දට මිලියන එකයි දශම ගණනක් ඕනෑ වෙලා තියෙනවා. අද අපේ වැය ශීර්ෂයේ මෙය නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනින් තැනකට ගියා. ඒ වාගේම පළාත් පාලනය වෙනින් තැනකට ගියා. පළාත් රාජ්‍ය කොමිෂන් සභාව වෙන තැනක. මෙය අනවශ්‍ය වැය බරක්. අපට ඒවා ඉතුරු කර ගන්න පුළුවන්කම තිබුණා නම්, ප්‍රාග්ධන ශිෂ්‍යමෙන් අපට යමක් කරන්න අනාගතයේ සැලසුමක් හදන්න තිබුණා. කොහෙන් කළමනාකරණය කළත්. අපි විවේචනය කරන්නේ නැහැ. අඩු පාඩුකම් පෙන්නුම් කරලා දෙනවා. කොහොම නමුත් අපේ තියෙන සම්පත් තවත් අපට අඩු වෙනවා. අපට අවශ්‍යතාවය ඉටු කර ගන්න බැරි වෙනවා. ඒකයි මම කිව්වේ. මේ කාර්යාලය පිටට යාමෙන් - මේ අවුරුද්දේ අපේ බජට් එකේ නැහැ නේ? ලබන මාසයේ සිට රුපියල් ලක්ෂ 12 ක් කුළී ගෙවන්න.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන අපට සාකච්ඡා කරන්න ඕනෑ. අපට

එපමණ සම්බන්ධයක් නැති වුණත් සේවකයන් මාරුවීම්, පත්කිරීම් පිළිබඳව ඔවුන්ගේ රාජකාරි කටයුතු පිළිබඳව සැහීමට පත් වන ගමන්ම - ගරු සභාපතිතුමනි, මේ ප්‍රධාන විශේෂ

[ ගරු ඒ.එම්. යූසුෆ් ]

කරුණු කිහිපය මෙතැනට සම්බන්ධ වෙලා තියෙනවා. ආණ්ඩුකාරතුමා, ඒ වාගේම පළාත් සභාව, ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව යන ප්‍රධාන අංශ තුන තමයි මෙතැන මෙහෙයවීම කරන්නේ. පළාත් රාජ්‍ය සේවා තුළ තමයි කළමණාකාරිත්වය බොහෝ දුරට සම්බන්ධ වෙන්නේ. එහෙම නම් මේ සේවකයින් බඳවා ගැනීම පමණක් නොවෙයි. සේවකයන් පුහුණු කිරීමේදී ඔවුන්ට පරිපාලනමය දැනුම ලබා දෙන්න. විනයගරුකව ආයතන පාලනය කිරීමේ වැඩ පිළිවෙළ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගේ මාර්ගයෙන් ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. අවසාන වශයෙන් මතක් කරන්න ඕනෑ, ගිණුම් කාරක සභාව පිළිබඳවත්. ගිණුම් කාරක සභාව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වයෙන් චන්ද්‍රභානු අදිකාරම් ගරු මන්ත්‍රීතුමාගේ වැඩ බැලීම යටතේ පවත්වා ගෙන ගියත් මම කලින් යෝජනා කළේ, මේ ගිණුම් කාරක සභාවෙන් මතු වෙන්නා වූ කරුණු පිළිබඳව යම් යම් අවස්ථාවලදී අමාත්‍ය මණ්ඩලය වෙත යොමු වෙනවා. විශේෂයෙන්ම ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු කරන්න කියලා ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. පරිපාලනය, මූල්‍යමය කටයුතු පිළිබඳව ගැටලු රාශියක් මතු වෙලා තියෙනවා. මතු වෙනවා. ඒ නිසයි මම කිව්වේ, ආණ්ඩුකාර කාර්යාලය මීට වඩා මැදිමත් වෙන්න ඕනෑය කියලා. ඔබතුමාට නැවත වරක් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[ පූ.භා. 09.51 ]

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමා, පළාත් සභාව හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳව වැය ශීර්ෂයන් යටතේ සාකච්ඡාවේදී පළමුවෙන්ම ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාල පහසුකම් පිළිබඳව, ඒ වාගේම එතුමාගේ නිල නිවාස ප්‍රශ්නය පිළිබඳව යූසුෆ් ගරු මන්ත්‍රීතුමාත් කාරණා මතු කළා. මේක දිගින් දිගටම වර්ෂයක් පාසා අපි මතු කරන කාරණයක්. විශේෂයෙන්ම ගරු ආණ්ඩුකාර අල්හාජ් අලවි මව්ලානා මැතිතුමා මේ ආණ්ඩුකාර ධුරයේ ගෞරවය ආරක්ෂා කර ගනිමින් එතුමා පළාත් සභාවේ කටයුතු සම්බන්ධව මහජන නියෝජිතයන්ගේ අදහස් පිළිබඳව විශේෂ ඇහුම්කන් දීමක් කරන ආණ්ඩුකාරවරයෙක් හැටියට එතුමාට ගෞරවයක් වශයෙන් අපි සිහිපත් කරන්න ඕනෑ. දීර්ඝ කාලයක් තිස්සේ එතුමා අප වෙනුවෙන් සේවා සැලසුවා. ඒ වාගේම එතුමා නව කාර්යාලයකට තාවකාලික වශයෙන් ස්ථානගත වෙලා තියෙනවා. අපි බලාපොරොත්තු වෙනවා. ආණ්ඩුකාරතුමාගේ නිල කාර්යාලයත්, ඒ වාගේම නිල නිවාසයත් පළාත් සභාව මගින් ඉතාමත් ගෞරවාන්විත ස්ථානයක ගෞරවාන්විතව ස්ථාපනය කළ යුතුයි කියලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නිල නිවාසයක් හැදුවා නේද?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

නැහැ. ඒකට අත්තිවාරමක් විතරක් දාලා තියෙනවා. බොහෝ කාලයකට පෙර. ගරු සභාපතිතුමනි, අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන්නේ, පළාත් සභාවේ කාර්යාලය පිළිබඳව. ඊයේත්, අදත් මේ සභා ගොඩනැගිල්ල පිළිබඳව දිගින් දිගටම අපේ මන්ත්‍රීතුමන්ලා අදහස් දැක්වූවා. සභා ගොඩනැගිල්ල වෙනත් ස්ථානයකට ගෙන යාමේ දැඩි අවශ්‍යතාවයක් අපට මේ වෙන කොට මතු වෙලා තියෙනවා. ඒ නිසා පෞද්ගලික ස්ථානයකට විශාල මුදලක් වැය කර යනවා වෙනුවට, දිගින් දිගටම මා යෝජනා කළේ, මේ ගොඩනැගිල්ලේ පවත්වනු ලබන අමාත්‍යාංශ දෙක වෙනත් ස්ථානයක ස්ථානගත කරලා, මේ ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම සභා ලේකම් කාර්යාලයේ පාවිච්චිය සඳහා ගත යුතුයි කියන කාරණයයි. කොහොම නමුත් මේ කටයුත්තේදී විපක්ෂය රජයට චෝදනා එල්ල කරන්න යම්කිසි ආකාරයකට චක්‍රව උත්සාහ ගත්තා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ, නැහැ. ඇමරිකාවෙන් කරන්නේ ඇවිල්ලා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මන්ත්‍රීතුමා පොඩ්ඩක් –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමාට ඔබතුමාට කථා කරන්න කාලය තියෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔබතුමාට කාලය දීලා. මම වාඩි වෙන්නම්. ඔබතුමා කථා කරලා –

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මේ සභාවේදී ඒ ඒ අවස්ථාවේදී ඔබතුමාත් පිළිපදින්න ඕනෑ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මම කථා කරනවා ඔබතුමා අහගෙන ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා බාධා කිරීම් කරන්න එපා ආණ්ඩු පක්ෂ සංවිධායකතුමාට.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මගේ කාලය මට ලබා දීම සඳහා විපක්ෂය සන්සුන් කිරීම පිළිබඳව. විශේෂයෙන් මේ සභා ලේකම් ගොඩනැගිල්ල වෙනත් ස්ථානයක ස්ථානගත කරන්න කියන උපදෙස මා දන්නා හැටියට වසර ගණනාවක් තිස්සේ අපට තිබුණ උපදේසයක්. විශේෂයෙන්ම මෙහිදී සභා ලේකම්වරයා හා නිලධාරීන්ට විතරක් මේ බර පටවලා ඉන්න පුළුවන්කමක් නැහැ. මෙය දේශපාලන අධිකාරියේ වරද අප සියලු දෙනා භාර ගන්නට ඕනෑ. මොකද? මේ කටයුත්තේදී රජයේ මූලික සැලැස්මක් ඇතිව රජයේ සංචාරක ව්‍යාපාරය පිළිබඳව යම් වැඩ පිළිවෙළක් කොළඹ නගරය තුළ ක්‍රියාත්මක කිරීම උදෙසා, කොළඹ නගරයේ රාජ්‍ය ආයතන ස්ථානගත කර තිබෙන පෞරාණික ගොඩනැගිලි නිදහස් කොට සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීම සඳහා රජයේ පවතින සැලැස්ම අනුව ක්‍රියා කිරීමට මේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට දීර්ඝ කාලයක් තිස්සේ උත්සාහ ගන්නවා. එහිදී රාජ්‍ය ආයතන ගණනාවක් ඒ නියෝගය ඒ ආකාරයෙන් පිළිපදිමින් ඒ අවශ්‍ය පියවරයන් කලින් ගත්තා. එහෙත් අපි, පළාත් සභාව හැටියට ඒ බව දැන දැනත් ඒ සඳහා පියවර නොගැනීම නිසා උච්චතම අවස්ථාවට පත් වී තිබෙනවාය කියන කාරණය මතක් කරන්නට ඕනෑ. මෙහිදී මේ වගකීම කාටවත් පවරන්න පුළුවන්කමක් නැහැ. විශේෂයෙන්ම පළාත් සභාවේ ආණ්ඩු පක්ෂ සංවිධායකවරයා හැටියට මා විශ්වාස කරනවා. මෙය අපි සියලු දෙනාම භාර ගත යුතු වගකීමක් කියලා. කෙසේ නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ සම්බන්ධව මැදිහත් වෙලා දැනටමත් ගරු අමාත්‍යතුමන්ලා සමග සාකච්ඡා කරලා තියෙනවා. මා කලින් කරපු යෝජනාව, පළාත් සභාවේ සියළුම අංශ මේ ස්ථානයේ ස්ථානගත කරන්නයි කියන කාරණය. ගැටළුවකට තියෙන්නේ, අපේ ප්‍රවාහන අමාත්‍යාංශයේ ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසන් කරන්න මාර්තු මාසය විතර වෙනවා. ඒ කටයුත්ත අවසන් වන තෙක් තමයි අපට මේ ප්‍රමාදය දරා ගන්න සිද්ධ වෙලා තියෙන්නේ.

ගරු සභාපතිතුමනි, කොහොම වුණත් අධික මුදලක් වැය නොකොට - මේ සඳහා ගොඩනැගිලි සොයා බැලීමේදී ලක්ෂ 12 ක වාගේ මුදලකට මාසිකව කුළියකට තමයි මේ ස්ථානය වෙනස් කිරීම සඳහා යෝජනා වුණේ. එහිදී මා විරුද්ධ වුණෙත් අධික මුදලක් වැය කරලා මේ කෙටි කාල සීමාවට යාම තුළ පළාත් සභාව විශාල පාඩුවක් ලබන නිසා තාවකාලිකව මෙය ආරක්ෂක ලේකම්තුමාට දැනුම් දීලා, අතිගරු ජනාධිපතිතුමාට දැනුම් දීලා, ඒ කෙටි කාලසීමාවේ කාලය දීර්ඝ කර ගෙන අපට අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් අපේම ගොඩනැගිලිවල හෝ සලසා ගෙන අපේ පළාත් සභාවේ මුදල් අනවශ්‍ය පරිදි වැය කිරීම් වලින් වළක්වා කෙටි කාලසීමාවක් තුළ මේ සඳහා උනන්දු වෙලා සභා ලේකම් කාර්යාලය මෙහිම ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරමුයි කියලා යෝජනා කරනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒ සඳහා මුදල් වෙන් කරලා තියෙනවාද මේ අයවැයෙන්?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මුදල් හොයා ගන්න පුළුවන්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

වෙන් කරලා නැහැ. ඒ කියන්නේ සැලැස්මක් නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

නැහැ තියෙනවා. ප්‍රවාහන අධිකාරියේ ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් අවසන් කරනවා. ඒ අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න ඒ අමාත්‍යාංශ මගින් කටයුතු කර ගෙන යනවා. ඒ නිසා මෙය ස්ථානගත කිරීමේදී අපට ගැටළුවක් මතු වන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, අපේ යුසුෆ් ගරු මන්ත්‍රීතුමා අවධානය යොමු කළා, විදේශ පුහුණුව සඳහා ගරු මන්ත්‍රීවරුන් සඳහා පළාත් සභාවේ සභා ලේකම්වරයා යටතේ පැවතුනු අරමුදල් අහිමි වීම සම්බන්ධව. මම හිතන්නේ මන්ත්‍රීවරුන්ට සභා ලේකම් කාර්යාලය හරහා මේ කටයුත්ත නොවුණත්, මන්ත්‍රීතුමන්ලා ඊටත් වඩා විදේශගත වීම් මේ අවුරුද්දේ සිදු කරනු ලැබුවා. මම හිතන්නේ, සභා ලේකම් කාර්යාලයෙන් නොවුණත් මන්ත්‍රීතුමාලා විදේශගත වීම නම් සිද්ධ වුණා. ඒ නිසා මම හිතන්නේ නැහැ, ඒ තරම් ගැටලුවක් මතු වුණාය කියලා. හැබැයි, මම ඔබතුමා මගින් ගරු ප්‍රධාන ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. නිලධාරීන්ට හා මන්ත්‍රීතුමන්ලාට වාර්ෂිකව පවත්වන පුහුණු කටයුතු සඳහා දේශීය වශයෙන් යම්කිසි අරමුදලක් මේ පළාත් සභාවේ සභාපති වැය ශීර්ෂය යටතේ තිබුණා නම් හොඳයි කියන කාරණය. මොකද? යම් යම් ප්‍රතිපත්තිමය ප්‍රශ්න පිළිබඳ, නැත්නම් යම් යම් දේවල් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීමේදී සභා ලේකම් කාර්යාලය ඒ කටයුතු කිරීමට යම් ප්‍රතිපාදනයක් සලස්වා නැහැ. එය ලොකු අඩුවක් කියලයි මම හිතන්නේ. ඒ නිසා දේශීය වශයෙන් ගරු මන්ත්‍රීවරුන් සහ සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් පුහුණුවීම් කටයුතු කළ යුතු වෙනවා. ඒ කටයුතු සඳහා යම් ප්‍රතිපාදනයක් මේ වැය ශීර්ෂයේ නොමැතිවීම අඩුපාඩුවක් හැටියට මම දකිනවා. ඒ නිසා මම යෝජනා කරනවා සභාපතිතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට, මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා.

විශේෂයෙන්ම පළාත් සභාව පිළිබඳව විවිධ මතවාදයන් රට පුරා පවතින කොට මෙවැනි දේවල්, ඒ මතවාදය තහවුරු කිරීම සඳහා පිටිවහලක් වෙලා තියෙනවා. උඩ ගෙඩි දීමක් වෙලා

තියෙනවා. පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත කිරීම සඳහා පුරෝගාමී වුණු පුද්ගලයෙක් හැටියට මම පැහැදිලිවම කියනවා. ගරු සභාපතිතුමනි, කවුරු කොහොම කිව්වත් මේ පළාත් සභා ක්‍රමය අහෝසි වෙන්නේ නැහැයි කියන එක.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ජනාධිපතිතුමා කිව්වද? සහතිකයක් දුන්නද?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

සහතික කරලා කියන්න පුළුවන්, වන්නේ නැහැයි කියලා. පළාත් සභා ක්‍රමය තුළ යම් යම් අඩුපාඩු පිළිබඳව අවුරුදු 25 ක අත්දැකීම් අපට තියෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ළඟින් ඉන්න එක්කෙනාට කියන්න. ආපුවාම කියන්න. ඉන්න වෙලාවේ කියන්නේ නැහැ ඕවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඉන්න වෙලාවේ කියන්න පුළුවන්. මම ඔබතුමාට මගේ දේශපාලන ස්ථාවරය පැහැදිලිව කියන්නම්. මේක සෙල්ලම් කරන්න පුළුවන් මාතෘකාවක් නොවෙයි ගරු සභාපතිතුමනි. මේ රටේ ද්‍රවිඩ ජනතාවගේ හමින් සපත්තු මහන්න ඕනෑය කියපු මිනිස්සු දේශපාලනය කරපු යුගයක් මේ රටේ තිබුණා. ඒ වාගේම ශ්‍රී අකුර සම්බන්ධව මේ රටේ මිනිස් ජීවිත ගණනාවක් විනාශ කර ගත්තා. අවසානයේ සිද්ධ වුණේ, මේ රටේ ජීවිත සිය දහස් ගණනක් විනාශ වීමයි. අවසානයේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ ශ්‍රී අකුර වෙනුවට ඉරක් ආවා. කවුරුවත් මොකුත් කථා කළේ නැහැ. ශ්‍රී අකුර ඉවත් කරලා ඉරකින් අංක දෙක වෙනස්ව හඳුනා ගැනීමේ පහසුව සැලැස්වුවා. එතකොට මේ ශ්‍රී අකුර වෙනුවෙන් පෙනී සිටි මිනිස්සුවත්, දමිළ අකුරක් පාවිච්චි කළ යුතුයි කියන එක වෙනුවෙන් පෙනී සිටි මිනිස්සුවත්, කවුරුවත් වචනයක්වත් කථා කළේ නැහැ. හැබැයි, ඊට පස්සේ පරිගණකය මගින් වාහනවල අංකය දෙන්න පටන් ගත්තාට පස්සේ නැවත පරණ විධියටම ඉංග්‍රීසි අකුර ආවාම මේ ජාති මාමකයෝ කවුරුවත් කථා කළේත් නැහැ. දැන් කිසිම කරදරයක් නැතුව මේ ඉංග්‍රීසි අකුර අපේ වාහන අංකය හඳුන්වා දීම සඳහා භාවිතා කරනවා. හැබැයි, ශ්‍රී අකුර වෙනුවෙන් මේ රටේ සිංහල, දෙමළ මිනිස්සුන්ගේ ජීවිත කීයක්, මේ ජාති මාමකත්වය උසිගන්වපු මිනිස්සු මේ රටේ ඒ අහිංසක මිනිස්සුන්ගේ ජීවිත කීයක් විනාශ කළාද කියන කාරණය හදවත්වලට තට්ටු කරලා බලන්න ඕනෑ. ඒ වාගේම දුටුගැමුණු වගේ රජවරු ඉතිහාසය පුරාම බිහි වෙලා නැහැ. ඒ වාගේම මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා හා ගෝඨාභය රාජපක්ෂ වැන්නන් අනාගතයේ හැමදාම බිහි වෙයි කියා හිතන්නත් බැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මගින් මම අවධාරණය කරනවා. මේ ජාතික ප්‍රශ්නය පිළිබඳව තමන්ගේ මනාපය වැඩි කර ගැනීම සඳහා තමන්ගේ ඡන්ද පදනම වැඩි කර ගැනීම සඳහා කවුරු හෝ භාවිතා කරනවා නම්, ඔහු දේශද්‍රෝහියෙක්. මොකද? මේ රටේ ජීවිත විනාශයන් අපි ඇස් පනාපිට දැකලා තියෙනවා. මේක තමන්ගේ ඡන්ද පදනම වැඩි කර ගැනීම සඳහා, තමන්ගේ මනාප පදනම වැඩි කර ගැනීම සඳහා ප්‍රශ්නයක් නොවෙයි. මේ රටේ ත්‍රස්තවාදය නිමා කළා. යුද්ධය නිමා කළා. හැබැයි, මේ රටේ සදාකාලික සාමය ස්ථාපිත කිරීමේ වගකීම අතිගරු ජනාධිපතිතුමා පිට පැවරිලා තියෙනවා. හෙට යම් දවසක ජනාධිපතිතුමාගෙන් පස්සේ, මේ රටේ රාජ්‍ය පාලනය භාර ගන්නේ කවුද කියලා අපි දන්නේ නැහැ. හැබැයි, ඔහුගේ දේශපාලන මග පෙන්වීම යටතේ මේ රට කොයි දිශාවට ගෙනයයිද කියල අපට කියන්නට බැහැ. ඒ නිසා අවස්ථාවාදීව ජාතිවාදීව කණ්ඩායම් හැඟීමෙන් තමන්ගේ ගොඩ වැඩි කර ගැනීමේ පදනමින් මේ ජාතික ප්‍රශ්නය පිළිබඳ විසඳුම් හොයන්න බැහැ. ඒ නිසා දේශපාලන බලය බෙදා හැරීම, දේශපාලන බල පංගුකාරිත්වය කියන කාරණය සදාකාලික දේශපාලන විසඳුමක් වෙනුවෙන් ඉදිරිපත් විය යුතු දෙයක්. ඒ නිසා මේ ක්‍රමයේ අඩුපාඩු තිබුණත්, මේ ක්‍රමය යම් තාක් දුරට මේ ප්‍රශ්නය විසඳීම සඳහා යම් පිටිවහලක් වුණාය කියලා මා විශ්වාස කරනවා. මොකද මම එහෙම කියන්නේ? මේ 13 වැනි සංශෝධනය මේ රටට ගේන කොට මේ රටේ ත්‍රස්තවාදී සංවිධාන අටක් හිටියා. ඒ ත්‍රස්තවාදී සංවිධාන සියල්ලම ආයුධ අතහැරියා. අවසානයේ එක ත්‍රස්තවාදී සංවිධානයයි මේ රටේ ආයුධ සන්නද්ධව සිටියේ. ඒ නිසා අපට මේ සියලුම දේවල් එක අංශයකට ලඝු කරලා බලලා, අපගේ දේශපාලන මතවාදය ජයග්‍රහණය කරවීම සඳහා භාවිතා කරලා හරියන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා අපේක්ෂා කරන විධියට අනාගතය ආසියාවේ ආශ්චර්ය බවට මේ රට පත් වෙන කොට, මේ රටේ ජීවත් වන්න පෙරුම් පුරන දරුවන්ගේ අනාගතයේදී ඔවුන්ට කවදාවත් මේ පීඩාකාරී ලෝකයේ ජීවත් නොවෙන්නට, වග බලා ගැනීම අද වර්තමානයේ දේශපාලඥයන් වන අපේ වගකීමක්. ඒ නිසා පටු මං පෙත් හොයමින් තමන්ගේ දේශපාලන වාසිය සඳහා යම් අයෙක් කටයුතු කරනවා නම්, ඔහු අනාගත දරු පරපුරට කරන ද්‍රෝහිකමක් හැටියටයි මම දකින්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක කරන්න රජයේ ප්‍රතිපත්තියක් හැටියට මහින්ද චින්තනය තුළ පොරොන්දු වෙලා තියෙනවා. ඒක මේ රටේ ජනතාව පිළි අරගෙන තියෙනවා. මහින්ද චින්තනය මේ රටේ සියලුම දෙනා අනුමත කරලා තියෙනවා.

ඒ වාගේම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සියලුම දේශපාලන පක්ෂ මහින්ද චින්තනයට එකඟ වෙලා තියෙනවා. මහින්ද චින්තනය තුළ පැහැදිලිව පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරමින් ඉදිරියට ගෙන යනවයි කියන කාරණය අතිගරු ජනාධිපතිතුමා කියලා තියෙනවා. ඒ නිසා අමුතුවෙන් ඒකට සංවාද කළ යුතු නැහැ. ඉදිරියේදී යම් යම් පුද්ගලයෝ තම තමන්ගේ අවශ්‍යතාවයන් අනුව යම් යම් මතවාදයන් ප්‍රකාශ කරාවි. ඒ වුණාට අපි දේශපාලනමය වශයෙන් ප්‍රතිපත්ති ගරුක

පුද්ගලයන් හැටියට, දේශපාලන ප්‍රතිපත්තියක් මත කටයුතු කරන පුද්ගලයන් හැටියට අපි දන්නවා, මේ රටේ පවතින මේ පළාත් සභා ක්‍රමය - මේ නම වෙනස් වෙන්න පුළුවන්. හැබැයි, බලය බෙදා හැරීම හෝ බල පංගුකාරීත්වය කියන කාරණය, මේ රටේ සදාකාලික මේ ප්‍රශ්නයට විසඳුමක් හැටියට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එහෙනම් fit එකේ ඉන්න -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

fit එකේ ඉන්න. ෆර්මිට් එකක් දෙනවා ඔයාලට. ගරු සභාපතිතුමනි, මේ ගොල්ලේ බයේ ඉන්නේ ඒකට. බය වෙන්න එපා. ජනාධිපතිතුමා අකාරුණික නැහැ. ජනාධිපතිතුමා දන්නවා ඔබතුමාලා ගැන. දැන් ඔබතුමාලා නායකතුමා අනුගමනය කරලා ඔබතුමන්ලා ඒ විධියට හොඳට වැඩ කරන්න. (බාධා කිරීම්) ඒක බලාගන්න පුළුවන් වෙනවා ලබන මැතිවරණයට නාම යෝජනා ගන්න ගියාම.

ගරු සභාපතිතුමනි, මෙතුමා හොඳ අදහසක් මතු කළා. අපේ විගණන කමිටුව පිළිබඳව. විගණන කමිටුව පිළිබඳව මතු කළ අදහසට මමත් යෝජනාවක් කරනවා, ගරු සභාපතිතුමනි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විගණන කමිටුවත් සමග මාස තුනකට වරක්වත් වෙනම දිනයක මේ ගැටලු සම්බන්ධව සාකච්ඡා කරනවා නම් හොඳයි. එතකොට මම හිතන්නේ, මේ අංශ පිළිබඳව තියෙන ගැටලු සියල්ල, දෙන්නා වූ නියෝග ක්‍රියාත්මක වී තියෙන්නේ මොනවාද? නොවී තියෙන්නේ මොනවාද? කියන කාරණය පිළිබඳව ගරු ප්‍රධාන ඇමතිතුමාට මැදිහත් වෙන්න පුළුවන් කමක් තියෙනවා. ඒ නිසා මා යෝජනා කරනවා. මාස තුනකට වරක් විගණන කමිටුව ඔබ ලබා දුන්නා වූ නියෝග සම්බන්ධව - එතුමාට පූර්ණකාලීනව සහභාගී වන්න බැරි නිසා මාස තුනකට සැරයක් කමිටු සාමාජිකයන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා මුණ ගැහෙනවා නම්, දිනයක් වෙනම යොදා ගෙන සාකච්ඡා කරනවා නම් ඒ ගැටලු සියල්ල නිරාකරණය කර ගන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ සභාවේ කටයුතු කර ගෙන යාමේදී ඇත්තෙන්ම මම ඊයේ දවස පිළිබඳව කනගාටු වෙනවා. අද දවස පිළිබඳවත් මම කනගාටු වෙනවා. අපගේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ සභා ගර්භයේ අඩු ප්‍රමාණයක් සහභාගී වන්නේ. අපේ ප්‍රධාන අයවැය පිළිබඳ සාකච්ඡාවේ ඒ සම්බන්ධව විශේෂයෙන්ම මම ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා හැටියට ඔබතුමාට මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. මොකද? අපි අපගේ වගකීම් ප්‍රමාණය කොතෙක් දුරට ඉෂ්ට කරනවාද කියන කාරණය - මම හිතන්නේ, අපි සැලකිලිමත් වන්න ඕනෑ. ඒ නිසා තමයි මම විශේෂයෙන් කිව්වේ, පුහුණු වැඩ සටහන් නොමැතිකම තමයි මේවාට බලපාන්නේ. යම් පුහුණුවක් හය මසකට සැරයක්වත් මන්ත්‍රීවරුන්ට හා නිලධාරීන්ට සාමූහිකව තමන්ගේ මතුවන ගැටලු සම්බන්ධව සාකච්ඡා කරලා විසඳුම් සොයා දීමට අවශ්‍ය වටපිටාව සකස් කර දීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙනවා, මේ පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීමෙන්. ඒ නිසා ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නයි කියන කාරුණික ඉල්ලීම කරනවා.

සභා ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීමේදී - ඒ වාගේම ප්‍රතිපත්තියක් හැටියට රජය පළාත් සභාව සඳහා මේ භූමි භාගයේ තට්ටු පහළොවක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දීලා තියෙනවා. එය ආරම්භ කිරීමේදී විශේෂයෙන්ම සභා ලේකම් කාර්යාලය හා අනෙකුත් ආයතන පිළිබඳවත් නැවත වතාවක් ඒ නිර්මාණ ශිල්පීන් සමග සාකච්ඡා කරලා පොදු පළාත් සභාව හැටියට අමාත්‍යාංශ හා සභා ලේකම් කාර්යාලය පිළිබඳව අවධානය යොමු කරලා, ඒ නිර්මාණය සැකසීමේදී කටයුතු කරන හැටියටත් යෝජනා කරනවා. මේ සභාවේ ඊයේ ගරු සභාපතිතුමනි, මම වාඩිවුණු ආසනය දෙවතාවක් මාරු කළා. මේ පුටුව බැහැ ගෙන බැහැ ගෙන යනවා. ඒ නිසා මම හිතන්නේ, සභා ශාලාවේ පුටු අවුරුදු අටකට වඩා වැඩියි. ඒ නිසා කාලසීමාව ඉක්මවා ගිහිල්ලා තියෙන්නේ. ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරමින් මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් ඔබතුමාත්, සභා ලේකම් කාර්යාලයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීනුත්, මේ සභාව වෙනුවෙන් දැඩි අපහසුතාවයන් මත මේ කරන්නා වූ සේවා කටයුතු පිළිබඳව ඇත්තෙන්ම අපි අගය කරනවා. විශේෂයෙන් අඩු පහසුකම් සහිතව විශාල වැඩ කොටසක් කරන, අවම පහසුකම් යටතේ සේවාවන් සලසන ප්‍රධානතම ආයතනය හැටියට මම දකින්නේ, පළාත් සභා ලේකම් කාර්යාලය. එහි සිටින ලේකම්තුමා ඇතුළු නිලධාරීන් ඒ අඩු පහසුකම් තත්ත්වය තුළ වුණත් කරන්නා වූ සේවය අගය කරමින් මෙතෙක් වේලා කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේ රත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Yoosuf M.P.C took the Chair*

[ පූ.භා. 10.11 ]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සැබෑ රැඩිකල් වෙනසකට භාජනය වෙලා ඉන්න රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ

ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ කථාවෙන් පසුව ඉඩ ප්‍රස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. රැඩිකල් වෙනසකට පත් වෙලා ඉන්නේ. අද කරපු කථාව දිහා බැලුවාම මම හිතන්නේ, ගරු ඇමතිතුමා නොහිටපු නිසා තමයි කථා කළේ.
[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

එහෙම කොන්දක් තියෙන මන්ත්‍රීවරයෙක් විධියට ඉන්න එක ගැනත් සන්තෝෂයි.

ආණ්ඩුකාරතුමා, පළාත් සභාව සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාළ වැය ශීර්ෂයන් පිළිබඳව කථා කරන අවස්ථාවේදී ප්‍රධාන වශයෙන්ම පළාත් සභාව පිළිබඳව වචන කිහිපයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. දැන් අපි පළාත් සභාව විසිපස් අවුරුද්දක කාල පරිච්ඡේදයක් අවසාන කරලා අපිටම කියලා ඉන්න හිටින්න තැනක් නැති ගරු සභාපතිතුමෙක්, ලේකම්තුමෙක්, සහා ලේකම් කාර්යාලයක් අවුරුදු 25 ක් තිස්සේ අපි පාවිච්චි කළා. නමුත් කියන්න කනගාටුයි. රේණුක පෙරේරා ආණ්ඩු පක්‍ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ කථාවේදී කියවුණා, පූර්ව දැනුම්දීමක් කරලා තිබුණාය කියලා සහා ලේකම් කාර්යාලය මෙම ස්ථානයෙන් අයින් කරන්න කියලා. අද කොළඹ නගරය ආශ්චර්ය කරා යන මෙම සංචාරක ව්‍යාපාරයේදී මෙම ගොඩනැගිල්ලේ අවශ්‍යතාවය පිළිබඳ මධ්‍යම රජයෙන් දැනුම් දීමක් කරලා තිබුණායි කියලා. නමුත් ඒ පිළිබඳව ක්‍රියාත්මක වීම ප්‍රමාද වීම නිසා අද විශාල වැය බරක් මේ පළාත් සභාවට දරන්න සිදු වෙලා තියෙනවා. මාසයකට ලක්ෂ 12 ක විතර මුදලක් වියදම් කරලා ඇත්ත වශයෙන්ම කොළඹ නගරයේ ඉතාම පහසු තැනක තමයි සභා ලේකම් කාර්යාලය තියෙනනේ. මන්ත්‍රීවරු හුඟ දෙනෙකුටම එන්න පුළුවන් තැනක්. මේ සභා ලේකම් කාර්යාලයට පහළින් ගරු ජගත් අංගගේ ඇමතිතුමාගේ සෞඛ්‍ය අමත්‍යාංශය තිබුණ නිසා, ඒ ගොඩනැගිල්ල උඩට ගිහිල්ලා බලනවා ඇති. නමුත් ගරු ප්‍රධාන ඇමතිතුමාවත්, අනෙක් ඇමතිවරු කී දෙනෙක් මේ සභා ලේකම් කාර්යාලයට ගිහිල්ලා මේ සභාපතිතුමා ඉන්න විධිය, සභා ලේකම්තුමා ඉන්න විධිය, හැන්සාඩ් වාර්තා සකස් කරන පිරිස ඉන්න විධිය. විපක්ෂ නායකතුමා සහ විපක්ෂ සංවිධායකතුමා ඉන්න විධිය, උප සභාපතිතුමා සහ සුනිල් ජයමිණි ගරු සභානායකතුමා ඉන්න විධිය සහ අනෙක් කාර්ය මණ්ඩලය ඉන්න විධිය ගැන ඇමතිවරු කී දෙනෙක් ගිහිල්ලා තමන්ගේ ඇහින් බැලුවාද කියලා තමන්ගේ හෘද සාක්ෂියට තට්ටු කරලා බලන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඇයි මම ඉන්නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

තමුන්නාන්සේ ඉන්නෙ මෙහෙ නේ ? මෙතැන නොවෙයි මම කථා කරන්නේ. එහේ ගැන.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒ ගැන නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා බැලුවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කවුරු හරි බලපු නිසා තමුන්නාන්සේට ටිකක් වැඩි වරප්‍රසාද ලැබුණා. විපක්ෂ නායක කාර්යාලයට ගියාම එතුමා දිහා බලලා මෙහා පැත්ත හැරෙන කොට පස්ස පැත්ත හැපෙනවා ජෝර්ජ් පෙරේරා අපේ සංවිධායකතුමාගේ මේසයේ. එහෙම දැඩි අපහසුතාවයක ඉන්නේ අපි. හදිස්සියේ ගිහිල්ලා කාරක සභා රැස්වීමක් ඉවර වෙලා කෑම ටික කන්න වුණොත්, කෑම ටික කන්න තැනක් නැහැ. ගරු සභාපතිතුමා අපට කාරුණික වන නිසා ඒ මේසෙට ගිහිල්ලා කෑම ටික කනවා. මේ අවුරුදු ගණනක් තිස්සේ තිබුණු ගැටළු. මොන තරම් අමාරුකින්ද සහකාර හැන්සාඩ් සංස්කාරක එතැන ඉඳගෙන කටයුතු කරන්නේ. මොන තරම් අමාරුවකින්ද අපේ වැටුප් සකස් කරන කාර්යාලයේ ඒ Computer යන්ත්‍ර තියා ගෙන ඒ ඉන්න සේවක සේවිකාවෝ වැඩ කරන්නේ. අඩු ගානේ සාමාන්‍ය විධියට, පොදු ධර්මතාවය අනුවවත් තියෙන වාතාශ්‍රය ලබා ගන්නවත් පුළුවන් තත්ත්වයක් නැහැ. එහෙමත් අමාරුවෙන් තමයි මේ කාර්යාලය මෙපමණ කාලයක් පවත්වා ගෙන ගියේ. කිසිම අගය කිරීමකට ලක් නොකර. මම හිතන්නේ මේ පළාත් සභාවේ තියෙන අමාත්‍යාංශ සහ අනෙක් නිලධාරීන් හැල්ලුවට ලක් කරනවා නොවෙයි. ඉතාමත්ම කාරුණික සුහදතාවයෙන් වැඩ කරන කාර්ය මණ්ඩලයක් ඉන්නේ අපේ සභා ලේකම් කාර්යාලයේ. නමුත් ලැබී ඇති සැලකිල්ල මේ අවුරුදු විසි පහ පුරාම ඉතාමත්ම අල්පයි. ඒකේ හොඳම උදාහරණය තමයි මුලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් පුහුණු වැඩ සටහන් ගැන මන්ත්‍රීතුමා කථා කළා. පුහුණු වැඩ සටහන්වලට මම හිතන්නේ, මේ අයවැයෙන් තඹ සල්ලි අලුක්කාලක්වත් වෙන් කරලා නැහැ. දේශීය හෝ විදේශීය. ඉස්සර මෙතැනින් තමයි මුළු සභාවේම තියෙන පුහුණු කටයුතු සිද්ධ කළේ. දේශීය සංචාර, විදේශීය සංචාර, පුහුණු වැඩ සටහන් සඳහා නිර්ණායකයක් සකස් කරලා ඒ වැඩ පිළිවෙළ සකස් කළේ.

දැන් පළාත් සභාව යටතේ තියෙනවා කාරක සභා හයක්. ඉතා වටිනා කාරක සභා හයක් තියෙනවා. පෙත්සම් කාරක සභාව කියන්නේ, ඉතා හොඳට වැඩ කරන කාරක සභාවක්. ගිණුම් කාරක සභාව තියෙනවා. සභා කටයුතු කාරක සභාව තියෙනවා. ගෘහ කාරක සභාව තියෙනවා. ඒවාවල ඉන්න මන්ත්‍රීවරුන්ට සහ නිලධාරීන්ට යම් පුහුණුවක් ලබා ගන්න ඕනෑය කියලා අඩු ගානේ එක තත්ත්පරයකටවත් කල්පනා කරලා මේ මුදල් ප්‍රකාශයෙන් සත පහක්වත් වෙන් කරලා නැහැ. ඒ නිසා එතැන විශාල අඩුවක් තියෙනවා. දැන් මේක බීරි අලින්ට වීණා වාදනය කරනවා වාගේ වැඩක්. ඉන්නේ ජගත් අංගගේ ඇමතිතුමා

විතරයි. එතුමාවත් මේක අමාත්‍ය මණ්ඩලයේ සාකච්ඡා කරලා හිටපු සභාපතිවරයා හැටියට තමුනනාන්සේටත් ඒකේ වගකීමක් තියෙනවා. ඒ නිසා මේ කාරක සභාවල පුහුණු කටයුතුවලට යම් කිසි මුදලක් වෙන් කිරීම සම්බන්ධයෙන් මුදල් ප්‍රකාශයේදී ඉඩක් ලබා දෙන්නය කියලා කාරුණිකව ඉල්ලා සිටින්න කැමතියි.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි යනවා කියලා තියෙනවා ලක්ෂ 12 කට කාර්යාලයක් අරගෙන. මේ කාර්යාලයට යනකොටත් මේ තත්ත්වයම නිර්මාණය වෙලා තිබුණොත්, මීටත් වඩා අඩු තත්ත්වයක් නිර්මාණය වෙලා තිබුණොත් අපි මේ කරන කාර්යයෙන් ඵලක් වෙන්නේ නැහැ. සැලසුමක් හදන කොට දැන් පළාත් සභාවේ අය වැය ලේඛනය හදන කොට හරි, පස් අවුරුදු සැලැස්ම හදන කොට හරි මේවා ඔක්කෝම ඇතුළත් කරන්න තිබුණු දේවල්. අමාත්‍යාංශ කොහේද ස්ථානගත කරන්නේ? මධ්‍යම රජයත් සමග යම්කිසි එකඟතාවයක් නැතිව, දැනුවත් භාවයක් නැතුව කටයුතු නොකිරීමේ ප්‍රතිඵල තමයි අපි අද මේ භුක්ති විඳින්නේ. දැන් සෞඛ්‍ය ඇමතිතුමාට යන්න සිද්ධ වුණා වෙන කොහේට හරි. උපාලි කොඩිකාර ඇමතිතුමා කාර්යාලයක් හදන කල් අපි බලා ගෙන ඉන්නවා මේ කාර්යාලයත් ස්ථානගත කරන්න. ඒ නිසා මේවා සැලසුම්වල තියෙන දෝෂ දර්ශන. දැන් මහ ඇමතිතුමා මොන විධියට පස් අවුරුදු සැලැස්මවල් හැදුවත්, හය අවුරුදු සැලැස්මවල් හැදුවත් - මම දැක්කා 2016 සිට 2018 වෙන කල් යම් ව්‍යාපෘතිවලට මුදල් වෙන් කරන්න වුවමනා කරන සැලසුම් සකස් කරලා තියෙනවා. නමුත් මේ සැලසුම් කොපමණ දුරට සාර්ථකද කියන එක තමයි අවුරුදු පහක විතර එතුමාගේ පාලන කාලයේදී ආපස්සට හැරිලා බලද්දි අපට කථා කරන්න සිදු වෙලා තියෙන්නේ.

ඒ නිසා බරපතළ අනතුරකට පළාත් සභා ක්‍රමය සහ මේ පළාත් සභාව පත් වෙලා තියෙන වෙලාවක ඒ පිළිබඳ කථිකාවක්, ඒ පිළිබඳ විවේචනයක් මේ රට තුළ ඇති වෙලා තියෙන වෙලාවක රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂ ගරු ප්‍රධාන සංවිධායකතුමා අද මේ සභාවේ අපට ඒ පිළිබඳ සහතිකයන් දුන්නා. එහෙම කවුරු කථා කළත් අමාත්‍ය මණ්ඩලයේ සාමූහිකත්වය කොයි විධියට උල්ලංඝණය වෙලා මෙතැන කථා කළත්, ඒවා එක එක්කෙනාගේ දේශපාලන මති මතාන්තර. නමුත් මේ ක්‍රමය ශක්තිමත් කරන්න ජනාධිපතිතුමා බැඳිලා ඉන්නවා. මේ තම වෙනස් වුණත් වෙන නමකින් හරි පළාත් සභා ක්‍රමය බලය විමධ්‍යගත කිරීම කරගෙන යන්න පුළුවන්. ඒ නිසා මේ කාර්යාල පහසුකම්, නිලධාරීන්ගේ පහසුකම්, මේ රටාව, මේ පරිපාලනය විමධ්‍යගත කිරීම මේ ආකාරයටම යනවා කියලා. ඒ නිසා මම හිතන්නේ, අපට විශ්වාස කරන්න පුළුවන්කම තියෙන්නේ, අතිගරු ජනාධිපතිතුමාගේ සමීපතම මිත්‍රයා හැටියට, මම දන්නේ නැහැ. එතුමා කියන විධියට ඉන්න -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේ නේ කියන්නේ? තමුන්නාන්සේ කියනවා, උදේට කන්න යනවා. එනකොට ලොක්කා ඉන්නවා. ඉතින් මම ඒ වෙලාවට හායි කියා ගෙන එනවා. ඒවා මා එක්ක පුද්ගලිකව කියන දේවල්. ඒවා මෙතැනට අදාළ නැහැ. නමුත් එතුමා කියන දේ තමයි මට විශ්වාස කරන්න වෙලා තියෙන්නේ. ඒ නිසා පළාත් සභා ක්‍රමය පිළිබඳව මොන විධියේ විවේචන එල්ල වුණත් රේණුක පෙරේරා සංවිධායකතුමා අපට අද විශ්වාසයක් මේ සභාවේදී දුන්නා. මේක තමයි වෙන්න ඕනෑ දේ. මේකේ නම පොඩ්ඩක් වෙනස් වුණත් ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කරන අතුරතුරේ තමයි මේ පළාත් සභාව නිර්මාණය වුණේ. යම් යම් තැන්වලදී අනෙක් අය මෝඩ වුං ගන්නවා කිව්වා. ඒ නිසා අපට ඒ ගැන බයක් නැහැ. දැන් අද Fit එකේ ගෙදර ගිහිල්ලා නිදා ගන්න පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ. පළාත් සභාවේ ස්ථාවරත්වය තියෙනවා.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉන්න නිලධාරීන්ව අපේ මන්ත්‍රීවරුන්ව, ධූරදාරීන්ව කුකුල් කූඩු වාගේ කූඩුවල හිර කරලා තමයි මෙපමණ කාලයක් කර ගෙන ගියේ. දැන් ආශ්චර්යට පිං සිද්ධ වෙන්න අඩු ගානේ මේ ගොඩනැගිල්ල භෝජනාගාරයක් හරි වේවි. අපිට යන්න තියෙන තැන ලක්ෂ 12 ක් වියදම් කරලා හරි යන තැන එතැන අඩු ගණනේ හුස්මක් අර ගෙන ඉන්න පුළුවන් වන විධියට සකස් කරලා දෙන්න කියන ඉල්ලීමත් කරමින් ගරු ප්‍රධාන ඇමතිතුමාට මේ ආයාචනය කරන්නේ. එතුමා බොහොම දුර දක්නා පුද්ගලයෙක්. එතුමා සැලසුම් හදන්නේ අද නොවෙයි. ඉස්කෝලේ යන කාලේ ඉඳන් මේ මේ දේවල් ඔක්කෝම කළේ. අයිය ඉන්න ඕනෑ කොතනද? මල්ලි ඉන්න ඕනෑ තැන කොතැනද? මම ඉන්න ඕනෑ කොතනද කියන එක පිළිබඳව එතුමාට දුර දක්නා නුවණක් තියෙනවා. ඒ නිසා එතුමාට තියෙනවා අයිතිවාසිකමක්. මේ පළාත් සභාවේ කටයුතු කර ගෙන යන්න නම්, පළාත් සභාවක් හැටියට ඉස්සරහට පවත්වාගෙන යනවා නම්, ස්ථිරසාර ගොඩනැගිලි හදන්න. මේ පළාත් සභාවේ අමාත්‍යාංශ සහ සභා ලේකම් කාර්යාලයට ඉඩ ලබා ගැනීමේ අයිතිවාසිකම තියෙනවා. මම හිතන්නේ, මේ අයවැය ලේඛනයෙන් ඒ සඳහා මුදලක් වෙන් කරලා නැහැ. ඒ පිළිබඳව ඔබතුමා ප්‍රකාශයක් කරනවා නම් හොඳයි. අපි දැන් කියනවා. බලාපොරොත්තු වෙනවා. ලබන අවුරුද්දේ අපට අහවල් තැන ලැබුණොත් අපි මුල් ගල තියනවා කියලා. එතකොට අපට කොහෙන්ද මුදල්? එහෙම මුදලක් පිළිබඳව 2013 මුදල් ප්‍රකාශනයේදී සඳහනක් නැහැ. අපේ ප්‍රවාහන ඇමතිතුමා නම් එතුමාට හොඳ කාර්යාලයක් හදා ගෙන තියෙනවා. එතුමාට දැක්මක් තියෙනවා. ගරු ප්‍රධාන ඇමතිතුමාටත් ඒ ප්‍රඥාව, ඒ දැක්ම පහළ වෙලා මේ පළාත් සභාවේ කටයුතු කර ගෙන යන්න විශේෂයෙන්ම මේ නිලධාරීන්ගේ ගෞරවය ආරක්ෂා වන විධියට - දැන් මෙතැන කථා වුණා

ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය සහ එතුමාගේ නිල නිවාසය පිළිබඳව. මම මෙපමණ කාලයක් සිතා ගෙන හිටියේ - ආණ්ඩුකාරතුමාට නිල නිවාසයක් හැදුවා. එතුමා ඒක පරිහරණය කරන්නේ නැති නිසා තමයි ගරු ප්‍රධාන ඇමතිතුමා පරිහරණය කරන්නේ කියලා. කොහොම වුණත් මෙහි ප්‍රධාන අමාත්‍ය නිල නිවාසයත්, අනිවාර්යයෙන්ම ආණ්ඩුකාර නිවාසයත් දෙකම තියෙන්න ඕනෑ. අවුරුදු විසිපහක් ගිහිල්ලා අපි තවමත්

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

මේවා ගැන කථා කරන එක, විවේචනය කරන එක සාධාරණයි. පළමුවැනි පළාත් සභාවේ ප්‍රධාන ඇමතිතුමා සුසිල් මුණසිංහ මැතිතුමා ඊයේ පෙරේදා අභාවප්‍රාප්ත වුණා. එතුමාගේ කාලයේ ඉතාමත්ම හොඳට හදපු සැලසුම් ටික ඇරුනාට පස්සේ, මේ පළාත් සභාව එක්සත් ජාතික පක්ෂයෙන් ගිලිහිලා ගියාට පස්සේ අවුරුදු විස්සක් තිස්සේම බොහොම මන්දගාමීව තමයි තවම ඉන්නේ. ඒකේ ප්‍රතිඵල තමයි රේණුක පෙරේරා සංවිධායකතුමා කථා කළේ.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

නැහැ, නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එතුමා බොහොම පැහැදිලිව කථා කළා. අහගෙන හිටියා නම්, හැන්සාඩ් එක අරගෙන බලන්න. එතුමා මොනවද කථා කළේ කියලා. අවුරුදු විස්සක සන්ධානය, පොදු ජන එක්සත් පෙරමුණ හරි සන්ධානය හරි මොන ක්‍රමයකින් හරි එක්සත් ජාතික පක්ෂයෙන් ගිලිහිලා ගියාට පස්සේ ඒක දිගටම පාලනය කළේ තමුන්නාන්සේලා. එතකොට ඒකේ වගකීම ගන්න වෙන්නේ ඒකයි. අපට අවුරුද්දයි තිබුණේ. දෙකයි තිබුණේ. ඒක කියන්න බැහැ. අවුරුදු විස්සක් තිබුණා. මහ ඇමතිවරු තුන් හතර දෙනෙක් යටතේ කටයුතු කළා. අවුරුදු 20 ක් මහ ඇමතිවරු තුන් දෙනෙක්, හතර දෙනෙක්, රටේ ජනාධිපතිවරයෙකුත් මෙහි පාලනය කළා. ඒ නිසා තව විස්සකින් කියන්න සිද්ධ වෙන්නේත් අද මේ කියන කථාවම තමයි. ඒ විධියට මන්දගාමී ස්වරූපයෙන් වැඩ කරනවා නම්, අනාගත දැක්මක් නැතුව වැඩ කරනවා නම්, සැලසුමක් නැතුව වැඩ කරනවා නම් මේ පළාත් සභාව අහෝසි වුණාට කමක් නැහැයි කියන ඒ කනගාටුව මගේ හිතේත් තියෙනවා.

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

යූ.එන්.පී. එකෙන් එළියට දාලා තියෙන්නේ ඔයාව.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

යූ.එන්.පී. ඒකේ යාවජීව සාමාජිකයෙක් මම.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔයා කවුද? සරත් ෆොන්සේකාගෙද? රනිල් වික්‍රමසිංහගෙද?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය මේ සඳහා යොමු කරන්න කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා.

[ පූ.භා. 10.21 ]

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොමත්ම ස්තුතියි. විශේෂයෙන්ම වැය ශීර්ෂ අංක 100, 101,102 යටතේ ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය පිළිබඳව කථා කරන විට අපේ ප්‍රධාන අමාත්‍යතුමාට ලබන අවුරුද්දට අවශ්‍ය මුදල්, ලබා දෙන්න ජනාධිපතිතුමා අවශ්‍ය කටයුතු කරලා තියෙනවා. මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. අපට තියෙන ගැටලු සම්බන්ධයෙන් මහ ඇමතිතුමා ගොඩාක් ප්‍රවේශ මාර්ග සම්බන්ධයෙන් උනන්දු වෙලා තියෙනවා. ඒ මහල් පහළොවක ගොඩනැගිල්ල හදන කොට විශේෂයෙන්ම ආබාධිත ප්‍රජාව පිළිබඳවත් සලකා බලලා ඒ සැලසුම ආරම්භයේදීම ප්‍රවේශ මාර්ග හදන්න කටයුතු කරන්න කියලා විශේෂයෙන්ම මම ඉල්ලීමක් කරනවා. ආබාධිතයෙක් හැටියට. ඒ වාගේම මම විශේෂයෙන්ම කථා කරන්න අවශ්‍යතාවය වුණේ, කාරක සභාව පිළිබඳවයි. කාරක සභාව පිළිබඳව කථා කරන විට මම සහ අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා අපි ඔක්කෝම සහභාගි වන පෙත්සම් කාරක සභාව. මන්ත්‍රීවරු 104 දෙනා වෙනුවෙන්ම පෙත්සම් කාරක සභාවේ නියෝජනය වන්නේ දහ දෙනයි. බොහොම දුෂ්කර තත්ත්වයකින් තමයි අපි කටයුතු කරන්නේ. විශේෂයෙන්ම කියන්න ඕනෑ. මහජනතාවත් සමග බොහොම සමීපව කටයුතු කරන කාරක සභාව තමයි පෙත්සම් කාරක සභාව. මේ සභාවට එනවා වාගේ තමයි එතැනට එන්නත් ඕනෑ. ඒ වාගේම ස්ථානීය පරීක්ෂණ. අපි කළුතර සිට ස්ථානගත පරීක්ෂණ සඳහා දිවුලපිටියට යන්න ඕනෑ. ඒ පිළිබඳවත් පෙත්සම් කාරක සභාවේ අපි හුඟාක් මහන්සි වෙලා කටයුතු කරන්නේ. සමහර නිලධාරීන් තීන්දු තීරණ ගන්න කොට නිලධාරීන්ගේ පොඩි අඩුපාඩුකම් තියෙන බව පේනවා. අපි එක අතකින් සන්තෝෂ වෙනවා. පෙත්සම් කාරක සභාව හැටියට බොහෝ වෙලාවට එන්නේ, පළාත් පාලන ආයතනවල තියෙන ගැටළු. පළාත් පාලන කොමසාරිස්තුමිය ගැන අපි විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මේ ප්‍රශ්නවලදී එතුමිය නියෝජනය කරනවා. නිලධාරීන් යොමු කරනවා. ඒ ගැන සතුටක් තිබුණාට අනෙක්

ඒවා ගැන නම් අපට ඒ තරම්ම සතුටු වෙන්න බැහැ, සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන්ට එන්න කියලා යැව්වාට ඔවුන් නියෝජනය නොවීම නිසා දෙන ලද තීන්දු ක්‍රියාත්මක කිරීමේදී ගැටලු තියෙනවා. ඒ නිසා යෝජනා කළා. ගිණුම් කාරක සභාවේ කටයුතුවලදී ගරු ප්‍රධාන ඇමැතිතුමා මාස තුනකට වරක්වත් එතුමාගේ ප්‍රධානත්වයෙන් රැස් වනවා වාගේම, පෙත්සම් කාරක සභාවේදීත් තීන්දු තීරණ ගැනීමේදී ඇතිවන තත්ත්වය පිළිබඳව ඔබතුමා මගින් ප්‍රධාන ඇමතිතුමාට යෝජනා කරන්නේ, මාස තුනකට වරක් හරි මේ පෙත්සම් කාරක සභාවේ සිටින සාමාජිකයන් සහ අපේ සභාපතිතුමාත් සමග එකතු වෙලා මේ ගැනත් පොඩි සාකච්ඡාවක් කරනවා නම් වඩා හොඳ ප්‍රගතියකට යන්න පුළුවන් කියලා.

අපි ඇත්ත වශයෙන්ම බොහොම කනගාටු වෙනවා, ඊයේ මේ සභාවේ ගණපූරණය නැතිවීම පිළිබඳව. ඇත්ත වශයෙන්ම මේ දවස්වල උත්සව තියෙන නිසා වෙනත් මන්ත්‍රීවරු යනවා. අපි මෙතැන නියෝජනය කරනවා. හැබැයි, මේ සභාවේ මන්ත්‍රීවරු ඒ උත්සවවලට ගියාම පස්සේ අපෙන් අහනවා, අපි ඔක්කොම එක සභාවකද ඉන්නේ කියලා. අපිට ඒ ගැටළුව තියෙනවා. මේ ගැන වහාම ක්‍රියා මාර්ගයක් ගන්න ඕනැ අපේ ප්‍රධාන ඇමතිතුමා. ඔබතුමා මාර්ගයෙන් අපි කියන්නේ, අපට පොඩි ප්‍රශ්නයක් එනවා. සභාවට තියෙන ගෞරවයට අපි මෙතැනට පැමිණෙනවා. අපේම සහෝදර මන්ත්‍රීවරු ඒ උත්සවයට සහභාගි වුණාම ජනතාව, නිලධාරීන් අපි ගැන හිතන විදිය ගැන ගැටළුවක් තියෙනවා. ඒ නිසා විශේෂයෙන්ම සංවිධායකතුමාගෙනුත් ඉල්ලන්නේ, එහෙම වුණොත් අපිත් සහභාගි වෙන්නම්. සභාව පස්සේ පවත්වනවාද මොකද කියන එක පිළිබඳව ගරු ප්‍රධාන ඇමැතිතුමා වහාම ක්‍රියාමාර්ගයක් ගනීවි කියන අදහසේ අපි ඉන්නවා. මොකද? නැත්නම් අපටත් ලොකු අසාධාරණයක් වෙනවා. ඊයේ අපටත් ආරාධනාවන් තිබුණා, ගොඩාක් තැන්වල. අපි නොගිහින් මේ සභාවේ ගෞරවයට පැමිණියා. එතැන වෙනත් කට්ටියක් නියෝජනය වුණාම ජනතාව අපි ගැන වැරදි විදියට හිතනවා. සංවිධායකතුමාටත් මේ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කළා.

ඒ වාගේම මේ කාරක සභාවල කටයුතු පිළිබඳව විශේෂයෙන්ම කියන්න ඕනැ. අපට මේ කරන කටයුතුවලදී පුහුණුවක් ලබන්න ඕනැ. ඒ පුහුණුව ලබා ගැනීම පිළිබඳව ගැටලු තියෙනවා. ඇත්ත වශයෙන්ම පෙත්සම් කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට අපට පුහුණුවීමට වැඩ සටහනක් නැහැ. ඉදිරියේදී මේ කටයුතු කිරීමේදී පෙත්සම් කාරක සභාවෙන් අපි බොහෝ දේවල් ඉගෙන ගන්නවා. මේවා ක්‍රියාත්මක කිරීමේදී පුහුණු වැඩ සටහන්වලට යන්න වෙනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම ඉල්ලන්නේ, ඇත්ත වශයෙන්ම විදේශ පුහුණුවීම්වලට සහ දේශීය වැඩ සටහන්වලට යම් මුදලක් ප්‍රධාන අමාත්‍යතුමාගෙන් හරි අපට වෙන් කරලා දෙනවා නම් වඩා වැදගත් වෙනවා. මොකද, වෙනත් පළාත් සභාවල මේ කාරක සභාවල සිටින මන්ත්‍රීවරු විදේශ පුහුණුවලට සහභාගි වෙනවා. මේවා ක්‍රියාත්මක කිරීමේදී අපට නැති වෙන කොට පොඩි ගැටලුවක් ඇති වෙලා තියෙනවා. අපි වඩාත් කැප කිරීමක් කරනවා. අපි මන්ත්‍රීවරු දහ දෙනාම. විපක්ෂයෙන් හතර දෙනෙක් ඉන්නවා. ආණ්ඩු පක්ෂයෙන් හය දෙනෙක් ඉන්නවා. අපි දහ දෙනාම ගණ පූරණය තබා ගෙන මහජනතාව වෙනුවෙන් කාරක සභාවල විශාල සේවයක් කරනවා. මම හිතන්නේ, වැඩියෙන්ම පෙත්සම් ගණනක් දාලා තියෙන්නේ අපේ ගරු විපක්ෂ නායකතුමා. එතුමාට ඇති ආදර්ශයක්, අපි කොපමණ හොඳ තීන්දු තීරණ අරගෙන තියෙනවාද කියලා. ඇත්ත වශයෙන්ම මේකට කැප වෙන්නේ අපි. අපට කවුරු හරි කෙනෙක් නැති වෙනවා. ඇත්ත වශයෙන්ම දේශපාලන වශයෙන් අපි ලොකු හානියක් කර ගන්නවා. පෙත්සම් කාරක සභාව නියෝජනය වන විට. හැමෝම සතුටු කරන්න බැහැ. එක්කෝ විත්ති පාර්ශවය හරි පැමිණිලි පාර්ශවය හරි කවුරු හරි කෙනෙක් අපට අහිමි කර ගෙන තමයි අපි මේ කටයුතු කරන්නේ. ඒ නිසා මේ ගැන පොඩි වැඩ සටහනකට යන්න කියන එක ඉල්ලා සිටිනවා. ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමා මගේ නම තුන් ගමනක්ම කථා කරලා, මිනිස්සුන්ට අමාරුකම් නැහැයි කියන එක මම කිව්වාම එතුමා ඒ ගැන බොහොම තද විදියට විවේචනයක් කළා. මොකද, අපිට පේන්නේ නැහැ. ජනතාවට ඔය කියන තත්ත්වයක් නැහැ. මොකද අපි දන්නවා. මම කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට විශේෂයෙන්ම යම් ප්‍රමාණයකට චූටි ගැටලුවක් තියෙන්නේ මුහුදු සීමාවේ ඉන්න අය ගැන පමණයි. අනෙක් වැඩ කරන සැම කට්ටියටම මහන්සි වන අයට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා දන්නවා මතුගම, අගලවත්ත, බුලත්සිංහල, හොරණ, බණ්ඩාරගම ආසනවල මිනිස්සු හොඳට මහන්සි වන මිනිස්සු. දිවි නැගුම යටතේ සැම ගෙදරකම මොකක් හරි පැළයක් හදලා තියෙනවා. ගෙදර එළවළු ටික හදා ගෙන තියෙනවා. ඒ වාගේ සැම දෙයක්ම කරනවා.

ඔබතුමා ඇත්ත වශයෙන්ම මාත් එක්ක එකඟ වෙනවා ඇති. යම් ප්‍රමාණයකට පිළිගන්නවා පානදුර, කළුතර, බේරුවල ගත්තාම මුහුදු සීමාවේ අය මුහුදු රස්සාව කරන අයට යම් ප්‍රමාණයකටම පොඩි ගැටලු තියෙනවා කියලා. පහුගිය දවස්වල කාලගුණ විපර්යාස මත. ඒ වුණාට සමස්තයක් ගත්තාම ගොඩාක් අයට කිසිදු ගැටලුවක් නැහැ. ගැටලුවක් තියෙනවා නම් ඇත්ත වශයෙන්ම අපි දන්නවා. මම මහජනතාවත් එක්ක ඉන්න මන්ත්‍රීවරයෙක්. B.M.W. එකෙන් ගිහිල්ලා බහින එතුමා වාගේ කෙනෙක් නොවෙයි මම. මම ත්‍රීවීල් එකේ යන මන්ත්‍රීවරයෙක්. සමහර අය දන්නේත් නැහැ මම මන්ත්‍රීවරයෙක්ද කියලා. ඒ නිසා මම පැහැදිලිවම කියන්නේ, අපි ජනතාවත් එක්ක ඉන්නවා. ඔබතුමා දන්නවා මා ගැන. ජනතාවට ඔය කියන තරම් අමාරුවක් නැහැ. හැබැයි, පොඩි දෙයක් තියෙනවා. විපක්ෂයේ කාර්ය භාරයක් තියෙනවා නේ? ඒ නිසා ඒ සම්ප්‍රදාය හැටියට විපක්ෂය විරුද්ධ වනවා වාගේ ඒ කිව්වාට එහෙම අමාරුවක් නැහැ. පැහැදිලිවම ඒ තරම්ම නැහැ. එහෙම නම් බාර්වල හවසට - ඔබතුමා අපි දන්නවා නේ? මහ තොටේ යන කොට

දිගටම බාර්වල කොපමණ සෙනගක් පෝලිමේ ඉන්නවාද කියලා. ඉතින් මිනිස්සු සල්ලි නැත්නම් ඕවාට එනවද? මම කියන්නේ ඒකයි. මම කියන්නේ මිනිස්සුන්ට අමාරුවක් නැහැ. හැබැයි මේ දේශපාලන අමාරුවක් තියෙනවා නේ? පැහැදිලිවම තියෙනවා. ඒ විපක්ෂයේ කාර්ය භාරය. මම කියන්නේ අරහෙම අමාරුවක් නැහැ. බහුතරයකට හොඳයි. නිකං ඉන්න මිනිස්සුන්ට කාටවත් වැඩක් නැහැ. නිකං ඉඳලා කොහොමටත් රට සංවර්ධනය කරන්න බැහැ. ආරක්ෂක ලේකම්තුමා ගත්ත තීන්දුව

[ ගරු විකුම් ගුණසේකර ]

බලන්න. රේස් කෝස් එක ඉස්සර කොහොමද තිබුණේ? පැහැදිලිවම රේස් කෝස් එක තිබුණ හැටි අපි දන්නවා. එතැන ඉස්සර හමුදා කඳවුරක් තිබුණා. හමුදා කඳවුර ඉවත් කළාට පස්සේ, ඒක පැලවත්තට ගියාට පස්සේ සම්පූර්ණයෙන්ම පාලු ගොඩනැගිල්ලක් තිබුණේ. අද කුහකත්වය මූලික වුණාම කෑ ගැහැව්වාට අද බලන්න එතැනට ගියාම කොපමණ ලස්සනයි ද කියලා. අද විදේශ විනිමය ලබා ගන්න පුළුවන් වැඩ සටහනක් හදලා තියෙනවා නේ? අපි ඒවා අගය කරන්න ඕනෑ. ඒවා දැක්කම අමාරුයි. බලන්නකෝ කොපමණ ලස්සනයි ද කියලා. අද ප්‍රවේශ මාර්ග හදලා. මට අද රෝද පුටුවෙන් හැම තැනටම යන්න පුළුවන් විධියට හදලා තියෙනවා. ප්‍රවේශ මාර්ග හොඳට හදලා තියෙනවා. අපි සන්තෝෂ වෙන්න ඕනෑ. පාලු ගොඩනැගිල්ලක අද තියෙන තත්ත්වය. ඒ නිසා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[ පූ.භා. 10.30 ]

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැය ශීර්ෂ අංක 100, 101, 102 සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මගේ කථාව අද දවසේ ආරම්භ කරන්නේ, ඊයේ ප්‍රධාන අමාත්‍යතුමාගේ අවසන් කථාවේ අවසන් පේළි කිහිපයෙන්. එතුමා ප්‍රකාශ කළා, මේ පළාත් සභාවේ ඊයේ තිබුණු රැස්වීමේදී, එහෙම නැත්නම් පොදු විෂයයන් පිළිබඳව කථා කරද්දී කිව්වා. මේ පළාත් සභාවේ ඉදිරි ප්‍රගමනය සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරු යම් යෝජනාවන් කරයි. නමුත් එවැනි යෝජනාවන් සිද්ධ වුණේ නැහැ. සිද්ධ වුණේ, මේ අයවැය ලේඛනය විවේචනාත්මකව කථා කිරීම කියන එකයි. අපි ප්‍රථමයෙන්ම මතක් කරන්න කැමතියි. මේ අය වැය ලේඛනය සකස් කරන්න පෙර ඔබතුමාම ප්‍රකාශ කළ පරිදි විපක්ෂයට ආරාධනාවක් කළා නම්, අපි කැමතියි. අනිවාර්යයෙන්ම අප ඒකට බැඳිලා ඉන්නවා. අපි 2013 අයවැය ලේඛනය සකස් කරනවා. විපක්ෂ මන්ත්‍රීවරුන් හැටියට තමුන්නාන්සේලා මේ පළාත් සභාව ඉස්සරහට ගෙන යන්න කරන්නේ මොන හොඳ යෝජනාද? ඒවා ලබලා දෙන්නය කියලා එතුමා අපෙන් ඉල්ලීමක් කළා නම්, අපි ඒක නිර්ලෝභීවම ලබලා දෙනවා. දැන් ඔබතුමා කියපු දේම තමයි මට කියන්න තියෙන්නේ. මේ පළාත් ආදායම් වැඩි කරන්න, ප්‍රධාන ඇමතිතුමා කමිටුවක් පත් කළා. ඒකේ සභාපතිත්වය දුන්නේ උදය ගම්මන්පිල ඇමතිතුමාට. අපෙන් ඉල්ලීමක් කළා විපක්ෂයත් ඒක නියෝජනය කරන්න කියලා. ඒ පිළිබඳව දැනුමක් ඇති මන්ත්‍රීවරු දෙපළක් ඒ කමිටුවට පත් කළා. ඔවුන් ඉතාම හොඳ යෝජනා ඒ කමිටුවට ඉදිරිපත් කළා විතරක් නොවෙයි, මේ වන කොට ඒ යෝජනා මේ සභාව ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තියෙනවාය කියන එකත් මතක් කරන්නට ඕනෑ. ඒ නිසා විපක්ෂයේ කාර්ය භාරය හැම දේටම විරුද්ධ වෙනවා කියන එක නොවෙයි. ඕනෑ දේකට උදව් කරන්න සූදානම්. ඒ අපෙන් උදව්වක් ඉල්లුවාම. ඉතාම පැහැදිලිව මෙතෙක් සහ ඉදිරියටත් ඒ උදව් ලබලා දෙනවා. හැබැයි, දේශපාලනය කරන්නේ අපි නොවෙයි. සම්පත් බෙදෙන කොට ඒවා ඉතින් නරක විධියට තමයි බෙදා ගන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අඩු ගණනේ තීන්ත ගාන එකටවත් එන්න කියන්නේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අඩුම ගානේ අර තීන්ත ගාන වෙක් එක පාසල්වලට ගිහිල්ලා දෙන්න කියලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි රට යන කොට එක්ක ගෙන යනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඊට පස්සේ, අවසානයේ චක්‍රලේඛයෙන්ම කියනවා Causeway එකෙන්ම තමයි ගන්න ඕනෑ. ඊළඟට ජනාධිපතිතුමා ගැන මිනිත්තු කිහිපයක් කථා කරන්න ඕනෑ, මෙන්න මෙහෙම තමයි ඒකේ තියෙන්නේ. (බාධා කිරීම්)

මම මතක් කරන්න කැමතියි. දැන් මේ පළාත් සභාව අවුරුදු විසිපහක් ක්‍රියාත්මක වෙනවා. මේ අවුරුදු විසිපහ තුළ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔයගොල්ලෝ හැමදාම කොළ පාට තීන්ත ගගා ඉන්නවා නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපි සැලසුමක් ඇතුව වැඩ කටයුතු කළා නම්, අපි දන්නවා, අද ගෞරවාන්විතව ආණ්ඩුකාරතුමාට ඉන්න පුළුවන්කම තියෙනවා. දැන් උදාහරණයක් විධියට අපට වැඩිය අඩු ආදායම් තියෙන පළාත් සභාවක් තමයි වයඹ පළාත් සභාව. අද මහ ඇමතිතුමාට නිල නිවාසයක් තියෙනවා. ආණ්ඩුකාරයාට නිල නිවාසයක් තියෙනවා. විපක්ෂ නායකතුමාටත් වයඹ නිල නිවාසයක් තියෙනවා. ඒ වාගේම මේ පළාත් සභාවක් සතු වගකීම් සියල්ල

හරියට දැරුවේ, තමන් යටතේ තියෙන බලතල හරියට පාවිච්චි කරලා තියෙන්නෙත්, වයඹ පළාත් සභාවේ ගාමිණී ජයවික්‍රම පෙරේරා - ප්‍රධාන ඇමතිවරයා හැටියට-

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි යෝජනා කරනවා විපක්ෂ නායකට නිල නිවසක් දෙන්න කියලා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් අපි මේක පත් කර ගන්න ඕනෑ. පළාතේ පරිසර අධිකාරියක් පිහිටුවලා තියෙන එකම පළාත් සභාවත් වයඹ පළාත් සභාව විතරයි. ඒ නිසා අද දවසේ අපේ ආණ්ඩුකාරතුමා මේ රටේ ශ්‍රේෂ්ඨ කෘතහස්ථ දේශපාලනඥයෙක් විධියට අද එතුමාටත් ආණ්ඩුකාර කාර්යාලය අරගෙන තැනින් තැනට යන්න සිද්ධ වෙලා තියෙනවා. මම හිතන විධියට තිබුණු ගොඩනැගිල්ලට වඩා කුළිය වැඩි වෙලාද දන්නේ නැහැ. නමුත් මම කියන්නේ, මහ ඇමතිතුමාගේ ගෞරවය ඒ විධියට තියෙන්න ඕනෑ. ආණ්ඩුකාරතුමාගේ ගෞරවය ඒ විධියට තියෙන්න ඕනෑ. කවුරු මේකේ මහ ඇමති වුණත්, කවුරු ආණ්ඩුකාරයා වුණත්. ඒ නිසා ඒ ගෞරවාන්විත තත්ත්වය ඇති වෙන්න ඒ කටයුතු කෙරෙන්න ඕනෑ.

අනික් එක තමයි, එතුමාගේ කෘතහස්ත භාවය, දැනුම. (බාධා කිරීම්) ඒ නිසා අපි මතක් කරන්න කැමතියි. මේ කටයුතුවලදී ආණ්ඩුකාරතුමාගෙත් බලපෑම මේ පළාත් සභාවට මීට වඩා වැඩියෙන් ඇති වෙන්නට ඕනෑ, සමහර පරිපාලනමය තීන්දු ගනිද්දි. ඒ නිසා ආණ්ඩුකාරවරයා ගෞරවාන්විත පුද්ගලයෙක් නිසා මම ඊට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ඊළඟට පළාත් සභාව පිළිබඳව අපි අද කථා කරනවා. මේ ප්‍රධාන ඇමතිතුමාගේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන වෙලාවේ පළාත් සභාවේ ඉන්න අපේ මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වය ඉතාම දුර්වලයි. දැන් ඊයේ පැයක් විතර අපි ගණ පූරණය නැතුව හිටියා. අද ගණ පූරණය පිළිබඳ ප්‍රශ්නය ඇදුනා නම් එහෙම ඒත් එහෙමයි. ඒ නිසා මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු හැටියට අපි අපේ වගකීම හරියට ක්‍රියාත්මක කරනවාද කියන ප්‍රශ්නය තියෙනවා. ඒ නිසා අනෙක් පැත්තෙන් පළාත් සභා ලේකම් කාර්යාලය - සිරිකමල් මන්ත්‍රීතුමා මතක් කළා වාගේ. අපි ලක්ෂ 12 ක් හරි ගෙවලා කමක් නැහැ, හරි තැනකට යන්නට ඕනෑ. ඒකට මුදල් ප්‍රතිපාදන හොයා ගන්න එක මම හිතන්නේ සියලු දෙනාගේ වගකීම. ඒ හේතුව දැන් අඩු කුළියකට වැරදි තැනකට ගියාම අපේ වාහන ටික ගාල් කරගන්න වෙන්නේ නැහැ. සභාපතිවරයාට ගෞරවයක් ඇතිව ඉන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ලේකම්වරයාට අදාළ නිලධාරීන්ට මේ වැඩ කටයුත්ත හරියට කර ගන්න බැරි වෙනවා. ඒ නිසා සභා ලේකම් කාර්යාලය සිරිකමල් ගරු මන්ත්‍රීතුමා මතක් කළා වාගේම මේ කාර්යාලයේ ඉන්න සේවක සේවිකාවන්, නිලධාරීන් සියලු දෙනා තමන්ට කරන්නට පුළුවන් උපරිම කැපවීමෙන් යුක්තව වැඩ කරලා මේ සභාව ඉහළ තැනකට ගෙන යන්න කටයුතු කරන කණ්ඩායමක්. ඒ නිසා ඔවුන් අගය කළ යුතුයි. ඔවුන්ට ප්‍රශංසා කළ යුතුයි. අවම දෙයින් උපරිම ඵලය නෙලා ගන්න උත්සාහ කරනවා.

ඒ වාගේම තමයි, මම මතක් කරන්න කැමතියි. අපේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අද ඒ තිබුණු තැනින් වෙනත් තැනකට ගිහිල්ලා. නමුත් මේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉන්න සියලු දෙනාමත් බොහොම ගෞරවාන්විතව, මැදිහත් භාවයෙන් යුක්තව තමන්ගේ රාජකාරිය හරියට ඉෂ්ට කරන කණ්ඩායමක් විධියට අපි අද දැකලා තියෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ හරහා ගරු ප්‍රධාන ඇමතිතුමාට වුණත් අපි යෝජනා කරන්න කැමතියි. ආණ්ඩුකාරතුමාගේ අවධානයට යොමු කරන්න. ඔවුන්ට දීමනාවක් වැඩියෙන් ගෙවන්න හරි පුළුවන්කමක් තියෙනවා නම්, ඒකත් වඩා වැදගත්. ඔවුන් ඉතාම අතළොස්සක් කරන සේවය පිළිබඳව අපි කල්පනා කරලා කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම මම මතක් කරන්න කැමතියි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියයි.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ කාල වේලාවේ තත්ත්වය නිසා. නමුත් අද අපට වෙලා තියෙන්නේ මොකක්ද? අපි අභිකුණ්ඨක තත්ත්වයට පත් වෙලා. අද රේණුක පෙරේරා මන්ත්‍රීතුමා කියනවා-

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඇත්ත තමයි කියන්නේ. මොනවා කරන්නද? අවුරුදු විසිපහක් ගිහිල්ලත් අභිකුණ්ඨකයෝ වෙලා.

[සභාවේ සෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

රේණුක පෙරේරා මන්ත්‍රීතුමා කියනවා. (බාධා කිරීම්) අවුරුදු විසිපහක් ගිහිල්ලා සන්ධානයේ මහ ඇමතිවරු හතරක් පහක් ඉඳලා අද තැනින් තැනට කුඩාරම් ගහ ගෙන යන තත්ත්වයට තමයි මේ පළාත් සභාව පත් කරලා තියෙන්නේ කියලා. ඒ නිසා මම මතක් කරන්න කැමතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මොකටද ඒ ගොඩනැගිලි ගන්නවා කියන්නේ? රස පරීක්ෂක

දෙපාර්තමේන්තුවට යන්න කිව්වා. තැපැල් කාර්යාලය තිබුණා. ඒක අන්තිමට යන්නේ නැති නිසා තැපැල් ස්ථානාධිපතිතුමියට වතුර ටික කැපුවා. ඊට පස්සේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. එතැනින් ගියාම පළාත් පාලන කොමසාරිස් කාර්යාලය. සෞඛ්‍ය අමාත්‍යාංශය. අද අපි. මොකටද? සංචාරක කලාපයක් කරන්නලු. සුද්දන්ට ඇවිල්ලා මෙහේ මනදොල පුරවාගන්න. මම හිතන්නේ ඒකට මේ රටේ සල්ලි කෝටි ගණනක් (බාධා කිරීම්) පාවිච්චි කරලා අපට කුළියට යන්න වෙන තත්ත්වයට පත් කරලා තියෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

සුද්දන්ගේ ජංගි හෝදන්න

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මතක් කරන්න කැමතියි. අපි මහ ඇමතිතුමාට මතක් කරන්න ඕනෑ. අනාගත වැඩ පිළිවෙළක් හදලා වාර්ෂිකව ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කරන්න කියලා මතක් කරනවා.

[ පූ.භා. 10.44 ]

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශීර්ෂ අංක 100 ආණ්ඩුකාරවරයා, 101 බස්නාහිර පළාත් සභාව සහ 102 පළාත් රාජ්‍ය සේවා කමිෂන් සභාව පිළිබඳව 2013 වර්ෂයේ ප්‍රතිපාදන පිළිබඳ සලකා බැලීමේ අවස්ථාවේදී මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඉතාමත් අගය කොට සලකනවා. විශේෂයෙන්ම, බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුකාරතුමා. එතුමා පුරා වසර 11 ක් මේ සභාවට සේවය සලසමින් ශ්‍රී ලංකා පළාත් සභා ඉතිහාසයේ වාර්තාවක් තබා තිබෙනවා. වසර 11 ක් අඛණ්ඩව ආණ්ඩුකාරවරයෙක් හැටියට පළාත් සභාවකට සේවය සපයා ඇති එකම ආණ්ඩුකාරවරයා අල්හාජ් අලවි මවුලානා ආණ්ඩුකාරතුමා. මම විශ්වාස කරන විධියට මේ එතුමාගේ තුන්වෙනි ධුර කාලයයි. අතිගරු ජනාධිපතිතුමා, එතුමා කෙරෙහි ඇති ගෞරවය, විශ්වාසය නිසාම මෙම ධුරය දැරීමේ අවස්ථාව අඛණ්ඩව එතුමා වෙත පවරා තිබෙනවා. ඒ වාගේම බම්බලපිටියේ ලිබර්ටි ප්ලාසා ගොඩනැගිල්ලේ පිහිටා තිබුණු එතුමාගේ කාර්යාලය වෙනත් ස්ථානයකට රැගෙන ගියා. 97/4 හැව්ලොක් පාර, කොළඹ 05 කියන ලිපිනයැති ස්ථානයකට. අපි දන්නවා. පහුගිය දවස්වල අපි එතුමා මුණ ගැහෙන්න ගියාම අපේ වාහනයක් නතර කරගන්න අපට තැනක් නැහැ. කිලෝ මීටර භාගයක් විතර ඈතට ගිහින් වාහනය නතර කරලා එන්න ඕනෑ. රියැදුරෙක් එක්ක නොගියොත් එහෙම ඒ යන මන්ත්‍රීවරයා විශාල අපහසුතාවයකට පත් වෙනවා. මේ පිළිබඳව සලකා බලමින් එතුමා ඒ ගත්ත තීරණය පිළිබඳව අපි එතුමාට අපේ ගෞරවය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ස්ථිර වශයෙන් ගොඩනැගිල්ලක් සකස් කරලා, නිල නිවාසයක් සකස් කරලා එතුමාට ඒ ස්ථානයට යන්න පහසුකම් සලසා දෙන තුරු මේ නව සේවා ස්ථානයට යාම නිසා මම හිතන්නේ, අපි කාටත් යම් පහසුවක් ලැබෙනවා. එතුමාගේ රාජකාරී කටයුතුවලට සම්බන්ධ වෙන්න. ඒ වගේම අපට ලොකු අඩුපාඩුවක් තිබුණා. පහුගිය දවස්වල ප්‍රඥප්ති සහ වෙනත් ලියවිලි සම්බන්ධයෙන් විද්‍යානුකූල භාවය පිළිබඳව අවසාන තීන්දු තීරණ ගන්න බලධරයා හැටියට ආණ්ඩුකාරතුමාට යැව්වාට පස්සේ, විශාල ප්‍රමාදයන් ඇති වෙනවා. ඒ නිසා අපි අළුතෙන් යෝජනා කරනවා. ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට නීති නිලධාරී තනතුරක් ලබා දෙන්න. ඒ තුළින් මම හිතන්නේ, පළාත් සභාවේ කාර්ය භාරය ඉතාමත් වේගවත් කිරීමට හැකි වේවි කියලා. ඒ නිසා මෙය අප්‍රමාදව කළයුතු කාර්යයක් හැටියට අප විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයෙන් අප වෙත සපයන සේවාවන් පිළිබඳව ඇත්ත වශයෙන්ම ගරු ආණ්ඩුකාරතුමාටත්, ආණ්ඩුකාර ලේකම්වරයා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයටත් අපේ ගෞරව ස්තුතිය පුද කරනවා. යම් යම් අවස්ථාවලදි පුංචි පුංචි ගැටළු, කාරණා අපට මතුවෙනවා. ඒක පෘථජ්ජන මිනිස්සුන් අතර සිදුවන සිද්ධීන් හැටියට සලකමින් ඒ සේවාව අගය කරනවා. මොකද, ආණ්ඩුකාරතුමා ඉතාමත් සම්භාවනීය පුද්ගලයෙක් හැටියට, දේශපාලන වශයෙන් ඉතාමත්ම කෘතහස්ත දේශපාලඥයෙක් හැටියට මෙතුමා වගේ සමීපව, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමාට, කැබිනට් මණ්ඩලයට සහ ගරු මන්ත්‍රීවරුන්ට සහයෝගය දෙමින්, අමාත්‍යාංශ ලේකම්වරුන්ට නිවැරදි මාර්ගෝපදේශකත්වය ලබා දෙමින් කටයුතු කරන ඉතාමත් සුහදශීලී, ආණ්ඩුකාරවරුන්ටත් ඉතාමත් ආදර්ශමත් ආණ්ඩුකාරවරයෙක් හැටියට අපි එතුමාගේ සේවය අගය කරමින් මේ අවස්ථාවේදී එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, සභා ලේකම් කාර්යාලයේ ශීර්ෂ අංක 101. හැමදාමත් අපිට තිබුණ පහසුකම් පිළිබඳව මම හිටපු සභාපතිවරයා හැටියට දන්නවා. ඒ ගැන විවාදයක් නැහැ. සභා ලේකම් කාර්යාලය තරම් අපහසුවෙන් සේවා සපයන වෙනත් කිසිම ආයතනයක් මේ පළාත් සභාවේ නැති තරම්. සභාපතිවරයාට සහ අනෙකුත් ධුරදාරීන්ට සභාපතිතුමා, ආණ්ඩුපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, විපක්ෂ නායකතුමා, සභානායකතුමා, මේ සියළු දෙනාට මේ කුකුල් කූඩුව ඇතුළේ රිංගගෙන අසීමිත කාලයක් තිස්සේ මේ සේවා පවත්වාගෙන යන්න සිද්ධ වුණා. කිසිසේත්ම ප්‍රමාණවත් ඉඩ ප්‍රමාණයක් ඒ කාර්යාලයේ සේවකයින්ට තිබුණේ නැහැ. සේවකයින් සතුව මූලික අයිතිවාසිකම්, තමන්ට පහසුවෙන් ස්වසනය කරමින් සෞඛ්‍යාරක්ෂිතව තමන්ගේ සේවා කටයුතු පවත්වාගෙන යාම, ඒ පහසුකම්වත් මේ කාර්යාල පරිශ්‍රය තුළ සම්පාදනය වී නැහැයි කියන එක අපි අවිවාදාත්මකව පිළිගත යුතුයි. ඒ නිසා දැන්වත් වහවහා නියමිත ස්ථානයකට තමන්ට ගැලපෙන ස්ථානයකට යා

යුතුයි. ඒ නිසා ගරු ප්‍රධාන ඇමතිතුමා යෝජනා කළා උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාටත්, නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමාටත් වෙනත් සේවා ස්ථානවලට තමන්ගේ අමාත්‍යාංශ රැගෙන ගොස් ගරු සභාපතිතුමාට අවශ්‍ය පහසුකම් සපයා දෙන්නය කියලා. ඒක ඉතාමත් කාලෝචිත යෝජනාවක්. මොකද සභාපතිතුමා ඉන්න ඕනෑ, සභා ගර්භයේ පවතින ගොඩනැගිලි පරිශ්‍රයේ. ඉතාමත් වැදගත් වෙන්නේ, ඒ කටයුත්ත. ඒ නිසා ඒ යෝජනාව ක්‍රියාත්මක වුණොත් මා විශ්වාස කරනවා ගරු මන්ත්‍රීවරුන්ටත් සභාවටත් අතිශයින්ම වැදගත් බවක් ඒ තුළින් ඇති වන බව.

ඒ වාගේම හැමදාම මතුවන මැසිවිල්ලක් තමයි සභා ලේකම් කාර්යාලය ආශ්‍රිතව පවත්වාගෙන යන කාරක සභාවල සාමාජිකයින්ට පළාත් සභාවේ අඩු සැලකිලි තිබෙනවයි කියලා. සභා කටයුතු කාරක සභාව, ගෘහ කාරක සභාව, ආදී කාරක සභා නියෝජනය කරන සමාජිකයින්ටද අමාත්‍යාංශ කාරක සභා නියෝජනය කරන සාමාජිකයින්ට හිමි වරප්‍රසාද ඒ ආකාරයෙන්ම ලැබෙන්නේ නැහැයි කියන මානසිකත්වය ඇති වී තිබෙනවා. විදේශ සංචාර පිළිබඳව කටයුතු කිරීමේදී, විදේශ පුහුණු ලැබීමේදී දේශීය හා විදේශීය වශයෙන් ඔවුන් දැනුවත් භාවයට පත් කිරීමට අවශ්‍ය පුහුණුව ලැබීමේදී ඒ කටයුතු කෙරෙන්නේ නැහැයි කියලා විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමාගෙනුත් පොඩි මැසිවිල්ලක් ආවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඉල්ලීම පිළිබඳව අපේ අවධානය යොමු වීම සාධාරණයි කියලා මම විශ්වාස කරනවා. මොකද හේතුව, විශේෂයෙන්ම, පෙත්සම් කාරක සභාව කුඩා අධිකරණයක් වගේ. පෙත්සම් පිළිබඳ තීන්දු තීරණ අරගෙන, ස්ථානගත පරීක්ෂණ කරමින් යුක්තිය පසැදීමේ කාර්යාවලිය තුළ ඔවුන් ක්‍රියාත්මක වෙනවා. එතකොට අධුගානේ පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව ක්‍රියාත්මක වෙන්නේ මොන ආකාරයටද, එහි පෙත්සම් කාරක සභාවේ නියෝජනය කරන මන්ත්‍රීවරයාට සහ ඒ සභාපතිවරයාට පැවරෙන කාර්යභාරය කුමක්ද කියලා විධිමත් අධ්‍යයනයක් කරන්නට ඔවුන්ට අවස්ථාව සලසා දීම ඉතාමත් වැදගත් වෙනවා. මොකද හේතුව, ඔවුන් ප්‍රජාව වෙනුවෙන් තීන්දු තීරණ ගන්නවා. ඉතාමත් නීත්‍යානුකූල භාවයෙන් යුක්තිය තීන්දු තීරණ විය යුතුයි. ඔවුන් උපදෙස් දෙනවා, යම් යම් අමාත්‍යාංශවලට මේ පුද්ගලයින් වෙනුවෙන් යුක්තිය පසැදන්න කියලා. යුක්තිය පසැදීමේදී අධිකරණයකට හිමි බලතල නොවුණත් ඒ දෙන නියෝග ක්‍රියාත්මක කිරීමට නම් එහි විධිමත් භාවය හා නීත්‍යානුකූල භාවය පිළිබඳ ඉතාමත් වගකීමක් ඒ සාමාජිකත්වයට පැවරෙනවා. ඒ නිසා මේවා විධිමත් කිරීම ඉතාමත් වැදගත් කටයුත්තක් කියලා මා විශ්වාස කරන නිසා ඔවුන්ට අවශ්‍ය කරන පුහුණු, දේශීය හා විදේශීය වශයෙන් ඔවුන්ට ඒ අවස්ථාව ලබා දීමට හැකියාවක් ඇත්නම් ඉතාමත් අගය කොට සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභා ලේකම් කාර්යාලය නැවත ස්ථාපනය කිරීමේදී යම් ස්ථානයක පසුගිය කාල පරිච්ඡේදය තුළ වුණු අමිහිරි අත්දැකීම්, අත්දැකීම් හැටියට පැහැදිලි කර ගනිමින්, ඒ පහසුකම් ඇති ආකාරයට, ඒ අවශ්‍ය වර්ග අඩි ප්‍රමාණය ලබා ගනිමින් ඒ කටයුත්ත කිරීම ඉතාමත් වැදගත් කියලා මා විශ්වාස කරනවා. සියළු දෙනාගේම යහපත පිණිස. ඒ වගේම අවසාන වශයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවා කොමිසන් සභාව මම ඉතාමත් අගය කොට සලකනවා. රාජ්‍ය සේවා කොමිසන් සභාවේ කාර්යභාරය. ඔවුනුත් නව සේවා ස්ථානයකට ගිහිල්ලා තියෙනවා. 532/7, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට කියන ලිපිනයේ තමන්ගේ සේවා කටයුතු පවත්වාගෙන යන්නේ. පළාත් අතර ස්ථාන මාරු කිරීමේදී පුංචි පුංචි ගැටළු තිබෙනවා. පරිවාස කාලය තුළ ස්ථාන මාරු වලදී ඇතිවන ගැටළු, රාජ්‍ය සේවා කොමිසන් සභාවටද ගැටළු හැටියට පවතිනවා. ඒ වගේම මම විශේෂයෙන්ම මතක් කරනවා. අපේ අමාත්‍යාංශ ලේකම්වරු නියමිත විධියට බඳවා ගැනීමේ පටිපාටි සම්පාදනය නොකිරීම නිසා 6/2006 චක්‍රලේඛනයට අනුකූලව මේ බඳවා ගැනීමේ පටිපාටි නිවැරදිව සකස් නොකිරීම නිසා විශාල ප්‍රශ්නවලට රාජ්‍ය සේවා කොමිසන් සභාවට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. දැන් අපේම අමාත්‍යාංශවල සමහරක් කම්කරුවෙකුට ඕනෑ, වැඩ 06ක් ගණිතය හා සිංහල ඇතුළුව. සමහරක් වේලාවට වැඩ 06යි සම්මාන 04ක් ඉල්ලනවා. මේ කම්කරු ශ්‍රේණිවල රැකියාවලට. සමහරක් තැන්වල රියදුරාට ඉල්ලනවා, වැඩ 06 ක් ගණිතය, සිංහල සමග සම්මාන. ගණිතය සිංහල ඇතුළුව වැඩ 06ක්. සමහරක් රියදුරන්ට 08 සමත්. ඉතින් මේ බඳවා ගැනීමේ පටිපාටිවල විශාල විෂමතාවයන් තිබෙනවා. ඒ නිසා වැටුප් සකස් කිරීමේදී හා අනෙකුත් ක්‍රියාවලදී මහත් දැවැන්ත බැරෑරුම් ගැටළුවලට රාජ්‍ය සේවා කොමිසන් සභාවට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේවා වහ වහා නිවැරදි වෙන්න ඕනෑ. එසේත් නැත්නම්, මේ ක්‍රියාවල් කරන්න අපහසුයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ප්‍රධාන ලේකම් කෙනෙකුත් නැහැ නේද?

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

වේලාව පිළිබඳව සලකා බැලීමේදී මට තවත් කථා කරන්න අවස්ථාව නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පළාත් සභාවට ප්‍රධාන ලේකම් කෙනෙකුත් නැහැ නේ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඒ හරහා මේ පිළිබඳව විමර්ශනයට ලක් කරලා ඒවා නිවැරදි කිරීමට කටයුතු කරන්නයි කියලා ගරු ඔබතුමා මාර්ගයෙන් සභාවෙන් ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේ ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ඒ.එම් යූසුප් මහතා] මූලාසනයෙන් ඉවත් වුයෙන් ගරු සභාපතිතුමා [සුනිල් විජේ රත්න මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. A.M. Yoosuf M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා, ඔබතුමාට විනාඩි 06 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 10.54 ]

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමනි, ශීර්ෂ අංක 100,101,102 සාකච්ඡාවට ගන්න මේ අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු කාරණා කිහිපයක් සම්බන්ධව පිළිතුරු ලබා දීම සඳහා අවස්ථාව ලබා දීම පිළිබඳව තමුන්නාන්සේලාට මගේ ස්තුතිය පුද කරනවා. ගරු සභාපතිතුමනි, අංක 100 ගරු ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කතා කරන කොට මම එතුමාට මගේ ගෞරවය ඒ වාගේම ස්තුතිය පුද කරනවා. පසුගිය කාල සීමාවේදී මේ පළාත් සභාව ගෙනියන්න එතුමා මට ලබාදීපු සහයෝගය අති විශාලයි. අපි අනෙක් ප්‍රධාන අමාත්‍යවරුන් එක්ක කථා කරන කොට, ඒ පළාත්වල ආණ්ඩුකාරවරු හා මහ ඇමතිවරු අතර ඇතිවෙන මත ගැටුම් පිළිබඳව සාකච්ඡා කරන කොට මම එතුමාට ගෞරවයක් හැටියට මේක මේ සභාවේ කියන්න ඕනෑ. කවදාවත් එතුමා මේ පළාත් සභාවේ කටයුතුවලට අනවශ්‍ය විධියට මැදිහත් වෙලා, බලපෑම් කරලා කටයුතු කරපු නැති ආණ්ඩුකාරයෙක් හැටියට ඒ ගෞරවය එතුමාට ලබා දෙන්න ඕනෑ. ඒ වගේම මම හිතන්නේ, එතුමා දේශපාලනය කරලා හොඳ අත්දැකීම් තියෙන නායකයෙක් හැටියට මේ දේශපාලන අධිකාරියේ කටයුතුවලට එතුමා ලබාදෙන සහයෝගය පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ නිසා තමයි ආණ්ඩු පක්ෂයේ, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු එතුමාට ඒ ගරුත්වය ලබා දෙමින් තමයි මේ සාකච්ඡාවට මැදිහත් වුණේ කියන එකයි මා විශ්වාස කරන්නේ.

ඒ වගේම එතුමාගේ කාර්යාලය හා එතුමාගේ නිල නිවාසය පිළිබඳව කථා වුණත් ගරු සභාපතිතුමනි, එතුමා පෞද්ගලිකවත් දන්නවා. මම ඒ නිල නිවාසය සකස් කරන කොට - එතුමා මගේ පියෙක් වගේ අපට අනුශාසනා දෙන්නේ. එතුමාට තමයි මම ඉස්සෙල්ලාම යෝජනා කළේ. එතුමා පරිත්‍යාගශීලි වුණා. නැහැ, ඔබතුමා ඉන්න. මට ඉන්න තැනක් තියෙනවා. මේක ඔබතුමා හදාගන්න කියලා. ඒ නමුත් අදටත් එතුමාට ඒ නිවස විවෘතයි. ඒ වගේම අපි බලාපොරොත්තු වෙනවා. මම යෝජනා කරලා තිබුණු පරිදි, අද විරුද්ධ පක්ෂයේ සිරිකමල් ගරු මන්ත්‍රීතුමා කිව්වා මේ පළාත් සභාවේ උන්නතිය සඳහා මොනවද අවුරුදු ගණනක් තිස්සේ මෙයින් කෙරුණේ කියලා. අපි මේ අද කථා කරන ගොඩනැගිල්ල පවා මේ කාල සීමාවේ සිදු වුණු දේවල්. ඒ වගේම ශ්‍රාවස්ති මන්දිරයේ තියෙන ගොඩනැගිලි දිහා බලපුවහම ඒවා මේ කාලයේ හදපුවා. එක එක කාල සීමාවන්වල ප්‍රධාන අමාත්‍යවරු තමන්ට හැකි ආකාරයෙන් ඒ අය කටයුතු කරලා තියෙනවා. අනාගතයේදි තව අවුරුදු පහකින් වේවා, දහයකින් වේවා මේ පළාත් සභාව ශක්තිමත් පළාත් සභාවක් හැටියට ගෙනියන්න, විශේෂයෙන්ම සබරගමු, වයඹ පළාත් සභා ආදර්ශයට අරගෙන අපි මේ පළාත් සභාවට අවශ්‍ය කරන ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු කරලා තියෙනවා. මෙතෙන්දි මා ස්තුතිවන්ත වෙනවා. අපට රජය කොලොන්නාවෙන් අක්කර 02 කට වැඩි ප්‍රමාණයක්, 03 ක් වගේ ප්‍රමාණයක ඉඩමක් දීලා තියෙනවා, අපේ පරිපාලන ගොඩනැගිලි ව්‍යුහයක් ඇති කරන්න. ඒ වගේම පළාත් සභාවක් හැටියට අපේ අමාත්‍යවරු අද එක එක තැන්වල කටයුතු කරනවා. අපට තට්ටු 15 ක ගොඩනැගිල්ලක් හදන්න ප්‍රතිපාදන වෙන් කරන්න ඉදිරි අවුරුදු 03 ක කාල සීමාව තුළ මේ ඉදි කිරීමට කැබිනට් එක අනුමැතිය දීලා අපට ඒක එවලා තියෙනවා. අපි ඒක යෝජනා කරලා තියෙන්නේ, මේ ගොඩනැගිලි පරිශ්‍රයේම අර car park එක තියෙන තැන, මම හිතන්නේ නිමල් ලන්සා ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා ඒ පිළිබඳව කටයුතු කරලා හොඳ සැලැස්මක් හදලා තියෙනවා. ආණ්ඩු පක්ෂයේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු ගෙන්නලා ඒක පෙන්නන්නත් අපි කටයුතු කරනවා. ඒ වගේම මේ පිටිපස්සේ තියෙන ඉඩම ක්‍රිකට් ක්‍රීඩකයින්ට වෙන් කළ ඉඩම් කැබැලි පවා හෂාන් තිලකරත්න ගරු මන්ත්‍රීතුමා මැදිහත් වෙලා, ඒවාත් ලබා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් ඒ අයට යම් කිසි මුදලක් දීලා, මේ පළාත් සභාවට අරගන්න පුළුවන් නම් ඒ සම්බන්ධයෙන් ද අපිට කටයුතු කිරීමට හැකියාව තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ ඉදිරි අනාගතය හිතලා මේ වෙනකොට පළාත් සභාවක් හැටියට කටයුතු කරන්න, අනාගත මන්ත්‍රීවරුන්ට මේ පහසුකම් සහිතව කටයුතු කරන්න අවශ්‍ය කාරණාව අපි මේ වනකොට කටයුතු කරලා තියෙනවයි කියන එක මතක් කරන්න ඕනෑ. ඒ වගේම ගරු ආණ්ඩුකාරතුමා වෙනුවෙන් කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් ආණ්ඩුකාරතුමා කැමති ස්ථානයක් බලලා කියන්න කියලා. අපි ඉල්ලීමක් කළා. එතුමාගේ නිල නිවාසය හදන්න. කොළඹ මේ අවටින්, ආසන්න ප්‍රදේශයකින්. මම යෝජනා කළේ, මේ ගොඩනැගිල්ල, පළාත්

සභා ගොඩනැගිල්ල ඒ වගේම අපේ අලුත් ගොඩනැගිල්ල ඉදි වෙද්දී මේක එතනට යනකොට ආණ්ඩුකාර ගොඩනැගිල්ල හා පළාත් සභා ලේකම් කාර්යාලය - ඔබතුමාගේ කාර්යාලය මේ ගොඩනැගිල්ලට ගෙනැල්ලා, අමාත්‍යාංශ ටික අ ත් ගොඩනැගිල්ලට ගිහිල්ලා, ඒකට අයත්ව තියෙන කාර්යාල සංකීර්ණය කොලොන්නාවේ ඉදි කරන්න. මේ ඉලක්කය තමයි අරන් තියෙන්නේ. මම කියන්නේ නැහැ, තව අවුරුදු දෙකකින් තුනකින් අපි කරනවා කියලා. නමුත් ප්‍රතිපාදන ලැබෙන ආකාරයට කරන්න මූලික සැලැස්ම හදලා තියෙනවා. මම හිතන්නේ අනාගතයේදී ඒ සැලැස්ම පිළිබඳව ඔබතුමන්ලාව දැනුවත් කරන්න කටයුතු කරනවා.

ඒ වගේම ගරු මන්ත්‍රීවරුන්ගේ දේශීය හා විදේශීය සංචාර පිළිබඳව සාකච්ඡා වුණා. ගරු සභාපතිතුමනි, අපි මේ අවුරුද්දේ විතරයි මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන අමාත්‍යාංශවලට වෙන් කළේ. වෙනදාට තිබුණේ සභා කටයුතු එකෙන්. සභා කටයුතු එකෙන් හැමදාම මුදල් වෙන්කරලා කටයුතු කරන කොට ලැබුණු අත්දැකීම් උඩ අපි තීන්දු කළා මේ මන්ත්‍රීවරුන්ට, මොකද අද මන්ත්‍රීවරු කථා කරනවා, පෙත්සම් කාරක සභාව ගැන. ඒ සමග ගිණුම් කාරක සභාව ගැන. මේවාට වෙනම අත්දැකීම් ලබා දෙන්න ඕනෑය කියලා. මේ කටයුතු කරද්දි කණ්ඩායමක් යනකොට, තව කණ්ඩායමක් ඒ පිළිබඳව සාකච්ඡා කරලා නොයෙකුත් ප්‍රශ්න ඇති වුණායින් පස්සේ, මේ සියළුම මන්ත්‍රීවරු හැම කාරක සභාවකම ඉන්න හින්දා ඒ ඒ අමාත්‍යාංශවලට ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවා. ඒ මන්ත්‍රීවරුන්ට පුළුවන් ඒ අනුව කටයුතු කරන්න. ඒ වගේම දේශීය පුහුණුවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කරලා නැහැයි කිව්වා. මම හිතනවා, එතුමා වැරදි අවබෝධයක ඉඳන් කටයුතු කළා කියලා. මේ 2013 අවුරුද්දෙත් රුපියල් ලක්ෂ 20 ක් වෙන් කරලා තියෙනවා දේශීය පුහුණු සඳහා. ඔබතුමාගේ ආයතනයට සභා කටයුතු එකට ප්‍රතිපාදන වෙන් කරලා තියෙන්නේ. විදේශ සංචාර සඳහා විතරයි - එතැන්දි ගරු සභාපතිතුමනි ඔබතුමා හරහා මේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන්න ඕනෑ. මම දැක්කා. පහුගිය දවසක මුදල් කොමිසමේ සභාපතිවරයා ප්‍රකාශයක් කරලා තිබුණා. පළාත් සභාවල මන්ත්‍රීවරු විදේශ සංචාරයේ යෙදෙනවා, මේ පළාත් සභා ප්‍රතිපාදන උපයෝගී කරගෙන කියලා. මම විශ්වාස කරනවා. මේ මන්ත්‍රීවරුන්ට විදේශ සංචාර ලබා දුන්නාම, ඒ අය ලබන ඒ අත්දැකීම් මේ රටේ සංවර්ධනය සඳහා යොදාගන්න පුළුවන් කියලා. අද මම කණගාටු වෙනවා. අද කොළඹ කෙරෙන සංවර්ධන දිහා බල බලා, ඒකේ ලස්සන බලලා, සංචාරකයෙකුට අවශ්‍ය විධියට පරිසරය හැදෙන කොට පිටරටවල් වල ගිහිල්ලා අපිත් එක්ක කථා කරන අය යකෝ, අපේ රටේ මෙහෙම වෙන්නේ නැහැ නේ? බලන්න කෝ කියලා කියන අය මෙතැනට ඇවිදින් ඒක විවේචනය කරලා කථා කරනවා. (බාධා කිරීම්)

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක ගැන නොවේ විවේචනය තියෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සමාවෙන්න. සමාවෙන්න. තවම ඉවර නැහැ. ගරු සභාපතිතුමනි මට තව කෙටි කාලයයි තියෙන්නේ. මේ රටේ යුද්ධයක් - අර යුද්ධය තාමත් තියෙනවා නම් සමහර අය කැමතියි. ඉදිරියටත් තියෙන්න ඕනෑ කියලා හිතන්නේ. මොකද, ඒක තමයි විවේචනය කරන්න පුළුවන් වුණේ. අද ඒක විවේචනය කරන්න බැහැ. අද රට සාමකාමී තත්ත්වයට ඇවිල්ලා අද රටේ වෙනසක් ඇති වෙනකොට සමහරුන්ට මේක බලන් ඉන්න බැහැ. ඒක දේශපාලන කුහකකතාවය වෙන්න පුළුවන්. ඒ අකමැත්ත, තමන්ට කතා කරන්න දේවල් නැති නිසා වෙන්න පුළුවන් එහෙම කරන්නේ. ගරු සභාපතිතුමනි කාලය පිළිබඳව ගැටළුව තියෙන හින්දා මම නවත්වනවා. ඒ නිසා ඔබතුමාගේ ඉදිරි සාකච්ඡාවේදී ඒ පිළිබඳව කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 11.00 ට, අංක 100, 101 හා 102 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***

*Accordingly discussion on the Expenditure Head Nos 100, 101 and 102 was concluded at 11.00 p.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ස්තුතිවන්ත වෙනවා. මෙම අවස්ථාවේදී ශීර්ෂ අංක 100, ශීර්ෂ අංක 101, ශීර්ෂ අංක 102 වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය අවසන් වෙනවා. ඒ පිළිබඳ අපි ඡන්දය විමසීමක් සිදු කරන්නේ නැහැ. සභා සම්මත වූ වැය ශීර්ෂයන් ලෙස සැලකෙනවා. ඒ නිසා එය සභා සම්මතවූ වැය ශීර්ෂයන් වශයෙන් මම මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 104** | **-** | **ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, මිනිස්බල හා රැකී රක්ෂා, විදුලිබල හා බලශක්ති, අමාත්‍යාංශය.** |
| **ශීර්ෂ අංක 109** | **-** | **ප්‍රධාන ලේකම් කාර්යාලය** |
| **ශීර්ෂ අංක 110** | **-** | **ඉංජිනේරු කාර්යාංශය** |
| **ශීර්ෂ අංක 111** | **-** | **ආදායම් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 112** | **-** | **ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 113** | **-** | **අධ්‍යාපන දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 114** | **-** | **පළාත් පාලන දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 115** | **-** | **ඉඩම් දෙපාර්තමේන්තුව** |

| | | |
|---|---|---|
| Head No. 104 | - | Ministry of Land, Education, Local Government, Manpower and Employment, Electricity and Power |
| Head No. 109 | - | Office of the Chief Secretary |
| Head No. 110 | - | Engineering Bureau |
| Head No. 111 | - | Department of Revenue |
| Head No. 112 | - | Department of Registration of |

Business Names

Head No. 113 - Department of Education

Head No. 114 - Department of Local Government

Head No. 115 - Department of Lands

***[සංකේත කපා හැරීම]***

*[Symbolic write-off]*

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, "*ශීර්ෂ අංක 104, 109, 110, 111, 113, 114, 115 යන වැය ශීර්ෂවලින් රු.10/- ක මුදලක් කපා හරින ලෙස යෝජනා කරනවා.*"

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි. නැවත වරක් ඔබතුමාටම ආරාධනා කරනවා විපක්ෂය වෙනුවෙන් මේ වැය ශීර්ෂ විවාදයට සම්බන්ධ වන ලෙසට.

[ පූ.භා. 11.03 ]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යවරයා දිගින් දිගටම කතා කරපු කතිකාවක් තමයි මේ සභාවේ ආදායම් මාර්ගය ඉහළ නැගීම සඳහා අප ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද කියන කාරණය. විශේෂයෙන්ම මේ අවස්ථාව මම අවස්ථාවක් කරගන්නවා පළාත් සභාවේ ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පොඩි ස්තුතියක් කරන්න. විශේෂයෙන්ම මුද්දර ගාස්තු අය කිරීම පිළිබඳව ඔවුන් විසින් පසුගිය කාලය පුරා දරන ලද ඒ උත්සාහය පිළිබඳව. විශේෂයෙන්ම අපි ඇස්තමේන්තු කරලා තිබුණේ, මුද්දර ගාස්තු සඳහා 2010, 2011 වසරවල මිලියන 4100 ක ප්‍රමාණයක්. නමුත් ඒ නිලධාරීන්ගේ කැපවීම තුළ විශේෂයෙන්ම අද බස්නාහිර පළාතේ මතයක් ගිහින් තියෙනවා, ඔප්පුවක් අඩු මුදලක් තියලා ලිව්වොත් බස්නාහිර පළාත් සභාවේ ආදායම් දෙපාර්තමේන්තුවෙන් මේ ගැන ප්‍රශ්න කරනවා කියලා. ඒ නිසා මිනිස්සු පෙළඹිලා තියෙනවා, අද හැකිතාක් දුරට අඩුම ගණනේ ලක්ෂ 2ක් වත් යොදා ඔප්පුව ලියන්න. ඉඩමේ පර්චස් එක රු.15000.00 යි කියලා ලියන්නේ නැතුව අඩුම ගණනේ ලක්ෂයයි කියලවත් ලකුණු කරලා අඩුම ගණනේ ඒ ඔප්පුව ලියාපදිංචි කරන තැනට කටයුතු කරන්න බස්නාහිර පළාත් සභාවේ ආදායම් දෙපාර්තමේන්තුව පහුගිය කාලේ ක්‍රියා කරපු ආකාරය නිසා අද කිසියම් ප්‍රගතියක් ලැබිලා තියෙනවා. එහි ප්‍රතිඵලය අනුව ගරු සභාපතිතුමනි 2010 මිලියන 4100 ක් වුණ ආදායම ඒ නිලධාරීන් 4548 ක් දක්වා ඉහළ නංවලා තියෙනවා. 2011 වසරේදී ඒක 4100 තිබුණ එක මිලියන 6354 බවට මේ පළාත් සභාවේ ආදායම ඔවුන් වැඩි කරලා දුන්නා. ඒ නිසා ඒ නිලධාරීන් යම්කිසි උත්සාහයක් අරගත්තා.

හැබැයි ගරු සභාපතිතුමනි, අපේ BTT ආදායම ඉවත් කරලා, ජාතිය ගොඩනැගීමේ බද්ද මේ සභාවට ගේන කොට මේ සභාවේ මම කතාවක් පවත්වමින් මම ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඇහුවා, යම් ආකාරයකින් අපට අපි බලාපොරොත්තු වන ආදායම, එනම් BTT වෙනුවට ලබන ජාතික බද්දෙන් අපට ඒ මුදල් ලැබෙයිද ගරු ප්‍රධාන ඇමතිතුමනි කියලා මම එතුමාගෙන් ඇහුවා. එතුමා කිව්වා, අපි උපරිමය උත්සාහය කරමු. නමුත් ලැබී තියෙන දත්ත අනුව, අපි 2011 වසරේ මිලියන 9500 ක් බලාපොරොත්තු වුණා, ජාතිය ගොඩනැගීමේ බද්දෙන්. නමුත් ගරු සභාපතිතුමනි අපට හමු වුණේ මිලියන 6654 ක් පමණයි. අපි 2012 වසරේදී මිලියන 12747 ක් බලාපොරොත්තු වුණා. හැබැයි ගරු සභාපතිතුමනි, අපට ලැබුණේ මිලියන 7000 කට ආසන්න මුදල් ප්‍රමාණයක්. එතකොට අපට දිගින් දිගටම එදා මම මේ පළාත් සභාවේ BTT ආදායම අපට අහිමි වීමේ තර්ජනය පිළිබඳව කතා කළා. නමුත් අද වනකොට ඒ ආදායම අහිමි වෙමින් පවතින තත්ත්වයක් තියෙන්නේ ගරු සභාපතිතුමනි. ඒ අනුව අපි මේ අවුරුද්දේ ඇස්තමේන්තු කරනවා.

2013 සඳහා ජාතිය ගොඩනැගීමේ බද්දෙන් මිලියන 14640 ක ආදායමක් බලාපොරොත්තු වෙනවා. නමුත් ගරු සභාපතිතුමනි පසුගිය වසර දෙක තුළ අපට ලැබුණු මුදල් ප්‍රමාණය අනුව මම විශ්වාස කරන්නේ නැහැ. අපට BTT තිබුණා නම් මිලියන 17000 ක් හොයාගන්න තිබුණා. නමුත් අපි මිලියන 14640 ක් ඇස්තමේන්තු කළත් මම විශ්වාස කරනවා, මේ පහුගිය වසර දෙකේ අපට ලැබුණු මුදල් ප්‍රමාණය අනුව මේ මිලියන 10000 දක්වා වැඩි කර ගන්නට, එකතු කර ගන්නට අපට ලබා දේවිද කියන සැකය මේ සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට ගරු සභාපතිතුමා මාර්ගයෙන් ප්‍රධාන අමාත්‍යවරයාට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මේ සභාව ගෞරවනීය පළාත් සභාවක්. මේ පළාත් සභාව පිළිබඳ අපි මොන මතවාද තිබුණත්, මේ පළාත් සභා ක්‍රමය තුළ බස්නාහිර පළාත් සභාවේ වැඩිම වියදමක්, බස්නාහිර ප්‍රධාන අමාත්‍යවරයාගේ විෂයයන් යටතේ අපි වෙන් කරලා තියෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි, සමහර මේ මන්ත්‍රීවරු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇමතිවරු මේ පළාත් සභා ක්‍රමය හොඳ නැහැ. පළාත් සභා ක්‍රමය අහෝසි කරන්න ඕනෑය කියනවා. ගරු සභාපතිතුමනි, මෙන්න මෙවැනි ආකාරයෙන් අපේ ආදායම අඩු වෙනවා නම්, පළාත් සභා ක්‍රමය අහෝසි කරන්න ඕනෑය කියලා සෘජුවම කතා කරලා, කශේරුකාව කෙලින් තියලා කතා කරලා කිව්වොත්, අපිත් අත උස්සනවා. එසේ අත උස්සලා ලබන වාරේ ඉදන් පළාත් සභා නවත්වලා, පුළුවන් නම් ප්‍රාදේශීය සභාවට නගර සභාවට, පුළුවන් නම් පාර්ලිමේන්තුවට යන්න තමයි අපි කටයුතු කරන්නේ. හැබැයි, මේක එපා එපා කියමින් මේක ගම් මට්ටමෙන්, ග්‍රාමීය මට්ටමෙන් බාල්දු කරමින් පළාත් සභා ක්‍රමයට කෙනෙහිලි

කරනවා විතරක් නොවෙයි, මේ මන්ත්‍රීවරු බාල්දු කරනවා විතරක් නොවෙයි, පළාත් සභාවේ නිලධාරීනුත් අද බාල්දු වන තත්ත්වයක් ග්‍රාමීය මට්ටමෙන් නිර්මාණය වෙලා තියෙනවා, ගරු සභාපතිතුමනි. ඒ නිසා අපිත් ඔබතුමා මාර්ගයෙන් ඉල්ලන්නේ, අපි ඉන්න තැන අපි හරියට තේරුම් ගන්න ඕනෑ. අපි මහජනතාව වෙනුවෙන් ඡන්දයකින් ඇවිල්ලා නියෝජනය කරන්නේ මොන ආයතනයද? ඒ අනුවයි නියෝජනය කරන්න ඕනෑ. සමහර මන්ත්‍රීවරුන්ට මේ පිළිබඳව විවේචනය කරන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, මේ සභාවේ මන්ත්‍රීවරු විධියට අපි ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටින්නේ, මේ මන්ත්‍රීවරුන්ට තියෙනවා නම් සමාජයේ යම්කිසි පිළිගැනීමක්. ඒ පිළිගැනීම නැති කරන්න එපා. මේක අහෝසි කරන්න, අපි ඔක්කොම එකතුවෙලා එක අතක් උස්සලා එකපාරට අහොසි කරලා දමමු. හැබැයි -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක පාර මා මරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔව්. ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ ක්‍රමයට ගරහමින් මේ ක්‍රමය ප්‍රතික්ෂේප කරමින් අපි මේ තුළ සිටිමෙන් පළක් නැහැ සභාපතිතුමනි. මම මීළඟ කාරණයට යොමු වෙන්නම්. අනිත් එක තමයි අපේ මේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් එක්ක, ඇමතිවරුත් එක්ක මම කතා කළා. පළාත් සභා ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආයතනය. මේකට ප්‍රඥප්තියක් ගේනවා කිව්වා. අලුතෙන් සංශෝධිත ප්‍රඥප්තියක්. අද වනතුරු ආවේ නැහැ ගරු සභාපතිතුමනි. ඒ අතර කොළඹ කොටුවේ එක්තරා ක්‍රීඩකයෝ දෙන්නෙක් පටන් ගත්තා අමාත්‍යාංශයක්. ඒ තමා කකුළු අමාත්‍යාංශය. Ministry of crabs කකුළු කර්මාන්තය. පටන් ගන්නකොට මමත්, මේ උදය ගම්මන්පිල මන්ත්‍රීතුමත්, මගේ සගයත් අපි මේකට සම්බන්ධවෙලා අපේ මතය කිව්වා. අමාත්‍යාංශයක් නමින් ව්‍යාපාර ආරම්භ කිරීම තහනම් කරන්න බැහැ කියන එක. නමුත් අද වනතුරු ඒ අමාත්‍යාංශය නමින් ව්‍යාපාරයක් දුවගෙන යනවා. ඒ කියන්නේ, හෙට උදේට ගරු සභාපතිතුමනි සමහර අර ගාල්ල දිස්ත්‍රික්කයේ මම හිතන්නේ දකුණු පළාතේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් කිව්ව විධියට කොළඹ ගණිකා අමාත්‍යාංශයකුත් ආරම්භ කරන්න පුළුවන්. එතකොට ඒකටත් අපේ පළාත් නාම ලියාපදිංචියෙන් අනුමැතිය දෙනවද කියලා මම අහනවා. ඒ නිසා මේ විධියට ගියොත් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒකට භාරකරුවෙක් හොයනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ගරු සභාපතිතුමනි, ඒ නිසා ඔබතුමා මාර්ගයෙන්

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. දැන් ඊයේ දැක්ක නේ? ඊයෙත් ප්‍රශ්නයක් වුණා නේ ඔබතුමාට.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

බලන්න කෝ. හිටපු සභානායක කෙනෙක්. ගරු සභාපතිතුමනි, ඒ හරහා ඔබතුමාට.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ඊයෙත් ඉල්ලලා කෑව නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. කරුණාකරලා එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

හැබැයි එතුමාත් ගිහිල්ලා ඒකේ කෑම කෑවා. කකුළුවෝ කාලා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

ඒ වාගේම ගරු සභාපතිතුමනි ස්වාමීන් වහන්සේලාට අපහාස කරන්නත් එපා කියලා කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මම කියන්නම්. ඔබතුමා කතාවේදී කිසි කෙනෙකුට හානියක්, අපහාසයක් කරන්න එපා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ සභාවේ තවදුරටත් මම ස්වාමීන් වහන්සේලා ඉන්නවා කියලා විශ්වාස කරන්නේ නැහැ ගරු සභාපතිතුමනි. මේකේ ඉන්නේ මහජන ඡන්දයෙන් පත්වුණු මන්ත්‍රීවරු. ඒ නිසා අනවශ්‍ය ප්‍රශ්න මතු කරගන්න එපා. අපි දර්ශනයක් විධියට බුද්ධාගම අදහන අය. දේශපාලනයට බුද්ධාගම සම්බන්ධ කරගත්ත අය නොවෙයි. ඒ නිසා කරුණාකරලා මට කථාව කරගෙන යන්න අවසර ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ මන්ත්‍රීතුමාලා කරුණාකරලා නිශ්ශබ්ද වන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ප්‍රධාන අමාත්‍යවරයාට තව අවධානය යොමු කළයුතු කාරණයක් තියෙනවා. ඒ තමයි එතුමා යටතේ පවත්නා වූ කැළිකසළ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදය පිළිබඳව. විශේෂයෙන්ම 2011 පොතේ එතුමාගේ අයවැය කතාවේදී අපි දැක්කා, එතුමා සඳහන් කරනවා. එතුමා සඳහන් කළා. විශේෂයෙන්ම, පිළියන්දල කරදියාන, කැළිකසළ අපද්‍රව්‍ය කරන ස්ථානයෙන් විදුලිය නිෂ්පාදනය කිරීම
[ ගරු නිරෝෂන් පාදුක්ක ]

සඳහා 2011 ඔක්තෝබර් මාසයේ මැලේසියාවේ Horizon Renewable Energy කියන ආයතනයක් සම්බන්ධ කරගෙන ඒ ව්‍යාපෘති ආරම්භ කරනවා කියලා. අපි සතුටු වුණා. අපි මන්ත්‍රීවරු විධියට ඒ පිළිබඳව කැමති වුණා. ඒ වගේම ප්‍රසන්න රණතුංග අමාත්‍යවරයා ඒ පිළිබඳව දරන්නා වූ උත්සාහය පිළිබඳව අපේ යම්කිසි විශ්වාසයක් තියෙනවා. නමුත් ගරු සභාපතිතුමනි, ඒ ආයතනය ඇමරිකන් ඩොලර් 50000 ක විතර තැන්පතුවක් තියලා ආරම්භ කළත්, මේ ව්‍යාපෘතිය අද වනතුරු ක්‍රියාත්මක නොවෙන තත්ත්වයක් තමයි ප්‍රදේශයේ ඉන්න මන්ත්‍රීවරයෙක් විධියට මට පෙනෙන්නේ. ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, අඩුම ගානේ ලබන අවුරුද්දේ පෙබරවාරි මාසයේ වෙනකොට මෙකී ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න නොහැකි නම් මේ පිළිබඳව නැවතත් සලකා බලන්න කියලා ඔබතුමා හරහා ප්‍රධාන අමාත්‍යවරයාගෙන් මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි මේ පළාත් සභාවේ අපි වැඩි මුදලක් වෙන් කරන අනෙකුත් විෂය තමයි පළාත් පාලන විෂය. ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා මම ප්‍රධාන අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිනවා. අද පළාත් පාලන සේවයේ සමහර සභාපතිවරු ඉතාමත්ම දූෂිත තත්ත්වයේ ඉන්නවා. දූෂිත සභාපතිවරු ඉන්නවා. අධ්‍යාපන උපදේශක, පළාත් පාලන උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරයෙක් විධියට මම එක්තරා සභාපතිවරයෙක් සම්බන්ධයෙන් නිරන්තරයෙන් ප්‍රශ්න මතු කරනකොට - මම සතුටු වෙනවා. ප්‍රසන්න රණතුංග අමාත්‍යවරයාට පුළුවන්කම තිබුණා, ඔහු පිළිබඳව පරීක්ෂණ පවත්වන්න කියලා කොමසාරිස්වරයාට භාර දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තියෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක් වැඩිපුර දෙන්න පුළුවන් නම් මේ කාරණය පැහැදිලි කරන්න - මෙතුමා විනාඩි තුනක් දෙනවා. ගරු සභාපතිතුමනි මේ සභාපතිවරයා ගැන විතරක් නොවෙයි, තව නගර සභා කිහිපයක සභාපතිවරු ගැන අපට ප්‍රශ්න තිබුණා. විශේෂයෙන්ම අද කොලොන්නාවේ පරණ කක්කුස්සි වළක් තියාගන්න බැහැ. පළාත් පාලන ක්ෂේත්‍රයේ ඉන්න සභාපතිවරු හින්දා නොවෙයි, එක්තරා නිලධාරියෙක් හින්දා. ඒ තමයි කොළඹ දිස්ත්‍රික්කය භාර සහකාර කොමසාරිස්වරයා. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ. ඔහු ඉතාමත්ම නිර්ධය ලෙස තමන්ගේ බලය පාවිච්චි කරමින් හොරකම් කරන සභාපතිවරු ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතියක නියැලී සිටිනවා ගරු සභාපතිතුමනි. ඕනෑ නම් මම මේ සභාවට ඔහුගේ නම සඳහන් කරන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, මම විශ්වාස කරනවා තව දුරටත් ප්‍රසන්න රණතුංග ප්‍රධාන අමාත්‍යවරයා හරහා මම ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව, එකී රාජ්‍ය නිලධාරීයා පිළිබඳව දැඩි අවධානයක් යොමු කරලා ඔහු විසින් දිගින් දිගටම නගර සභා, ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට කොළඹ දිස්ත්‍රික්කයේ වැරදි කරන්න ආරක්ෂාව ලබාදීම සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රියාකරනු ඇතැයි මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි. ඒ හරහා අවසාන වශයෙන් ගරු ප්‍රසන්න රණතුංග ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පවතින ප්‍රධාන විෂය වන අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව කතා කරන්න ඕනෑ. අපි දන්නවා. 1991 ඉදන් මේ පළාත් සභාවේ බලය තියෙන්නේ, විවිධ නම්වලින් හැඳින්වීගෙන ආවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයට 1993 සිට. එක කාලෙක එක්සත් ජනතා නිදහස් සන්ධානය කියලා ආවා. කාලෙක පොදුජන එක්සත් පෙරමුණ නමින් ආවා. ඒ මොන නමින් ආවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පුද්ගලයෙක් තමයි මේකේ මහ ඇමතිවරයා වුණේ. ඒ නිසා අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල දේශපාලනීකරණයකට ලක්වෙලා තියෙනවා. සමහර නිලධාරීන් කාර්යාලයේ වැඩ කරන්නේ මම උපන් ශ්‍රී ලංකා. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙක්. මගේ සීයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමාජිකයෙක් කියමින්, විවිධ දේශපාලන අර්ථකථන දෙමින් සමහර තනතුරුවල ඉන්න උත්සාහ කරනවා. හැබැයි, ප්‍රසන්න රණතුංග අමාත්‍යවරයා එහෙම පුද්ගලයෝ පිළිබඳව විශ්වාස කරලා කටයුතු කළ බවක් මම දැකලා නැහැ. මම දන්නවා, එතුමා යම් අවස්ථාවලදී කියලා තිබෙනවා, පක්ෂය පිළිබඳව මට වැඩක් නැහැ. අවශ්‍ය රාජකාරිය, සේවය කිරීම කියලයි. මගේ ඉදිරියේ මම දැකලා තියෙනවා ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි ගිය සෙනසුරාදා පිළියන්දල සෝමවීර චන්ද්‍රසිරි විද්‍යාලයේ -

[සභාවේ සෝෂා]

අපේ පළාත් සභාවේ පිළියන්දල සෝමවීර චන්ද්‍රසිරි විද්‍යාලයේ ශිෂ්‍යත්වය පාස්වෙලා හොඳ පාසලක් තොර ගන්න බැරි ළමයින්ට මානසික අල්ලසක් දෙනවා. සහතිකයක්. ඒ සහතිකය බෙදන්න

පිළියන්දල සෝමවීර චන්ද්‍රසිරි විද්‍යාලයට උදේ 9.00ට එන්න කිව්වා ළමයින්ට. 11.30 වෙනකල් ළමයින්ව ප්‍රධාන ශාලාවේ වාඩි කරවලා තිබුණා. ආණ්ඩු පක්ෂයේ දේශපාලන අධිකාරිය ආවේ නැහැ. 11.30 වෙනකල් බලන් ඉන්නකොට, දෙමව්පියෝ කෑගහනකොට අන්තිමේදී දේශපාලන අධිකාරිය යන්තම් ඇවිදින් සහතික දහයක් බෙදුවා. පසුව දෙමව්පියෝ ළමය ටික අරගෙන ගෙදර ගියා. ගරු සභාපතිතුමනි, මේවාට දේශපාලන අධිකාරිය අවශ්‍ය නැහැ. මේක පළාතේ අපේ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ට දෙන්න පුළුවන් සහතිකයක්. හැබැයි, ගරු සභාපතිතුමනි, සෝමවීර චන්ද්‍රසිරි විද්‍යාලයේ ලකුණු 70 ගත්ත ළමයට දෙනවා, සහතිකයක්. හැබැයි ශිෂ්‍යත්වයෙන් 137 ක් ගත්ත ළමයට යන්න පිළියන්දල ඉස්කෝලයක් නැහැ. සෝමවීර චන්ද්‍රසිරි විද්‍යාලයෙන් එළියට යනකොට ශිෂ්‍යත්වය සමත් නැත්නම් පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයේ පන්ති කාමර දෙක පිරුනාම ලකුණු 132 ගත්ත ළමයා පළාතේ තියෙන දුර්වලම පාසලට දානකොට අපි දෙනවා, මානසික අල්ලසක්. ශිෂ්‍යත්වය පාස් වුණාට ලකුණු 70ක් ගත්තා කියලා සහතිකයක්. ඒ සහතිකයෙන් ළමයාගේ අනාගතය හැදෙන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා මම දිගින් දිගටම මේ සභාවේ අවුරුදු 07ක් ඉල්ලා සිටිනවා. පිළියන්දල කලාපයේ ඉතා කුඩා චක්‍රලේඛයක් අවලංගු කරන්න කියලා. අද වෙනතුරු ඒක සිද්ධවෙලා නැහැ. පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගන්නේ කලාපයේ පාසල් 04 කින් විතරයි. අනන්ත දුක් මහන්සි වෙලා කහපොළ පාසලේ ලකුණු 130 ක් ගන්න ළමයට පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයට එන්න බැහැ. චක්‍රලේඛයක් දාලා නවත්වලා තියෙනවා. කහපොළ දරුවට කියනවා දිගටම කහපොළ පාසලට වෙලා හිටපිය. පිළියන්දල නගරෙ තියෙන ජාතික පාසලට එන්න දෙන්නේ නැහැ. පිළියන්දල නගරේ තියෙන ජාතික පාසල් දෙකේ පන්ති කාමර 15 ක් තියෙනවා. ග්‍රාමසේවා වසම් 08 යි. සමාවෙන්න. පස්වෙනි ශ්‍රේණිය දක්වා තියෙන ප්‍රාථමික පාසල්. හැබැයි, පන්ති කාමර 15 ක් තියෙනවා. මේ පහළොවේ ගම් 04 යි ගරු සභාපතිතුමනි අයිති වෙන්නේ. හැබැයි, මේ අපේ ළමුන් ඇතුළත්වෙන චක්‍රලේඛයේ. වැන් එනවා කහතුඩුවෙන්. මේ පාසල් දෙකට හෝමගම ආසනයෙන් වැන් එනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ මේවා පිළිබඳව අවධානය යොමු කරන්න කියලා. විශේෂයෙන්ම අධ්‍යාපන උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරු විධියට අපි අධ්‍යාපනය සම්බන්ධයෙන් හැම දෙයකදීම යම් උත්සාහයක් අරගෙන තියෙනවා. එතුමා කිව්වොත්, මේ කලාපයේ සියළුම මන්ත්‍රීවරු එකතුවෙලා, කලාපයේ අධ්‍යාපනය නගා සිටුවන්න වැඩ කරන්න කියලා. අපි සියළු දෙනා පක්ෂ භේදයකින් තොරව අත්වැල් බැඳගෙන වැඩ කරලා තියෙනවා. හැබැයි, සමහර අපේ කලාපයේ අධ්‍යක්ෂක වරයෙක් පත් වුණා ගිය වසරේ. ප්‍රසන්න රණතුංග ප්‍රධාන අමාත්‍යවරයාත් දන්නේ නැහැ. අදෘශ්‍යමාන හස්තයක් හරහා කොළඹ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක්ට කැන්වසින් ගියා කියලා සුදුසුකම් අරගෙන මේ කලාපයෙන් අයින් කරපු අධ්‍යක්ෂකවරයෙක්ව ගෙනැල්ලා පිළියන්දල කලාපයේ අධ්‍යක්ෂක කළා. ප්‍රසන්න රණතුංග ප්‍රධාන අමාත්‍යවරයා දැනගෙන හිටියෙත් නැහැ ඔහු කොහෙන්ද ආවේ කියලා. මොන Planet එකෙන්ද කියලා. එහෙම වෙනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා ඔබතුමාගෙන් අවසානයේ ඉල්ලන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසාන වෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම හිතන්නේ, මෙවැනි කාරණා මේ සභාව හරහා වී තියෙනවා. නමුත් මම ඊයේ කතා කළාම, මෙතන සුපසන් නිම්තෙර ගැන කතා කරන්න ගියාම අපේ ආණ්ඩු පක්ෂයේ රේණුක පෙරේරා මන්ත්‍රීතුමා මට බාධා කළා. අපි දන්නවා ප්‍රසන්න රණතුංග ගරු අමාත්‍යතුමා යමක් කරන්න උත්සහා කරනවා. මම කිව්වේ, සුපසන් කියන්නේ ප්‍රසන්න නම්, නිම්තෙර කියන්නේ කෙරවල නම් මේ ප්‍රසන්නට පේන උපරිමය දුර කියලා. ඒ ප්‍රසන්නට පේන උපරිමය දුර. ප්‍රසන්න යමක් කළා පළාත් සභාවේ අධ්‍යාපනයට. කියන්න දුන්නේ නැහැ. සමහර මන්ත්‍රීවරු ඒක කියන්න දුන්නේ නැහැ. හැබැයි, එතුමා ඒක කළේ මේ කැබිනට් මණ්ඩලයත් එක්ක. ඒකයි මට කියන්න ඕනෑ වුණේ. බස්නාහිර පළාත් සභා ඉතිහාසයේ ලැබුණු දුර්වලතා කැබිනට් මණ්ඩලය ඔබතුමාට ලැබුණා කියන එක බොහොම කණගාටුවෙන් මම මේ අවස්ථාවේදී මතක් කරනවා. මේ සභාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ, කාලේ අවසන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔය වගේ ඇමතිවරුන් එක්ක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අගේ ඉඳන් කන කනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කකුලෙන් අදින ඇමතිවරු, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අගේ ඉඳන් කන කනවා.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

අනේ ගරු මන්ත්‍රීතුමා, බාධා කිරීම් කරන්න එපා. (බාධා කිරීම්)

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අරගෙන ගියා කියන එක ගෞරවයෙන් ප්‍රකාශ කරමින්, ප්‍රසන්න රණතුංග මැතිතුමාට පළාත් සභාව වසර හතරක් දුවලා, අවසාන වසරේ අවසානයේවත් ඒ නිම්තෙරට වෙලා ජීවත් වෙන්නට වාසනාව ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මන්ත්‍රීකෙනෙක් කතා කරනකොට ගරු මන්ත්‍රීතුමාලා බාධා කිරීම් කරන්න එපා. අන්තිමට අපේ කට්ටිය අනික් පැත්ත කුලප්පු වුණාම කථා

[ ගරු සභාපතිතුමා ]

කරන්න දෙන්නේ නැහැ. ඊයෙත් ඔය ප්‍රශ්නේ එතුමාට වුණා නේ? ඊයෙත් එතුමාට ඒ ප්‍රශ්නේ වුණා. එතුමා මහ ඇමතිතුමාව අගේ කරන්න ගියා. එතුමාට ඒ අවස්ථාව ලබා දුන්නේ නෑ. එහෙම කරන්න එපා. මම ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා, ආණ්ඩු පක්ෂයේ ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමාට විවාදයට සම්බන්ධ වන ලෙසට. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තියෙනවා.

[ පූ.භා. 11.23 ]

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

බස්නාහිර අපේ ප්‍රසන්න රණතුංග ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කතා කිරීමට ලැබීම ගැන මම ඉතාමත්ම සතුටු වෙනවා. මට ප්‍රථම කතා කරපු මගේ ගමේ අසල්වැසියා, මම හිතන්නේ පක්ෂයක් පාටක් බලන්නේ නැතුව එතුමා හොඳ අදහස් කිහිපයක් ඉදිරිපත් කළා. මම නිරන්තරයෙන්ම බලාපොරොත්තු වන දෙයක් තමයි සභාපතිතුමනි, අපට අවශ්‍යවෙලා තියෙන්නේ, ආණ්ඩු පක්ෂයේ කථාවලට වඩා විපක්ෂයෙන් කරන කථා පිළිබඳව අවබෝධයක් ලබාගෙන ඒවාට පිළිතුරු සැපයීමයි. ඒක මෙතන වෙන්නේ නැහැ. ඒ අයට අවස්ථාව දීලා අපි බලාගෙන ඉන්න ඕනෑ. මේ අය මොනවද කියන්නේ කියන එක. සමහර අවස්ථාවල ලෝක බොරු කියනවා. දැන් සමහර අවස්ථාවල කියනවා, අපට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් මේ ගැන කිව්වයි කියලා. ඉතින් ඒක ඇත්ත වෙන්න පුළුවන්. බොරු වෙන්න පුළුවන්. ඒ ගැන අපි හොයන්න යන්න ඕනෑ නැහැ. පළාත් සභාව ගැන කථා කරන කොට බොහොම සතුටින් තමයි මම මේ ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය ගැන කථා කරන්නේ.

විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, එතුමාගේ සංකල්පයක් මත සුපසන් නිම්තෙර. මෙම වැඩ සටහන මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාව තුළ - අපි මේ පළාත් සභාවේ කිහිප වතාවක්ම හිටියා. මම හිතන්නේ, අවුරුදු 20 කට කිට්ටු කාලයක් හිටියා. ප්‍රසන්න රණතුංග මැතිතුමා ප්‍රධාන අමාත්‍යවරයා හැටියට අධ්‍යාපනය වෙනුවෙන් පක්ෂයක් පාටක් බලන්නේ නැතුව තමන්ගේ කොට්ඨාශයට කරන්න තිබුණු වැඩ කොටසක් තිබුණා නම්, ඒ සියළුම දෙනාගේ ආශිර්වාදය මැද ඒවා ඉෂ්ට කළා. ඉස්සර ප්‍රධාන අමාත්‍යවරයෙකුගෙන් යම්කිසි දෙයක් ලබා ගන්නේ, වැඩි හිතවත්කමට තමයි. ඒක සාමාන්‍ය දෙයක්. නමුත් අද තමන්ගේ කලාපය තුළ පක්ෂ පාට භේදයකින් තොරව සියළුම දෙනා එකතුවෙලා ගන්න තීන්දුව තමයි අද ප්‍රධාන අමාත්‍යතුමා ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා තමයි අද විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් වුණත්, මේ ව්‍යුහ කමිටුව පිළිබඳව හොඳ සුභාශිංෂන ඉදිරිපත් වෙන්නේ. මේ ව්‍යුහ කමිටුව තුළ තමන්ට අධ්‍යාපනයෙන් නොවෙයි, අනෙක් සියළුම වැඩ කටයුතු සඳහා සියළුම දෙනාගේ අදහස් ලබාගෙන කලාප අධ්‍යක්ෂකතුමා ඇතුළු නිලධාරීන්ද එතැන ළඟ තියාගෙන, ගන්න තීන්දුවක් වෙනස් කරන්න කොයි ආකාරයෙන්වත් ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා මම බොහොමත්ම කැමති වෙනවා ගරු සභාපතිතුමනි, මේ ව්‍යුහ කමිටුව තුළින් - මම දන්නේ නැහැ වෙන වෙන පළාත්වල මොන ආකාරයෙන් කෙරෙනවද කියන එක. අඩුපාඩු තියෙන්න පුළුවන්. නැත්නම් සමහරවිට කියයි එයා දන්නේ නැහැ. අපේ කලාපේ කියලා. හෝමගම කලාපය තුළ ඒ කටයුත්ත හරියාකාරව ඉෂ්ට වෙනවයි කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ඒ ව්‍යුහ කමිටුවේ අපේ විපක්ෂ නායකතුමාත් සහභාගී වෙනවා. ඒ නිසා ඒ කමිටුව තුළින් සියළුම අවශ්‍යතාවයන් නොපිරිහෙලා අපේ කලාපය තුළ ඉෂ්ට වෙනවා. අද අපේ කලාපයේ මේ වනකොට වැඩ අවසන් නොවුණු එකම පාසල් ගොඩනැගිල්ලක්වත් නැහැ. සියළුම ගොඩනැගිලිවල වැඩ අපි අවසන් කරලා තියෙනවා. තවත් මම සඳහන් කරන්න ඕනෑ. පහුගිය දවස්වල මේ ශිෂ්‍යත්ව විභාගය පිළිබඳව බොහොම පුරාජේරුවට මේ ජාතික පාසල් සංස්කෘතිය ගැන කථා කළා. අපේ කොළඹ දිස්ත්‍රික්කය කියන්නේ, ජාතික පාසල් ගණනාවක්ම තියෙන - මම හිතන්නේ, රටේ වෙන කොහෙවත් නැහැ මේ තරම් ජාතික පාසල්. ගරු සභාපතිතුමනි මම බොහොම ආඩම්බරයෙන් කථා කරනවා. අපේ වර්තමාන ප්‍රධාන අමාත්‍යතුමාට ලොකු සතුටක්. කොළඹ දිස්ත්‍රික්කයේ පළමුවෙනි තැනට, වැඩිම දරුවෝ පිරිසක් සමත් වුණේ, හෝමගම අධ්‍යාපන කලාපයේ, සුභාරතී විද්‍යාලයෙන් කියන එක මම මතක් කරනවා. මම එක උදාහරණයක් කියන්නම් ගරු සභාපතිතුමනි. මේක තවත් එක්කෙනෙකුට මම අඩු තක්සේරුවක් වෙන්න කථා කරනවා නොවෙයි. නුගේගොඩ අනුලා විද්‍යාලය කියන්නේ, අපේ ප්‍රදේශයේ ජාතික පාසල් අතර ඉතාමත්ම ජනප්‍රිය පාසලක් අපි දන්න කිට්ටුවක තියෙන. එහි තියනවා පහේ පන්ති හයක්. එක පන්තියක ඉන්නවා හතලිස් පහක්. මම මේක විදුහල්පතිතුමිය හමුවෙලා කථා කරලා දැනගත්තු දෙයක්. බොරුවක් නොවෙයි. අපේ ගොඩගම සුභාරති විද්‍යාලයේ 42 පන්ති හතරයි තියෙන්නේ. අනුලා විද්‍යාලයේ පාස්වුණේ 60 යි. ගොඩගම සුභාරතී

විද්‍යාලයේ 67 යි. ඒකේ ගෞරවය පළාත් සභාවට හිමි විය යුතුයි. මොනතරම් සැප පහසුකම් තිබුණත්, මොනතරම් දේ තිබුණත් මම කල්පනා කරන්නේ, මේ ජාතික පාසල් සංස්කෘතියට වඩා පළාත් සභා පාසල් ටික අපි හරියාකාරව ගෙන ගියොත් මම හිතන්නේ, ජාතික පාසල් අභිබවා අපට යන්න පුළුවන්. ජාතික පාසල්වල, සාමාන්‍ය පෙළ උසස් පෙළ විභාගවලින් ඔය ප්‍රතිඵල දෙන්නේ, අපේ පාසල්වලින් ශිෂ්‍යත්වය පාස්වෙලා යන දරුවෝ. ඒ නිසා ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවට අයිති පාසල්වල පහුගිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල ඉතාමත්ම හොඳ තත්ත්වෙක තියෙනවා කියන එක මම සඳහන් කරන්න ඕනෑ.

විනාඩි 10 නිසා මේවා සියල්ලම කථා කරන්න බොහොම අමාරුයි. මට මතකයි සභානායකතුමා ඇතුළු තවත් කිහිප දෙනෙකු කථා කළා, මේ එක එක අයට ගොඩනැගිලි අවශ්‍යයි කියලා. හැබැයි, මම සඳහන් කරනවා එකක්. අපේ පළාත් සභාවේ ඉන්නවා ගරු සභාපතිතුමනි මන්ත්‍රීවරු 104 දෙනෙක්. ඈත පැය ගණන් ගතකරලා මෙහාට එනවා. අද අපේ මන්ත්‍රීවරයෙකුට ගරු සභාපතිතුමනි ඉන්න තැනක් නැහැ. ආවහම රෙද්ද ගලවන්න තැනක් නැහැ. බාත් රූම් එකකට යන්න තැනක් නැහැ. අපිට කියලා කනගාටුයි දුකයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට දන්වා සිටිනවා. අපේ ඉන්න මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට නිවහනක් හදලා දෙන්නයි කියන කාරුණික ඉල්ලීම ඔබතුමාගේ මාර්ගයෙන් කර සිටිනවා. ඒක ඉතාමත් අත්‍යවශ්‍ය දෙයක්. අපි වෙන අය ගැන කතා කරනවා. ඒ නිසා මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතාවය ඉෂ්ට කරලා දෙන්නයි කියලා මම විශේෂයෙන්ම සඳහන් කරනවා. සුපසන් නිම්තෙර යටතේ ඉතිහාසයේ කවදාවත් නැතුව අපි විදුහල්පතිවරු ගණනාවක්, විදුහල්පතිවරු 33ක්, ගුරුවරු 228ක් මේ සියළුම දෙනාම සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනයට ගෙනැල්ලා ලොකු අගය කිරීමක් කළා. සමහර කොටසක් අපි දඹදිව වන්දනාවෙත් යැව්වා. ගරු සභාපතිතුමනි විශේෂයෙන්ම අද සමහරක් කලාප කාර්යාලවල. වාහන තියෙනවා ඒවගේ මේ කලාප අධ්‍යක්ෂකලාට යන්න පුළුවන්කමක් නැහැ. මට සතුටුයි. ගරු සභාපතිතුමනි මට දැනගන්න ලැබුණා. අපි පහුගිය දවස්වල උපදේශක කාරක සභාවේදී කතා කළා. අද ඒකේ එල නෙලාගන්න පුළුවන්කම ලැබිලා තියෙනවා ගරු සභාපතිතුමනි, ප්‍රසන්න රණතුංග ප්‍රධාන අමාත්‍යතුමා සියළුම අධ්‍යාපන කලාප කාර්යාලවලටත් සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්ටත් වාහන ලබා දීමට කටයුතු කරලා තියෙනවා. ඒ පිළිබඳවත් මම මේ අවස්ථාවේ සභාපතිතුමාගේ මාර්ගයෙන් ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වගේම අපි සඳහන් කරන්න ඕනෑ. පහුගිය දවස්වල පාසල්වලට උදව් කරපු මැති ඇමතිවරු ඉන්නවා. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා. අපේ සියළුම පාසල්වලට මම හිතන්නේ, ලක්ෂ ගණන් වැය කරලා වැසිකිළි ලබා දීමට කටයුතු කළා. ඒ නිසා අපිට එක් ප්‍රමාණයකින් හෝ අපේ ප්‍රතිපාදන වෙනත් දේවල්වලට යොමු කර ගන්නට පුළුවන්කම ලැබුණයි කියන එක මම සඳහන් කරන්න ඕනෑ. මුළු සමස්ත වියදමෙන් අධ්‍යාපනය සඳහා 41% ක් වැය කරනවා කියන්නේ, මම හිතන්නේ විශාලම දෙයක්. ඒක සාමාන්‍යයෙන් නොවෙන දෙයක්. නමුත් අද මේ අධ්‍යාපනය තුළ වැඩිම මුදලක් වෙන් කරලා ප්‍රධාන අමාත්‍යතුමා මේ කටයුත්තේදී ලබාදෙන සහයෝගය පිළිබඳ විශේෂයෙන්ම අගය කරන්න ඕනෑ. ඒ වගේම අපි දන්නවා. මේ දවස්වල අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් මත අධ්‍යාපන අමාත්‍යතුමා විසින් සැලසුම් කරලා මුල්ගල තියපු මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර සඳහා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තියෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර සඳහා ප්‍රතිලාභ ලබාදීලා, හැමතැනම මුල්ගල් තියාගෙන යනවා. විශේෂයෙන්ම මේක ජනතාව දන්නේ නැහැ. මේ සඳහා අපි 2013 වර්ෂයේදී මේ ගොඩනැගිලි සඳහා මිලියන 372 ක් මේ තරම් මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තියෙනවයි කියන එකත් අපි සඳහන් කරන්න ඕනෑ. එහෙමනම් මේ සියල්ලටම අපේ දායකත්වයත් මහින්දෝදය තාක්ෂණ මධ්‍යස්ථානවලටත් ලබා දෙනවයි කියන එකත් සඳහන් කරන්න ඕනෑ. ඒක අපි දැනගෙන හිටියේ නැහැ. අපි දැන් දන්නවා. මේ මහින්දෝදය තාක්ෂණ මධ්‍යස්ථානය මධ්‍යම රජයෙන් පමණක් නොවෙයි, ඒවාට අවශ්‍ය කරන ප්‍රතිපාදන අපේ පළාත් සභාවෙනුත් ලබා දීමට කටයුතු කරලා තියනවයි කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි හෝමාගම අධ්‍යාපන කලාපය තුළ පාසල්වලට අවශ්‍ය ගුරුවරුන් අපට ලබා දීලා තියෙනවා. අවශ්‍ය සම්පත් ටික අපට ලබාදීලා තියෙනවා. විශේෂයෙන්ම පත්වීම් ලබාදීමේදී විශාල ප්‍රමාණයක් පත්වීම් ලබාදීලා තියෙනවා. ඒ නිසා අපේ හෝමගම අධ්‍යාපන කලාපය තුළ අධ්‍යාපනය අතින් ඉහළම තැනක තියනවයි කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. ඒ අවස්ථාවට පක්ෂ පාට භේදයකින් තොරව උදව් උපකාර කළ අපේ සියළුම මන්ත්‍රීවරුන්ටත්, කලාප කාර්යාලයේ සියළු නිලධාරීන්ටත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියළු නිලධාරීන්ටත් අපගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේ පුදකර සිටිමින් ඔබතුමාගේ මාර්ගයෙන් මම නැවතත් ප්‍රකාශ කර සිටිනවා, අධ්‍යාපන අමාත්‍යතුමා හැටියට අපේ ප්‍රධාන අමාත්‍යතුමා පහුගිය කාල පරිච්ඡේදය තුළ මම හිතන්නේ, ජීවිතේ කිසිම කෙනෙක් නොකරපු ආකාරයට මේ අධ්‍යාපනය වෙනුවෙනුත් පළාත් පාලන සේවය වෙනුවෙනුත් - මට මතකයි. තව එකක් කතා කරන්න ඕනෑ. මම ගිය පළාත් සභාවේ අයවැයෙදි මම ප්‍රධාන

අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කළා. මේ පළාත් පාලන ආයතනවලට පොඩ්ඩක් යන්න, පළාත් පාලන ආයතනවලට ගිහිල්ලා එක සැරයක්වත් රැස්වීමක් තියන්න කියලා. ඒ අනුව එතුමා වැඩකටයුතු කරගෙන ගිහිල්ලා තියෙනවා. ඉතාමත්ම ඉක්මණින් මේ නොගිය පළාත් පාලන ආයතනවලටත් තමුන්නාසේ ගිහිල්ලා, ඒ පළාත් පාලන ආයතනවල තියෙන ප්‍රශ්න පිළිබඳව සොයා බැලුවොත්, අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය අපිට අයින් කරගන්න පුළුවන්කම ලැබෙනවයි කියන එකත් මම ප්‍රකාශ කර සිටිනවා. ඒ නිසා ඔබතුමාට බෙහෙවින් ස්තුතියි. මගේ වචන ප්‍රමාණය මෙතකින් සමාප්ත කරනවා.

[ පූ.භා. 11.30 ]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මේ විවාදයට සහභාගි වෙන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

විශේෂයෙන්ම ගරු ප්‍රධාන ඇමතිතුමාට 2013 මුදල් ප්‍රකාශනයේදී සමස්ත අයවැයෙන් 54% කට අධික මුදලක් මේ අමාත්‍යාංශයේ තියෙන විවිධ ආයතන සඳහා වෙන් කරන්න හැකියාව ලැබිලා තියෙනවා. ඒ මොකද, එහෙම ලැබෙන්නේ, මේ පළාත් සභාවේ තියෙන වටිනාම ආයතන ටික ප්‍රධාන අමාත්‍යාංශ සතුව තිබෙන නිසා. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක. ඒත් මගේ කතාව මම ආරම්භ කරන්න බලාපොරොත්තු වෙන්නේ - අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව ඔබතුමාට පැවරිලා තියෙන නිසා මේ පිළිබඳවයි මම කථා කරන්නේ. මම හිතන්නේ, අපි ඉතාමත් මන්දගාමී ස්වරූපයකින් තමයි මේ වසර ගණනාවක් තිස්සෙම මේ පිළිබඳව කටයුතු කරගෙන යන්නේ. කොහෙත්ම අපේ පළාත් පාලන ආයතනවල තියෙන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව අපිට සතුටු වෙන්න බැහැ. මේ පළාත් සභාවේ විවිධ ඇමතිවරු මේ පිළිබඳව අධ්‍යනය කරන්න දේශීය හා විදේශීය සංචාර අපමණ සංඛ්‍යාවක් යොදාගෙන තියෙනවා. නමුත් කියන්න කණගාටුයි. අද වනකොටත් මේ බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල තියෙන කැළිකසළ පිළිබඳව විධිමත් වැඩ පිළිවෙළක් අපේ පළාත් සභාව හරහා කරගන්න තවමත් අපි අපොහොසත් වෙලා තියෙනවා. එහෙම පුළුවන්කම තිබුණා නම් මම මේ කතාව කියන්නේ නැහැ. අපි වත්තල ඉඳලා මේ කොළඹ නගරයට ඇතුළු වනකොට කෝච්චියෙන් ආවත්, ප්‍රධාන පාරෙන් ආවත් නහය අකුලගෙන තමයි එන්න වෙන්නේ. තොටළඟ මහා කුණු කන්ද තවමත් තියෙනවා. එහෙමම ගඳ ගගහ තියෙනවා. රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මේ සභාවේ නැහැ. එතුමා උපදේශක කාරක සභාවේදී මතක් කෙරුවා කොලොන්නාවේ කුණු දාලා තියෙන එක ගැන. පාරවල්වල තැන් තැන්වල. වෙන මුකුත් ඕනෑ නැහැ. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සාක්ෂි දරයි. කදාන දේවස්ථානය පහුකරලා යනකොට මම පෙරේදත් ඒ පාරේ ගියා. යනකොට සුදු පාටට ලොකුවට පේනවා. බලපුවහම මොක්කුද? කොක්කු, ඌරෝ, බල්ලෝ, පූසෝ. මුළු පාරෙම කුණු දෙපැත්තෙම. මිනිහෙකුට යන්න බැහැ. නහයේ ගඳ අල්ලගෙන තමයි යන්නේ. මම මේ ස්ථාන කිහිපයක් ගැන විතරයි සඳහන් කළේ. මේවා බොරු නොවෙයි. මේවා සත්‍ය දේවල්. ඕනෑ කෙනෙකුට ගිහිල්ලා ඕනෑ වෙලාවක බලන්න පුළුවන්. තාමත් ඒ ප්‍රාදේශීය සභාවලට, නගර සභාවලට තමන්ගේ කැළිකසළ බැහැර කරන්න විධිමත් වැඩ පිළිවෙළක් නැහැ. අපි අවුරුදු ගානක් තිස්සේ මේ පිළිබඳව කතා කෙරුවා. අධිකාරී හැදුවා. විවිධ ස්ථානවල ගියා. වැඩමුළු පැවැත්වුවා. රට රාජ්‍යවල ගියා. ඒවා බැලුවා. ආවා. නමුත් ඉතාමත්ම කණගාටුයි. මේ තත්ත්වය පිළිබඳව අපේ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් මේ පළාත් සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වේගවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා - විවිධ බාධාවල් ඇති. ස්ථාන හොයා ගැනිද්දීම අපහසුතාවය ඇති. නමුත් මේකට ඕනෑ තරම් කාලයක් තිබුණා. මේ කාලය දැන් කෙමෙන් ගෙවීගෙන ගෙවීගෙන යනවා. ප්‍රශ්නේ එහෙම්මමයි. ඇත්ත වශයෙන්ම මේ කුණු සම්පතක් කරගන්න පුළුවන්. මේ සම්පත අපි හරිහැටි භාවිතා නොකිරීමේ ප්‍රතිඵලය තමයි අද මේ ප්‍රදේශයේ ඉන්න ජනතාවත් දේශපාලඥයෝ අපටත් මේ පීඩා විඳින්න සිද්ධවෙලා තියෙන්නේ. ඒක නිසා මේ පිළිබඳව 2013 දී මම හිතන්නේ, මේ ඇති කරලා තියෙන වැඩ පිළිවෙළ ක්‍රියාවට නගලා, මේ පළාත් සභාවට සමහර වෙලාවට ලබන අවුරුද්දේ වෙනකොට මැතිවරණයකට මුහුණ දෙන්න සිද්ධ වෙයි. එතකොට ප්‍රධාන ඇමතිතුමාගේ ඒ අවුරුදු පහක කාල සීමාව තුළ එතුමාට ප්‍රගති වාර්තාවක් හදාගන්න පුළුවන්, මම මෙතන මේ අවුරුදු කාල සීමාව තුළ කොහොමද ක්‍රියා කළේ කියලා. මගේ ක්‍රියා කලාපය කොපමණද? මම කියපු ඒවා මොනවාද? මම මේ මුදල් ප්‍රකාශනවල මොනවාද ඉදිරිපත් කළේ? මේවා කොපමණ දුරට ක්‍රියාත්මක කරලා තියෙනවද කියන එක, අවසානයේදී එතුමාට ඒ ලැබෙන ප්‍රගති වාර්තාව අනුව එතුමාට හදාගන්න පුළුවන්. ඒක නිසා 2013 වර්ෂයේදී මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරගෙන ඇවිල්ලා මේ තියෙන පරිසර හානිය මේ මනුස්සයින්ට වන පීඩාව, මේ බලවත් පරිසර විනාශය පිළිබඳව කටයුතු කරන්නයි කියන ඉල්ලීම මම කරනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, ඒ හා සමානව පළාත් පාලන ආයතන ප්‍රධාන ඇමතිතුමාගේ අමාත්‍යාංශයට ඒක වැටෙන්නේ. අද පළාත් පාලනවල, අර ගාමිණී තිලකසිරි ඇමතිතුමා කිව්වා, පළාත් පාලන ආයතන වලට ගිහිල්ලා බලන්න කියලා. පළාත් පාලන ආයතනවලට ඇත්ත වශයෙන්ම ගිහිල්ලා බැලිය යුතුම තමයි. හොඳම උදාහරණය උපදේශක කාරක සභා රැස්වීමේ මේ අරගෙන බලන්න, මේ ප්‍රධාන අමාත්‍යාංශයේ න්‍යාය පත්‍රය ගත්තොත් මෙරිල් පෙරේරා මන්ත්‍රීතුමා කොච්චර කාරණා ඉදිරිපත් කරලා තියෙනවද තමන්ගේම ප්‍රාදේශීය සභාවට විරුද්ධව කටයුතු කරන්න - කටයුතු කරන්න නොවෙයි, සොයා බලන්න පරීක්ෂණය පවත්වන්න කියලා. සමහරක් ඒවායේ වැරදිකාරයෝ වෙලා

තියෙනවා. සමහරක් ඒවායේ තවම පරීක්ෂණ පවත්වනවා. ඇයි මෙහෙම වෙන්නේ? අද මේ ආයතන මහජනතාවගේ සුබ විහරණය එහෙම නැත්නම්, පළාත් පාලන ආයතනයකින් වෙන්න ඕනෑ යුතුකම පැත්තකින් තියලා මේ පළාත් පාලන ආයතන ක්‍රියා කරන්නේ, තනිකරම තමන්ට හම්බවෙන කොමිස් එක සීයට 10 ද සීයට 15 ද සීයට 20 ද කියලා - ඒ ගැන හිතන්න නොවෙයි.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඒ කාලෙත් කොමිස් ගත්තා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒ කාලේ මම ඉන්න කාලේ මහරගමත් හිටියා සභාපති කෙනෙක්. මාත් එක්ක සමගාමීව මේක කෑවා. ඒ නගර සභාව. ඒක හින්දා තමයි එතුමාව එළවලා ඉවරවෙලා, අද මේ තත්ත්වයට පත්වෙන්න සිද්ධ වුණේ. දැන් බලන්න ගරු සභාපතිතුමනි මම මේ අනවශ්‍ය වාදවලට පැටලෙන්නේ නැහැ. මගේ කාලය සීමා සහිත නිසා. මේ පළාත් පාලන ආයතනවල තියෙන වැරදි ගැන තමුන්නාන්සේලා දන්නේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

වත්තල ප්‍රාදේශීය සභාවද කෑවා කිව්වේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

දැන් 2013 ට මුදල් ප්‍රකාශන ඉදිරිපත් කරන වෙලාවේ, ප්‍රාදේශීය සභා නගර සභාවලත් දැන් තමන්ගේ අයවැය ලේඛන සකස් කරලා යනවා. හැබැයි, 2013ටත් ගෙවන්න කොන්ත්‍රාත්කාරයින් වැඩ කරලා ඉවරයි. මම ඊයේ පෙරේදා දැක්කා, වත්තල ප්‍රාදේශීය සභාවේ වැලිසර සත්ත්ව ගොවිපලට යන පාර. ඒක අයිති මේ බස්නාහිර පළාත් සභාවේ පළාත් අමාත්‍යාංශයට. නමුත් වත්තල ප්‍රාදේශීය සභාවේ ඒක තාර දාලා. තාර දාලා මාස 04 යි. ඒකට ඩෝල්ටන් ජානක ගරු මන්ත්‍රීතුමා සාක්ෂි දරයි. ගිය සතියේ පළාත් සභාවේ අපේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ගිහිල්ලා කාපට් කෙරෙව්වා. මේ කාගෙද මුදල්? කවුද මේවාට යොදවන්නේ? මේවා පිළිබඳව පරීක්ෂණ පවත්වන්න. මේ සභාපතිවරුන්ට ඕනෑ ඕනෑ විධියට කොමිස් ගන්න - මේ අවුරුද්දේ නොවෙයි. 2013 අවුරුද්දටත් සල්ලි වියදම් කරලා ඉවරයි. දැන් ඒවාවලට තමයි වැඩ කරන්නේ. ඒ සල්ලිවලට තමයි ණය වෙලා කොන්ත්‍රාත්කාරයින්ට ගෙවන්න සිද්ධවෙලා තියෙන්නේ. ඉතිං මේවා කරන්නේ මහජනතාවට ඕනෑ විධියට නොවෙයි. එහෙමනම්, පාර කොන්ක්‍රීට් කළහම අඩුම තරමේ අවුරුදු හතරක් පහක්වත් ඒකේ හොඳ තත්ත්වයක් තියෙන්න ඕනෑ. දාලා අවුරුද්දයි එකහමාරයි යනකොට ආයේ යන්න බැහැ. ඉස්සර නම් පාර තාර දාපුවහම ආයේ කොහොමහරි ගල් ටිකක් දාලා ප්‍රිමික්ස් ටිකක් දාලා, ඕක තලලා හදා ගන්න පුළුවන්. කොන්ක්‍රීට් කරපුවහම මුකුත් කරන්න බැහැ. ආයේ සැරයක් කොන්ක්‍රීට්ම කරන්න තමයි ඕනෑ වෙන්නේ. ඒක නිසා මේ කිසිම සැලැස්මක් නැතුව මේ පළාත් පාලන ආයතනවල කරන වැඩ පිළිබඳව තමුන්නාන්සේලා මීට වැඩිය කටයතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ ඉඩම් කට්ටි කරලා විකුණන එක පිළිබඳව. ඒ පිළිබඳව අද විවිධ විධියට ඉතාමත් විෂමාචාර ක්‍රියාවල් සිද්ධ වෙන්නේ. මේවා හොයලා බැලුවොත් එහෙම, පරීක්ෂණ කණ්ඩායමක් හිටියා.

මට මතකයි. ඉස්සෙල්ලා ප්‍රධාන ඇමතිතුමා ඉන්න කාලේ තිබුණා අර කඩා පනින හමුදාවක්. ඒකෙන් ගිහිල්ලා අර යම් යම් දේවල් කෙරුවා. හැබැයි, දැන් ඒක ටිකක් වෙන්නේ නැහැ. ඒක නිසා දැන් අර හොයන්නේ නැති හින්දා සභාපතිවරු, ඉන්න මන්ත්‍රීවරු - මේකට පක්ෂයක් නැහැ. දෙගොල්ලෝම එක්කහුවෙලා තමයි කරන්නේ. දෙගොල්ලෝම එක්කහු වෙලා බොහොම සහයෝගයෙන් මේ වැඩේ දෙන්නේ. ඒකේ පීඩාව විඳින්නේ, මේ බදු ගෙවන ජනතාව. ඒක නිසා පළාත් පාලන ආයතන පිළිබඳව මේ පළාත් සභාව - අපට සීයට සීයක් බලය පැවරිලා තියෙන්නේ. සීයට සීයක් බලය විමධ්‍යගත වෙලා තියෙන්නේ. මේක පිළිබඳව ගරු ප්‍රධාන ඇමතිතුමාට ක්‍රියා කරන්න පුළුවන්. ඒ නිසා මම මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

ඊළඟට එතුමාගේ අමාත්‍යාංශය යටතේ තියෙන විශේෂම වැදගත්කමක් තියෙන කොට්ඨාශය තමයි අධ්‍යාපනය. එතුමා මේ අවුරුදු කිහිපයක් තිස්සේ මේ මුදල් ප්‍රකාශනය ඉදිරිපත් කරන වෙලාවේ අධ්‍යාපනය ගැන කථා කරන කොට කිව්වේ, අඩක් නිම කරපු ගොඩනැගිලිවලට ඉස්සෙල්ලා ප්‍රමුඛතාවය දීලා තමයි අළුත් ගොඩනැගිලි ඉදි කරන්නේ කියලා. මට කියන්න කණගාටුයි. තාමත් මේ බස්නාහිර පළාතේ වැඩ ආරම්භ කරලා ඉවර කරගන්න බැරි වුණු ගොඩනැගිලි, මේ අවුරුදු පහ අවසන් වනකොටත් තවත් විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒ නිසා කරුණාකරලා අළුත් ගොඩනැගිලි යම් යම් තැන්වල ස්ථාපිත කරන්න ඉස්සෙල්ලා, මේ තියෙන ගොඩනැගිලි ටික ඉවරයක් කරලා මේ දරුවන්ට නිදහසේ තමන්ගේ අධ්‍යාපන කටයුතු කරගන්න අවස්ථාව, ඒ භෞතික සම්පත ලබා දෙන්නට කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟට ඔබතුමා හරහා ගරු ප්‍රධාන ඇමතිතුමාගෙන් ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටින්න කැමතියි. පාසල් රජයට පවරගත්ත වෙලාවේ කතෝලික සභාව සතු පාසල් තමයි විශාල වශයෙන් රජයට ගත්තේ. එතකොට දැන් මේවා 1960-61 ඉඳලා අවුරුදු ගානක් ගිහිල්ලා. දැන් ඒ තිබුණු නීති රීති වෙනස් කරන්න කාලේ හොඳයි. මොකද උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම, ඒ වෙනකොට ඒ පාසල් පවරා ගන්නකොට දීපු රෙගුලාසි තිබුණා. ඒ හිටපු ප්‍රතිශතය අනුව ළමයි ගන්න ඕනෑ කියලා. දැන් අපේ පළාත්වල ඉඩම් විකිණිලා කෑළිවලට කැඩිලා ගිහිල්ලා. ඒ තියෙන ජන අනුපාතය වෙනස් වෙලා. දැන් උදාහරණයක් ගත්තොත් එහෙම මාබෝලේ ශාන්ත මරියා විද්‍යාලය, ජානක මන්ත්‍රීතුමා දන්නවා. ඒක සීයට සීයක් කතෝලික විද්‍යාලයක්. තව අවුරුදු තුන හතරක් යනකොට ඒක ශාන්ත මරියා මුස්ලිම් මහා විද්‍යාලය

වෙනවා. ඇයි එහෙම වෙන්නේ. මාබෝලේ තියෙනවා අල් අෂ්රොෆ් විද්‍යාලය කියලා එකක්. ඒකේ උගන්වන්නේ ද්‍රවිඩ භාෂාවෙන්. හැබැයි, මේ විද්‍යාලයේ තියෙන ඉඩකඩ සීමිතයි. එක පැත්තකින් කොළඹ කටුනායක ප්‍රධාන මාර්ගය. අනිත් පැත්තෙන් තව ප්‍රධාන මාර්ගයක් යනවා කර්මාන්ත සංකීර්ණයට. අනිත් පැත්තෙන් අළුත් අධිවේගී මාර්ගය යනවා. මේක බොහොම පටු බිම් තීරයක තියෙන්නේ. මම ගිය අවුරුද්දේ තමුන්නාන්සේට යෝජනා කළා, උපදේශක කාරක සභාවටත් යෝජනාවක් ගෙනාවා. මේකේ සිංහල මාධ්‍ය පටන් ගන්න කියලා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

පටන් ගත්තා.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔව්. මම දන්නවා. ඉතින් පොඩ්ඩක් ඉන්න කෝ පනින්නේ නැතුව. පනින්න එපා. මේ කියාගෙන යන්නේ ඒක තමයි. ඉන්න

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

එතෙන්ට තමයි එන්න යන්නේ. සිංහල මාධ්‍ය පටන් ගන්න කියලා. හැබැයි, සිංහල මාධ්‍ය පටන් ගන්න කිව්වට වැඩක් නැහැ. ඒ පටන් ගන්න උවමනා කරන පහසුකම් තියෙන්න ඕනෑ. ගොඩනැගිල්ල තියෙන්න ඕනෑ. සිංහල උගන්වන්න ගුරුවරු ඉන්න ඕනෑ. මූලික වශයෙන් ඒ දෙක තියෙන්න ඕනෑ. එතකොට ඒ ගොඩනැගිලිවලට උවමනා කරන - එතුමා හොයලා දුන්නේ නැහැ. මම ව්‍යාපාරිකයෙකුට කියලා පර්චස් 20 ක් අරන් දුන්නා. ඒකේ තමයි ගොඩනැගිල්ල හැදුවේ. ඒකේ මම කියන්නේ තව උඩට

[සභාවේ ඝෝෂා]

හරි හරි ඉඩම් කෑල්ල හොයලා දුන්නේ මමය කියන එකයි මම කිව්වේ. හරි ඉන්න කෝ පොඩ්ඩක්. නිකන් දුන්නේ. නිකන් දුන්නේ ඉඩම්.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ආ ඒ මොකක්ද ඒ ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කිසිම ව්‍යාපාරිකයෙක් නොකරන වැඩක් ඉස්කෝලෙට - මුස්ලිම් ඉස්කෝලෙට සිංහල ව්‍යාපාරිකයෙක් ඉඩම අරන් දීලා -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඔබතුමා ඉඩම අරන් දීලා කොමිස් ගත්තයි කියන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

දැන් ඒකෙත් නගගන්න. එතකොට එහෙම වෙනකොට මේ තියෙන සංස්කෘතික ප්‍රශ්න මතු වෙන්නේ නැහැ. ශාන්ත මරියා එකට හරි, වැලිකඩ මුල්ලේ සිද්ධාර්ථ විද්‍යාලයට හරි අර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මුස්ලිම් දරුවන්ට තමන්ගේ ඒ අනන්‍යතාවය ආරක්ෂා කරගෙන ඉස්කෝලෙට ගිහිල්ලා - මේගොල්ලෝ යන්නේ අපට සිංහල ඉගෙන ගන්න ඕනෑය කියලා. ඇත්ත, ඒක හොඳයි. එහෙම නම් මේ විද්‍යාලවල සිංහල වැඩි දියුණු කළොත් එහෙම අර තිබෙන ප්‍රශ්න - යාඥා කරන්න තියෙන වෙලාවේ හිටගෙන හිටියාය. ඔය වාගේ නැති ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ. ඉතින් ඒ නිසා අපේ ප්‍රදේශයේ තිබෙන විශාල ප්‍රශ්නයක්.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

නැත්නම් මුස්ලිම් ආගමට ගහන්න හිටියේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ, නැහැ. අපි කියන්නේ අනන්‍යතාවය, ඒ සංස්කෘතිය ආරක්ෂා කරමින් වැඩි දියුණු කරමින් ඒ පහසුකම් දෙන්නය කියලා. ඊළඟට තමුන්නාන්සේ නියෝජනය කරන ගම්පහ කොට්ඨාශයේ ගම්පහ, මිරිස්වත්ත, මුදුන්ගොඩ, කැප්පෙටිපොල විද්‍යාලයේ. මේ විද්‍යාලයේ තිබෙන ගොඩනැගිලි පාර දෙපැත්තේ තියෙන්නේ. කතෝලික සභාවෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. එක ගොඩනැගිල්ලක් හදලා දෙන්නම්. ඒත් එක්කම ඉඩම දෙන්නම්. එක තැනකට මේ විද්‍යාලය ගන්න කියලා. එක තැනකට විද්‍යාලය ගත්තාම පල්ලියට අර ඉඩම හම්බ වෙනවා. ඒක සාධාරණයි. මොකද, දැන් ඇත්ත වශයෙන්ම අපි දැකලා තිබෙනවා. මෝදර ශාන්ත ජේම්ස් විද්‍යාලයේ මඟුල් පූජාවකට ගියාම ඒක කරන්න බැහැ. මොකද එතැන පුදුමාකාර කරදරයක් තිබෙන්නේ. එකක්, ඉගෙන ගන්න ළමයින්ටත් කරදරයි. පූජාව තියන්නත් බැහැ. මොකද, ඒ කාලේ මේ පල්ලිය ආශ්‍රිතව තමයි ගොඩනැගිලි හැදුනේ. දැන් ඒක වෙනස් වෙන්න කාලය හොඳයි. ඒක නිසා මේ ගොඩනැගිලි නැවත මුල් අයිතිකරුවන්ට දීලා, ඒ අයට යම් ස්ථානයක් දෙනවා නම්, ඒ ස්ථානවල විද්‍යාලයක් හදලා දෙනවා නම් මම හිතන්නේ මෙය එපමණ අමාරු දෙයක්

නොවෙයි. අභක යන දේවල්වලට අපි නිකරුණේ ගැටළු ඇති කර ගන්න උවමනාවක් නැහැ. ඒ නිසා මේ කාරණා කිහිපය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම, නැවත ඒ මුල් අයිතිකාරයන්ට ගොඩනැගිලි දෙනකොට පළාත් සභාවේ විද්‍යාලවලට සාධාරණය ඉෂ්ට වන ආකාරයට කටයුතු කරන්න කියන ඉල්ලීම මම මේ වෙලාවේ කරන්න කැමැතියි. ඒ නිසා අවසාන වශයෙන් යෝජනාවක් හැටියට මම ඔබතුමාට කියනවා. අපි අද උදම් අනනවා. පළාත් සභාවක් හැටියට මේ අධ්‍යාපනය - ඇත්ත වශයෙන්ම බස්නාහිර පළාත් සභාවේ යම් ප්‍රමාණයකට හොඳ ගුණාත්මක වර්ධනයක් සිදු වෙමින් යනවා. ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරන්න කැමැතියි. අපි පළාත් සභා හැටියට ප්‍රාථමික පාසල් පද්ධතිය දියුණු කෙරුවොත් එහෙම, ඉතාමත් ශක්තිමත් ආකාරයට - 6 න් එහා හරි 8 න් එහා මේ විද්‍යාල ටික හරි මධ්‍යම රජයට භාර දීලා ප්‍රාථමික අධ්‍යාපනය මේ පළාත් සභාව යටතේ තියාගෙන ඒක පෝෂණය කරනවා නම්, අද ඔය පහේ ශිෂ්‍යත්වයට දෙමව්පියෝ දුවන දිවිල්ල දුවන්න වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතකොට ගමේ ළමයින්ට මොකද වෙන්නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

දරුවන්ව මහන්සි කරන මහන්සි කිරිල්ල, මානසික වේදනාව, කම්කටොළු ඒ කිසි දෙයක් නැහැ. ප්‍රාථමික විද්‍යාල හැටියට හොඳ තත්ත්වයේ විද්‍යාල පවත්වාගෙන යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මම ගරු ප්‍රධාන ඇමැතිතුමාට යෝජනාවක් කරනවා. එතුමා කල්පනා කරලා බලලා ශක්තිමත් ප්‍රාථමික පාසල් පද්ධතියක් බස්නාහිර පළාතේ ඇති කරලා, ඔය 6 න් එහා හරි, 8 න් එහා හරි - දැන් මධ්‍යම රජය මොනතරම් මුදලක් වියදම් කරනවාද? ජා-ඇළ කොට්ඨාශයේ බැලුවොත් ජාතික පාසලක් හැටියට තියෙන්නේ එක විද්‍යාලයයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කවුරු හරි කාලය වෙන් කිරීමක් කරනවාද?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එක විනාඩියයි. වත්තල කොට්ඨාශයේ බැලුවොත් එහෙම ජාතික පාසලක් විධියට ශාන්ත අන්තෝනි විද්‍යාලයේ විතරයි තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවදුරටත් අමාරුයි. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒවාට සල්ලි හම්බ වෙනවද?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒවාට සල්ලි හම්බ වෙනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

කොහෙන්ද හම්බ වෙන්නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒවාට මධ්‍යම රජයෙන් හම්බ වෙනවා. (බාධා කිරීමක්) මධ්‍යම රජයෙන් හම්බ වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සතයක් හම්බ වෙන්නේ නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ, නැහැ එහෙම කියන්න එපා. දැන් මම ගිය සතියේත් තුඩැල්ලේ ක්‍රිස්තුරාජ විද්‍යාලයේ හිටියා. ඉස්කෝලවලට ඕනෑ තරම් සල්ලි හම්බ වෙනවා. මේ ශ්‍රීනාත් මන්ත්‍රීතුමාත් හිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව අවසන් කරන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අපි ඒ ටික මහ ආණ්ඩුවට භාර දීලා ප්‍රාථමික පාසල් පද්ධතිය මේ බස්නාහිර පළාතේ ඉතා හොඳින් තියා ගන්න පුළුවන් විධියට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. තමුන්නාන්සේට සුභ පතනවා. ඒ වාගේම මම එක දෙයක් කියන්න ඕනෑ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, එතුමාට විනාඩි 02 ක කාලයක් ලබා දෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ප්‍රධාන ඇමැතිවරයාට අපි සමහර වෙලාවට විහිළු තහළු කරනවා. සංවේදී ප්‍රධාන ඇමැතිවරයෙක්. අපට ගිහිල්ලා යම්කිසි අවස්ථාවකදී ප්‍රශ්නයක් කථා කර ගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔන්න සුදු හුණු ගානවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කියන්න තියෙන දේ කියන්න ඕනෑ. මම කිසිම දවසක

[සභාවේ ඝෝෂා]

මම කිසිම දවසක ලැයිස්තු අරගෙන ගිහිල්ලා ළමයි දාලා නැහැ. ඕනෑ වෙලාවක අහන්න. මම කාරුණික ඉල්ලීමක් කරනවා මිසක්. ලැයිස්තු අරගෙන ගිහිල්ලා දාගෙන නැහැ. මට වත්තල කොට්ඨාශයේ ළමයෙක් දාගන්න අවශ්‍ය වුණොත් ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට කියනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඔය එළි වෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ජා-ඇළ කොට්ඨාශයට ළමයෙක් දාගන්න ඕනෑ වුණොත්, මම මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට කියනවා. ප්‍රධාන ඇමැතිතුමා පස්සේ ගිහිල්ලා කරගන්නේ නැහැ. ඒ නිසා ඒ චෝදනාව මට එල්ල කරන්න එපා. මම කිව්වේ, එතුමා සංවේදී පුද්ගලයෙක් හැටියට -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ජානකට ඕනෑ නම් කියන්න. ළමයෙක් දෙන්නෙක් දාලා දෙයි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එතුමාගේ තිබෙන එකම දුර්වලකම තමයි මේ සැලැස්මවල් සකස් කරද්දී, අදහස් ගනිද්දී - ඇත්ත වශයෙන්ම උපදේශක කාරක සභාව නොකඩවා හැම මාසයකම පවත්වනවා. ඒවාට සහභාගී වෙනවා. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට මේ අයවැය ලේඛනය සකස් කරද්දී අපෙන් කිසිම අදහසක් ගත්තේ නැහැ. ඒ පිළිබඳවත් කනගාටුව ප්‍රකාශ කරමින් තමුන්නාන්සේට මේ අවුරුදු 05 ඉවර වෙනකල් මේ පළාත් සභාවේ ශක්තිමත් මහ ඇමැතිවරයා හැටියට ඉන්න වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

[ පූ.භා. 11.45 ]

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ අපේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් බිහි වුණු ගරු ප්‍රධාන ඇමැතිතුමා යටතේ තුන්වැනි අයවැය විවාදය පවත්වන මේ අවස්ථාවේදී අධ්‍යාපන විෂයය පිළිබඳවත්, පළාත් පාලනය පිළිබඳවත් මට ලැබී ඇති කාලයේදී අදහස් ප්‍රකාශ කිරීමට මම අදහස් කරනවා. බස්නාහිර පළාත තුළ පාසල් 1261 කුත්, ශිෂ්‍ය සංඛ්‍යාව 209,349 කුත්, ගුරු සංයුතිය 32,940 කුත් ඒ වාගේම සිසු ගුරු අනුපාතය කොළඹ 1 : 21 කුත්, ගම්පහ 1 : 22 කුත්, කළුතර 1 : 20 කුත් පළාත තුළ සමස්තය 1 : 22 යටතේ මේ පළාත තුළ අධ්‍යාපන සංයුතිය සැදී තිබෙනවා. මේ සඳහා 2013 දී ගරු ප්‍රධාන ඇමැතිතුමා එතුමාගේ වැඩ සටහන තුළ පළාතේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය තේමා කරගෙන යම්කිසි ඉලක්ක හතරක් ඉදිරිපත් කරලා තිබෙනවා.

ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා සම අවස්ථා ඇති කිරීම.

ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය.

ආයතනික ධාරිතාව සහ මානව සම්පත් සවිබල ගැන්වීම,
ශක්තිමත් යහ පාලනයක් ඇති කිරීම,

කියන මූලික කරුණු සිද්ධාන්ත හතර ඉලක්ක කරගෙන. ඒ යටතේ මෙම අරමුදල පහත ඉලක්ක සාධනයට ආයෝජනය කරන්න එතුමා කටයුතු කරනවා. ප්‍රථම දේ හැටියට මා ඉතාමත්ම අගය කරනවා, දැනට පවතින සාක්ෂරතාව 98% දක්වා ඉලක්කගත කිරීම. ගරු සභාපතිතුමනි, මේ වනවිට කැලණි කලාපය ගැන උදාහරණයක් කියනවා නම්, සාක්ෂරතාවය බොහොම අඩු පාසල් තිබෙනවා. වනවාසල නාගසේන විද්‍යාලයේ 6, 7 පන්තිවලත් දරුවන්ගේ සාක්ෂරතාවය Zero. අපි උපදේශක කාරක සභාවේදීත්, කලාප කමිටු රැස්වීමේදීත් විදුහල්පතිවරුන්ගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. 2013 වසර සඳහා ඉලක්කගත සංවර්ධන වැඩ පිළිවෙළක් ලබා දෙන්න කියලා. සම්ප්‍රදායක් හැටියට ශිෂ්‍යත්වය, සාමාන්‍ය පෙළ, උසස් පෙළ ඉලක්කගත වැඩ පිළිවෙළක් දුන්නාට තමන්ගේ පාසල්වල සාක්ෂරතාවය හීන දරුවෝ කොපමණද? අම්මා තාත්තා නැති දරුවෝ කොපමණද? අම්මා විදේශගත වුණු දරුවෝ කොපමණද? ආර්ථික හීනතාවය නිසා පාසලට නොපැමිණෙන දරුවෝ කොපමණද? කියන සංඛ්‍යා ලේඛන අපි ඉල්ලුවා. දැනට සමහර විදුහල්පතිවරු අපට දීලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා 2013 සඳහා ඉලක්කගත සැලැස්මක් ක්‍රියාත්මක කරනකොට මෙවැනි දේවල්

අවශ්‍ය වෙනවා. සැලසුමක් කියන දෙයට මේවාත් අන්තර්ගත වෙන්න ඕනෑ. ඒ වාගේම ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවිෂ්ට වීමේ අනුපාතය 100% කිරීම. දැන් හුඟක් මන්ත්‍රීවරු අධ්‍යාපනය ගැන කථා කරනකොට ප්‍රාථමික අංශය ගැන කථා කළා. දැන් අපේ සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාත් කථා කළා. ඇත්තටම අඩුම වශයෙන් පළාත් සභාවට ප්‍රාථමික අධ්‍යාපනය සකස් කරන්න 1 - 5 වත් දෙන්නට ඕනෑ. මධ්‍යම ආණ්ඩුවට ඉන් ඉහළ දෙන්න කියල ඉල්ලීම පළාත් සභා පිහිටවපු දා ඉඳලා ඉල්ලනවා ගරු සභාපතිතුමනි. ඒ වාගේම 1 - 9 ශ්‍රේණි දක්වා රැඳී සිටීමේ අනුපාතය 98% දක්වා. එතුමාගේ මේ ඉලක්කයන්. 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් 100 ට වඩා ලකුණු ගන්නා ප්‍රමාණය 65% දක්වා වර්ධනය කිරීම. මෙතැනදී ගරු ප්‍රධාන ඇමැතිතුමා පිළිබඳව මම ප්‍රශංසා මුඛයෙන් කථා කරනවා. අපි පාසල් යන කාලේ සාමාන්‍ය පෙළ විභාගයට ලකුණු 35 ක් ගත්තාම S එකක් දෙනවා. මේ සැරේ ශිෂ්‍යත්ව දරුවෙක් ලකුණු 152 ක් ගත්තාම තමයි පාස් කියන කඩඉම තක්සේරු කරන්නේ. මෙය බරපතළ වරදක්. ළමා මනසක්. අම්මා තාත්තා විභාගයක් කරලා. අම්මලා තුළත් මේ ගණන් කිරීම, මේ තක්සේරු කිරීම හරි වැරැදියි. මෙතුමා මෙය නිවැරැදි කිරීමක් වශයෙන් ලකුණු 100 ට වැඩි සෑම දරුවෙකුම ඇගයීමට ලක් කරන්න සහතිකයක් දුන්නා. මෙවර ලකුණු 70 ට වැඩි දරුවන්ට අපි හරහා මධ්‍යම ආණ්ඩුවෙන් සහතික ලබා දුන්නා.

ගරු සභාපතිතුමනි, 5 වසරේදී මේ දරුවන් ඒ මට්ටමට ගැනීමෙන් අධ්‍යාපනඥයෙක් හැටියට, අධ්‍යාපනයේ හර පද්ධතීන් දන්න කෙනෙක් හැටියට ඔබතුමන්ලා අපි සියලු දෙනාම අධ්‍යාපන විෂයයට උනන්දු අය හැටියට මේ වරද නිවැරැදි වෙන්න ඕනෑ. ගරු ප්‍රධාන ඇමැතිතුමා පළාත් සභාවලට හොඳ ආදර්ශයක් දීලා තිබෙනවා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම උසස් පෙළ සුදුසුකම් ලැබීමේ අනුපාතය 75% දක්වා වැඩි කිරීම. ඒ වාගේම විශ්ව විද්‍යාලවලට ප්‍රවේශ වීමේ ප්‍රතිශතය 67% දක්වා. මේ හොඳ ඉලක්කගත කරුණු හයක්. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ද්විතීයික පාසල් වැඩ සටහන ගැන එතුමාගේ ඊළඟ වැඩ සටහන්වල තිබෙනවා. මේ ද්විතීයික පාසල් වැඩ සටහනේදී ප්‍රාථමික අංශය ගැන යම් දෙයක් කියන්නට ඕනෑ. මේ ප්‍රාථමික අංශය නඟා සිටුවීමෙන් ආදර්ශ ප්‍රාථමික පාසල් පිහිටුවීම තුළ ජාතික පාසලක්, ද්විතීයික පාසලක් ආශ්‍රිත කරලා පිහිටුවීම තුළ ජාතික ප්‍රතිපත්තියකට ඇතුල් වෙන්න ඕනෑ කියන හඬ අපි නගන්න ඕනෑ. ප්‍රාථමික පාසලේ පහෙන් පස්සේ දරුවන්ට යන්න ළඟ තිබෙන ජාතික පාසලටත්, ද්විතීයික පාසලටත් යන විධියේ වැඩ පිළිවෙළක් දුන්නොත් අපේ ප්‍රාථමික පාසල් පද්ධතිය නඟා සිටුවීමේ හොඳ ඉලක්කයක් වෙනවා. දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා ඇත්තටම දේශපාලඥයන් ළඟට එනවා කියන එකට මම නම් පෞද්ගලිකව විරුද්ධයි. දේශපාලඥයින් ඉන්නේ ප්‍රතිපත්ති සැලසුම් හදන්න ගරු සභාපතිතුමනි. අඳුරට බනිනවාට වඩා ඉටි පන්දමක් හරි පත්තු කිරීමේ අරමුණින් තමයි ගරු ප්‍රධාන ඇමැතිතුමා ආරම්භ කරලා තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

සභාපතිතුමාත් කැමැති නැහැ.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ඒ එක එක්කෙනාගේ කැමැත්ත. මම කියන්නේ මගේ පෞද්ගලික මතය. ගරු සභාපතිතුමනි, 50 ට අඩු පාසල් සංවර්ධනය වැඩ සටහන ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ වැඩ සටහන තුළ ඉදිරිපත් කරලා තිබෙනවා. 50 ට අඩු පාසල් ව්‍යාප්තිය පිළිබඳව. කොළඹ 50 ට අඩු පාසල් සංඛ්‍යාව 17 යි. සිසුන් ගණන 537 යි. මෙය සාමාන්‍ය හැටියට බැලුවාම එක පාසලක ළමුන් 31 දෙනෙක් ඉන්නවා. ගුරුවරු අවම වශයෙන් හයක් හතක්වත් ඇති. මේ වැඩ පිළිවෙළ ගැන අපේ සැලසුම්වලට ඇතුල් වෙන්න ඕනෑ. ප්‍රධාන අරමුණක් ගැන මම මේ පැහැදිලි කරන්නේ. ඒ වාගේම ගම්පහ 50 ට අඩු පාසල් 25 යි. සිසුන් ගණන 826 යි. අඩුම වශයෙන් සාමාන්‍ය ගණන හරියට බැලුවොත් දරුවෝ 33 යි. ඊළඟට කළුතර පාසල් 49 යි. සිසුන් 1536 යි. ගරු සභාපතිතුමනි, මේ පාසල් ප්‍රමාණය හැටියට ගුරුවරුන්, 546 ක්වත් අඩුම වශයෙන් ඉන්නට ඕනෑ. පාසලකට 06 ගාණේ ඉදිරිපත් කළොත්. මේ දරුවෝ 33 කට ගුරුවරු හය හත් දෙනෙක්. සමස්ත ගුරු තුලනය 546 යි නේ? ගුරුවරුන්ගේ ඵලදායීතාවය. මේ සැලසුම්වල තිබෙන දේවල් ගරු සභාපතිතුමනි. අපේ පළාත් සභා පාසල් පද්ධතිය තුළ මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ අතිගරු ජනාධිපතිතුමාගේත්, බැසිල් රාජපක්ෂ ගරු ඇමැතිතුමාගේත් වැඩ පිළිවෙළ තුළ අඩක් නිම කළ ගොඩනැගිලි නිම කරන්න පුළුවන් වුණා. වැසිකිළි, කැසිකිළි පද්ධතිය අවසන් කරන්න පුළුවන් වුණා. මාර්ග පද්ධතිය ඉවර කරන්න පුළුවන් වුණා. මේ මෑතක ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් මිතුරු පාසල් පද්ධතියට ලක්ෂ 850 ක් දීලා තියෙනවා. සුදු අලියෙක්, සුදු අලියෙක් කියනවා. පළාත් සභාවලට බැණ බැණ ඉන්නවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ කාලය තුළ කළ ප්‍රධාන වැඩ කිහිපයක් නොවෙයි ගරු සභාපතිතුමනි -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඇහුම්කන් දෙන්න. ඇහුම්කන් දෙන්න.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ඔබතුමාගේ කථාව ජෝන් බාස්ට යවාගෙන අපේ කථා ජෝන් බාස්ට යවන්න එපා. උදව් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා, එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ගරු සභාපතිතුමනි, කැලණිය කලාපය තුළ 50 ට අඩු පාසලක් ලෙස මහර ආසනයේ කිඹුල්ගොඩ පාසල විතරයි තියෙන්නේ. දරුවෝ 40 ක් වාගේ ඉන්නවා. ඒ නිසා මගේ යෝජනාව මෙන්න මේකයි. මේ සටහනේ 1 - 5 පාසල්ද, 1 - 11 පාසල්ද කියලා ගරු ප්‍රධාන ඇමැතිතුමනි සඳහන් වෙලා නැහැ. මේ ඉදිරිපත් කරලා තිබෙන සැලැස්මේ. මේ පාසල් මොන වර්ගයේද කියලා කොහොමද හඳුන ගන්නේ? ළමුන් 50 ට අඩු පාසල් ගණන තිබෙනවා. 1 - 5 ද, 1 -11 ද කියලා නැහැ. ප්‍රශ්නයක් මේක. ගරු සභාපතිතුමනි, තුන් සැරයක් පළාත් සභාවේ ඉඳලා, දිගටම මේ අධ්‍යාපනයට දායක වන කෙනෙක් හැටියට, අපි ලබපු ඇත්දැකීම් හැටියට අවුම වශයෙන් දරුවෝ 125 කටවත් සීමා කරලා 1 - 5 පාසල් විධියට වර්ග කරලා මේ පාසල් ඒකාබද්ධ කරලා ළඟ තිබෙන දියුණු පාසලකට මේ ප්‍රාථමික පද්ධතිය ගොඩනැඟීමේ හොඳ ඉලක්කයකට යන්න කියලයි මම කියන්නේ. අනෙක් එක ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා පසුගිය වසර හතර තුළ රුපියල් මිලියන 640 ඉඳලා 1527 දක්වා අධ්‍යාපනයට ආයෝජනය කරලා තිබෙනවා. එය හොඳ වර්ධනයක්. ඒ වාගේම කාලය මදී නිසා මම කෙටියෙන් කියන්නේ.

අධ්‍යාපනයට බඳවා ගන්නා උපාධිධාරී ගුරු භවතුන්ට අවුම වශයෙන් තුන් මසකවත් සේවාස්ථ පුහුණුවක් ලබා දෙන්න. සමහරු පෞද්ගලික ආයතනවල ඉඳලා එනවා. සමහරු ගෙදර
[ ගරු රෙහෙන්සිරි වරාගොඩ ]

ඉඳලා කෙළින්ම පාසලට එනවා. උගන්වන්නත්, උගන්වලා එවන්න ගරු ප්‍රධාන ඇමැතිතුමනි. මේ අවුල තිබෙනවා. මේක වෙන්නට ඕනෑ දෙයක්. ඒ වාගේම මට ලැබුණු වේලාව අනුව මම කියන්නේ ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ කාලය තුළ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට දුරකථන ලබා දුන්නා. මේ ප්‍රගති වාර්තාවේ එය නැහැ. සඳහන් වෙලා නැහැ. මෙය කලින් කියන්න ඕනෑ දෙයක්. මම හැම අයවැය විවාදයකදීම කියනවා, කොට්ඨාශ අධ්‍යක්ෂතුමා හෝ තුමිය මාරු මණ්ඩලයට ඉන්දන්න කියන එක. අද වනතුරු ක්‍රියාත්මක වුණේ නැහැ. අපි ගුරු මාරු ගැන ඇඟිලි ගහන්නේ නැහැ. දේශපාලනය අනන්තයි - සමහර අය ඒ හරහා කර ගන්නවා. අපට බැරි මාරුවීම් කර ගන්නවා. ඒක නිවැරැදි කරන්න. ඒ වාගේම දැනට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා - මම සභාගත කරනවා. දකුණු පළාත් සභාවේ ඉන්ධන දීමනාවක් දෙනවා. මේ වාර්තාවත් සලකා බලා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා එයත් ඔබතුමාගේ කාලය තුළ ලබා දෙන්න කියමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පර්මිට් එක ගැන වචනයක්වත් කථා කෙරුවේ නැහැ.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

වගකීමෙන් කියන්නේ. ලැබෙනවා. ඕක හැමදාම අහන්න එපා.

[ පූ.භා. 11.51 ]

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන වැය ශීර්ෂය යටතේ කථා කරන්නට අවස්ථාව සලසා දීම පිළිබඳව මම ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙනවා. අද විරුද්ධ පක්ෂය පවා පළාත් සභා අධ්‍යාපනය පිළිබඳව සතුටින් කථා කළා. විවේචන නැතුවා නොවෙයි. ඇත්ත වශයෙන්ම පාසල් පද්ධතියට අද මුදල් ගලා එමින් තිබෙනවා. ක්‍රමානුකූලව මේ කටයුතු සකස් කරගෙන යනවා. ශිෂ්‍යත්වයට, දරුවාට ඉලක්කයක් කරා යන්නට වැඩ පිළිවෙළවල් සකස් කරලා තිබෙනවා. ඒ වාගේම සාමාන්‍ය පෙළ, උසස් පෙළ හදාරන දරුවාට අපි ඉලක්ක දීලා තිබෙනවා. ගුරුවරුන් නියමිත වේලාවට පන්ති කාමරයට යවන්න වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ වාගේම ගුරුවරුන්ට සේවා තෘප්තිය ඇති වන විධියට ඒ වැඩ කොටසක් කරන්නට ගරු ප්‍රධාන ඇමැතිතුමා උපදෙස් දීලා තිබෙනවා. ඒක නිසා ක්‍රමක්‍රමයෙන් දරුවන්ගේ අධ්‍යාපන ප්‍රගතිය ලැබෙමින් තිබෙන බව අපට පෙනෙන්නට තිබෙනවා. පාසල්වලට අපි යනකොට එහි පරිසරය ලස්සනට තිබෙනවා. දරුවාට පාසලට එන්න ආස හිතෙන විධියට, ගුරුවරුන්ට පාසලට ඇවිල්ලා කල්ගත කරන්න පුළුවන් විධියට ඒ පරිසරය සකස් වෙමින් යනවා. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. ඒ වාගේම මම විශේෂයෙන් මේ අවස්ථාවේදී කථා කරන්න ඕනෑ. අපි විදුහල්පති භූමිකාවත් ශක්තිමත් කරන්න ඕනෑ. පාසලේ ප්‍රධාන නියමුවා විදුහල්පති. විදුහල්පතිතුමාට වැඩ කරන්නට පුළුවන් හොඳ පුහුණුවක් ලබා දෙන්න ඕනෑ. විදුහල්පතිවරු හිඟයක් තිබෙනවා. සමහර පාසල්වල ඉන්නේ වැඩ බලන විදුහල්පතිවරු. විදුහල්පතිවරුන්ට, විදුහල්පතිවරු වෙන්න පුළුවන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන්ට ඒ සුදුසුකම් තිබෙන අයට හොඳ පුහුණුවක් දිය යුතුයි කියන එක මම මීට ඉස්සෙල්ලාත් යෝජනාවක් ඉදිරිපත් කරලා කිව්වා. මේ පිළිබඳව සොයා බලාගෙන යනකොට මට දැන ගන්න ලැබුණා, විදුහල්පතිවරුන්ට වෙලා තිබෙන අසාධාරණයක් ගැන. විදුහල්පතිවරු කොහේවත් වැඩ වර්ජන කළේ නැහැ. කරන්නේ නැහැ. නමුත් ඒ අයගේ වැටුප් ප්‍රශ්නයක් තියෙනවා කියන එක මට දැන් ගන්න ලැබුණා. විදුහල්පතිතුමාට වඩා වැඩි වැටුපක් ගුරුවරුන්ට තිබෙනවා. ගුරු සේවයට තිබෙනවා. ගුරු සේවයට වැඩි වැටුපක් තිබෙන එක ගැන අපි සතුටු වෙනවා. අපේ ආණ්ඩුවලින් ගුරු සේවයට ගෞරවයක් ඇති කොටසක් වශයෙන් ජීවත් වෙන්න පුළුවන් හොඳ වැටුපක් ලබා දුන්නා. ඒවායේ අඩුපාඩු තිබෙන ඒවා සකස් කරලා දුන්නා. ඉදිරියටත් ඒවා තිබෙනවා නම්, සකස් කරන්න රජය කටයුතු කරනවා. නමුත් ගුරු සේවයේ පළමුවැනි ශ්‍රේණියේ වැටුප රුපියල් 21,345 කින් ආරම්භ වනකොට, තුන්වැනි ශ්‍රේණියේ

විදුහල්පතිවරයෙකුට රුපියල් 15,350 ක වැටුපක් තමයි ලැබෙන්නේ. මේ සේවයන් දෙකට වැටුප් ලැබෙන ක්‍රමය මම සභාගත කරනවා.[1] නමුත් අවසානයේ බලනකොට විදුහල්පතිවරයාට 10,840 කින් වැටුප අඩු වෙනවා. ඒ නිසා සමහර අවස්ථාවලදී විදුහල්පති තනතුරේ වැඩ කරන්න විභාග සමත් වුණත් සමහර විදුහල්පතිවරුන්ට දෙපාරක් හිතන්න තිබෙනවා. මොකද, ඒ අය මේ තනතුර අරගෙන වැඩ කරලා විශ්‍රාම යනකොට අර වෙනස නිසා ඔවුන්ගේ පඩිය ගුරු සේවයට වඩා අඩු නිසා විශ්‍රාම වැටුපත් අඩු වන තත්ත්වයක් තිබෙනවා. ඒක නිසා ඔබතුමා මගින් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව පරීක්ෂා කරලා, මෙහි නිවැරැදිතාවය සොයාගෙන විදුහල්පතිවරුන්ට ඒ වෙනසින් නිදහස් වෙන්න පුළුවන් සාධාරණ වැටුපක් ලබා දෙන්නට කටයුතු කරන්නය කියලා. එතකොට තමයි විදුහල්පති භූමිකාව ශක්තිමත්ව කරන්න පුළුවන් සතුටක් විදුහල්පතිවරුන්ට ඇති වෙන්නේ. තමන්ගේ නායකත්වය හොඳින් මෙහෙයවලා වැඩ කරන්න ලොකු ධෛර්යයක් ලැබෙන්නේ. ඒක නිසා අපි ඒක සුළු කොට තැකිය යුත්තක් නොවෙයි කියන එක මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මතක් කරනවා.

ඒ වාගේම අද පාසල්වල ගුරු හිඟය නැහැ. තිබෙනවා නම්, බොහොම සුළු වශයෙන් සමහර පාසල්වල ඇති. දෙමළ මාධ්‍ය ගුරුවරු පවා බඳවා ගන්නවා. ඒ වාගේම මම ස්තුතිවන්ත වෙනවා. ගුරුවරු විශ්‍රාම යනකොට ඒ සම්බන්ධව හිතලා වැඩ පිළිවෙළක් දැන් තිබෙනවා. ඊළඟට, ඒ විදුහල්වල සම්පත් දිහා බලනකොට මම හිතන්නේ මේ කාලේ තරම් කවදාවත් පාසල්වලට සම්පත් ලැබුණේ නැහැ. අමාත්‍යාංශ මට්ටමින් ලැබෙනවා. පළාත් සභා මට්ටමින් පාසල්වලට සම්පත් ලැබෙනවා. ඒ වාගේම අපේ පළාත් සභා අරමුදල්වලින් අපි සම්පත් ලබා දෙනවා. නමුත් බොහෝ පාසල්වලට ශිෂ්‍ය සංඛ්‍යාව අඩුයි කියලා මුරකාරයෝ නැහැ. මුරකරුවෝ නැති නිසා අර අපි දෙන සම්පත් ආරක්ෂා කරන්න විදුහල්පතිවරුන්ට පුළුවන්කමක් නැහැ. උදාහරණයක් හැටියට මම ඒක මතක් කරනවා. අපේ රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් මේ පිළිබඳව දන්නවා. අපේ කොලොන්නාව නගර සභා සීමාව තුළ තිබෙන ශාන්ත ජෝශප් විද්‍යාලය මම හිතන්නේ, මේ අවුරුද්දට හය හත්වෙනි වතාවටත් පාසල කඩලා තිබෙනවා. ඊයේ පෙරේදාත් අපි අලුතින් දුන්නු වැසිකිළිවල දොර සරනේරු ගලවාගෙන, දොරවල් බිත්තියට හේත්තු කරලා ගිහින් තිබුණා. ඒක නිසා අපි සම්පත් දෙනවා වාගේම සම්පත් රැක ගන්නට ක්‍රමෝපායන් සකස් කරලා දෙන්න ඕනෑ. සෑම පාසලකම මේ වාගේ ප්‍රශ්න තිබෙනවා. ඒ වෙනුවෙන් මුරකාරයෙක් යොදන්න හැම පාසලකටම ආර්ථික ශක්තිය නැහැ, සංවර්ධන කමිටුවල මුදල් උපයා ගන්න. අන්න, ඒ වාගේ අවස්ථා පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ගරු සභාපතිතුමා මගින් ඉල්ලීමක් කරනවා. ඒ පාසල්වලටත් ඉක්මණින් මුරකරුවන් ලබා දෙනවා නම් - අපි දන්නවා. කාඩර් එකේ ප්‍රශ්න තිබෙනවා. නමුත් ඒවා දැනුවත් කරලා ඒ තත්ත්වය ඇති කරනවා නම්, වඩාත් යහපත් සම්පත් සුරක්ෂිතතාවයකට අවස්ථාව සැලසෙනවා කියන එක මම විශ්වාස කරනවා.

ඒ වාගේම අද කෘෂිකර්මාන්තයට අපේ රටේ විශාල තැනක් ලැබිලා තිබෙනවා. ඒකෙන් ලැබෙන සහන පිළිබඳව අපි දන්නවා. ඒ වාගේ වැඩ පිළිවෙළක් රටේ ක්‍රියාත්මක වනකොට පාසල්වල කෘෂිකර්ම ගුරුවරුන් සිටිය යුතුයි කියන එක මම විශ්වාස කරනවා. කෘෂිකර්ම ගුරුවරු ඉන්නේ, බොහොම අල්ප පාසල් ප්‍රමාණයක. ඒක නිසා කෘෂිකර්ම විෂයය හදාරන අයට ඉහළ රැකියාවල් ලැබෙන නිසා සමහර වෙලාවට අපට ගුරුවරුන් වශයෙන් පත් කර ගන්නට පිරිස අඩු වෙන්න පුළුවන්. නමුත් මම හිතන්නේ, අපි කලා උපාධිධාරීන් අරගෙන ප්‍රාථමික පුහුණුව දීලා, ප්‍රාථමික පාසල්වලට දානවා වාගේ ගුරුවරුන් බඳවා ගන්නකොට කෘෂිකර්මාන්තය පිළිබඳව පුහුණුවක් දීලා අපේ පාසල්වලට කෘෂිකර්ම ගුරුවරුත් පත් වෙනවා නම් මම හිතන්නේ, ඒකේ ලොකු පහසුවක් තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මම කරනවා. අපි පසුගිය කාලයේ කථා කළා දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කරන්න කියලා. ඔබතුමා ඒ සම්බන්ධව පටන් අරගෙන තිබෙන වැඩ පිළිවෙළ ඉතාම සාර්ථක වෙයි කියලා මම විශ්වාස කරනවා. එහෙම වුණොත් ද්‍රවිඩ, ඉස්ලාම් කියලා නැහැ. හැම දරුවෙක්ම දහම් පාසල වෙත පිටත් කරලා, ඔවුන්ගේ අධ්‍යාත්මය ඉතා හොඳින් සකස් කරන්න අපට අවස්ථාව ලැබෙනවා. රටේ තිබෙන තත්ත්වයට වඩා හොඳ තත්ත්වයකට මේ රට ගේන්න අපට පහසුකම් ඇති වෙනවා. ඒ වාගේම පළාත් පාලනය පිළිබඳව කථා කළොත්, පළාත් පාලන ආයතන තවම ගිණුම් කාරක සභාවට ගෙන්නලා ප්‍රශ්න කරන්න අපට අවස්ථාව නැහැ. අපි පළාත් පාලන ආයතනවලට විශාල මුදල් සම්භාරයක් දෙනවා. අද අපට වඩා පළාත් පාලන ආයතන පොහොසත් කියලා මට වෙලාවකට හිතෙන්නේ. ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාට ඒ පිළිබඳව හොඳින් දැනුම් තේරුම් තිබෙනවා. අඩුම ගාණේ සියලුම මුදල් නොවෙයි. පළාත් සභා අරමුදල් වශයෙන් දෙන මුදල්, මුද්දර ගාස්තු වශයෙන් දෙන මුදල් අපේ විමධ්‍යගත මුදල්වලින් දෙන මුදල්වත් විගණනය සඳහා අපට බලන්න, අපට යටත් කරන්න කටයුතු සම්පාදනය කරන්න කියලා ගරු සභාපතිතුමා මගින් මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එතකොට එය විශාල සහනයක්. ඒ අයව නිවැරැදි කරන්නත් ලැබෙනවා කියන එකත් මම විශ්වාස කරනවා. හිටපු සභාපතිවරියක් හැටියට.

අවසාන ප්‍රශ්නය. අවසානයේ අපි රැදෙන්නේ කොලොන්නාවේ කුණු ගොඩේ. අපි පසුගිය දවස්වල දැක්කා, කඩුවෙලට හොඳ ක්‍රමයක් ඇති වෙලා තිබෙනවා. මම විශ්වාස කරනවා තවදුරටත් අපට මේ කුණු වද දෙන්නේ නැතුව, කොළඹ කුණු කොලොන්නාවේ කරුමයක් කරන්නේ නැතුව වහාම කොලොන්නාවේ මිනිස්සුන්ට සහනයෙන් ජීවත් වෙන්න, ගඳ නැතුව ජීවත් වෙන්න, සෞඛ්‍ය සම්පන්න පිරිසක් වශයෙන්

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

ජීවත් වෙන්න මේ කරුමෙන් අපව නිදහස් කරන්න කියලා ඉල්ලා සිටිමින් මම මගේ වචන ස්වල්ප මෙයින් අවසන් කරනවා.

[ අ.භා. 12.08 ]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, අද දින විවාදයට භාජනය වන වැය ශීර්ෂයන් යටතේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවට මධ්‍යම රජය ගන්න තීන්දු තීරණ ඉතාමත් සෘජුව සහ වක්‍රව බලපාන බව අපි කවුරුත් දන්නවා. දැන් මධ්‍යම රජයට පසුගිය කාලේ අධ්‍යාපන විෂයය සම්බන්ධයෙන් ඉතා විශාල ප්‍රබුද්ධ බුද්ධිමත් ජනතාවගේ සහ රටේ බහුතර ජනතාවගේ ඉල්ලීමක් තිබුණා අධ්‍යාපනයට වෙන් කරන මුදල දළ දේශීය නිෂ්පාදිතයෙන් 4% ක්වත් අවමය වශයෙන් වෙන් කරන්න කියලා. දැන් ඒ ඉල්ලීමට විවිධ තර්ක විතර්ක ආණ්ඩුව පැත්තෙන් මතු වුණා. ඒ මතු කරපු අදහස්වලින් කිසියම් ප්‍රමාණයකින් මෙවර මධ්‍යම රජය ඉදිරිපත් කරපු අයවැය ලේඛනයටත් ඇතුළත් කරලා තිබෙනවා. අපි දැක්කා අපේ අධ්‍යාපන අමාත්‍යතුමා ඉතාමත් දක්ෂ විධියට මේ අදහස් ඉදිරිපත් කරනවා. ඒ කියන්නේ, බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන ඇමැතිතුමා නොවෙයි. මධ්‍යම රජයේ අධ්‍යාපන ඇමැතිතුමා. ගරු සභාපතිතුමනි, මධ්‍යම රජය ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළේ මෙන්න මේ විධියට තියෙනවා. අයවැය ලේඛනයේ පිටු අංක 185.

අධ්‍යාපනය සඳහා වන රජයේ වියදම් යටතේ තිබෙනවා, සාමාන්‍ය අධ්‍යාපනය. මධ්‍යම රජය. 2011 රුපියල් මිලියන 30,986 යි. 2012 රුපියල් මිලියන 35,300 යි. එතකොට අපේ

[ ගරු සරත් පතිරණ ]

දිගටම දාලා තිබෙනවා. මේ විධියට දිගට දිගට කියාගෙන යනවා. මහපොළ ශිෂ්‍යාධාර, තාක්ෂණ පර්යේෂණ වියදම්, ක්‍රීඩා, අධ්‍යාපන ඔක්කෝම දාලා, 2012 වර්ෂයේ එකතුව දාලා තිබෙනවා රුපියල් මිලියන 154,243 ක්. දැන් මේකේ ඊළඟ ප්‍රශ්නය තිබෙන්නේ ගරු සභාපතිතුමනි, මේ දළ දේශීය නිෂ්පාදිතයේ 4% හදන්න එකතු කරගෙන තිබෙනවා, දෙමව්පියන් වියදම් කරන මුදල් ටිකත් ඉදිරිපත් කරලා. මම දැන් දෙමව්පියන් වියදම් කරන මුදල් ටික ඉදිරිපත් කළා නම්, මේ විධියට සඳහන් වෙනවා.

අධ්‍යාපනය සඳහා වන පෞද්ගලික වියදම්, සාමාන්‍ය බාහිර පන්ති ගාස්තු, අධ්‍යාපන ප්‍රකාශන අභ්‍යාස පොත් සහ උපකරණ, ප්‍රවාහන වියදම්, පෞද්ගලික සහ අන්තර් ජාතික පාසල්, බාහිර උපාධි හැදෑරීම, අර්ධ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන, අනෙකුත් උසස් අධ්‍යාපන වියදම්, විදේශගත අධ්‍යාපන වියදම්. ගරු සභාපතිතුමනි, අවශ්‍ය නම් සංඛ්‍යා ලේඛනත් කියන්න පුළුවන්. කාල වේලාව යන නිසා මෙන්න මේ විධියට දෙමව්පියන් විසින් වියදම් කරන මුදලුත් එකතු කරලා තමයි මෙවර අයවැය ලේඛනය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඒ වාගේම ඊයේ හෙක්ටර් බෙත්මගේ හිටපු ගරු ඇමැතිතුමා එතුමාගේ ප්‍රකාශයේ සඳහන් කළා, අජටාකාශගාමීන් හදන යුගයකට තමයි අපි දැන් ප්‍රවිෂ්ට වෙමින් තිබෙන්නේ කියලා. ගරු සභාපතිතුමනි, අද උදේ පුවත්පත් බලද්දී අපි දැක්කා. ඊයේ මධ්‍යම රජයේ ඇමැතිතුමා පොළොන්නරුවට ගිහිල්ලා උපකරණ බෙදුවා. සිවුරු. පාසල් නිල ඇඳුම්. සංඝයා වහන්සේලාට නියමිත ඒ සිවුරු ප්‍රදානයේදී දාන වෙලාව පරක්කු වෙලා. ඇමැතිතුමාගේ කථාව විනාඩි 45 ක්. රටේ අධ්‍යාපන ඇමැතිවරයාට මතක නැහැ, මේ හාමුදුරුවන් නියමිත වෙලාවට දානය වළඳන්න ඕනෑ කියලා. එතුමාගේ කථාව කියාගෙන, කියාගෙන ගියා. විනාඩි 45 ක් ගියා. මම දන්නේ නැහැ. අද පත්තරවල තියෙන්නේ. ඉතින් මෙන්න මේ වාගේ අධ්‍යාපන ඇමැතිවරුන් විසින් -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

හාමුදුරුවන්ගේ දානේ ගැන හරි කැක්කුම තියෙන්නේ සංඝයා වහන්සේලාගේ ඔළුවට වෙඩි තියපු කට්ටියට.

[සභාවේ ඝෝෂා]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මම කියන්නේ අද පුවත්පත්වල පළ වෙලා තිබෙන දේවල්. දැන් මේ මිනී -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පෝද්දර පේමාලෝක හාමුදුරුවෝ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හාමුදුරුවරුන්ට වෙඩි තියනකොට ඒවා නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පෝද්දර මුල්ලේ පේමාලෝක හාමුදුරුවන්ගේ ඔළුව කුඩු වෙන්න වෙඩි තියලා, ඇයි ගිනි තිබ්බේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. පොඩි කාලයක් තිබෙන්නේ. ආණ්ඩු පක්ෂයට කාලය තිබෙනවා. ඔබතුමා කථා කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මම කියාගෙන ගියේ මෙන්න මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අදහස් ප්‍රකාශ කරන්න දෙන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මෙන්න මේ වාගේ හිතන අධ්‍යාපන ඇමැතිවරයෙක් තමයි මෙවැනි අධ්‍යාපන වැඩ පිළිවෙළක් සකස් කරලා එවන්නේ. දෙමව්පියන් වියදම් කරන මුදලත් එකතු කරලා දැන් හදලා එවනවා, දළ දේශීය නිෂ්පාදිතයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අපි වෙන් කරනවා කියලා. ඒ විතරක් නොවෙයි. පසුගිය දවසක හෝමාගම මධ්‍යම මහ විද්‍යාලයේ උත්සවයක් පැවැත්තුවා. මම කිව්වේ, මධ්‍යම රජය ගන්න තීන්දු තීරණ සෘජුව හා වක්‍රව බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාගේ වැය ශීර්ෂය යටතේ බලපානවා කියලා. උත්සවයක් තිබ්බා. අඩුම තරමේ එතුමාට කල්පනා කරන්න තිබුණා, මේ දරුවන්ගේ විභාග දවසේ මේ උත්සවය පවත්වන්නේ. විභාගය දවසේ උත්සවය පවත්වමින් එතුමා විභාග කාල සටහන් පවා වෙනස් කරමින් දරුවෝ ටික උත්සවයට කැඳවා ගත්තා. තමන් ඉස්සරහා දරුවෝ ටික නටවන්න. මේ අධ්‍යාපන ඇමැතිවරයාට අඩු තරමින් මොළේ කළඳක් තිබුණා නම් ගරු සභාපතිතුමනි, මේ දරුවෝ නටවලා, ඒ දරුවෝ විභාගයට මුහුණ දෙන්නේ කොහොමද? අවසන් වාර පරීක්ෂණ විභාගය. මෙන්න මෙවැනි අධ්‍යාපන ඇමැතිවරු විසින් -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ළමයින් අරගෙන ගිහිල්ලා ඒ කාලේ කරපුවා හොඳයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

බස්නාහිර පළාත් සභාවේ ගරු ඇමැතිතුමා කිසියම් ප්‍රමාණයකින් මේ ප්‍රශ්න අවම කර ගන්න විශාල උත්සාහයක් දරනවා. මධ්‍යම රජය විසින් මේ කරන විලම්භිත ක්‍රියාවන් අවම කර ගන්න ඉතාමත් දැඩි උත්සාහයක යෙදෙනවා. අපි දන්නවා උපදේශක කාරක සභාව නියමිත පරිදි කැඳවලා ඒ (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කථා කරන්න දෙන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට වේලාව තියෙනවා. බාධා කිරීම් කරන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මගේ වෙලාව ඕනෑ ගරු සභාපතිතුමනි. විනාඩි 06 යි වෙන් වෙලා තියෙන්නේ.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඔබතුමාට වෙලා දෙන්නේ නැතුවට අපි මොනවා කරන්නද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අනෙක් එක මම ගරු ප්‍රධාන ඇමැතිතුමා අධ්‍යාපන විෂයය සම්බන්ධයෙන් දක්වන උනන්දුව ගැන කිව්වේ. (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කීදෙනෙක් මැරුවාද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

කට වහගෙන ඉන්න කෝ ගරු මන්ත්‍රීතුමා. මේ කියන දේ අහගෙන ඉන්න. මේ අවස්ථාවේදී ඒ නිලධාරී මණ්ඩලයට, ඒ කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා. මමත් නියෝජනය වන සමහර අමාත්‍යාංශවල උපදේශක කාරක සභාව පවත්වලා තියෙන්නේ මේ වර්ෂයට අවස්ථා තුනයි. බස්නහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ තිබෙන ඒ අමාත්‍යාංශය නියමිත පරිදි උපදේශක කාරක සභාව කැඳවලා තිබෙනවා. මට ගණන මතක නැහැ. ඒක තමයි කියන්නේ. අපි වැරැද්ද දකිනවා වාගේම, මෙන්න මේ මධ්‍යම රජයේ අලකලංචි අවම කර ගන්න එතුමාට උපදේශක කාරක සභාව ඇතුළේ මේක කරගන්න බැහැ. ඒකයි මම කියන්නේ. ගරු සභාපතිතුමනි මම කියාගෙන ආවේ, හෙක්ටර් බෙත්මගේ හිටපු ගරු ඇමැතිතුමා කියපු ප්‍රකාශය. ගගනගාමීන්, අජටාකාශගාමීන් හදන යුගයට යන්නේ. හැබැයි, අද පත්තරවල තිබෙනවා රටේ රේල් ගේට්ටු නැහැ. මට මතක හැටියට හරස් පාරවල් හයසිය ගණනක. දවස ගාණේ මිනිස්සු

මිය යනවා. අපි දන්නේ නැහැ ඊයේ මාතර රේල් පාරේදී මැරුණේ අර බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයේ ගගන ගාමීන් දෙදෙනෙක්ද කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ කාලේ බෙල්ල කපන්න -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඉන්න කෝ මන්ත්‍රීතුමා? අවශ්‍ය වුණොත් ආපහු කරන්නම්. එකහද?

[සභාවේ ඝෝෂා]

අපිව එතැනට ගේන්නද යන්නේ?

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මේ වාගේ බාධා කිරීම් කරනවා නම්, මේක ඇතුළේ ප්‍රජාතන්ත්‍රවාදය නැත්නම් -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාට අදාළ පුටුවට යන්න කියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඒක තමයි තුනට වැටුණේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

දෙකයි, දෙකයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

නැති වුණත් කමක් නැහැ. අපි එළියේ ඉන්නම්. 104 ම ගන්න කෝ? අපට ප්‍රශ්නයක් නැහැ. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒක තමයි කථා කරන්න දෙන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. ඒ වාගේම අනවශ්‍ය ප්‍රකාශ කරන්නත් එපා. මාතෘකාවට කථා කරන්න. ගැටුම් ඇති කර ගන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, ඊළඟ කාරණය හැටියට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විෂයයට අදාළව කථා කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අධ්‍යාපන විෂයය සම්බන්ධයෙන් කථා කරන්නේ. ගරු සභාපතිතුමනි, (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අපි කොහොමත් එකට වැඩ කරනවා. ඔබතුමාට පක්ෂයක් වත් නැහැ නේ? කෝ පක්ෂය? මට පිටකොන්දක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ගැටුම්වලට යන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මට පිටකොන්දක් තියෙනවා. මම ජනතා විමුක්ති පෙරමුණු පක්ෂයේ බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙක්. මොකක්ද පක්ෂය?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ සභාව ඉතාම සාමකාමීව ගෙනියන්න පුළුවන් මේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාට එළියෙන් ඉන්න කියන්න. එතකොට මේක හොඳට යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා දැන් බොහොම හොඳයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අපි දැන් පාසල් වැසී යාමේ තර්ජනයක් ගැන නිතරම කථා කරනවා. බස්නාහිර පළාත් සභාවේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නවලට ලබා දීපු උත්තරවල තිබෙනවා. 1996 බස්නාහිර පළාත් සභාව සතුව පාසල් 1455 ක් තිබුණා. හැබැයි, 2010 වනකොට පාසල් ප්‍රමාණය කීයද තියෙන්නේ? 1269 යි. ඒ බස්නාහිර පළාත් සභාවේ දීපු -

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒවා ඒකාබද්ධ කළා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඊළඟ ප්‍රශ්නය -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඇයි ගිනි තියපුවා?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, ඉතා අසාධාරණයක්. මෙන්න මේ විධියට බාධා කිරීම් මැද්දේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට වැඩිපුරත් කාලය දීලා තිබෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඉදිරිපත් කරන්න ඕනෑ, අත්‍යවශ්‍ය කාරණා ටිකක් තිබෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මගෙන් විනාඩියක් දෙන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

එපා. මට විපක්ෂයේ කාල වේලාවෙන් වෙන් කරලා දෙන්න. ගරු ප්‍රධාන ඇමැතිතුමාට කථා කරන්න තිබෙන වේලාව ගන්න එතුමාම.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමාගෙන් විනාඩි 02 ක් දෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, දැන් මම කියාගෙන ආවේ පාසල් 1269 දක්වා අඩු වෙලා තිබෙනවා. 1996 අවුරුද්දේ 1455 ක් තිබුණු පාසල් ප්‍රමාණය. හැබැයි ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් 2012 වර්ෂයේ ඉදිරිපත් කරපු අවසන් සංඛ්‍යා ලේඛන වාර්තාව අනුව වැඩිම ජනගහනය ඉන්න දිස්ත්‍රික්ක දෙක තමයි කොළඹ, ගම්පහ. දැන් ජනගහනය වර්ධනය වැඩි නම් - වර්ධනය බලාගන්න පුළුවන් මේ වාර්තාව ලබා ගත්තාම. ජනගහන වර්ධනය වැඩියි. පාසල් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ පනාවල පාසලේ එක ළමයයි. එක විදුහල්පතිවරියයි කියලා -

**ගරු කාමල් කුරුප්පු**
Hon. Karmal Kuruppu

ඒක වැහුවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මම හිතන්නේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා පළාත් සභාවෙත් කථා වුණා. මේක ලංකාදීප පුවත්පතෙත් වාර්තා වෙලා තිබුණා. එක ළමයයි -

**ගරු කාමල් කුරුප්පු**
Hon. Karmal Kuruppu

ඒ පාසල වහලා ඉවරයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒක තමයි මම කියන්නේ. ඒවා තමයි වහලා තියෙන්නේ. ඒක තමයි මම කියන්නේ. ඇයි පාසල් වැහුවේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ළමයි එන්නේ නැත්නම් මොනවා කරන්නද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

දැන් -

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, ඒ වාගේම පළාත් පාලන විෂයය යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට උත්තර දෙන්න වෙලාවක් දෙන්නම්.

**ගරු කාමල් කුරුප්පු**
Hon. Karmal Kuruppu

කලාපේ පාසලක් ගැන කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය බාධා කිරීම් කරන්න එපා ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට කාලය අවශ්‍ය නම් ආණ්ඩු පක්ෂයෙන් ඉල්ල ගන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, පළාත් පාලන විෂයය යටතේ -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එහෙම නම් ලංකාදීප පත්තරේට නඩු දාන්න බොරු කියනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට උත්තර දෙන්න කාලය දෙන්නම්.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, පළාත් පාලන විෂයය යටතේ මොරටුව නගර සභාවේ දිගටම කෙරීගෙන යන සහ පසුගිය කාලයේ වුණු විශාල මූල්‍ය වංචාවක් පිළිබඳව මම උපදේශක කාරක සභාවටත්, මේ සභාවටත් ඉදිරිපත් කළා. මොරටුව මහ නගර සභාවේ විදේශ සංචාරයකට ගියා. සම්පූර්ණයෙන්ම මුදල් රෙගුලාසි කඩා බිඳ දාලා රුපියල් ලක්ෂ 49 ක් වැය කළා විදේශ සංචාරයට. අපි විදේශ සංචාරවලට විරුද්ධ නැහැ. හැබැයි, මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුව තිබෙනවා. පසුව ගුවන් යානා ප්‍රමාදය නිසා කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

විනාඩියක් දෙන්න. ගුවන් යානා ප්‍රමාද නිසා තවත් අමතරව රුපියල් 150,000 ක් ගත්තා මේ පරීක්ෂණය යන අතරතුරේ. ඒ වාගේ සභාව නොසලකා හරිමින්, සභා ආවරණ අනුමැතියට යටත්ව කරන ගෙවීම් ඉතාමත් අක්‍රමිකතාවන්වලට මුල පාදා තිබෙනවා ගරු සභාපතිතුමනි. සේවක ආපදා ණය මාසයකට ලක්ෂ 13 ක මුදලක්, සේවක ආපදා ගිණුමට බැර කරලා එවන්න ඕනෑ. හැබැයි, තවමත් බැර කරලා නැහැ. මේක දුන්නේ, මොරටුව මහ නගර සභාවේ ජනතා විමුක්ති පෙරමුණේ නාගරික මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොපමණ තිබුණාද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

තව තියෙනවා. ඔබතුමාට අවශ්‍ය නම් දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මූල්‍ය රෙගුලාසි උල්ලංඝණය කිරීම වෙනුවෙන් පළාත් පාලන ආයතන පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරන්න කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 12.21 ]

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

ගරු සභාපතිතුමනි, මම ඉතාමත් සන්තෝෂ වෙනවා, අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ අධ්‍යාපන විෂයය සම්බන්ධයෙන් කථා කරන්න මට අවස්ථාව ලැබීම ගැන. මොකද, ගාමිණී තිලකසිරි හිටපු ගරු ඇමතිතුමා සඳහන් කළා වාගේ ඉතාම සන්තෝෂයෙන් තමයි මේ විෂයයට සම්බන්ධ වෙන්නේ. ඒ වාගේම අපේ රෙහෙන්සිරි වරාගොඩ මන්ත්‍රීතුමා සඳහන් කළා, තමන්ගේ දිස්ත්‍රික්කයේ මහ ඇමැතිතුමා ඉන්න එක සම්බන්ධයෙන් එතුමා සන්තෝෂයෙන් කථා කරනවා කියලා. මමත් මහ ඇමැතිතුමා කළුතර දිස්ත්‍රික්කයේ නැතිවීම

සම්බන්ධයෙන් සන්තෝෂයෙන් තමයි මේ කථාව කරන්නේ. මොකද, මම එහෙම කියන්නේ මහ ඇමැතිවරයෙක් නැතිවීම නිසා අපට ලැබෙන සම්පත් ප්‍රමාණය අතිවිශාල වෙලා තිබෙනවා. ඒ පිළිබඳව මම සන්තෝෂ වෙනවා. ඒ වාගේම අපේ මහ ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. (බාධා කිරීමක්) පරණ අය ගැන අපි කථා කරන්නේ නැහැ. අපි වර්තමානය ගැන කථා කරන්නේ. මොකද, අපි දැකපු ඉතිහාසයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ හොඳම කාලය මේ කාලය කියලා තමයි පුද්ගලිකව මම විශ්වාස කරන්නේ. මම විශ්වාස කරන්නේ පුද්ගලිකව මේ කාලය කියලා. මම එහෙම සඳහන් කරන්නේ හේතු සාධක ඇතිව. අපි මේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට සුදු හුණු ගානවා නොවෙයි. නමුත් කරපු වැඩ කොටස, අපට දීපු සම්පත් ප්‍රමාණය, අපට දීපු දේ ගැන අපි සඳහන් කරන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, මේ කාලය තුළ පාසල් වැසී යනවා කියලා. අපි එතුමාට සඳහන් කරන්න ඕනෑ. බණ්ඩාරගම ආසනයට එන්න. බණ්ඩාරගම ආසනයේ වැහිලා තිබුණු පාසල් හතරක් ඇරියේ ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ කාලයේදී කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ඒ සඳහා සම්පත් දුන්නේ එතුමා. ඒ වාගේම ඔබතුමාට මතක් කරන්න ඕනෑ. අපි හෙට අනිද්දා අලුත් මුස්ලිම් පාසලකුත් ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ කාලයේදී ආරම්භ කරනවා කියන එක. මේ කටයුත්තේදී ලොකු සහයෝගයක් ලබා දෙනවා අපට -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. එතුමා මගේ නම සඳහන් කරලා කියපු නිසා. මම ඉදිරිපත් කළේ ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවෙන් ඉදිරිපත් කරපු හැන්සාඩ් වාර්තාව අනුව තමයි.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා දැන් වාඩි වෙන්න කෝ? ඔබතුමාගේ කථාව අහගෙන හිටියා නේ? දැන් වාඩි වෙන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

හරි, හරි. වාඩි වෙන්නම්. ඔබතුමාට -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමාගේ අවස්ථාව නොවෙයි. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඔබතුමා කොහොමද මට කියන්නේ වාඩි වෙන්න කියලා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

වාඩි වෙන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඔබතුමා කවුද මට වාඩි වෙන්න කියන්න? ඔබතුමාගේ ඇමැතිකම ඔබතුමා තියා ගන්න. ඔබතුමා කවුද මට වාඩි වෙන්න කියන්න?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා දෙපැත්තෙම අය නිශ්ශබ්ද වෙන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා වාඩි වෙන්න කෝ?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඔබතුමා ඇමැති. මම මන්ත්‍රීවරයෙක්. ඔබතුමා කියන්න ඕනෑ නැහැ. මම සභාපතිතුමා කිව්වොත් වාඩි වෙනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා නිශ්ශබ්ද වෙන්න. අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ප්‍රධාන ඇමැතිතුමාට ගරු කරනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ඇමැතිකමේ ගෞරවය තියාගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාමත්ම කාරුණිකව ඉල්ලා සිටිනවා. පෞද්ගලික දෝෂාරෝපණවලට යන්න එපා. එහෙම වුණොත් මේ සභාව කරගෙන යන්න බැහැ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමා එතුමාට අපහාස කළේ නැහැ. එතුමා ඉතාමත් හොඳ කථාවක් කළේ. මෙතුමා මුළු කථාවම විවේචනය කරලා, එතුමාගේ හොඳ කථාවටත් මෙතුමා බාධා කරනවා නම් ඒ මන්ත්‍රීවරයාගේ වරප්‍රසාද තත්ත්වය මොකක්ද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මම ඉදිරිපත් කළේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට, මෙතුමා මුකුත් කිව්වේ නැහැ. නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

ගරු සභාපතිතුමනි, ඇත්තටම මම කනාගටු වෙනවා. මොකද, පාසල් හතරක් ඇරලා අලුත් පාසලක් දානවා කියනකොට තුණ්ඩු කෑල්ලෙන් පාසල් වහපු අයට මේක ඉවසන්න බැහැ. මම ඒක දන්නවා. ඒ නිසා අපි මේ හොඳ දේ ගැන කථා කරන්නේ. ඒක අහගෙන ඉඳලා ඔබතුමන්ලා අපට උත්තර දෙන්න කියන ඉල්ලීම අපි කරනවා. මේකේදී ගරු සභාපතිතුමනි මම සඳහන් කරන්න ඕනෑ, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. අපේ පාසල් පද්ධතියට පමණක් - මම කථා කරන්නේ පාසල් පද්ධතිය ගැන පමණයි. පාසල් පද්ධතියට බොහොම විද්‍යානුකූල අධ්‍යාපනයක් ලබා දෙමින්, ඊළඟට භෞතික සම්පත් අතිවිශාල ප්‍රමාණයක් ලබා දීලා, ඒ වාගේම ගුරු හිඟයට සාර්ථක පිළියම් දීලා පළාතේ අධ්‍යාපනය දියුණු කරමින් පවතිනවා. භෞතික සම්පත් ලබා දෙනකොට ඒ භෞතික සම්පත් නියමාකාරයෙන්, නියම පාසල්වලට නියම විධියට, නියම වෙලාවට, නියම තැනට - ඒ කියන්නේ වහලේ හදන්න ඕනෑ නම් වහලය හදන එකට. තාප්පේ හදන්න ඕනෑ

[ ගරු නිමල් චන්ද්‍රරත්න ]

නම් තාප්පේ හදන එකට. එහෙම නැත්නම් අනෙකුත් අඩුපාඩුවක් හදන එකක් තිබෙනවා නම්, ඒ අවශ්‍ය විධියට භෞතික සම්පත් ලබා දීලා කටයුතු කළා වාගේම ඒ භෞතික සම්පත් නියමාකාරයෙන් වියදම් වෙනවාද කියලා සැරෙන් සැරේට ප්‍රගති සමාලෝචන රැස්වීම් තියමින් ඒ වියදම් සියයට සියයක් සම්පූර්ණ කරන්න ගරු ප්‍රධාන ඇමැතිතුමා කටයුතු කළා. ඒ පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඊළඟට ක්‍රමවත්ව අපට මුදල් ලබා දුන්නා. ඒ පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. මම තමුන්නාන්සේලාට සඳහන් කරන්න යන්නේ, මේ සුපසන් නිම්තෙර වැඩ සටහන සම්බන්ධයෙන්. සුපසන් නිම්තෙර වැඩ සටහන සම්බන්ධයෙන් දේශපාලඥයින් හැටියට අපෙන් නොවෙයි ප්‍රශ්න කරන්න ඕනෑ. ඒක විදුහල්පතිවරුන්ගෙන් අහන්න. ඒක දෙමව්පියන්ගෙන් අහන්න. ඒක දරුවන්ගෙන් අහන්න. ඒ දරුවෝ සාක්ෂි දරාවි බස්නාහිර පළාත් සභාවේ මේ සුපසන් නිම්තෙර වැඩ සටහන කොපමණ සාර්ථක වැඩ සටහනක්ද කියලා.

ඊළඟට මම තමුන්නාන්සේලාට සඳහන් කරන්න ඕනෑ. මහින්ද චින්තනය යටතේ ද්විතීයික පාසල් වැඩ සටහන. බන්දුල ගුණවර්ධන ගරු ඇමැතිතුමාගේ වැඩ සටහනක් යටතේ ද්විතීයික පාසල් වැඩ සටහන නිසා බස්නාහිර පළාත් සභාව නියම ප්‍රයෝජන අරගෙන තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. ඒ සඳහා ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා බොහොම සහජීවනයෙන්, ජවයක් ඇතිව අපට සහයෝගය ලබා දෙනවා. ඒ නිසා තමයි වැසුණු පාසල් හතරක් අපට ඇරලා, අලුත් පාසලකුත් අරින්න අපට අවස්ථාව හම්බ වුණේ. මම තමුන්නාන්සේලාට සඳහන් කරන්න ඕනෑ, බණ්ඩාරගම ආසනයේ කැටගොඩ කණිෂ්ට විද්‍යාලය, බටගොඩ කණිෂ්ට විද්‍යාලය, ඉඹුල්හේන ප්‍රාථමික විද්‍යාලය, ලෝකවිල ලක්ෂ්මී විද්‍යාලය කියන විද්‍යාල හතරම අද ළමයින්ගෙන් පිරුණු පාසල් හැටියට අපට ආරම්භ කරන්න ලැබුණේ, මේ අධ්‍යාපන ක්‍රමය නිසා කියන එක අපි සඳහන් කරන්න ඕනෑ. ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා දන්නවා අටළුගම ප්‍රදේශයේ අද තදබදය වැඩියි. එහි අලුතින් පාසලක් සඳහා අටළුගම මුස්ලිම් ජනතාව ලක්ෂ 500 ක් විතර වටිනා පර්චස් 300 ක වාගේ ඉඩමක් අටළුගම ප්‍රදේශයේ ජනතාව මිලදී අරගෙන ගිය බ්‍රහස්පතින්දා ගරු ප්‍රධාන ඇමැතිතුමාට පරිත්‍යාග කළා. ලබන අවුරුද්දේ අපි අලුත් මුස්ලිම් පාසලක් ආරම්භ කරන්න කටයුතු කරලා තිබෙනවා. මේ අධ්‍යාපන ක්ෂේත්‍රයට මේ මහින්ද චින්තනය යටතේ ජාතික අධ්‍යාපනය යටතේත්, ඒ වාගේම පළාත් සභාව හැටියටත් විශේෂයෙන්ම මේ පාසල් අපට අරින්න හම්බ වෙන්නේ නැහැ, ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමා උදව් කළේ නැත්නම්. මොකද, චින්තනය මහින්ද චින්තනය වුණාට, බන්දුල ගුණවර්ධන ඇමැතිතුමාගේ ක්‍රමය වුණාට ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා මුදල් ලබා දීපු නිසා තමයි අපට මේ පාසල් අරින්න අවස්ථාව ලැබුණේ.

ගරු සභාපතිතුමනි, මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අවසාන වශයෙන් ඔබතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මම එක යෝජනාවක් කරන්න කැමැතියි. ඔබතුමා දන්නවා මේ ප්‍රාථමික අංශයේ දරුවන්ට උදේ ආහාර වේල මේ ආණ්ඩුවෙන් සපයනවා කියලා. උදේ 07.30 ට 08.00 ට තමයි මේ ආහාර වේල සපයන්නේ.

ඊළඟට 100 ට වැඩි පාසල්වලටත් මේ ආහාර වේල සපයනවා. උදේ 07.30 ඉඳලා 08.00 වනකල් තමයි ඒ දරුවන්ට විවේක කාලය දීලා ආහාර සපයන්නේ. නියමිත වෙලාවට. නමුත්

තමුන්නාන්සේ දන්නවා මේ දරුවෝ සමහර වෙලාවට ගෙදරින් එන්නේ, පාන්දර 05.00 ට. සමහර වෙලාවට ගෙදරින් එන්නේ පාන්දර 04.00 ට. ගුරුවරයා සමහර වෙලාවට ගෙදරින් එන්නේ උදේ 06.00 ට. නැත්නම් පාන්දර 04.00 ට 05.00 ට. අරවාට අයිති වෙන්නේ නැති ගුරුවරයාට සහ දරුවාට විවේකය තිබෙන්නේ, උදේ 10.30 ට. මේක ක්‍රමවත්ව කරන්න පුළුවන්ද කියන කාරණය මම දන්නේ නැහැ. මගේ යෝජනාවක් හැටියට තමුන්නාන්සේ මගින් මම ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඉදිරිපත් කරනවා. අර දරුවාට, ගුරුවරයාට ඇවිල්ලා උදේ කෑම ගන්න වෙන්නේ 10.30 ට. උදේ 08.00 ට 08.30 විතර දුව දුව තමයි කෑම ගන්නේ. දරුවෝ දුව දුව කෑම ගන්නේ. ගුරුවරයා දුව දුව කෑම ගන්නේ. ඒ නිසා ඔබතුමා මාර්ගයෙන් මම ගරු ප්‍රධාන ඇමැතිතුමාට යෝජනා කරනවා. උදේට විනාඩි 10 ක් හෝ විවේක කාලයක් වෙන් කරන්න පුළුවන් නම්, ඒක ප්‍රයෝජනවත් වෙයි කියලා මම විශ්වාස කරනවා. මේ කාරණය ඔබතුමන්ලා සොයා බලන්න. අපි සමහර වෙලාවට යනකොට ගුරුවරයා මේසේ උඩ තියාගෙන කෑම කනවා. සමහර විට දරුවා හොරෙන් කෑම කනවා. ගුරුවරයා හොරෙන් කෑම කනවා. ඒ නිසා මේකට පිළියමක් හැටියට උදේ විනාඩි 10 ක වේලාවක් වෙන් කරන්න කටයුතු කරන්න කියන යෝජනාව කරනවා. මම දීර්ඝව කථා කරන්නේ නැහැ. මේ අධ්‍යාපනය ක්‍රමය වෙනුවෙන් විශේෂයෙන්ම බණ්ඩාරගම ආසනයේ කොට්ඨාශ වෙනුවෙන් මුළු පාසල් ප්‍රමාණය 41 ක් තිබෙනවා. සිංහල පාසල් 38 යි. ද්‍රවිඩ පාසල් 02 යි. මුස්ලිම් පාසල් 01 යි. අනෙක් පාසලත් එකතු වුණාම මුස්ලිම් පාසල් 02 ක් වෙනවා. මේ පාසල් පද්ධතිය සඳහා ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපි වෙත දීපු සහයෝගය සම්බන්ධයෙන් බණ්ඩාරගම ජනතාවගේ විශේෂ ස්තුතිය පුද කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.32 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම ඉතාමත් නිශ්ශබ්දව කථා සියල්ලම අහගෙන හිටියා. ඉතින් මම බලාපොරොත්තු වෙනවා, මේ සභාවේ අනෙකුත් ගරු මන්ත්‍රීවරුත් මට කථා කරන්න ඒ වාගේම අවස්ථාවක් ලබා දෙයි කියලා. ගරු සභාපතිතුමනි, අද මහ ඇමැතිතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ කිහිපයක් තිබුණත් හැකිතාක් අන්දමින් අධ්‍යාපනයට පමණක් සීමා කරන්න මම බලාපොරොත්තු වෙනවා. ලැබිලා තිබෙන කාල වේලාව නිසා. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, අපේ ආණ්ඩු පක්ෂයේ සහෝදර මන්ත්‍රීවරු හැම තිස්සේම කියනවා කියන්නේ, නරක විතරයි කියලා. අපට බණින එක විතරයි කියලා. හැබැයි විනාඩි 10 ක් ඇතුළත තිබෙන නරක ටික ඔක්කෝම කියලා, හොඳ කියන්න ඉඩ මදී. ඒක නිසා ඔබතුමන්ලා වැඩි කාලයක් ගන්නේ නැතුව අපට ඊට වැඩිය වැඩි කාලයක් ලබා දෙනවා නම් ඔබතුමන්ලාගේ තිබෙන හොඳ ටිකත් කියන්න අපි ලැහැස්තියි. ඒ නිසා හොඳ අහගන්න ඕනැ නම් අපට ටිකක් වැඩිපුර කාලය දෙන්න.

ගරු සභාපතිතුමනි, මම කිසිම ඇමැතිවරයෙකුගේ පස්සේ ගිහිල්ලා කිසිම දෙයක් ඉල්ලාගෙනත් නැහැ. ඉල්ලලාත් නැහැ. ඉල්ලන්න බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. ඒ නිසා මම කාටවත් ණයත් නැහැ. භයත් නැහැ. ඒක නිසා මට ඕන දේ මට කියන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම කියන්න ඕනැ. අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඊයේ කිව්වා, මගේ පියා අවුරුදු 36 ක් පාර්ලිමේන්තුවේ ඉඳලා ජා-ඇළ පාසල්වලට මොනවාද කළේ කියලා. මම එතුමාට ඉතාමත් කෙටියෙන් මතක් කරලා දෙන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, ඒකල, ජී.බී. සේනානායක මහ විද්‍යාලය හැදුවේ මගේ පියා. එතුමා අද ජීවත් වෙලා ඉන්න ප්‍රදේශයේ රාගම බැසිලිකා මහ විද්‍යාලය හැදුවේ මගේ පියා. ඒ වාගේම දඬුගම්පේරුවේ හෝලි රොසරි එක හැදුවේ මගේ පියා. ඒ වාගේම කදානේ ශාන්ත සෙබස්තියන් මහ විද්‍යාලය හැදුවේ මගේ පියා. ඒ විතරක් නොවෙයි. ඒ සෑම විදුහලකටම ක්‍රීඩා පිටියකුත් දුන්නා. ගරු සභාපතිතුමනි, මීට අමතර ක්‍රීඩා පිටි නැති පාසල්වලට -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

හැබැයි, ඔක්කෝම හදලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතැනට එන්නම්. ඉන්න. එතැනට එනවා. ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. පාසල් බහුතරයකට නැති වෙලා තිබුණු ක්‍රීඩාංගණත් ලබා දුන්නා. ගරු සභාපතිතුමනි දැන් මෙතුමා කිව්වා, වතුර දුන්නේ නැහැයි කියලා. එතුමා ඊයේ කථාවේදීත් මට අභියෝග කළා, මමත් අභියෝග කළා ඉල්ලා අස්වෙන්න මමත් කැමැතියි කියලා. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට එක කාරණයක් මතක් කරලා දෙනවා. දැනුත් කිව්වා. එතුමා වතුර දුන්නේ නැහැයි කියලා. ගරු සභාපතිතුමනි, එක කාලයක් තිබුණා, ගමක් හදද්දී පාර හැදුවේ බොරළු දාලා. එතකොට ඒක නිකම් රාජධානියක් වාගේ ඒ කාලයේ පිළිගත්තේ. හැබැයි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා තවම ඉන්නේ, ඒ ආදි කාලේ. එතුමා හිතන්නේ පාසලට ළිඳක් තිබෙනවා නම්, ඒක හරි කියලා. එතුමාගේ සංකල්පය ළිඳ තිබෙනවා නම් ළිඳෙන් ඇඳගෙන නාගන්න පුළුවන්. එතුමා හැමදාම ජා-ඇළ ආසනයේ ඇමැතිවරයාගෙනුත් ඉල්ලගෙන නාගන්නවා. ඔය වාගේම තමයි ඇඳන් නාගන්නේ. මම ඊට වැඩිය එතුමාට උත්තර දෙන්න යන්නේ නැහැ. මම අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට ලැබිලා තිබෙන ලිපි ගොඩක් තිබෙනවා. මම මේකෙන් කිහිපයක් ඔබතුමාට දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාගත කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජල නල පහසුකම් ඉල්ලලා එවපු ලියුම්. ගරු සභාපතිතුමනි, අදටත් කණුවන ශාන්ත ජෝශප් විද්‍යාලයේ ජල නල පහසුකම් නැහැ. ඒකට ටැංකියක් දුන්නෙත් මම. හෝලි රොසරි විද්‍යාලයට වතුර සඳහා ටැංකිය දුන්නෙත් මම. වැල්ලවීදියේ මෙතුමා ඉන්න ප්‍රදේශයේ පාසලටත් ජල පහසුකම් සඳහා රුපියල් 50,000 ක් දුන්නා. ඉතින් මෙතුමන්ලා මොන ලෝකේ ඉඳලා කථා කරනවාද මම දන්නේ නැහැ. ඒ වාගේම මම කියන්න ඕනෑ. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉතාමත්ම වැදගත් -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

චරිතවත්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

චරිතවත්. ඒකත් කියන්න ඕනෑ. වැදගත් චරිතවත් හොඳ දේශපාලන පවුලකින් එන හොඳ ඇමැතිවරයෙක්. ඒක මම කියන්න ඕනෑ. නමුත් එතුමාගේ වටේ ඉන්නවා, ඒ කියපු දේවල්වලින් භාගයක්වත් නැති -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද? කවුද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සමහර ඇමැතිවරු, අධීක්ෂණ මන්ත්‍රීවරු. ඉතින් ඒ ආභාසය පොඩ්ඩක් ඇඟේ ගැවිලාද මන්දා එතුමාත් ඊයේ කොළ මිටියක් අරගෙන මාව පෙන්නලා කිව්වා, මෙතුමා කිසිම පාසලකට ශත පහක්වත් දීලා නැහැයි කියලා. මම හිතුවා, එතුමා වගකීමෙන් ඒක ප්‍රකාශ කෙරුවේ කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

2012 දී.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

2012 දී. මම එතුමාට මතක් කරන්න කැමැතියි. බටුවත්ත කණිෂ්ට විද්‍යාලයට මම ලක්ෂයක් දුන්නා. ඒ විද්‍යාලයට ඒකෙන්
[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

Photocopy යන්ත්‍රයක් අරගෙන තිබුණා. ඔය එකයි මම කියන්නේ. ඉතුරු ටික ඔබතුමාට අර කියපු කට්ටියගෙන් (බාධා කිරීම්)

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ජා-ඇළට තව මොනවාද කළේ? Photo Copy මැෂින් එකද දුන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම මෝඩයා, හරකා, බූරුවා, බල්ලා කියන මිනිස්සුන්ට ප්‍රතිචාර දක්වන්න යන්නේ නැහැ. ඒක මගේ පරිසරයේ තිබෙන දෙයක් නොවෙයි. ඒ නිසා මගේ පරිසරය අනුව මම මගේ කථාව කරගෙන යන්නම්. ගරු සභාපතිතුමනි, ඒ වාගේම ජා-ඇළ -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. පළාත් සභා අරමුදලින්ද, ඔබතුමාගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන්ද කළේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පළාත් සභා අරමුදලින්. ගරු සභාපතිතුමනි, ඒ වාගේම මේ අවුරුද්දේ -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ජා-ඇළට Photocopy යන්ත්‍රයක් විතරද දුන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා පොඩ්ඩක් ඉන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මීට අමතරව මම දුන්නු දේවල් ලිස්ට් එකක්ම තිබෙනවා. ඒකත් මම දෙන්නම් එතුමාට අවශ්‍ය නම් - මම කඩේ යන මිනිස්සුන්ට දෙන්න කැමැති නැහැ. මහ ඇමැතිතුමාට ඕනෑ නම්, පෞද්ගලිකව හම්බ වෙලා මේක පෙන්වන්න මම කැමැතියි. අහල පහළ කඩේ යන මිනිස්සුත් එක්ක මගේ ගණුදෙනු නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාගත කරන්න. අපි මහ ඇමැතිතුමාට ලබා දෙන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක නිසා ගරු සභාපතිතුමනි, අර කිව්වා වාගේ මහ ඇමැතිතුමා ඉතාමත්ම හොඳ දක්ෂ ඇමැතිවරයෙක්. වැදගත් පවුලකින් ආපු ඇමැතිවරයෙක්. ඒක ගැන මම සතුටු වෙනවා. ඒත් එක්කම මම සතුටු වෙනවා, එතුමා මේ අයවැයෙන් දහම් පාසල් සංවර්ධනය සඳහා මුදලක් වෙන් කරලා තිබෙනවා.

ඒ ගැනත් විශේෂයෙන්ම මම සතුටු වෙනවා. මමත් දහම් පාසල් බහුතරයකට සල්ලි දීලා තිබෙනවා. ජා-ඇළ, මීගමුව විතරක් නොවෙයි. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ දහම් පාසල්වලට මම සල්ලි වෙන් කරලා තිබෙනවා. ඒක නිසා සමහර වෙලාවට අර කියන දේ අහලා ඔබතුමා - සමහර නායකයන්ව නොමඟ යවනව නේ? එක එක කථා කියලා. ගරු මහ ඇමැතිතුමාවත් ඒ වාගේ නොමඟ යවන්න කට්ටිය බලාගෙන ඉන්නවා. මම දන්නවා.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

මන්ත්‍රීතුමා, ඔබතුමා දහම් පාසල්වල උගන්වන්නත් යන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා නොමඟ යන්න එපා. අහල පහළ කට්ටිය බිරුවාට කඳු කඩාගෙන වැටෙන්නේ නැහැ. ඒ නිසා ඔය බුරුන බල්ලෝ හැමදාම හපා කන්නෙත් නැහැ. ඒ නිසා අපි භය නැහැ. ගරු සභාපතිතුමනි, අපි අධ්‍යාපනය ගැන කථා කරද්දී සමහර කට්ටියට ටිකක් වේදනයි.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ලංකාවේදී අධ්‍යාපනය ලැබුවේ නැහැ නේ? කෝ සහතික පෙන්නන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

සහතික පෙන්නන්න. ඔබතුමා අධ්‍යාපනය ගැන නේ කථා කරන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, සහතිකයෙන් අධ්‍යාපනය මනින්න බැහැ. හැබැයි තමුන්ගේ මුඛයෙන් අධ්‍යාපනය හොඳට මැන ගන්න පුළුවන්. මෙතුමාගේ මුඛයෙන් පිට වෙන්නේ - දෙකේ පන්තියටත් ඉගෙන ගත්තේ නැති කෙනෙකුගේ වචන තමයි ඔය මුඛයෙන් පිට වෙන්නේ. ඒක හොඳට මතක තියාගන්න. තමුන්නාන්සේ තමුන්නාන්සේගේ මුඛය පරිස්සම් කර ගන්න. තමුන්නාන්සේගේ වැඩ වාගේම කටත් පරිස්සම් කර ගත්තොත් තමුන්නාන්සේගේ ගැනත් හොඳ දේවල් ටිකක් කියන්න අපි භය නැහැ. ඒක නිසා ඔක්කෝටම ඉස්සෙල්ලා ඔය ජරා කට නවත්ත ගන්න.

ගරු සභාපතිතුමනි, මහ ඇමැතිතුමාගේ වැය ශීර්ෂය යටතේ විශාල කොටසක් තිබෙනවා. මේ මන්ත්‍රීවරුන්ව විදේශ සංචාරවල යවනවා. හැබැයි තවමත් ගරු සභාපතිතුමනි, සමහර කට්ටියට විදේශගත වෙලත් කථා කරන භාෂාවවත් හසුරුවා ගන්න බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. මේ පළාත් සභාව ගැන බලද්දී ඒක ඉතාමත් කනගාටුවට කරුණක්. පත්තරවල එක පාරක් නොවෙයි, දෙතුන් පාරක්ම වාර්තා වුණා. සමහර අයගේ කථා විලාසය ගැන. ඒ නිසා ඉතාමත් කනගාටු වෙනවා. අර නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ හැම පාසලකම බැලුවාලු. මගේ නම තිබුණේ නැහැයිලු. ඉතින් ඒ වාගේම කට්ටය තමයි අද අධ්‍යාපනය නිරීක්ෂණයට දාලා තියෙන්නේ. නමක්වත් හොයා ගන්න බැහැ. අද නිරීක්ෂණ මන්ත්‍රීවරුන්ගේ රාජකාරිය මොකක්ද? ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ -

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

විශේෂ අධ්‍යාපන එකේ තිබුණා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැනුවත් කිරීම පිණිස මම කියන්න කැමැතියි. අද නිරීක්ෂණ මන්ත්‍රීවරු හැටියට පත් කරලා එතුමා වගකීමෙන් කිව්වා එහෙම එකක් නැහැයි කියලා. නමුත් මම කියනවා තිබෙනවා කියලා. දැන් නම් මාරු කරලා ඇති. අධීක්ෂණ මන්ත්‍රී කියලා. හැබැයි අද මේ අධීක්ෂණ මන්ත්‍රීවරු කියන අය අධ්‍යාපනයට මොනවද කරන්නේ? අද අධීක්ෂණ මන්ත්‍රීවරු කරන්නේ අධ්‍යාපනයේ පරිපාලනය තමන්ගේ අතට අරගෙන - අද නිරීක්ෂණය කියන වචනයේ තේරුම දන්නේ නැති කට්ටියව මේ වාගේ තැන්වලට දාපුවාම වෙන්නේ ඕනෑ ඔය දේ තමයි. අද පළාත් සභා මන්ත්‍රීවරුන්ව, නිරීක්ෂණ මන්ත්‍රීවරු විධියට පත් කරලා ඉන්නේ, අධ්‍යාපනය ගැන, පාසල් ගැන සොයා බලලා පාසල්වල අඩුපාඩු ලබා දෙන්න මිසක්, ගුරුවරුන් මාරු කරන්නවත්, එහෙම නැත්නම් තමන්ට ඕනෑ විධියට කොට්ඨාශ කළමනාකරුවන් මාරු කරන්නවත්, ඒ අයව තමන්ගේ ගෙදරට ඕනෑ ඕනෑ වේලාවට ගෙන්න ගන්නවත් නොවෙයි. ඒක තමයි ගරු සභාපතිතුමනි, O/L, A/L විශ්ව විද්‍යාල ගියා කියලා කොළයක් තිබුණාට වැඩක් නැහැ. ඒකට ගිහිල්ලා තමන් අධ්‍යාපනය හදාරලා හැසිරෙන්නත් ඉගෙන ගන්න ඕනෑ. අන්න ඒක තමයි තිබෙන වෙනස. මේ අයට නැත්තේ ඒක. ඒක තමයි මෝඩයෝ වාගේ කෑ ගහන්නේ. ඒක නිසා ගරු මහ ඇමැතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. පාසල් පද්ධතිය විනාශ කරන්න හදන්න එපා. අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් පත් කරනවා නම් දැනුමක් තිබෙන හොඳ මන්ත්‍රීවරයෙක් පත් කරන්න. ඒ වාගේ කට්ටියත් මේ සභාවේ ඉන්නවා. ආණ්ඩු පක්ෂයේත් ඒ වාගේ කට්ටිය ඉන්නවා. පාසල් විනාශ කරන, දේශපාලනීකරණය කරන මන්ත්‍රීවරුන්ව අයින් කරලා වැදගත්, උගත් වැඩක් කරන්න පුළුවන් මන්ත්‍රීවරයෙක්ව පත් කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[ අ.භා. 12.46 ]

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් කථාවක් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට මාගේ අවංක ආදර ස්තුතිය පුද කරනු ලබනවා. මා බලාපොරොත්තු වුණා, මට ප්‍රථම කථා කළ අපි ගරු කරන ජෝශප් මයිකල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ පුත්‍රරත්නය ඉතාම සාරගර්භ, හොඳ වැදගත් අධ්‍යාපනය වෙනුවෙන් හොඳ කථාවක් කරයි කියලා. නමුත් එතුමා ආවේගශීලීව කිසිම හරයක් නැති කථාවක් ප්‍රකාශ කළා. ඒ එක්කම ජනතා විමුක්ති පෙරමුණේ අපේ ගරු මන්ත්‍රීතුමා මීට ප්‍රථම කථා කළා. දැන් මේ අවධියේදී එතුමාගේ අධ්‍යාපන කාලසීමාව තුළ පාසල් වැසී යන තත්ත්වයක්. නමුත් මම එතුමාට ප්‍රකාශ කරන්න කැමැතියි, පාසල් වැසී යන තත්ත්වයක් තිබුණා. ඔබතුමන්ලාගේ යම්කිසි පාලන සමයක් තුළ එක තුණ්ඩු කැබැල්ලකින් පාසල් වසලා, කඩ සාප්පු වැසී යන යුගයක් තිබුණා. නමුත් අද මේ අධ්‍යාපනයේ ස්වර්ණමය කාලය, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කාලය වශයෙන් මම ප්‍රකාශ කරන්න කැමැතියි. එතුමා පාසලේ ළමුන්ට පමණක් නොවෙයි. සැමට අධ්‍යාපනයක් යන තේමාව තුළ ඉඳගෙන අද මේ අයවැය ලේඛනය ඉදිරිපත් කරලා තියෙනවා. සැමට අධ්‍යාපනය මේ රට තුළ ව්‍යාප්ත කළ යුතුයි කියන තේමාව තුළ ඉඳගෙන ඉතාම වැදගත් අයවැයක් මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය ඉතාම වැදගත් අමාත්‍යාංශයක් වුණත්, මේ අධ්‍යාපනය නිසා මේ අමාත්‍යාංශය තුළින් ජනතාව අතරට ගිහිල්ලා ජනප්‍රිය වීමට නොහැකියාවක් තිබෙනවා. අපට මතකයි. මේ රටේ නිදහස් අධ්‍යාපනය ඇති කරපු කන්නන්ගර මැතිතුමා පවා බැනුම් ඇහුවා. අවසානයේ එතුමා පරාජයට පත් වුණා. අන්න එවැනි අමාත්‍යාංශයක් ඉතාමත් කෙටි කාලසීමාවක් තුළ, අවුරුදු 04 ක් වැනි කාලසීමාවක් තුළදී ජනතාවට හිතකර, දරුවන්ට හිතකර ආකාරයට මේ පළාත් සභාව රැගෙන යන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගන්නා වූ උත්සාහය අපි අගය කළ යුතුයි.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අධ්‍යාපනයේ වටිනාකම තේරුම් අරගෙන තමන්ට අවශ්‍ය ආකාරයට - අපගේ මන්ත්‍රීතුමෙක් ප්‍රකාශ කළා, සුපසන් නිම්තෙර වැඩ සටහන ප්‍රසන්න වැඩ සටහනේ අවසන් වැඩ සටහන කියලා. නමුත් ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යවරයා යම්කිසි වැඩක් භාර ගත්තාට පසුව ඒ වැඩට නමක් දැම්මත් වෙලාවක් බලලා,

[ ගරු ලයනල් ජයසිංහ ]

නක්ෂත්‍රය පරීක්ෂා කර බලලා කටයුතු කරන පුද්ගලයෙක් වශයෙන් සුපසන් නිම්තෙර කියන්නේ, මේ පළාත් සභාවේ ඉදිරි වර්ෂ 05 ටත් ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කිරීමට එතුමා යම්කිසි වැඩ පිළිවෙළක් මේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කරලා තිබෙනවයි කියන එකයි ඒ අදහස්වලින් අපට පිළිඹිබු වන්නේ. ඒ වාගේම සුපසන් නිම්තෙර කියන වැඩ සටහන තුළ මිලියන 90 ක් පමණ වැය කරලා පාසල් පද්ධතිය අපට අවශ්‍ය ආකාරයට, දරුවන්ට අවශ්‍ය ආකාරයට සකස් කර ගන්න ඒ වැඩ පිළිවෙළ තුළින් අද ක්‍රියාත්මක වෙලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාවක් වශයෙන් ගත්තාම ඒ වැඩ පිළිවෙළ තුළ දරුවාට අලංකාර පන්ති කාමරයක් තුළ ඉඳගෙන වර්ණ ආලේපන තුළින්, ඒ බිත්ති සකස් කිරීම තුළින්, කාණු පද්ධති සකස් කිරීම තුළින් ඉතාම හොඳ ආකාරයේ වැඩ පිළිවෙළක් එතුමා ක්‍රියාත්මක කරලා තිබෙනවා.

ඒ වාගේම එතුමාගේ සදහම් වැඩ පිළිවෙළ තුළින් එතුමා බලාපොරොත්තු වෙනවා, පළමුවැනි වසරේ දරුවන්ට හොඳ දහම් අධ්‍යාපනයක් ලබා දෙන්න. ඒ තුළින් බලාපොරොත්තු වෙන්නේ විනය ගරුක සාරධර්මවලින් පිරි දරු පිරිසක් අපේ රටට උදා කර දෙන්න. ඒ අනුව බලන විට අවශ්‍ය ගොඩනැඟිලි ප්‍රමාණය - මම කථා කරන්නේ මීනුවන්ගොඩ කලාපය තුළ. මීනුවන්ගොඩ කලාපය තුළ දිවුලපිටිය, මීරිගම, මීනුවන්ගොඩ කියන ආසන තුන ගත්තාම අද භාගෙට ඉදි කරලා තිබුණු ගොඩනැඟිලි සියල්ලම අංගසම්පූර්ණ ගොඩනැඟිලි බවට පත් කරලා තිබෙනවා. ඒ වාගේම ගරු පුරප්පාඩු සම්පූර්ණයෙන්ම අවසන් කරලා තිබෙනවා. උපාධිධාරී ගුරුවරුන් බඳවා ගෙන ඒ ගුරුවරුන් අවශ්‍ය ආකාරයට සකස් කර දීලා එතුමා ඒ පාසල්වලට අවශ්‍ය කරන ගුරු හිඟය තුලනය කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර තිබෙනවා. මම හිතන්නේ, හය දහස් එකසිය ගණනක උපාධිධාරීන් පිරිසක් බඳවාගෙන තිබෙනවා. දෙමළ මාධ්‍ය ගුරුවරුන් 304 ක් පමණ බඳවාගෙන ඒ පුරප්පාඩු සපුරන්න එතුමා මේ කාලවකවානුව තුළදී කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම එතුමා අපි අධීක්ෂණ මන්ත්‍රීවරු වශයෙන් -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔන්න ඉන්නවා අධීක්ෂණ මන්ත්‍රීවරු. ඔන්න බඩු එළියට ආවා.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

බඩු එළියට එන්නේ නැහැ. බඩු තමයි-

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ක තියෙනවා කිව්වාම මටත් බැන්නේ.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

ඉන්න. ඉන්න. ඔබතුමා ඉන්න.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

අධ්‍යාපන අධීක්ෂණ මන්ත්‍රීවරු වශයෙන් - අද අපේ ගරු ප්‍රධාන ඇමැතිවරයාට කොළඹ, කළුතර අනික් දිස්ත්‍රික්කවලට ගිහිල්ලා නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් එතුමාගේ අමාත්‍යාංශය කරගෙන යන්න අපි නිදහස ලබා දීලා අධ්‍යාපන අධීක්ෂණ මන්ත්‍රීවරු වශයෙන් අපි මීනුවන්ගොඩ කොට්ඨාශයේ ඉතාම සාර්ථක අධ්‍යාපනයක් ගෙනියනවා කියන එකත් මම මේ අවස්ථාවේ තමුන්නාන්සේට මතක් කරනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මීනුවන්ගොඩ ගෙනියන්න බැරි නම් වෙන කොහේ ගෙනි යන්නද?

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

අපේ ගරු ප්‍රධාන ඇමැතිවරයාව අපි අපේ ආසනය තුළින් නිදහස් කරලා තිබෙනවා. අපේ දිස්ත්‍රික්කය තුළින් නිදහස් කරලා තිබෙනවා. අද එතුමාට සාර්ථකව ඒ කටයුත්ත කරගෙන යන්න අවස්ථාව ලබා දීලා තිබෙන්නේ අපි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මාර පිට කැහිල්ලක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාත් ආවේගශීලී වෙලා නේ. ඇයි ඒ?

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

මම ගහන්නේ නැහැ මඩ. මඩ ගහන්න දෙයකුත් නැහැ. එතුමාව අද නිදහස් කරලා තිබෙනවා බස්නාහිර පළාතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා. එතුමා බාධා කරන මන්ත්‍රීවරයෙක් නොවෙයි. බොහොම කලාතුරකින් කථා කරන්නේ.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

දිස්ත්‍රික්කය තුළම කටයුතු කරන්න. අපි තිබ්බ මුල් ගලක් පැළ වෙලා නැහැ. අපි ගුරු හිහයක් තියලා නැහැ. අපි අධීක්ෂණ මන්ත්‍රීවරු වශයෙන් ඒ කාර්යභාරය කරනවා. කලාප අධ්‍යක්ෂතුමා මෙතැන ඉන්නවා. එතුමා දන්නවා. මාසයේ හැම සඳුදාම ඒ මන්ත්‍රී කණ්ඩායම ඒකරාශි වෙලා ආසනයේ තිබෙන අඩුපාඩු සකස් කරලා ඒ කටයුත්ත කරනවයි කියන එක අපි මේ අවස්ථාවේ තමුන්නාන්සේට ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කැලණි කලාපය, මීගමු කලාපය පෙනෙන්නේ නැහැ.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

මීගමු කලාපය ගැන නොවෙයි මම කථා කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාපතිතුමාට කියන්න. මට කියන්න එපා.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

තමුන්නාන්සේ මට බාධා කළ නිසා මම උත්තර දෙන්නේ. ගරු සභාපතිතුමනි, ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ යම්කිසි සංකල්පයක් තුළ අපේ කලාපයේ සිටින සියලුම ගුරුවරුන් අපි එක තැනකට ඒකරාශී කරගෙන ඒ ගුරුවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ තිබෙන අඩුපාඩු පිළිබඳව අපි සාකච්ඡා කරනවා. ඒ අඩුපාඩු සාකච්ඡා කරලා දරුවන්ගේ පහේ ශිෂ්‍යත්ව විභාගයට මොනවද අපි යොදවන්නේ? පාසලේ තිබෙන අඩු පාඩු පිළිබඳව සාකච්ඡා කරලා, එවැනි වැඩ සංකල්පයක් අපි ක්‍රියාත්මක කරලා අපේ කලාපයේ තිබෙන පහේ ශිෂ්‍යත්ව විභාග අධ්‍යයන කටයුතු මේ වන විට ඉතාම උසස් අන්දමට ගෙන යෑමට අපි එතුමාගේ ක්‍රියාකලාපය තුළ කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම එතුමා 100 ට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ගන්න හැම දරුවෙකුටම සහතිකයක් ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. දේශපාලන භේදයෙන් තොරව කටයුතු කරන ආසනයක් තමයි මීනුවන්ගොඩ ආසනය. අපි සිය දෙනාම, දේශපාලන අධිකාරිය සම්බන්ධ වෙලා පාසල් බෙදාගෙන ඒ පාසල්වලට ගිහිල්ලා ඒ දරුවන් ඇගයීමට ලක් කළා. ඒ දෙමව්පියන් ඉතාම ආඩම්බරයෙන් ඒ සහතිකය ලබා ගත්තා. ඒ සහතිකය ලබා ගෙන - ඒ ලකුණු 100 ට වැඩිය ගත්ත සෑම දරුවෙක්ම මම දකින ආකාරයට අ.පො.ස. සාමාන්‍ය පෙළ සුදුසුකම් ලබන දරුවන් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පාසල් මුරකරුවන් කීයක් දැම්මාද?

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

මොකක්ද?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පාසල් මුරකරුවන් කීයක් දැම්මාද?

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

පාසල් මුරකරුවන් දාලා තිබෙනවා අවශ්‍ය ආකාරයට.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එක්කෙනෙක්වත් දුන්නේ නැහැ නේ ඔබතුමාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා,

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔබතුමා ප්‍රංශයේදී කිව්වේ එකෙක්වත් දුන්නේ නැහැයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

ඒ ගැන කථා කරන්න එපා මෙතැන. ඒක මහ ඇමැතිතුමයි මමයි බලා ගන්නම්. මහ ඇමැතිතුමා දාන ඔක්කෝම අපේ පාසල්වලට තමයි දාන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. එතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. වරින් වර බාධා කිරීම් කරනවා.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

ඒ අවශ්‍ය ආකාරයට එතුමා ඒ අනධ්‍යයන කාර්ය මණ්ඩලය ලබා ගන්න අවශ්‍ය කටයුතු කරනවා. මම හිතන්නේ, වැඩිපුරම අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් පාසල්වලට තමුන්නාන්සේලාට ලබා නොදුන්නත්, එතුමා හොඳ ආකාරයට ඒක බෙදීයන ආකාරයට පාසල්වලට ලබා දීලා තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා ඇත්ත කිව්වා.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

ඒ පිළිබඳවත් මම එතුමාට මගේ අවංක ආදර ස්තුතිය පුද කරනවා. ඒ වාගේම අපේ තිබුණා යම්කිසි කාලසීමාවක් තුළදී ගමට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තව කාලය දෙන්න. කියා ගන්න බැහැ.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

ඒ වාගේම මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි. විරුද්ධ පක්ෂයක් වශයෙන් ඔබ තමුන්නාන්සේලාගෙන් අපි බලාපොරොත්තු වන්නේ, මිතුරු විධියට අපට ඒ විරෝධතා ප්‍රකාශ කරන්න කියලා. මම ඉතාම ආඩම්බරයෙන් කියන්න කැමැතියි. තමුන්නාන්සේලාගේ නායකයා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අධීක්ෂණ ගුලිය ගිල්ලා.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

ඔබගේ නොවෙයි. අපේ යුසුෆ් ගරු මන්ත්‍රීතුමාගේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉතා හොඳ ක්‍රියා කලාපයක් කළා, එතුමා අධ්‍යාපන ඇමැතිවරයා වශයෙන් ඉන්න කාලයේදී. එතුමා විදුහල්පතිවරු පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරලා ඒ ක්‍රියාවලිය ඉතාම සාර්ථකව ඉදිරියට ගෙන ගියා. ඒ පිළිබඳව මම එතුමාට මගේ අවංක ආදර ස්තුතිය පුද කරනවා.

ඒ එක්කම මම ඔබතුමාගේ මාර්ගයෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරන්න කැමැතියි. ගරු ඇමැතිතුමනි, ප්‍රසූත නිවාඩු ගියාට පසුව - අපේ කාන්තාවන් වැඩිපුරම ඉන්නේ ගුරු වෘත්තියේ යෙදිලා. ඒ උදවිය අර්ධ නිවාඩු ලබලා මේ කාලසීමාව තුළදී නිවාඩු ලබාගෙන ඉන්නවා. අපි මාස 09 ක් වැනි කෙටි කාලයක් තමයි පාසල් දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්නේ. නමුත් මේ කාලසීමාව තුළදී ඒ අයගේ නිවාඩුත්, අර්ධ නිවාඩුත් ලබා ගත්තාම මේ ගුරුවරියන් අර නිවාඩු ප්‍රමාණය සම්පූර්ණයෙන්ම ලබා ගන්නවා. නමුත් කලාපයෙන් අනුයුක්ත කිරීමක් කෙරෙන්නේ නැහැ. අන්න ඒ අවස්ථාවේදී දරුවන්ට යම්කිසි අසාධාරණයක් සිදු වෙනවා. මම ඔබතුමාගේ මාර්ගයෙන් ඒ පිළිබඳව දැනුවත් කරනවා. යම් යම් රජයන් ගත්තු වැරදි තීරණ නිසා දරුවන්ට අසාධාරණයක් ඇති වෙනවා. ඔබතුමාගේ මාර්ගයෙන් මධ්‍යම රජය දැනුවත් කරලා ඒ නිවාඩු ක්‍රමය අර පසුගිය තිබුණු ආකාරයෙන් ගුරු මෑණිවරුන්ට ලබා

දෙන්න කියන ඉල්ලීම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ප්‍රකාශ කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට මාගේ අවංක ආදර ස්තුතිය පුද කරමින් ඉදිරි අවුරුදු එකහාමාරත් ඉදිරි පළාත් සභාවේදීත් නැවත වතාවක් ඔබතුමාට මේ පළාත් සභාවේ මහ ඇමැතිවරයා වශයෙන් කටයුතු කිරීමට වාසනාව ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. ඔබ සැමට ස්තුතියි.

[ අ.භා. 12.56 ]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය ඒ වාගේම අධ්‍යාපන ඇමැතිතුමාගේ වැය ශීර්ෂයයන් යටතේ අධ්‍යාපනය ගැන කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම අධ්‍යාපන විෂයය ගැන කථා කිරීමේදී බස්නාහිර පළාතට අයිති පාසල් තිබෙන්නේ, 1332 යි ජාතික පාසල් එක්ක. ඒ වාගේම පළාත් සභා පාසල් 1261 යි. ඒ 1261 තුළ සිසුන් ඉගෙන ගන්න සංඛ්‍යාව බැලුවොත් හත් ලක්ෂ නව දහස් තුන්සිය හතළිස් නවයයි. ඒ වාගේම උගන්වන ගුරුවරුන් සංඛ්‍යාව බැලුවොත් තිස් දෙදහස් නවසිය හතළියයි. කලාප11 ක් සහ කොට්ඨාශ 38 ක් තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා 94 ඉඳලා 2009 වන විට අවුරුදු 15 ක් තුළ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියටත්, ඒ වාගේම අමාත්‍යවරයෙක් හැටියටත් විෂයයන් ගණනාවක් කර අත්දැකීම් ඇති ඇමැතිවරයෙක්. ඒ වාගේම 2003 දිස්ත්‍රික්ක තුනේ වැඩිම මනාප ලබා ගෙන බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියටත් ඒ වාගේම අධ්‍යාපනය පළමුවරට භාරගත්ත ඇමැතිවරයෙක් හැටියටත් එතුමා ලොකු අභියෝගයක් මේ භාර ගත්තේ. 2009 වසරේ එතුමා අධ්‍යාපන අමාත්‍යාංශය, ඒ වාගේම දෙපාර්තමේන්තුව, කලාප, කොට්ඨාශ වාගේ සියලු දේවල් සම්බන්ධ සංඛ්‍යා ලේඛන අරගෙන ඒවා බලනවා වාගේම තවත් අවශ්‍යම වැඩ සටහනක් එතුමා කළා. ස්ථිර වැඩ සටහනක්. ඒ සුපසන් නිම්තෙර වැඩ සටහන යටතේ පාසල් හතක් සැම සිකුරාදාවකම තමන්ගේ අමාත්‍යාංශයට ගෙනැල්ලා ඒ පාසල්වල ඉන්න විදුහල්පතිතුමිය හෝ විදුහල්පතිවරයා ආචාර්ය මණ්ඩලයේ ගුරු මහත්ම මහත්මීන් කොටසක්, ඒ වාගේම විශේෂයෙන් ඉගෙන ගන්නා දරු දැරියන් කොටසක්, ඒ වාගේම දෙමව්පියන් කොටසක්, ඒ වාගේම ආදි ශිෂ්‍යයන් කොටසක් ගෙනැල්ලා ප්‍රායෝගිකව සුළු සාකච්ඡාවක් කරලා සොයා බැලුවා එක් එක් පාසල් ගැන. ඒ පාසල් ගැන සාකච්ඡා කිරීමෙන් තමයි එතුමාට මේ පාසල් ගැන විශේෂ අවධානය යොමු කරලා භෞතික සම්පත්, මානව සම්පත්වල තිබෙන හිඟය මේ බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කරලා, ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයක් කරන්න පුළුවන් කියන එක පිළි අරගෙන එතුමා ඒ හරහා තමයි වැඩ සටහන පටන් ගත්තේ. ඒ වැඩ සටහන පටන් ගැනීමේදී පළමුවෙන්ම දැක්කේ මානව සම්පත අඩුකම.

අපි උදාහරණයක් වශයෙන් කියනවා නම් ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමු කලාපයේ තමයි ගුරුවරුන් අඩුවෙන්ම සිටියේ. ඒ වාගේම කොළඹ දිස්ත්‍රික්කයේ කොළොන්නාව කලාපය, ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ මතුගම, අගලවත්ත කලාපවල. මේ කලාපවල හැමදාම ගුරුවරුන් අඩු ප්‍රමාණයක් සිටියේ. ඒකට හේතුව තමයි ගුරු මාරුවීම් තුළදී ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමු කලාපයට ගුරුවරුන් එන්නේ නැහැ. කැලණි කලාපයට, ගම්පහ කලාපයට, මිනුවන්ගොඩ කලාපයට ගුරුවරුන් වැඩි ප්‍රමාණයක් සිටි නිසා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා පළමුවෙන්ම කළේ ගුරු තුලනය පටන් ගත්තා. ජා-ඇළ කොට්ඨාශයෙන් තමයි ඉස්සෙල්ලාම ගුරු තුලනය පටන් ගත්තේ. ඒ වේලාවේ අපි පාසල් තුළ කාලපරිච්ඡේද 35 ට අඩු ප්‍රමාණයක් උගන්වන ගුරුවරුන් හඳුනාගෙන ඒ කාලපරිච්ඡේද අනුව කොට්ඨාශ අධ්‍යක්ෂතුමාත් එක්ක එකතුවෙලා, ඒ මොහොතේ කලාප අධ්‍යක්ෂතුමාත් එක්ක එකතු වෙලා ගුරු තුලනය කරලා ගුරු ඌනතා හඳුනාගෙන ගුරු පුරප්පාඩුවලට ගුරුවරුන් ලබා දුන්නා. මේ ලබා දීමෙන් පස්සේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට සංඛ්‍යා ලේඛන අරගෙන අපි අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේදී ඉදිරිපත් කර පෙන්නුවා. ඒ තුළ එතුමා 2008 වසරේ උපාධිධාරීන් හැටියට විභාගයට පෙනී සිටි සංඛ්‍යාව අරගෙන, එක විෂයයකට 40 ගණනේ විෂයයන් 2 ට අසුව දක්වා ගත්ත සැම කෙනෙක්ම උපාධිධාරීන් හැටියට බඳවා ගෙන 2011 ඔක්තෝබර් මාසයේ විභාගය තියන කොට මේ ගුරුවරුන් සංඛ්‍යාව බඳවාගෙන ඒ පාසල්වලට ලබා දුන්නා. ඒ වාගේම 2011 වසරේ නැවතත් උපාධිධාරීන් බඳවා ගැනීමට පෙර, රැකියා වැස්ස කියන වැඩ සටහනක් පටන් අරගෙන දිස්ත්‍රික්ක තුනට වෙනම වැඩ සටහන් කරලා මේ උපාධිධාරීන්ව වැඩිපුර ප්‍රමාණයක් විභාගයෙන් පාස් කරන්න, උපාධිධාරීන් බඳවා ගන්න විශාල වැඩ සටහනක් කෙරුවා. ඒ වාගේම 2011 ඔක්තෝබර් මාසයේ 11,000 කට වැඩි ප්‍රමාණයක් විභාගයට පෙනී සිටියා. 7600 කට වැඩි ප්‍රමාණයක් විභාගයෙන් සමත් වුණා. අද මේ වන විට සමස්ත මුළු ගුරු සංඛ්‍යාව 2009 වසරේ 956 දෙනෙකුත්, 2010 වසරේ 1759 කුත්, ඒ වාගේම 2011 වසරේ 2644 කුත්, ඒ වාගේම 2012 වන විට 1247 කුත් මුළු ගුරු සංඛ්‍යාව 6106 දක්වා බඳවාගෙන පාසල්වලට ඇතුළත් කරලා තියෙනවා. ඒ වාගේම ඉතිහාසයේ කවදාවත් බඳවා නොගත්ත දෙමළ මාධ්‍ය ගුරුවන් 304 කුත් බඳවාගෙන අද සැම පාසලක්ම පවත්වාගෙන යන්න පුළුවන් විධියට ගුරු සංඛ්‍යාව ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම තමයි භෞතික සම්පත් ලබා දීමේදී 2009 වසරේ එතුමා උපමාන පාදක ප්‍රදාන හැර භෞතික සම්පත් සහ උසස් ඉගෙනුම් අවකාශ සංවර්ධන වැඩ සටහන යටතේ පසුගිය වසර හතර තුළ අධ්‍යාපනය වෙනුවෙන් කරන ලද ප්‍රාග්ධන ආයෝජනය බැලුවොත් 2009 වසරේ මිලියන 676 යි. 2010 වසරේ මිලියන 791 යි. 2011 වසරේ මිලියන 887 යි. 2012 වසරේ මිලියන 1527 යි. මේ භෞතික සම්පත්වලට මුදල් ටික වෙන් කරලා පාසල් හඳුනාගෙන, පාසලේ අවශ්‍යතාවයන් හඳුනාගෙන අමාත්‍යාංශයට උපදෙස් ලබා දීලා දෙපාර්තමේන්තු මට්ටමින්, කලාප මට්ටමින්, කොට්ඨාශ මට්ටමින් අධ්‍යාපනය සඳහා මේ මුදල් වෙන් කරලා තමයි අද භෞතික සම්පත්, මානව සම්පත් ලබා දීලා මේ පාසල් සංවර්ධනය කරන වැඩ සටහන පටන් ගත්තේ. ඒ සුපසන්

නිම්තෙර වැඩ සටහන යටතේ ප්‍රාථමික පාසල් වෙනුවෙන් විශාල අවධානයක් යොමු කරලා එතුමා විශාල වශයෙන් බලාපොරොත්තු වෙනවා, පහේ ශිෂ්‍යත්ව සමත් වෙනවාට වැඩිය සියයට වැඩි හැත්තෑවට වැඩි ළමුන් සංඛ්‍යාව වැඩි කරන්න. එතුමා පටන් ගත්තේ 2009 වසරේ. කොළඹ දිස්ත්‍රික්කයේ විතරක් 2009 වසරේ සියයට වැඩි ප්‍රමාණය තිබුණේ, 38.94% යි. 2012 වන විට 40.23% දක්වා 1.29% කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ 41.09% යි. 2012 වසරේ 43.78% දක්වා 2.69% දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ ඉතාමත්ම වැඩි ප්‍රතිශතයක් දක්වන දිස්ත්‍රික්කයක් හැටියට 2009 වසරේ 38.09% යි. 2012 වසරේ 41.57% ක් හැටියට 4.77% ක් වර්ධනය ඇති කරලා තිබෙනවා. ඒ වාගේම ලකුණු 70 ට වැඩි ළමුන් ප්‍රමාණය 2009 වසරේ කොළඹ දිස්ත්‍රික්කයේ 63.70% යි. 2012 වසරේ 65.89% යි. එය 2.19% කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ 2009 වසරේ 64.78% යි. 2012 වසරේ 68.33% යි. වර්ධනයක් හැටියට 3.55% ක් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ 2009 වසරේ 58.99% යි. 2012 වසරේ 65.44% යි. කළුතර දිස්ත්‍රික්කයේ වර්ධනයක් හැටියට 6.45% ක් වැඩි කරලා තිබෙනවා. අපි පිළිගන්න දෙයක් තමයි, සාක්ෂරතාවය අඩු කරන්න නම්, ඒ වගේම සාමාන්‍ය පෙළ, උසස් පෙළ ප්‍රතිඵල වැඩි කරන්න නම් අත්‍යවශ්‍ය දෙයක් තමයි පහේ ශිෂ්‍යත්වයට වාඩි කරන සිසුන් සංඛ්‍යාවෙන් ශිෂ්‍යත්වය සමත් ප්‍රතිශතය වැඩි කරනවා වාගේම, 70 ට වැඩි ප්‍රමාණය සහ 100 ට වැඩි ප්‍රමාණය වැඩ කරන්නම ඕනෑ. ඒ ගැන සම්පූර්ණ සංඛ්‍යා ලේඛන අරගෙන ගරු ප්‍රධාන ඇමැතිතුමා අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු සියලු නිලධාරීන් එකතු කරගෙන විශාල වැඩ සටහනක් කරලා තිබෙනවා කියන එක මේ සංඛ්‍යා ලේඛනවලින් ඔප්පු කරන්න පුළුවන් කියන එක අද පළමුවෙන්ම මම කියා සිටිනවා.

ඒ වාගේම තමයි කොට්ඨාශ කාර්යාල සවිබල ගැන්වීම. කොට්ඨාශවල විශාල අඩුපාඩු තිබෙනවා. කොට්ඨාශ 38 ක් තිබෙනවා. මේ කොට්ඨාශ 38, සමහර කොට්ඨාශ කාර්යාලවල ඉඳගන්න අවශ්‍ය ලී බඩු ඒ කාර්යාලවල තිබුණේ නැහැ. ඒ වාගේම විද්‍යුත් උපකරණ තිබුණේ නැහැ. ගිය වසරේ විතරක් ඒක මිලියනය ගණනේ, ලක්ෂ 10 ක් වෙන් කරලා මිලියන 38 ක් කොට්ඨාශ 38 ටම ලබා දුන්නා. අද අපි ආඩම්බර වෙනවා. කොට්ඨාශ කාර්යාලවලට ගියාම, ඒ වාගේම දුරකථනයක්, ඒ වාග්ම ෆැක්ස් මැෂින් එකක්, ෆොටෝ කොපි මැෂින් එකක්, ඩුප්ලෝ මැෂින් එකක් තියාගෙන අද කොට්ඨාශ කාර්යාලයේ සියලුම පාසල්වලට ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයක් ලබා දෙන්න අවශ්‍ය සියලුම වැඩ සටහන් කරන්න පුළුවන් හොඳ අවස්ථාවක් ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම තමයි අඩක් නිම කළ ගොඩනැගිලි හැටියට 2010 අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කළුතර

[ ගරු මෙරිල් පෙරේරා ]

දිස්ත්‍රික්කයේ පානදුර රැස්වීමේදී පෙන්වා සිටියා භාගෙට නිම කරලා තිබෙන මුළු ගොඩනැගිලි සංඛ්‍යාව 185 ක් තිබෙනවා කියලා. ඒ වේලාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට උපදෙස් ලබා දුන්නා, අවුරුද්දක් දෙකක් යන කොට මේ අඩක් නිම කළ ගොඩනැගිලි සම්පූර්ණයෙන් ඉවර කරන්න කියලා. විශේෂයෙන් අලුතෙන් ගොඩනැගිලි හදන්නේ නැතිව, මේ ගොඩනැගිලි ඉවර කරන්නය කියලා. මොකද, මුල් ගල තියලා අවුරුදු ගණනාවක් වන අත්වාරම් දාපු, ස්ලැබ් එක නොදාපු, වහළවල් නොහදපු ගොඩනැගිලි රාශියක් තිබුණා. 2011 වසරේ මිලියන 300 ක් ලබා ගෙන අද මේ වන විට ඒ 195 න් ගොඩනැගිලි 62 ක් සම්පූර්ණයෙන් නිම කරලා තිබෙනවා. ඒ වාගේම 2012 මිලියන 400 ක් ලබා ගෙන ගොඩනැගිලි 78 ක් සම්පූර්ණයෙන් ඉවර කරලා තිබෙනවා. මේ වන විට නිම කළ ගොඩනැගිලි සංඛ්‍යාව 139 යි. තව ලබන වසරට ඉතුරු වෙලා තිබෙන්නේ 46 යි කියන එක මේ වේලාවේ සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ළමා මිතුරු පාසල් සංවර්ධනය කිරීම. ප්‍රාථමික පාසල් හැටියට බස්නාහිර පළාතේ පාසල් 535 ක් තෝරාගෙන තිබෙනවා. ඒ පාසල් 535 අතරේ මේ අවුරුද්දේ ලක්ෂ 5 බැගින් පාසල් 170 ක් ප්‍රාථමික පාසල්, ළමා මිතුරු පාසල් කරලා ප්‍රාථමික අංශය හොඳ ශක්තිමත් විධියට අද සංවර්ධනය කරලා තිබෙන එකත් මේ වේලාවේ මතක් කරනවා. ඒ වාගේම තමයි අපේ දැතින් අපේ පාසල සුරකිමු කියන වැඩ සටහන. 2009 වසරේ මෙතුමා සුපසන් නිම්තෙර වැඩ සටහන යටතේ පාසල් 1261 ටම සල්ලි දෙන්න බැරි නිසා තෝරාගත් පාසල් කොටසකට දුන්නා. 2010 තෝරාගත් පාසල් කොටසකට දුන්නා. නමුත් 2011 වසරේ ගිය වාරේ 1261 ටම සිසුන් අනුපාතය අනුව මුදල් ලබා දීලා අපේ දැතින් අපේ පාසල සුරකිමු වැඩ සටහන පටන් අරගෙන අර දෙසැම්බර් මාසයෙන් නිවාඩුවෙන් ගෙදර යන ළමයා, ඒ වාගේම ජනවාරි මාසයේ නැවත පාසල් එන දරුවන් සහ දෙමව්පියන් පාසල දකින කොට පාසලේ පරිසරය වෙනස් කරලා, ගොඩනැගිලිවල තීන්ත ආලේපනය කරලා, පන්තියේ තීන්ත ආලේප කරලා, මනා පරිසරයක් හදලා ළමුන්ට පාසල අලුත් නිවහනක් හැටියට තමයි ලබා දෙන්න සලස්වලා තිබෙන්නේ . ඒ වගේම තමයි 2012 වසරේත්, මේ වසරේත් සිසු අනුපාතය අනුවම මුදල් වැඩි කරලා පාසල් 1261 කට මේ වන විට මුදල් ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපි සන්තෝෂ වෙනවා. සාමාන්‍යයෙන් එදා පාසලෙන් නිවාඩු යන කොට, මාසයකින් ආයේ පාසලට එන කොට පාසල දිරාපත් වෙලා ජරාවාස වෙලා තිබුණේ. අද ඒ තත්ත්වය බස්නාහිර පළාතේ පාසල්වල නැහැ. පාසල් 1261 ටම අද මුදල් ලබා දීලා ජනවාරි මාසය වන විට අලුත් තත්ත්වයක් ඇති කරලා තිබෙනවා කියන එකත් මේ වේලාවේ මතක් කරනවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම තමයි මහා පවිත්‍රතා දිනය. අවුරුදු ගණනාවක් පාසල ජරාවාස වෙලා තිබුණු තැන් තිබුණා. ගොඩනැගිල්ලක් කඩලා නම්, වැසිකිළි කැසිකිළි පාවිච්චි කරන්න බැරි නම් ඒවා ඉවත් කරන්නේ නැතිව, ඒ වාගේම කුණු ගොඩගහලා තිබුණු

පාසල් ගණනාවක් තිබුණා. මහා පවිත්‍රතා දිනය හැටියට මේ අවුරුද්දේ දිනයක් වෙන් කරලා, පාසල් 1261 ටම එකම වේලාවක් දීලා කටයුතු කරලා තියෙනවා. ඒ පාසල්වල තත්ත්වය මොකක්ද කියලා අද ගිහිල්ලා බලන්න පුළුවන්. හැම පාසලකම වැඩ සටහන් කරලා, පාසල මනා පරිසරයක් ඇති විධියට පාසලේ රුක් රෝපණයක් කරලා මේ වාගේ හොඳ වැඩ සටහනක් කරලා අද පාසල් පද්ධතිය වෙනස් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අද ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ජා - ඇළ කොට්ඨාශයේ පාසල් ගැන කථා කෙරුවා. මම එතුමාට කියනවා. එකම විදුහල්පති රැස්වීමකටවත් සහභාගී වෙන්නේ නැතිව, කලාප රැස්වීමකට සහභාගී වෙන්නේ නැතිව, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන උපදේශක කාරක සභා රැස්වීමට සහභාගී වෙන්නේ නැතිව ජා-ඇළ කොට්ඨාශය ගැන නොවෙයි. මෙතුමාට මීගමු කලාපය ගැන, පළාත ගැන කිසිම දැනීමක් නැතිව මෙතැන ඇවිල්ලා කථා කිරීම ගැන කනගාටු වෙනවා. මොකද ජා-ඇළ අධ්‍යාපන කොට්ඨාශයේ පාසල් ගැන කථා කරනවා නම්, පළාත් සභාවට අයිති පාසල් 38 යි තිබෙන්නේ. කතෝලික පාසල් 24යි, බෞද්ධ පාසල් 14 යි තිබෙන්නේ. එම පාසල්වල දරුවන් 26,929 ක් ඉගෙන ගන්නවා. ගුරුවරුන් 1077 ක් ඉන්නවා. කතෝලික ළමුන් පහළොස් දාහකට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. බෞද්ධ ළමුන් දහ දාහකට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. මෙතුමා එක පාසලකටවත් ගිහින් නැතිව අධ්‍යාපනය ගැන කථා කිරීම පිළිබඳව මම කනගාටු වෙනවා. අඩුම ගණනේ ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා 1991 ඉඳලා අවුරුදු ගණනාවක් දේශපාලනය කරලා, යම්කිසි දැනීමක් තිබෙන නිසා එතුමා මේ කථාව කිව්වා නම්, මම පිළිගන්නවා. අනික මෙතුමා කියනවා වතුර නැහැයි කියලා. අද ජා-ඇළ කොට්ඨාශයේ ජලනල පද්ධතිය අලුතෙන් ඉදි කරලා තිබෙන්නේ. අවුරුදු ගණනාවකට පස්සේ. ජා-ඇළ වතුර පාවිච්චි කරන්න බැරි නිසා. ඒ නිසා පාසල් ගණනාවක් ජල නළ සැපයුමට අලුතෙන් ඉල්ලලා තිබෙනවා. ඒවා ඇස්තමේන්තු ගත කරලා, නියමිත සල්ලි වෙන් කරපුවාම හැම පාසලකටම ගන්න පුළුවන්. ජා-ඇළ කොට්ඨාශයේ වතුර නැති එක පාසලක්වත් නැහැ. අනික මෙතුමා මහ ලොකුවට කථා කෙරුවා, තමුන්ගේ තාත්තා පාසල් හැදුවා කියලා. ඉඩම් ලබා දීලා, ගොඩනැගිලි හඳලා වෙනම පාසල් හදලා නැහැ. හදලා තිබෙන්නේ, ආණ්ඩුවේ සල්ලිවලින්. පළාත් සභාවේ සල්ලි. එහෙම හදපු පාසල් ගණනාවක්ම තමයි ජා- ඇළ තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාත් හදන්නේ ඒවාවලින් තමයි. ගෙදරින් ගෙනල්ලාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කරුණාකර ඔබතුමා කෑ නොගහා ඉන්න. ඔබතුමා කථා කරන කොට අපි කෑ ගැහුවේ නැහැ නේ? ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා. මෙතුමා කථා කරන්නේ කිසි දෙයක් නොදැන. වගකීමෙන් කියනවා. මහ ඇමතිතුමා ඊයේ පැහැදිලිව කිව්වා. ගරු සභාපතිතුමනි, පාසල් අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කරලා නැහැ. නමුත් පාසල් අධීක්ෂණය කරන්න මන්ත්‍රීවරුන්ට බලය ලබා දීලා තිබෙනවා. ඒක තමයි ප්‍රධානම දේ. අද ගම්පහ දිස්ත්‍රික්කයේ ඡන්දය ඉල්ලලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඒකේ වෙනස මොකක්ද කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පොඩ්ඩක් ඔබතුමා කට වහගෙන ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කියලා දෙන්නම් වෙනස.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වාඩි වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඉගෙන ගෙන නැහැ නේ? ඒක නිසා ඇහුවේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා පාසල් අධීක්ෂණ මන්ත්‍රීවරුන් කියලා මීට ඉහත ලිඛිතව ලිපියක් ලබා දීලා තිබුණා. අද ප්‍රධාන අමාත්‍යතුමා අධ්‍යාපන ඇමැතිවරයා හැටියට කාටවත් ලිඛිතව දීලා නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයේ තමන්ට ස්වෙච්ඡාවෙන් වැඩ කරන්න කැමැති මන්ත්‍රීවරයෙක් ඉන්නවා නම් නැම පාසලකට ගිහිල්ලා අධීක්ෂණය කරලා. ඒ අවශ්‍ය පහසුකම් ටික තිබෙනවාද නැද්ද කියලා බලලා ඒවා ගෙනැල්ලා අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට කථා කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවයි කියන එක තේරුම් ගන්න බැරිය කියන එකයි මම කියන්නේ. මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

බොහොම ස්තුතියි. මෙම අවස්ථාවේදී සභාව දිවා ආහාර විවේකය සඳහා පස්වරු 02.00 දක්වා කල් තබනවා. නියමිත වේලාවට සභා ගර්භයේ අසුන් ගන්න කියලා මම ඉතාමත්ම කාරුණිකව ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් අ.භා. 02.05 ට යළිත් රැස්විය.***

*Accordingly the Whole Council Suspended and. it resumed at 02.05 p.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම්.එම්.එම්. ෆයිරූස් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 6 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 02.05 ]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි. අධ්‍යාපන, පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉඩම්, මිනිස්බල හා රැකිරක්ෂා අමාත්‍යාංශයේ, ගරු මහ ඇමැතිතුමාගේ වැය ශීර්ෂය ගැන, විශේෂයෙන් අධ්‍යාපනය ගැන කථා කරන්න මට අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, සුපසන් නිම්තෙර. ඇත්තටම මේක හොඳ වැඩක්. ගරු මහ ඇමැතිතුමා විශේෂයෙන් කරන මේ වැඩවලට අපි ගරු කරන්න ඕනෑ. හොඳ වැඩක් ගරු මහ ඇමැතිතුමා කරන්නේ. මේ වැඩේ තිබෙන අඩුපාඩු මොනවාද කිව්වොත් ගරු මහ ඇමැතිතුමනි, මේක දේශපාලනීකරණය කරලා තිබෙන්නේ. මේ වැඩේ සම්පූර්ණයෙන් (බාධා කිරීමක්) මේක සම්පූර්ණයෙන්ම දැන් දේශපාලනීකරණය වෙලා තිබෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මොකක්ද දේශපාලනය වෙලා තියන්නේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඔබතුමන්ලා ඉස්කෝලයකට එක් ලක්ෂ පනස්දාහක් දෙනවා. පනස් දාහක් දෙනවා. හැත්තෑ පන්දාහක් දෙනවා. ඉස්කෝලේ වැඩකට. ඒ අස්සේම අධ්‍යක්ෂතුමන්ලාට කියලා තිබෙන්නේ, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ගෙන්නලා තමයි මේ Cheque එක දෙන්න ඕනෑ කියලා.

[සභාවේ ඝෝෂා]

[ ගරු එම්.එස්.එම්. ෆයිරෝස් ]

මම අහන්නේ ගරු මහ ඇමැතිතුමනි, මේ බස්නාහිර පළාත් සභාවේ සල්ලි. මේ සල්ලි බස්නාහිර පළාත් සභාවේ සල්ලි. අපටත් අයිතියක් තිබෙනවා, අපේ පළාතේ ඉස්කෝලයකට මේ සල්ලි ටික දෙන්න. අධ්‍යක්ෂතුමා හැම ඉස්කෝලයකටම ඇවිල්ලා කියලා තිබෙනවා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට විතරයි මේ Cheque එක භාර දෙන්නේ කියලා. ඔබතුමන්ලා මේ පොතේ ලස්සනට ගහලා තිබෙන එකේම දාන්න තිබුණා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට විතරයි මේ Cheque එක දෙන්න ඕනෑ කියලා. ඒක ඒ ගොල්ලෝ මුද්‍රණය කරන්නේ නැත්තේ ඇයි?

[සභාවේ ඝෝෂා]

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

Budget එකට පක්ෂව ඡන්දය දෙන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, මේක ලොකු ප්‍රශ්නයක්. මෙතැන ඇවිල්ලා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඒගොල්ලෝ කථා කරනවා නම්, මම වාඩි වෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට විනාඩි හයයි කාලය තිබෙන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම අහන්නේ ගරු මහ ඇමැතිතුමාගෙන්. ගරු මහ ඇමැතිතුමා මේකට උත්තරය දෙයි. අපට කථා කරන්න ඉඩදෙන්න. මේ බජව්වක්ද කරන්නේ. මේ අයගේ තිබෙන වැරැදි ටික හංගගෙන. අපට කථා කරන්න දෙන්නේ නැහැ. මොකක්ද මේකේ තේරුම? ඊයේ ගරු මහ අමැතිතුමාගේ කථාවේදී කිව්වා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා, බාධා කිරීම්වලින් වළකින්න. එතුමාට විනාඩි හයයි තිබෙන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඊයේ අපේ ගරු මහ ඇමැතිතුමාගේ කථාවේදී කිව්වා, අධීක්ෂණ මන්ත්‍රී කෙනෙක් නැහැයි කියලා. මම ලිඛිතව දීලත් නැහැ. ඒක ඇත්ත. අපි ඊයේ තමයි දැන ගත්තේ අධීක්ෂණ මන්ත්‍රී කෙනෙක් ඇවිල්ලා පත් කරලා නැති විත්තිය. මෙපමණ දවස් හැම ඉස්කෝලයකම කුමක් හෝ උත්සවයක් තිබුණා නම්, අරාධනා පත්‍රයේ ගහනවා, මේ මන්ත්‍රීතුමා අධීක්ෂණ මන්ත්‍රීතුමෙක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගහනවා. මම ඒක ඔප්පු කරනවා. මම ගරු මහ ඇමැතිතුමාට Card එක දෙන්නම්. ඇත්තද බොරුද කියලා බලන්න. කවුද මේ කරන්නේ? ඉස්කෝලේ ඉන්න විදුහල්පතිවරුන්ව මේ අය ඇවිල්ලා අසරණ කරනවා. අපි අධීක්ෂණ මන්ත්‍රීලා. උදේ පාන්දර ලියුම් අරගෙන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වලට යන්න ඕනෑ අත්සන් ගන්න. එක් ලක්ෂ පනස්දාහකක් ගන්න. හැත්තෑ පන්දාහක් ගන්න. මොකක්ද මේ කරන්නේ? සම්පූර්ණයෙන්ම බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපනය කඩාකප්පල් කරනවා විතරක් නොවෙයි. මේක දේශපාලන ගුහාවක් කරගෙන යන්නේ. මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විතරක් කළාට කමක් නැහැ. මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මුක්කු ගහන, මේ කඩේ යන ටිකක් අද ඔබතුමන්ලාගේ පක්ෂයේ මුක්කු ගහගෙන ඉන්නවා. හෙට අනිද්දා ඇවිල්ලා අපේ පක්ෂයටත් මේ අය මුක්කු ගහයි. ඒ අය ඇවිල්ලා උතුරු කොළඹ අධීක්ෂක මන්ත්‍රී කියනවා. මැද කොළඹ හැම ඉස්කෝලෙකම හැම විදුහල්පතිවරයෙකුටම ඒ අයගේ ගෙවල්වලට යන්න වෙලා තිබෙන්නේ. මම අහන්නේ මොකක්ද මේකේ තේරුම ගරු මහ ඇමැතිතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමන්ලාගේ ලොක්කොත් මුක්කු ගහගෙන ඉන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මැද කොළඹ ඉස්කෝලවල් 28 ක් විතර තිබෙනවා. ඊයේ පෙරෙයිදා දවස් දෙකෙන් මේ මන්ත්‍රීවරුන් දෙන්නා විතරයි. වෙන කවුරුත් නොවෙයි. මේ මන්ත්‍රීවරුන් දෙන්නා විතරයි. හැම ඉස්කෝලයක් ගාණේම ගිහිල්ලා උත්සව තියලා - මේ එක උදාහරණයක් ගරු මහ ඇමැතිතුමනි. බණ්ඩාරනායක මාවතේ (බාධා කිරීමක්) පොඩ්ඩක් ඉන්න. ඔබතුමන්ලා කථා කරන්න. මම අවස්ථාව දෙන්නම්. බණ්ඩාරනායක මාවතේ ශාන්ත සෙබස්තියන් සිංහල මහ විද්‍යාලය. ඒ මහ විද්‍යාලයේ Cheque එක භාර දෙන්න කියලා අපේ උතුරු කොළඹ අධ්‍යක්ෂතුමා එනවා කියලා ඉස්කෝලේ ළමයින් ටික පාරට ගෙනැල්ලා කොඩි ඔක්කෝම දාලා රතිඤ්ඤා පත්තු කරලා විදුහල්පතිතුමිය ඔක්කෝම ලැහැස්ති කළා. අන්තිමට ගියේ කවුද? කුඩු කාරයෙක්. මෙයාට උතුරු කොළඹ පාරට බහින්නත් බැහැ. අපි ඒ පාරේ බලාගෙන ඉන්නේ මොකද මේ කරන්නේ කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කුඩුකාරයෙක් කියන්නේ කවුද?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ශාන්ත සෙබස්තියන් ඉස්කෝලේ විදුහලපතිතුමියගෙන් අහන්න කාවද එක්කගෙන ගියේ කියලා චෙක් එක භාර ගන්න. කවුද ගියේ කියලා අහන්න ඉස්සෙල්ලා.

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

ඒක වැරැදියි. මමයි ගිහිල්ලා Cheque එක දුන්නේ. කුඩුකාරයෙක් ගියේ නැහැ. මම ගිහිල්ලා Cheque එක දුන්නේ. බොරු කියන්න එපා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම කථා කළාට පස්සේ එතුමාට කථා කරන්න කියන්න. ඊයේ එතුමා අධීක්ෂණ මන්ත්‍රීතුමා කියලා ඒ ඉස්කෝලෙට යනවා කියලා, ඊයේ එතුමා ගියාද කියලා අහන්න. ඒ උත්සවයට ගෙන ගියේ කවුද කියලා ඉස්සෙල්ලා අහන්න. මේක විහිළුවක්. මේ බස්නාහිර පළාත් සභාවේ තිබෙන ඉස්කෝල. අපි මෙතැන එකට වාඩි වෙලා ඉන්නේ. අපි එකට ගිහිල්ලා කෑම කන්නේ මොකටද? බස්නාහිර පළාත් සභාවේ නම්බුව බේරගන්න. මේක විහිළුවක් කරගන්න යන්නේ. විදුහල්පතිතුමියලා කරන්නේ මොකක්ද? මේ අයට කඩේ යනවා. හැම එකකටම ආණ්ඩු පක්ෂය කියලා බෝඩ් එකක් ගහ ගන්නවා. ගරු සභාපතිතුමනි, හැම ඉස්කෝලේ ගණනේම මගේ විමධ්‍යගත මුදල් විතරක් නොව පෞද්ගලික මුදල්වලින් කොච්චර වැඩ කරගෙන යනවාද? මම වැඩ කරනවා. අපි ඇවිල්ලා පිංතූර දාගෙන, ෆොටෝ දාගෙන මේ ඕනෑ නැති දේවල් කරන්නේ නැහැ. Principal ලා අනාථ වෙලා ඉන්නේ. විදුහල්පතිවරුන්ට කථා කරන්න දෙයක් නැහැ. ඒ අය හරි අහිංසකයි. දැන් ඒ අය ඉස්කෝල දාල යන තත්ත්වයට වැටිලා තිබෙන්නේ. දුප්පත් අහිංසක ළමයින්ව, අහිංසක දෙමව්පියන්ව අමාරුවේ දාන වැඩක් මෙයින් වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු මහ ඇමැතිතුමනි, මේ පිළිබඳව අවධානය යොමු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඊයේ මව්බිම පත්තරේ තිබෙනවා,

> *"තීන්ත අධාර ගන්න මන්ත්‍රී නිර්දේශ. ගෙනෙන්නැයි නියෝග.*
>
> *බස්නාහිර පළාතේ පාසල්වල තීන්ත ආලේප කිරීම සඳහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙන ආධාර මුදල ලබා ගැනීමට ප්‍රදේශයේ මන්ත්‍රීවරයාගේ නිර්දේශ රැගෙන එන ......... ."*

ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක් නොවෙයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ.

**ගරු මන්ත්‍රීවරු**

එහෙම එකක් නැහැ නේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

නිර්දේශ රැගෙන -

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩු පක්ෂයේ කියලා ලියලා තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. කෑ ගහනවා නේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අදාළ පාසලට දැනුම් දී ඇතැයි ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝශප් ස්ටාලින් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හොරෙක් නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේක ඇත්ත කථාව.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

හොරෙක්. හොරෙක්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේක බොරුවක් නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජෝශප් ස්ටාලින් කියන්නේ හොරෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පත්තරේ සභාගත කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේ ගොල්ලෝ කඩකප්පල් කරන්නේ.

[සභාවේ ඝෝෂා]

තේරුමක් නැහැ. මගේ කථාව අවසන් කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න.

[සභාවේ ඝෝෂා]

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පුවත්පත සභාගත කරනවාද? එය සභාගත කරන්න. මම ඉතාමත්ම කාරුණිකව ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට කාල ප්‍රමාණය අඩුවෙන් තිබෙන්නේ. එතුමාට විනාඩි 06 යි තිබුණේ. ඇයි බාධා කරන්නේ? බාධා

කිරීම් කරන්න එපා. ඔබතුමන්ලාට ඕනෑ තරම් කාලය තිබෙනවා, එතුමන්ලාට උත්තර දෙන්න. එතුමාගේ කථාවට ඔබතුමන්ලාට උත්තර දෙන්න පුළුවන්. ඇයි බාධා කිරීම් කරන්නේ. කෑ ගහනවා. මොකක්ද මේ වැඩේ. බලයත් එක්ක එහෙම කරන්න එපා. ඔබතුමන්ලා ඒ මන්ත්‍රීවරුන්ටත් සාධාරණයක් කරන්න. කථා කරන්න අවස්ථාව දෙන්න කෝ. ගරු මහ ඇමැතිතුමාට වටිනා කරුණු එතුමා කියන්නේ. අදාළ දේවල් නිවැරැදි කරන්න.

ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 02.14 ]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් ගරු සභාපතිතුමනි, දැන් මේ ඉහත කරුණු දක්වපු ගරු මන්ත්‍රීතුමා මේ සභාව සම්පූර්ණයෙන් නොමඟ යවන ප්‍රකාශයක් කළා. ඒ තමයි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සුපසන් නිම්තෙර අධ්‍යාපනික වැඩ සටහන තුළ පාසල් වර්ණ ආලේප කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ නිර්දේශ ගන්න, ඒ form එකේ එහෙම සඳහනක් නැහැ. බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුගේ නිර්දේශය ගන්න පමණයි තිබෙන්නේ. ඒක තමයි සත්‍යය කථාව. මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මොකක්ද පැගිලා -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, මේක ඇත්තද නැද්ද කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට දැන් විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේක බොරුවක්ද කියලා අහගන්න ඕනෑ. අධ්‍යක්ෂතුමා ඇතුළේ ඉන්නවා. මේක ඇත්තද බොරුද කියලා එතුමන්ලාගෙන් අහගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක සභාවේ කරන්න බැහැ. ගරු මහ ඇමැතිතුමා ඒකට උත්තරයක් දෙයි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේක ආණ්ඩු පක්ෂයේ -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. මෙතුමාගේ මේ කථාවෙන් මාධ්‍ය නොමඟ යනවා. අපි ඇරපු උපදෙස් පත්‍රිකාව මම සභාගත කරනවා.[2] ඔය පුවත්පතේ කියන්නේ - නම කිව්වේ මොකක්ද? ස්ටාලින් කියන්නේ ගරු සභාපතිතුමනි, අධ්‍යාපනයට වැදගත්ම නැති පුද්ගලයෙක්. එතුමා පුවත්පත්වලට දාන ඒවා ගැන අපට වගකීම් භාර ගන්න බැහැ. එතුමාගේ ක්‍රියාපටිපාටිය - ඔය වාගේ වගකීමෙන් තොර වැඩ කරන කෙනෙක්. මම පැහැදිලිව පාසල්වලට ඇරපු චක්‍රලේඛයේ පිටපතක් සභාගත කරනවා. ඊට පස්සේ ඔබතුමන්ලාට ඒ පිළිබඳව කථා කරන්න පුළුවන්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමැතිතුමා ඉදිරිපත් කරපු දේට මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට උත්තර දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, එතුමා කුමන රීතිය යටතේද කථා කරන්නේ. අපටත් කථා කරන්න පුළුවන්. මොකක්ද රීතිය?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩි වෙන්න. මම බේරගන්නම් ඒක.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ කටයුතු කරද්දී ඒකේ නායකත්වය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාපතිවරු තුන්දෙනෙක් නැහැ. සභාපතිවරු එක්කෙනයි ඉන්නේ.

---

[2] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මේ වැඩ කටයුත්ත, මේ ක්‍රියාදාමය ගෙන යද්දී ඒකේ නායකත්වය, ඒකේ වගකීම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලබා දෙන්නය කියලා මම උපදෙස් දීලා තිබෙනවා. ඒක වගකීමක් ඇතුව කළ යුතුව තිබෙන නිසා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඒක දේශපාලනීකරණයක් නේ ගරු මහ ඇමැතිතුමනි? බස්නාහිර පළාත් සභාවේ දේශපාලනයක් ඔබතුමන්ලා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ පාසල් 1332 ක අපේ දරුවෝ හත් ලක්ෂ නව දහස් තුන්සිය හතළිස් නව දෙනෙක් සඳහා මේ සංවර්ධන වැඩ කටයුත්ත අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා 2013 වසරට රුපියල් දස ලක්ෂ දහසය දහස් හාරසිය හැට පහක මුදලක් සමස්ත අයවැයෙන් 40.97% ක මුදලක්, අති විශාල මුදලක් 2013 අපේ පළාතේ දරුවන් වෙනුවෙන් වැය කරන්න බලාපොරොත්තු වන වේලාවේ මම විශේෂයෙන් සතුටු වෙනවා. පෙර වසරත් එක්ක සංසන්දනය කළාම 7.46% ක වැඩි වීමක් 2013 වසරේ අපේ පාසල් ප්‍රජාව වෙනුවෙන් වැය කරලා, දරුවන්ගේ අධ්‍යාපනයේ ගුණාත්මක මට්ටම ඉහළ දමන්න සූදානම් වන වේලාවේ, මේ සභාවේ විපක්ෂයේ බොහොම සදාචාරයක් තිබෙනවයි කියන, විනයක් තිබෙනවයි කියන ඇතැම් පක්ෂවල මන්ත්‍රීවරු මේ කියන අදහස් දරාගන්න බැරිව එක අවස්ථාවක අර සදාචාරයක් තිබෙනවයි කියන පක්ෂයක මන්ත්‍රීවරයෙක් අපේ ඇමැතිවරයෙකුට බෙලි කපන්න වුණත් සූදානම් කියන පරණ 88, 89 යුගය තවමත් මේ ගොල්ලෝ තුළ හොල්මන් කරනවා. එහෙම සභාවක තමයි අද අපට මේ කටයුතු කරන්න වෙලා තිබෙන්නේ කියන කාරණය ගරු සභාපතිතුමනි මම වේලාවේ මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සුපසන් නිම්තෙර වැඩ සටහන යටතේ පසුගිය දිනවල අපි ක්‍රියාත්මක කරපු පාසල්වල - පසුගිය වසරවල්වල වසර තුනක අධ්‍යාපනයේ ප්‍රගතිය පිළිබඳ, විභාග සමත් ප්‍රතිශතයන් පිළිබඳ විශ්ලේෂණයත්, ඒ වාගේම - විශේෂයෙන් මෙන්න මේ මන්ත්‍රීවරු ඉස්සෙල්ලා නැවත දහම් පාසල් යවන්නට ඕනෑ, මේ අයගේ විනය සහ සදාචාරය හදා ගන්න. අද අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපේ පළාත් සභාවේ සිටින දරුවන් දහම් පාසල් ගත කරන වැඩ පිළිවෙළක් සුවිශේෂී ආකාරයට විදුහල්

[ ගරු ගුණසිරි ජයනාත් ]

හරහා ක්‍රියාත්මක කරන්න යනවා. මම දැක්කා. ඊයේ දවසේ අදහස් ප්‍රකාශ කරද්දී විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, මේවාට නීති දාලා ක්‍රියාත්මක කළාට හරි යන්නේ නැහැ. කැමැත්තෙන් යවන්න ඕනෑ කියලා. ගරු සභාපතිතුමනි, මොළයක් නැති ඇතැම් මන්ත්‍රීවරු. හරි දේ නීතිය දාලා හරි ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. හරි දේ අවශ්‍ය වෙනවා. ඒක අවශ්‍යයි කියන කාරණාව මම සඳහන් කරන්නම්.

ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මේ වැඩ පිළිවෙළ තුළ මගේ කොට්ඨාශයේ පාසල් 24 කට මම ගියා, ඔය කිව්ව වැඩ සටහනට. මම දෙමව්පියන්, ආචාර මණ්ඩලය, විදුහල්පතිවරු, දරුවෝ මේ සියලු පාර්ශවයන් එක්ක සාකච්ඡා කරද්දී - මගේ කොට්ඨාශයේ ප්‍රාථමික පාසලක දරුවෝ එක් දහස් ගණනක් ඉන්නවා. ඒ ප්‍රාථමික පාසලේ දරුවෝ එක් දහස් ගණන ඉදිරියට ගෙන්න ගෙන, ළඟට ගෙන්න ගෙන මම කථා කළා. ගරු සභාපතිතුමනි, මම එක උදාහරණයක් කියන්නම් අද අපේ රටේ සිදුවන්නේ මොකක්ද කියන එක පිළිබඳව. දරුවන් එක්ක කථා කරලා ගෙදර ඉගෙන ගන්න පරිසරයක් අපේ දෙමව්පියෝ හදලා තිබෙනවාද කියන ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කළාම ගරු සභාපතිතුමනි - මම දරුවන්ගෙන් ඇහුවා. දරුවනි, සවස හතාමාරේ ඉඳන් අපේ රටේ මාධ්‍යවල තිබෙන TV එකේ නාට්‍යය ටික බලනවා නේද කියලා ඇහුවා. සියලුම දරුවෝ අත ඉස්සුවා. නාට්‍ය බලනවා. ගරු සභාපතිතුමනි, දරුවෝ බොරු කියන්නේ නැහැ. ඊට පස්සේ මම ඒ දරුවන්ගෙන් අම්මාලා ඉන්න තැනම ඇහුවා. අම්මලාත් මේ නාට්‍ය ටික බලනවා නේද දරුවනේ කියලා. ගරු සභාපතිතුමනි, ඔක්කෝම අත ඉස්සුවා. අද අපේ රටේ වෙලා තිබෙන්නේ මේකයි. ගරු සභාපතිතුමනි, මම මේ වේලාවේ කනගාටු වෙනවා. අපි ඉස්සෙල්ලා එක පෞද්ගලික මාධ්‍යයකට බැන්නා, අර රන් දෙපැය ගැන. කනගාටුයි ගරු සභාපතිතුමනි, අද අපේ රටේ තිබෙන ආණ්ඩුවේ මාධ්‍ය ආයතන දෙකෙනුත් මේකම තමයි කරන්නේ. අද අපේ පියල් නිශාන්ත, ලාල් කුලරත්න, රොජර් සෙනෙවිරත්න වාගේ ප්‍රවීන කලාකරුවන් ඉන්නවා. මේ ගොල්ලන්ගෙන් ඇහුවොත් කියයි අද මේ යන නාට්‍ය මාලාව මොනතරම් අපේ රටේ දරුවන්ට උචිතද කියලා. කිසිදු ආදර්ශයක් ගන්න නැති මෙගා ටෙලි නාට්‍ය තමයි බලන්නේ. අද අපේ රටේ පාසල්වල ඉන්න දරුවෝත් අම්මලා තාත්තලා සියලු දෙනා හතාමාරේ සිට රෑ නවය හාමාර, දහය වනතුරු මේක දිහා තමයි බලාගෙන ඉන්නේ. වෙන කිසිම වැඩක් නැහැ. මේක මහ ව්‍යසනයක් ගරු සභාපතිතුමනි. මම ගිය පාසල් 24 ම දරුවෝ කිව්වා. ඒ නිසා මම ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යෝජනා කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා කැබිනෙට්ටුව නියෝජනය කරන නිසා රජයට යෝජනා කරන්න, අඩු වශයෙන් මේ නාට්‍ය මාලාව, හතාමාරේ සිට නවය හමාර වනතුරු යන නාට්‍ය මාලාව අඩුම වශයෙන් එකකට සීමා කරන වැඩ පිළිවෙළකට යන්න කියන යෝජනාව ඔබතුමා හරහා ගරු ප්‍රධාන ඇමැතිතුමාට කරනවා. එහෙම

නැතිව ගියොත් අපේ රටේ මහ ව්‍යසනයක් මේ වෙන්නේ. මේවාගේ තිබෙන අසභ්‍ය දර්ශන, අසභ්‍ය අදහස් දරුවන් ජීවිතයට එක්කාසු කරගෙන ක්‍රියාවට යොදවන්න ගිය අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ ගෞරවනීය අවධානය මම මේ අවස්ථාවේ යොමු කරනවා.

ඒ වාගේම දහම් පාසල් ගත කිරීමේ වැඩ පිළිවෙළත් ඒ හා සමාන විශිෂ්ට ක්‍රියාවක් කියලා ගරු ප්‍රධාන අමාත්‍යතුමනි මම හඳුන්වන්න කැමැතියි. ඒ වාගේම එතුමාගේ හොඳ කියන එකත් ඉතාමත්ම වැදගත් වෙනවා. එතුමා ඒ පිළිබඳව තව උනන්දු වෙනවා. සමහරවිට කියයි මේගොල්ලෝ කඩේ යනවා කියලා. අද විපක්ෂය පැත්තෙන් බොහෝ දෙනෙක් කථා කළා. පාර්ලිමේන්තුවේ ජාතික අයවැය ගැන, මහ ආණ්ඩුවේ වැඩ ගැන. ඇයි? මේ අයට පළාත් සභාව විවේචනය කරන්න බැහැ. ඉතිහාසයේ පළාත් සභාව විවේචනය කළා. නමුත් වර්තමාන ගරු ප්‍රධාන අමාත්‍යතුමා 2009 සිට අද වනතුරු මේ පළාත් සභාව ක්‍රියාත්මක කරලා තිබෙන විධියට හැම සතියකම බදාදා දිනයේ මහජන දිනය පවත්වමින් ජනතාවගේ අදහස් ගත්තා. ඒ වාගේම මන්ත්‍රීවරු ඒකරාශී කරගෙන මාසිකව කලාප කමිටුව හරහා මේ සංවර්ධන ක්‍රියාදාමයට අදහස් ගත්තා. ඒ වාගේම මාසිකව අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව තියලා ඒ අදහස් අරගෙන තමයි මේ සියලු කාර්යයන් ක්‍රියාත්මක කළේ. මේ ගොල්ලන්ට ඕනෑ විධියට ප්‍රතිපාදන දෙන්න ඕනෑ නැහැ. මේ රටේ ජනතාව 2/3 ට ආසන්න බලයක් මේ පළාත් සභාවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට දීලා තිබෙන වේලාවේ කෙහෙල්මලකටද මේ අයට දෙන්නේ. ඒක අපේ අයිතිය. ඒක ජනතාව අපට භාර දීලා තිබෙනවා. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉතාම වැදගත් ආකාරයට මේ පළාත් සභාව මෙහෙයවමින් අධ්‍යාපනයේ සියලු කඩඉම් හැම වසරෙන් වසර ඉහළ යන දත්තයන් අද මේ පළාත් සභාවේ අපි පෙන්නලා තිබෙනවා. ඒ එතුමාගේ මැදිහත්වීම. කැපවීම.

ඒ වගේම තමයි විශේෂයෙන් මම සඳහන් කරනවා. ඉතිහාසයත් එක්ක ගත්තාම, ආපසු පසුගිය අවුරුදුවලට ගියාම මේ අපේ පළාත් සභාවට මහ ආණ්ඩුවෙන් වෙන්න පුළුවන්. ලෝක බැංකුවෙන් වෙන්න පුළුවන්. අපේ උපයන ආදායමෙන් වෙන්න පුළුවන්. සංවර්ධන ව්‍යාපෘතිවලට වෙන් කරපු මුදල් හැම ශතයක්ම මේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කාලය තුළ වැය කරලා, ව්‍යාපෘතිය අවසන් කරන්න වැඩ පිළිවෙළක නිරත වෙලා තිබෙනවා. කිසිදාක කවරදාක්වත් නැති විධියට. ඒක ඉතාම විශිෂ්ට කාර්යයක්. ඒකට අවශ්‍ය නිලධාරීන්, අමාත්‍යාංශ ලේකම්තුමිය ප්‍රධාන සියලු නිලධාරීන් එතුමා මෙහෙයුවා. අපව මෙහෙයුවා. අපට අදාළ වගකීම් භාර දුන්නා. ඒ වගකීම අධීක්ෂණ කාර්යය අපට භාර දීපු නිසා තමයි මේ ව්‍යාපෘතිය අවසන් වෙලා මූල්‍ය ප්‍රගතියත්, භෞතික ප්‍රගතියත් 100% කට ආසන්න ප්‍රමාණයකට අපට ලබා ගන්න හැකියාවක් ලැබුණේ කියන කාරණය මම මේ වේලාවේ මතක් කරන්න කැමැතියි. ඒ නිසා පළාත් සභාවේ අද ඉතාම පෙර නොවූ විරූ ආකාරයේ සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන යුගයක්. මේ යුගය ඉතාම ඓතිහාසිකයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම දීර්ඝව අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

විශේෂයෙන් මම තව එක යමක් සඳහන් කරනවා. අපේ විදුහල්පති මහත්ම මහත්මීන් එක්ක සාකච්ඡා කරන වේලාවේ දැන ගැනීමට ලැබුණේ, මේ සේවාස්ථ සැසි පැවැත්වීම – ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. සේවාස්ථ සැසි පැවැත්වීම අද ඵලදායි තත්ත්වයක නැහැ. ගරු සභාපතිතුමනි, ඒකට හේතුව වෙලා තිබෙන්නේ, මේ සේවාස්ථ සැසි අවුරුද්ද පුරාම පවත්වනවා. වර්ෂ අවසානයේත් පවත්වනවා. අපි උදාහරණයක් හැටියට ගත්තොත් III වැනි ශ්‍රේණියේ ගුරුවරයෙකුට සේවාස්ථ සැසියක් වර්ෂය අවසානයේ පැවැත් වුවොත් කිසිම ප්‍රායෝගික ඵලදායි තත්ත්වයක් නැහැ. ඒ නිසා මම අවධානය යොමු කරනවා. මේ සේවාස්ථ සැසි කොට්ඨාශයෙන්, කලාපයෙන්, පළාත් මට්ටමින්, ඒ වාගේම මහ ආණ්ඩුවේ ඉසුරුපායෙන්, ජාතික අධ්‍යාපන ආයතනයෙන් මේ වාගේ ආයතන රාශියකින් පැවැත්තුවත් කාල වකවානුවක් ඒ ආයතන තුළ අන්තර් සම්බන්ධතාවයක් නැති නිසා, මේවාගේ කිසිදු ඵලදායි තත්ත්වයක් ඇති නොවන තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමා හරහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යෝජනා කරනවා. මේ සියලු ආයතන තුළ අන්තර් සම්බන්ධතාවයක් හදලා, කිසියම් කාලරාමුවක මේ සේවාස්ථ සැසි පවත්වලා, වඩාත් ඵලදායි තත්ත්වයකට පත් කරන්න කියන කාරණය මතක් කරමින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ඉලක්ක ජය ගන්නට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 02.25 ]

**ගරු එස්. රාජේන්ද්‍රන්**
Hon. S. Rajandran

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන සන්තෝෂ වෙනවා. මේ අපේ ෆයිරූස් ගරු මන්ත්‍රීතුමා කථා කරපු මාතෘකාවෙන් මම වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන් උතුරු කොළඹ, මැද කොළඹ පාසල්වල රජයේ මන්ත්‍රීවරුන් හැටියට ඔවුන්ගේ බලතල කලාප කාර්යාලයේ සිට විදුහල්පතිවරුන් දක්වා විහිදිලා තිබෙනවාය කියන එක තමයි කියන්න තිබෙන්නේ. වෙන පළාත්වල කෙසේ වෙතත් මේ පළාතේ ඒ විධියට යනවා ගරු මහ ඇමැතිතුමනි. මොකද, අපේ කොළඹ කලාප අධ්‍යක්ෂක කාර්යාලය, අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට, අපට කාලවේලාවට රැස්වීම් පිළිබඳව දැනුවත් කරන්නේ නැහැ. අඩු ගණනේ දුරකථනයෙන්වත් දැනුම් දෙන්නේ නැහැ. ඔබතුමාගේ උපදේශක කාරක සභාවට මම ඇවිල්ලා, මගේ කාඩ් එක දීලා මම කිව්වා, රැස්වීම් පවත්වන කොට අපව දැනුවත් කරන්න කියලා. මම හිතන්නේ, කලාප කාර්යාලයත් එක්ක සංවිධානය වෙලා වෙන දෙයක් තමයි ඒ. ඒ නිසා මම ඔබතුමාගේ අවධානයට යොමු

කරනවා. ඒ වාගේ වැරැදි නොවෙන්න කටයුතු කරන්න කියලා ගරු සභාපතිතුමා හරහා ගරු මහ ඇමැතිතුමාට දන්වනවා. මොකද, අපි සුළු ජාතිකයන්ගේ පාසල්වල අඩුපාඩු කථා කරන ස්ථානයක් තමයි අපේ කලාප අධ්‍යාපන කාර්යාලය සහ උපදේශක කාරක සභාව. ඒ සභාවල්වල තිබෙන රැස්වීම් සම්බන්ධවවත් අඩුම ගණනේ අපට හරියාකාරව වේලාවට දන්වන්නේ නැති එක පිළිබඳව හුගාක් වේදනාවක් තිබෙනවා. ඒ වාගේම මම ඊයේත් කථා කළා. කථා කරනකොට පැහැදිලිවම කිව්වා. ගරු මහ ඇමැතිතුමා දෙමළ මාධ්‍ය ගුරුවරුන් පත් කිරීම ගැන නැවත නැවතත් අපි සුළු ජාතික පක්ෂයක් හැටියටත්, ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ හැටියටත්, එහි මන්ත්‍රීවරුන් හැටියටත් අපේ ජනතාව වෙනුවෙන් මම මේ අවස්ථාවේදී ස්තුතිය පුද කරනවා. ඒ වාගේම තවත් අඩුපාඩුකම් තිබෙනවා. ඒ කියන්නේ, මේ ගුරු පත්වීම් ලබා ගත් ඒ ගුරුවරුන් ඒ විෂයන් සම්බන්ධව පුහුණුව මදි කමක් තිබෙනවා. ඒ වගේම ගුරු පත්වීම් ලබපු කට්ටියගෙන් මට දැන ගන්න ලැබුණා. සමහර ගුරුවරුන් ඒ පත්වීම් දුර පළාත්වලට ලැබුණු නිසා, පත්වීම් ලබා ගන්නේ නැතිව සිටින එකත්. ඒ නිසා මේ ගුරු පත්වීම් සම්බන්ධයෙන් තව අඩුපාඩු තිබෙන බව මම ගරු සභාපතිතුමා හරහා ගරු මහ ඇමැතිතුමාට දන්වන්න කැමැති වෙනවා.

ඒ වාගේම මෙම සුපසන් නිම්තෙර කියන ව්‍යාපෘතිය හොඳ ව්‍යාපෘතියක්. ඇත්ත වශයෙන්ම මම හිතන්නේ, හැම මාධ්‍ය පාසලකටම උදව් කරන අය හැටියට මම ඉල්ලා සිටිනවා, ඒකත් දේශපාලනාධිකාරියක් කරන්න එපා. මොකද, එහෙම කරන්න ගියොත් අපි වාගේ මන්ත්‍රීවරුන්ටත් අසාධාරණයක්. අපි දන්නවා. මේ ආණ්ඩුවේ අතිගරු ජනාධිපතිතුමා හැම මිනිහාටම උදව් කරනවා. එහෙම ආණ්ඩුවක් හැටියට අපි පිළි අරගෙන තිබෙනවා. නමුත් අපි එතැනදී අඩුපාඩුවක් දකිනවා. මොකද මෙවන් පළාත් සභාවක සුළු ජාතික මන්ත්‍රීවරුන් අපහසුතාවයට පත් වන ආකාරයට ක්‍රියා කිරීම පිළිබඳව. ඇත්ත වශයෙන්ම අධීක්ෂණ මන්ත්‍රීවරුන් කියලා දෙමළ පාසල්වල ගුරුවරුන්ව භය කරලා තිබෙනවා. අපි තමයි අධීක්ෂණ මන්ත්‍රීවරු අපෙන් අහන්නේ නැතිව කිසිම මන්ත්‍රීවරයෙකුට ආරාධනා කරන්න එපා කියන එක -

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

ඒවා බොරු. ඒවා බොරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා නිශ්ශබ්දව ඉන්න. එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු එස්. රාජේන්ද්‍රන්**
Hon. S. Rajandran

ඒ විදුහල්පතිවරුන්ගෙන් මට ලිපි අරගෙන හරි අපට ලබා දෙන්න පුළුවන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා

[ ගරු එස්. රාජේන්ද්‍රන් ]

මාර්ගයෙන් ගරු මහ ඇමැතිතුමාගේ අවධානය මේ සඳහා යොමු කරනවා. අපි කියන්නේ, අසාධාරණ විධියට මේවා වෙන්න නරකයි කියන එක. ඒ වාගේම අධීක්ෂණ මන්ත්‍රී කියලා - මෙතුමා පුළ පුලා කියනවා. කථා කරනකොටත් බාධා කිරීම් කරමින් කියනවා, එහෙම දෙයක් නැහැයි කියලා. ගරු මහ ඇමැතිතුමාත් ඊයේ ඒ ගැන කිව්වා, අධීක්ෂණ මන්ත්‍රීවරුන් කියලා කිසිම කෙනෙක්ව අපි පත් කරලා නැහැයි කියලා. පැහැදිලිවම කිව්වා. එහෙමනම් මෙවන් ප්‍රචාර කටයුතු කරගෙන විදුහල්පතිවරුන් භය කරගෙන, අපටත් ඒ පාසල්වලට යන්න බැරි තත්ත්වයක් උදා කර තිබෙනවා. ඒ පාසල්වල විදුහල්පතිවරුන් අපට කියනවා. මෙහෙම දෙයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. ඔයගොල්ලන්ට අපට ආරාධනා කරන්න බැහැ. ඒ ගොල්ලෝ කියනවා. මේ පාසලට ප්‍රතිපාදන ආණ්ඩුවෙන් ගන්නවා නම්, අපි කියන දේ අහගෙන, අපි කියන දේ කරන්න ඕනෑය කියලා. ඇත්ත වශයෙන්ම එතුමා කිව්ව විධියට විදුහල්පතිවරු තමුන්ගේ රාජකාරී කරගන්න මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වලට යනවා. ඒක ඇත්ත. ඒක බොරු කථාවක් නොවෙයි. ඒක නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා ගරු මහ ඇමැතිතුමාට කියනවා. ඒ වාගේ කටයුතුවලට නැවත නැවතත් ඉඩ දෙන්න එපා. ඒ ගැන සොයා බලලා සාධාරණයක් ඉටු කරන්නය කියලා.

ඒ වගේම පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳවත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු එස්. රාජේන්ද්‍රන්**
Hon. S. Rajandran

තව විනාඩියක් දෙන්න. පාසල්වලට ළමුන් ඇතුළත් කිරීම සම්බන්ධවත් ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් ගරු මහ ඇමැතිතුමාගේ අවධානයට මම ලිඛිතව ලබා දීමට කටයුතු කරමින් මේ අවස්ථාව ලබා දුන් ගරු සභාපතිතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

[ අ.භා. 02.30 ]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, අද අපේ පළාත් සභාවට ඉතාමත්ම වැදගත් වන අමාත්‍යාංශයක් සම්බන්ධව විශේෂයෙන් අධ්‍යාපන, පළාත් පාලන, විදුලිබල හා බල ශක්ති, ඉඩම් හා මිනිස් බල අමාත්‍යාංශය පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මගේ ගෞරවනීය ප්‍රණාමය, ස්තුතිය පුද කරන්න ඕනෑ. ඒ වාගේම අද මධ්‍යම රජයේ ජාතික අධ්‍යාපනය පිළිබඳව රට පුරාම දැවැන්ත විවේචනයට ලක් වන මොහොතක බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට අපේ පළාත් සභාවේ

අධ්‍යාපනය පිළිබඳව ඉතාමත්ම සතුටින් කථා කිරීමට ලැබීම පිළිබඳව මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. ඒ පිළිබඳව මම හිතන්නේ, මේ අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුදෙනාම තමන්ගේ හෘද සාක්ෂියට එකහව මේ තත්ත්වය පිළිබඳව මනා වැටහීමක් මේ සියලුදෙනා ලබාගෙන තිබෙනවා. ඒ නිසා අද මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාව ඉතාමත්ම හොඳින් සියලු පැතිකඩ පිළිබඳව හොඳ අවබෝධයක් ලබාගෙන අපේ දරුවන්ගේ අනාගතය නිර්මාණය කරන්නට, ඒ වාගේම උගත් බුද්ධිමතුන් මේ රටට දායාද කරන්නට ඉතාමත්ම හොඳ කැපවීමක් කරන නිසා විශේෂයෙන්ම අපේ ගරු ප්‍රධාන අමාත්‍ය, ඒ වාගේම අධ්‍යාපන විෂයය භාරව කටයුතු කරන අමාත්‍යවරයා හැටියට ප්‍රසන්න රණතුංග ගරු අමාත්‍යතුමාටත් ඒ වාගේම අධ්‍යාපන ලේකම්තුමිය ඇතුළු මේ ක්ෂේත්‍රයේ ඉන්න සියලුම නිලධාරීන්ටත් මගේ ගෞරවනීය ප්‍රණාමය, ස්තුතිය පුද කරනවා.

ඒ වාගේම තමයි අද මම හිතන්නේ, අපේ අධ්‍යාපන රටාව තුළ යම් යම් වෙනස්කම් සිදු වුවත්, සමස්තයක් හැටියට ගත්තාට පස්සේ අපි දැනට වසර කීපයකට උඩදී බස්නාහිර පළාතේ අධ්‍යාපන සංවර්ධනයත්, අද සංවර්ධනයත් ගැන කථා කරනකොට මම හිතන්නේ, විපක්ෂය මොන මොන දේවල් කිව්වත්, තමන්ගේ හෘද සාක්ෂියත් එක්ක සසඳනකොට ඔවුනුත් අඩම්බර විය යුතුයි. අපට මතකයි අපේ පාසල් යුගය කාලයේ මහ ලොකුවට කථා කරන ජනතා විමුක්ති පෙරමුණ, එක්සත් ජාතික පක්ෂය කොහොමද මේ අධ්‍යාපනය අවුල් සහගත තත්ත්වයකට පත් කළේ කියලා. දරුවන්ව බිල්ලට අරගෙන, දරුවන්ව සුසාන භූමිය දක්වා කැන්දගෙන යන යුගය එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ එදා නිර්මාණය කළා. මම හිතන්නේ, මම මීට ප්‍රථමත් මේ සම්බන්ධව කථා කරලා තිබෙනවා. මම පාසල් යන කාලයේ ධවල පත්‍රිකාව ගෙනැල්ලා මේ ධවල පත්‍රිකාවට විරුද්ධව දැවැන්ත උද්ඝෝෂණ රට පුරා පැවැත්වෙන කොට අපේ අහිංසක දරුවෝ අමු අමුවේ මරලා දාපු යුගය මම හිතන්නේ, දැන් ජනතා විමුක්ති පෙරමුණට සහ එක්සත් ජාතික පක්ෂයට අමතක වෙලා තිබෙනවා. ඒ නිසා ඒ අය බොහොම වේදනාවෙන් කථා කරනවා. ඒ යුගයයි මේ යුගයත් එක්ක සංසන්දනය කරනකොට සැබෑ ලෙස අපේ කාලයේ අපට යමක් කරන්න බැරි වුණා නේද කියලා. ඒ නිසා අද මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාව අධ්‍යාපන විෂයය සම්බන්ධව වැඩි මුදලක් වෙන් කරලා තියෙනවා. ඒ වාගේම දැනට තිබුණු ප්‍රධානම ගැටලුව වන ගුරු හිඟය, විශේෂයෙන්ම භෞතික සම්පත් ලබා දීලා (බාධා කිරීමක්) - ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් හැටියට ඔහු දන්නවා කොහොමද එදා ඒ අහිංසක දරුවන්ට සලකපු ආකාරය. ටයර් සෑය මත. ලයිට් කණු උඩ. ගංගාවල. එසේ සලකපු ආකාරය ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා දන්නවා. ඒක නිසා මම හිතන්නේ, ඒ පිළිබඳව අපට දුකක් නැහැ. ඔබතුමා ටිකක් සද්දෙන් කථා කළාට. ඒ නිසා මම හිතනවා, අධ්‍යාපන සංවර්ධනය වාගේම භෞතික සංවර්ධනයත් ඉතාමත්ම හොඳින් අපේ පළාත් සභාව තුළ අපේ දරුවන්ට ලැබෙනවා.

ඒ වාගේම කිව යුතු එක කාරණයක් තිබෙනවා. ඒ පෞද්ගලික අධ්‍යාපන ආයතන. අද පෞද්ගලික අධ්‍යාපන ආයතන දැනුමට පමණක් සීමා වුණු නිසා අද නොයෙකුත් ගැටලු මතු වෙලා තිබෙනවා. ඒ නිසා අපට ඒ පෞද්ගලික අධ්‍යාපන ආයතන තුළින් දැනුම, කුසලතා, ආකල්පවලින් පිරුණු දරුවෝ බිහි කර ගැනීමට බැරි වෙලා තිබෙනවා. අද ඒ පිළිබඳව විතරක් නොවෙයි, සමහර පෞද්ගලික පාසල් අද වැහෙන තත්ත්වයට පත් වෙලා, දරුවන් දෙමව්පියන් අනාථ වන මට්ටමට පත් වෙලා තිබෙනවා. ඒක අපි පැහැදිලිවම දන්නවා. කළුතර කලාපය තුළ පෞද්ගලික පාසලක් වහන්න ගිහිල්ලා, උද්ඝෝෂණය කරන්න ගිහිල්ලා බොහොම අමාරුවෙන් යාන්තම් සාමාන්‍ය මට්ටමෙන් පවත්වාගෙන යනවා. මම නම් ගම් කියන්නේ නැහැ. ඒ නිසා මම හිතන්නේ, මේ සියලු දේවල් අපේ බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයට බැර කරලා වැඩක් නැහැ. ඒ නිසා අපි පැහැදිලි විධිමත් වැඩ පිළිවෙළක්, තවදුරටත් ශක්තිමත් වැඩ පිළිවෙළක් බස්නාහිර පළාත් සභාව තුළ අරගෙන ගියොත් ඉතාමත්ම හොඳ දරු පිරිසක් අපට නිර්මාණය කරගන්න පුළුවන්.

ඒ වාගේම තමයි, අපි බේරුවල අධ්‍යාපන කොට්ඨාශය දිහා අරගෙන බැලුවොත් ගරු සභාපතිතුමනි, අද අපි සන්තෝෂ වෙනවා. එදා අපේ ගුරු හිඟය, දැඩි ගුරු හිඟයක් බවට පත් වෙලා, එක ජනප්‍රිය පාසලක්වත් අපට තිබුණේ නැහැ. එක ජනප්‍රිය පාසලක්වත් තිබුණේ නැහැ. අපි හැමදාම මහ ඇමැතිතුමා ගාව, ඒ වාගේම කළුතර සහ පානදුරේ ඉන්න, මතුගම ඉන්න මගේ සහෝදර මන්ත්‍රීවරුන් ළඟට ගිහිල්ලා අනේ මන්ත්‍රීතුමා, මට මේ දරුවාව මේ පාසලට දාලා දෙන්නය කියන ආයාචනය කරන්න සිදු වුණා. අද මම ආඩම්බරයෙන් කියනවා. අද බේරුවල ආසනයේ ජනප්‍රිය පාසල් 05 ක් තිබෙනවා. ඒක නිර්මාණය කළේ අපි කවුරුවත් නොවෙයි. විශේෂයෙන්ම ගරු ප්‍රධාන ඇමැතිතුමාත්. ඒ වාගේම අපේ නිලධාරීනුත්. ඒ කාර්යය ඉටු කිරීමට අපේ විදුහල්පතිවරු, බේරුවල ගුරු මණ්ඩලය ලොකු ශක්තියක් දීලා, අපට ආඩම්බරයෙන් කථා කරන්න පුළුවන් මට්ටමක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි මේ වන විටත් අපට දැඩි ගුරු හිඟයක් තිබෙනවා. නමුත් අපි තිබෙන විධියට ඒ සම්පත් බෙදා ගෙන මේ වන විට ඉතාමත් හොඳ ගමනක් යනවා. තවත් අපට අපේ කළුතර කලාපයේ ගුරුවරු 58 ක් අඩුයි. ඒ නිසා මම ඔබතුමා මාර්ගයෙන් අධ්‍යාපන ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. බේරුවල කොට්ඨාශය, ඒ වාගේම කළුතර කලාපයට, ඒ වාගේම මතුගම කලාපයට අපට වැඩි වශයෙන් ගුරුවරුන් ලබා දීමට කටයුතු කරන්නය කියලා. ඒ වාගේම තමයි අද අපි කථා කරනවා. මේ පාසල් පද්ධතිය තුළ විදුහල්පතිවරු, ඒ වාගේම ගුරු මණ්ඩලය ගැන අපි කථා කරනවා. සමහර අවස්ථාවලදී නොයෙකුත් මත ගැටුම් ඇති වුණත්, ඔවුන් ඉතාමත්ම තෘප්තිමත් ආකාරයෙන් වැඩ කළත් සමහර වේලාවට ඔවුන්ට ලැබෙන සොච්චම් පඩිය ගැන බලන කොට අද ජීවන තත්ත්වයත් එක්ක මම හිතන්නේ, මේ මුදල සෑහීමකට පත් වෙන්න බැහැ. ඒ නිසා අනිවාර්යයෙන්ම මේ විදුහල්පතිවරුන්ගේ, ගුරුවරුන්ගේ වැටුප් වැඩි කරලා ඔවුන්ගේ

මානසික ශක්තිය ශක්තිමත් කරලා අපේ දරුවන්ට නිවැරැදි අධ්‍යාපනයක් ලබා දෙන්නට ඔවුන්ට ශක්තිය ලබා දෙනවා නම්, මම හිතන්නේ ඉතාමත්ම වැදගත් වෙනවා. ඒ වාගේම තමයි අද මම හිතන්නේ, කළුතර කලාපයට උග්‍ර ලී බඩු හිඟයක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා අද අපට ඒ ප්‍රශ්නය විසඳගන්න බැරි වෙලා තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙන්න මේ උග්‍ර හිඟයට කඩිනම් විසඳුම් ලබා දීමට කටයුතු කරන්න කියලා.

ඒ වාගේම තමයි අපි අපේ පළාත් සභාවේ මුදල් ලැබෙන තුරු බලාගෙන ඉන්න ඕනෑ නැහැ. මම මේ වන විට සිසු නැණ ප්‍රදීප කියන මගේ වැඩ සටහනක් හරහා අද පෙර පාසල්, දහම් පාසල් ඒ වාගේම පාසල් ළමුන් වෙනුවෙන් විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ නිසා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා. එවැනි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී අපට පළාත් සභාවක් හැටියට තවත් ශක්තියක් ලබා දුන්නා නම්, ඉතාමත්ම වැදගත් වෙනවා කියලා.

මේ පිළිබඳව මතක් කරනවා වාගේම පළාත් පාලන විෂයය සම්බන්ධව ඉතාමත්ම කනගාටුවෙන් කථා කරන්න ඕනෑ. ජනාධිපතිවරු බිහි කරන්න, අගමැතිවරු බිහි කරන්න, ඒ වාගේම ඇමැතිවරු, මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ බිහි කරන්න, පළාත් සභා මන්ත්‍රීවරු බිහි කරන්න කටයුතු කරන අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ දීමනාව සම්බන්ධව අපි සෑහීමකට පත් වෙන්නේ නැහැ. මම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙක් හැටියට අපි දන්නවා. ඔවුන් මොනතරම් ශක්තියක් පළාත් පාලන ආයතනයට ලබා දෙනවාද කියලා. ඒ නිසා අවම වශයෙන් රුපියල් දොළොස් දාහකින්වත් ඔවුන්ගේ දීමනාව වැඩි කරන්න කියලා මේ අවස්ථාවේදී ඉල්ල සිටිනවා. ඒ වාගේම තමයි ඉතාමත්ම හොඳ කාර්ය ශූර ලෙස විධිමත් ආකාරයට පළාත් පාලන ආයතනය ගෙන යන සභාපතිවරු ඉන්නවා. ඒ වාගේම තවත් සභාපතිවරු ඉන්නවා, තමන්ගේ අම්මාගේ තාත්තාගේ බූදලය පාවිච්චි කරනවා වාගේ අනවශ්‍ය විධියට අහිංසක ජනතාවගේ මුදල් පාවිච්චි කරන. එහෙම සභාපතිවරු ඉන්නවා. ඒ නිසා විශේෂයෙන් මෙන්න මේ අය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරලා, ඒ සභාපතිවරු සම්බන්ධව යම් යම් තීන්දු තීරණ ගන්න කියලා ඉල්ලා සිටිනවා. මම හිතන්නේ මේ විෂයය සම්බන්ධව මොනතරම් කථා කළත් අපි අවසානයේ කථා කරන්න තිබෙන්නේ ආඩම්බරයෙන්.

ඒ නිසා මම නැවතත් අපේ අහිංසක දරුවන් වෙනුවෙන් මෙවැනි ශක්තියක් ලබා දුන්න ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලු දෙනාටම මාගේ ගෞරවණීය ස්තුතිය අපේ කලාපයේ ජනතාව වෙනුවෙන් අපි ලබා දෙනවා. එදා තිබුණු කලාප කාර්යාලය නොවෙයි අද කළුතර තියෙන්නේ. අපි ආඩම්බරයෙන් කථා කරනවා. අද ඒ කලාප කාර්යාලය ප්‍රසන්න ජනක කලාප කාර්යාලයක් බවට පත් වෙලා තියෙනවා. ඒ නිසා අධ්‍යක්ෂතුමිය ඇතුළු ඒ සියලු දෙනාටම අපේ ගෞරවණීය ප්‍රණාමය පුද කර සිටිමින් මම මගේ කථාව සමාප්ත කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 02.42 ]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබෙන වැය ශීර්ෂය පිළිබඳව කථා කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මම බොහොම සතුටු වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් මේ සභාවට ඉදිරිපත් කර තිබෙන අයවැය ලේඛනය දිහා බැලුවාම අපට පුදුම හිතෙනවා. බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවගේ යහපත සඳහා අය වැයක් ඉදිරිපත් කරන කොට ජනතාව බලාපොරොත්තු වෙනවා, සහන රාශියක්. මධ්‍යම රජයේ අය වැය ඉදිරිපත් කළා. බස්නාහිර පළාතේ ඉතාමත් අමාරු අපහසුතාවයකින් ජීවත් වන ජනතාවගෙන් බදු අය කිරීම තුළින් දැවැන්ත අසාධාරණයක් සිද්ධ වන අන්දමට අය වැයක් කියලා මධ්‍යම ආණ්ඩුවේ අයවැය ලේඛනය දිහා බැලුවාම අපට සඳහන් කරන්න පුළුවන්. පළාත් සභාවත් තම අයවැය ලේඛනය ඉදිරිපත් කරලා, සංවර්ධන වැඩ කටයුතුයි, ඒ වාගේම ජනතාවගේ සේවා අවශ්‍යතාවයන් සඳහාත් කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. අධ්‍යාපනය, පළාත් පාලනය වැනි විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙන් කරලා තියෙන මුදල් අනුව බැලුවාම එතුමා 2013 වර්ෂය සඳහා රුපියල් දස ලක්ෂ 16,465 ක මුදලක් අධ්‍යාපනයට වෙන් කරන්න ඉලක්කගත කරලා, සැලසුම් හදලා මේ සභාවට ඉදිරිපත් කරලා තියෙනවා. අනෙක් පැත්තෙන් පළාත් පාලන අයතන 48 ක් සඳහා 2013 වර්ෂයේදී රුපියල් දස ලක්ෂ 8638 ක් වෙන් කිරීමට එතුමා බලාපොරොත්තුවෙන් සිටිනවා.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමා මාර්ගයෙන් මේ සභාවේ මන්ත්‍රීවරුන්ට සහ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කරුණක් පිළිබඳව අවධානය යොමු කරන්න කැමතියි. බස්නාහිර පළාත තුළ පළාත් පාලන ආයතන අනුව මහ නගර සභා 07 කුත්, නගර සභා 14 කුත් ප්‍රාදේශීය සභා 27 කුත් තියෙනවා. මේ බස්නාහිර පළාත තුළ ජීවත් වන ජනතාව වෙනුවෙන් එතුමන්ලාගේ අයවැය ලේඛනය බස්නාහිර පළාත් සභාවෙන් ඉදිරිපත් කරනවා. මධ්‍යම ආණ්ඩුවෙන් අටවැනිදා එතුමන්ලාගේ අයවැය ඉදිරිපත් කරමින් එය අනුමත කර ගෙන වැඩ කටයුතු ක්‍රියාත්මක කරනවා. ගරු සභාපතිතුමනි, අපි කියන්න කැමතියි බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන දිහා බැලුවාම බුලත්සිංහල ප්‍රාදේශිය සභාව අයවැය ලේඛනය ඉදිරිපත් කරනවා. බුලත්සිංහල ප්‍රාදේශිය සභාවේ ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීතුමන්ලා එක පැත්තකින් සභාපතිවරයාගේ අයවැයට විරුද්ධ වෙලා. විපක්ෂයේ සිටින මන්ත්‍රී කණ්ඩායම එකඟ වෙනවා අයවැය ලේඛනය ඉදිරිපත් කරන්න. අයවැය ලේඛනය ඉදිරිපත් කරලා කියවාගෙන යන කොට ගරු සභාපතිතුමනි - මම මෙය සභාගත කරන්න කැමතියි. බුලත්සිංහල ප්‍රාදේශිය සභාව ආදායම් එකතු කිරීම, මෙවර බදු ක්‍රමයකට ඇතුළත් කරලා තියෙනවා, බීඩි නිෂ්පාදන තොග වශයෙන් පවත්වා ගෙන විකිණීමේ මධ්‍යස්ථාන ඇතුළු

ආයතනවලින් එතුමන්ලා බදු අය කරන්න යනවා. කුමන අන්දමේ හෝ ව්‍යාපාර පවත්වා ගෙන යන ඒවායින් බදු අය කරනවයි කියනවා. 01 සිට 102 කට නම් කරලා. ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට දරන්න බැරි බදු ක්‍රමයක්. ඒ පළාතේ පළා විකුණන මිනිස්සුන්ට, ඒ වාගේම ගවයකුගෙන් කිරි ටික අරගෙන අලෙවි කරලා මුදලක් සොයාගන්න යන අයගෙන්. ඒ වාගේම ගොඩනැගිලි ද්‍රව්‍යයක් යම්කිසි අන්දමේ ගමේ නිෂ්පාදනය කර ගෙන වෙළඳ පොළකට දාන, ඒ වාගේම තේ දළු මිලට අරගෙන, ඔට්ටුපාලු ටිකක් මිලට අරගෙන වැඩ කටයුතු කරන්න යන අය සඳහා ඉදිරිපත් කරලා තියෙන අයවැය ලේඛනය දිහා බැලුවාම මම ඉතාමත් කනගාටුවෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. අද පළාත් සභාවයි, මධ්‍යම ආණ්ඩුවයි, පළාත් පාලන ආයතනයි ජනතාව ජීවත් කරවන්න ඕනෑ වෙනුවට ජනතාවගේ ඇඟේ තියෙන ලේ ටික බදු මගින් අරගෙන ජනතාව නොමරා මරණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවයි කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අද අපේ රටේ ජනතාව දිහා අරගෙන බැලුවාම, රාජ්‍ය සේවයේ නියැලී සිටින බස්නාහිර පළාතේ පුද්ගලයින් විශාල වශයෙන් අරගෙන බැලුවාම අද රාජ්‍ය සේවාවෙන් ජීවත් වන ජනතාවට ලබා දෙන වැටුපයි, ඒ අයගේ අවශ්‍යතාවයන් සඳහා ලබා ගන්නා භාණ්ඩ ටිකයි අරගෙන බැලුවාම ඒ අයට සිද්ධ වෙලා තියෙනවා - අද මේ රටේ සහනයක් ලබා දෙනවා වෙනුවට, යුද්ධයක් අවසන් කරලා ඒ යුද්ධයෙන් ලැබුණු ප්‍රතිලාභ වියහියදම් පිළිබඳව, ඒ අය බලාපොරොත්තු වුණා සහනදායී වැඩ පිළිවෙළ තුළ 2013 වර්ෂයේ අයවැය ලේඛනය ඉදිරිපත් කරලා ජනතාවට සහන ලබා දෙයි කියලා. නමුත් මම කනගාටුවෙන් ප්‍රකාශ කරන්න ඕනෑ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අපේ අමාත්‍ය මණ්ඩලය ඉදිරිපත් කරලා තියෙන අයවැය ලේඛනයේ මේ පළාතේ ජීවත් වන ජනතාවට සහන, ඒ බදු ගෙවීමෙන් පළාතේ ජනතාව නිදහස් කරන කිසිම ලේඛනයක් මේ අය වැය ලේඛනය තුළ බස්නාහිර පළාතේ ජනතාවට ඉදිරිපත් කරනේ නැහැයි කියන එක මම මතක් කරන්න ඕනෑ.

අනෙක් පැත්තෙන් බැලුවාම බස්නාහිර පළාතේ රාජ්‍ය සේවාවේ නියැලී සිටින මම හිතන්නේ, ගුරුවරුන් 38000 ක් විතර ඉන්නවා. ඒ වාගේම විශාල පිරිසක් පළාත් පාලන ආයතනවල සිටිනවා. මේ සියලු දෙනා ගැන අපි හිතලා බලලා මේ අයට සේවාවක් ලබා දීම සඳහා පළාත් රාජ්‍ය සේවයේ ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ දිහා බැලුවාම, අද මේ පළාත් රාජ්‍ය සේවාවේ ඉන්න ඒ නිලධාරීන්ට ඒ සේවකයන්ට යම් ක්‍රමවේදයක් යටතේ හෝ මේ අයවැය ලේඛනයෙන් කිසියම් සහනයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ඔබතුමන්ලා සඳහන් කරලා නැහැයි කියන එකත් අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ඊළඟට මම කථා කරන්න කැමතියි. ඔබතුමා ඉතාමත් හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න සැලසුම් කරලා තියෙනවා. පළාතේ ජීවත් වන ජනතාවගේ දරුවන්ගේ මූලික අධ්‍යාපන සංවර්ධනය සඳහා පෙර පාසල් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම. ඔබතුමා එතැන පෙන්නුම් කරලා තියෙනවා, පෙර පාසල් අධ්‍යාපනය ගුණාත්මක භාවයකට ගෙන ඒම සඳහා විවිධ ආකාරයෙන් පළාතේ පෙර පාසල් ක්‍රියාත්මක කරනවා කියලා. ඒ නිසා පෙර පාසල් ප්‍රඥප්තිය සංශෝධනය කරන්න. ඒ ප්‍රඥප්තිය සංශෝධනය කරලා ඔබතුමා බලාපොරොත්තු වෙනවා, ඒ උගන්වන පෙර පාසල් පාලිකාවන් වෙනුවෙන් පුහුණු මධ්‍යස්ථාන තුනක් කළුතර, ගම්පහ, කොළඹ යන දිස්ත්‍රික් තුනේ පිහිටුවන්න. ඔබතුමාගේ 2012 අයවැය ලේඛනය බැලුවාමත් පෙර පාසල් ගැන විශේෂයෙන් ඉතාමත් විශේෂ උනන්දුවක් දක්වන ලියකියවිලි සංඛ්‍යා ලේඛන ලබා දීලා තිබුණත්, පෙර පාසල් අධ්‍යාපන ප්‍රඥප්තිය සංශෝධනය කරලා ක්‍රියාත්මක කරන්න යන වැඩ පිළිවෙළ තුළ ඉතාමත් පහළ පසු බෑමකට ලක්වන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. එහෙම නම් අන්න ඒ වැඩ පිළිවෙළ තුළ ඔබතුමා ක්‍රියාත්මක කරන්න යන පාසල් විෂයයි, පෙර පාසල් විෂයයි පිළිබඳව බැලුවාම අනෙක් පැත්තෙන් ඔබතුමා දහම් පාසල් අධ්‍යාපනය සහ හින්දු, කතෝලික, මුස්ලිම් ආගම්වල දහම් පාසල් සංවර්ධනය සඳහා යම් යම් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න යෝජනා ඉදිරිපත් කරලා මූල්‍ය ප්‍රතිපාදන විශාල ලෙස වෙන් කරලා ක්‍රියාත්මක කරන්න හදනවා. නමුත් ගරු සභාපතිතුමනි, අපි කියන්න කැමතියි, මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු 104 දෙනා මහජන නියෝජිතයින් හැටියට කටයුතු කළත්, දහම් පාසල් අධ්‍යාපනය අපේ මන්ත්‍රීවරුන් කිව්වා වාගේ, පාසල් අධ්‍යාපනය වාගේම අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම තුළ ඔබතුමාලාගේ සංකල්ප තුළින් මේවා සියල්ල දේශපාලනීකරණය වෙලා, සේවාව සංවර්ධනය කිරීමට කිසිම වැඩ පිළිවෙළක් හරියාකාරව ක්‍රියාත්මක වෙන්නේ නැති තත්ත්වයකට ගිහිල්ලා තියෙනවයි කියන එක අපි මතක් කරන්න ඕනෑ. අද රාජ්‍ය වැඩ පිළිවෙළ යටතේ බදු මුදල්වලින් ලබා ගන්නා ආදායම් ටික අද දේශපාලනීයකරණය කරමින් සංවර්ධනයට යොදවන කොට එයින් 60% ක විතර මුදල් ප්‍රමාණයක් නාස්තියට, දූෂණයට, යොමු කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක වෙනවා කියන එකත් අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

එහෙම නම් ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ගරු අමාත්‍ය මණ්ඩලයටත් මතක් කර දෙන්න කැමතියි. අපට මතකයි. එදා මේ පළාත් සභාව වාහන බද්දක් අය කළා. එදා රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමතිතුමා ඉන්න කාලයේ මේ පළාතේ වාහන අයිතිකරුවන් ගෙන් බද්දක් අය කළා. අපි විපක්ෂයක් හැටියට ඒ අයකර ගත්ත බදු මුදල් මේ පළාතේ ජීවත් වන ලොකු මෝටර් රථ හිමියන්ට නොවෙයි, කුඩා මෝටර් රථ හිමියන්ට ඒ සහනය ලබා දෙන්න කියලා විපක්ෂයේ අපි එදා ඉල්ලීමක් කළා. එදා සිටි ප්‍රධාන අමාත්‍යතුමාට. එතුමා ඒ පිළිබඳව අධ්‍යයනය කරලා අවබෝධයක් ලබා ගෙන ඒ සහනය ලබා දීම තුළ මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාව අයවැය

ලේඛනයක් ඉදිරිපත් කරන කොට වැඩි මුදලක් අයකර ගන්න එක, ඒ අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශ මත අඩු කරලා ජනතාවට සහනයක් ලබා දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණාය කියන එක මතක් කරමින්, ඔබතුමා ලබා දී තිබෙන කාලය අවසන් වන නිසා 2013 වසරේ අයවැය පිළිබඳ විවාදයේදී ප්‍රධාන අමාත්‍යතුමා විධියට ඔබතුමා ඉදිරිපත් කළ මේ මුල්‍ය ප්‍රතිපාදනයෙන් මේ පළාතේ ජනතාවට සේවාවක් කරන්න ඔබතුමාටත්, අමාත්‍ය මණ්ඩලයටත් ධෛර්යය, ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[ අ.භා. 02.55 ]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, මම මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා අධ්‍යාපන, පළාත් පාලන සහ අනෙකුත් විෂයයන් සම්බන්ධයෙන් අමාත්‍ය ධුරය දරන ගරු මහ අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය වෙනුවෙන් කථා කිරීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව. ගරු සභාපතිතුමනි, මම මුලින්ම කියන්න කැමතියි. ගරු මහ ඇමතිතුමා අධ්‍යාපන ඇමතිතුමා වශයෙන් පත් වුණු ගමන්ම එතුමාගේ පළමුවැනි රාජකාරිය වුණේ, අයාලේ ගිහිල්ල තිබුණු පාසල් සංවර්ධනය කර ගැනීමයි. "අපේ දෑතින් අපේ පාසල් සුරකිමු" කියන සංකල්පය අනුව රුපියල් 50,000/-, රුපියල් 100,000/- ඒ පාසල්වල විදුහල්පතිවරුන්ට දීලා පාසල්වල දෙමව්පියන් සහ දරුවන්ගේ උදව් උපකාර ඇතුව රුපියල් ලක්ෂයක වැඩය ලක්ෂ හතරක පහක ඵලදායිතාවක් ඇති වන විධියට වැඩ කළා. ඒ තුළින් පාසල අපට තියෙන භූමිය අලංකාර කළා. අලංකාර කරලා අධ්‍යාපනය ලබන්න පුළුවන් විධියට ඒ ළමයින්ගේ මනස පිරිසිදු කළා. ඊට පස්සේ කළ දේ තමයි, පාසල්වල තියෙන අඩු පාඩු බලලා, පාසල්වල භාගෙට හදපු ගොඩනැගිලි හදන්න මුදල් දීලා, ඒ ගොඩනැගිලි සම්පූර්ණයෙන් හදලා ඒකට අවශ්‍ය කරන භාණ්ඩ පුටු, ඩෙස්ක් බංකු මේ සියල්ලක්ම අලුත්වැඩියා කරලා ළමයින්ට අධ්‍යාපන ලබන්න පුළුවන් පරිසරයක් හදලා දුන්නා. ඊට පස්සේ ගුරු ඌණතා තියෙන පාසල්වලට ගුරුවරු පත් කරලා, ගුරු හිඟය නැති කරලා ළමයාට අධ්‍යාපනය ලබන්න පුළුවන් පරිසරයක් ඇති කළා. අද ගම්පහ දිස්ත්‍රික්කයේ පහේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල දෙස බැලුවාම, අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල දිහා බැලුවාම, අ.පො.ස උසස් පෙළ ප්‍රතිඵල බැලුවාම මේ වසර වන කොට අධ්‍යාපනයේ සැහෙන ප්‍රගතියක් ඇති වෙලා තියෙනවා. විශේෂයෙන් මුළු බස්නාහිර පළාත තුළම. ඒ නිසා ගරු මහ ඇමතිතුමාගේ ඉල්ලීම පරිදි, එතුමාගේ මග පෙන්වීම යටතේ ගරු ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙන් විශාල මුදල් සම්භාරයක් දීලා අද බස්නාහිර පළාතේ තියෙන සියලු පාසලවල ජල ප්‍රශ්නය, ඒ වාගේම වැසිකිළි කැසිකිළි ප්‍රශ්න සියල්ලක්ම අංග සම්පූර්ණ ලෙස විසඳුවේ ගරු බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයයි කියන එක මතක් කරන්න ඕනෑ.

[ ගරු ජානක සූරියබණ්ඩාර ]

ගරු සභාපතිතුමනි, අප මෙතැන බොරුවට බෙදිල කෑ ගහ ගත්තාට අපි මහජනතාවගෙන් පත් වුණේ, යමක් ගමට කරන්න. අපේ පාසලට වැඩ කරන්න. අපේ ප්‍රදේශයට වැඩ කරන්න කියන එක අපි මතත තියා ගන්න ඕනෑ. කොට්ඨාශ මට්ටමින් අපේ සන්ධාන මන්ත්‍රීවරුන් රැස් වෙලා - පක්ෂ විපක්ෂ ඔක්කෝම මන්ත්‍රීවරු රැස් වුණා. රැස් වෙලා අපේ මහ ඇමතිතුමාගේ උපදෙස් මත එහි සභාපති කෙනෙක්ව පත් කළා. සභාපති වශයෙන් යූ. ජෝර්ජ් පෙරේරා මහතා යෝජනා කළේ, රෙහෙනසිරි වරාගොඩ මන්ත්‍රීතුමාගේ නම. එතුමා සභාපති වශයෙන් අපේ කොමිටිය තුළ අද කැලණිය කලාපය තුළ ඉතාමත් ඵලදායී ලෙස වැඩ කටයුතු කර ගෙන යනවා. කියන්න කනගාටුයි. පාසල්වලට යන්න එන්නේ, පාසල්වල දුක සැප බලන්නේ අපි. මෙරිල් පෙරේරා, වරාගොඩ, ජයනාත්ලා වගේ අය තමයි කැලණි කලාපයේ හැම තැනම යන්නේ. එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරු ඉස්කෝලයක් පැත්තකටවත් යන්නේ නැහැ. ඒ නිසා තමයි අධීක්ෂණ මන්ත්‍රීවරු කියලා අපව නිකම්ම හඳුන්වන්න ගත්තේ. රැස්වීමේදී කථා කරන විදුහල්පතිතුමා කියනවා, අපේ අධීක්ෂණ මන්ත්‍රී අභවලයි කියලා. මොකද, ඉස්කෝලෙට හැම දෙයක්ම දෙන්නේ අපි නේ? ඉතින් හෙණ ගහනවාද අපට අධීක්ෂණ මන්ත්‍රී කියලා කිව්වාට. අපි නේ ගිහිල්ලා දෙන්නේ. අපි නිකම්ම අධීක්ෂණය වුණා. ඒ අය අධීක්ෂණය නොවෙයි. ඉස්කෝල පැත්තකටවත් යන්නේ නැහැ. භීෂණයට විතරයි අද යන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තලගොයා කබරගොයා කරලා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙවැනි දේවල් නිසා තමයි අද විපක්ෂයට රිදිලා තියෙන්නේ. අපි ගිහිල්ලා චෙක් පතක් දෙන කොට - අපි චෙක් පොත දෙන්නේ, ඡන්දෙ දීපන් කියලා නොවෙයි. මේක දෙන්නේ ශ්‍රී ලංකා, යූ.එන්.පී., සම සමාජ, ජේ.වී.පී. සියලු මිනිස්සුන්ගේ දරුවෝ ඉන්න ඉස්කෝලවලට. ඔක්කෝම හොඳට ඉගෙන ගන්න කියලා. නැතුව ශ්‍රී ලංකා කාරයින්ගේ දරුවන්ට විතරක් ඉගෙන ගන්න නොවෙයි. මේ ගැන අවබෝධයක් නැහැ. මෙහි තියෙන්නේ වෛරය. අවුරුදු ගණනක් විපක්ෂයේ දුක් විඳලා, දුක් විඳලා තියෙන වෛරය තියෙන්නේ. කුහකකම තියෙන්නේ. ඊර්ෂ්‍යාව තියෙන්නේ.

ගරු සභාපතිතුමනි. මේවා ගැන මෙහෙම කථා කරලා වැඩක් නැහැ. අපි මේ විහිළු කරනවා නොවෙයි. අපි පාසල්වලට ගියාම දෙමව්පියෝ අපට දක්වන ගරුත්වය අපි දන්නවා. ඇයි? මේ අය යන්න එපැයි. ගිහිල්ල දෙන්න එපැයි මොනවාහරි ඉස්කෝලවලට. ලක්ෂ 35 ක් ගන්නේ. ලක්ෂ 35 ට කරන්නේ මොකක්ද දන්නවාද ගරු සභාපතිතුමනි. ලක්ෂ තිස් පහේම සමහර අය කාන්තාවන්ට මැෂින් බෙදනවා. නැත්නම්

ලක්ෂ තිස්පහම යොදවලා කරන්නේ කුකර් බෙදනවා. ඡන්ද ගන්න. දැන් කියනවා අධ්‍යාපනය ඉවරයි කියලා. අපි අධ්‍යාපනයට ඔක්කෝම සල්ලි දෙනවා. ගරු සභාපතිතුමනි, මේ ක්‍රමය අනුව ගරු මහ ඇමතිතුමාගෙන් මම ඊයේ පෙරේදා ඇහුවා. මහ ඇමතිතුමනි, මේ ක්‍රමවේදය කවුද ඔබතුමාට කියලා දුන්නේ? කියලා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

තාත්තා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

අවුරුදු ගණනක් මම ලබපු පළපුරුද්ද අනුව තමයි මම මෙය කෙරුවේ කියලා එතුමා කිව්වා. ශිෂ්‍යත්වය තියලා 150 ගණනට වැඩිය ලකුණු ගත්ත අය විතරක් අපි ඇගයීමට ලක් කරනවා. අහිංසක දෙමව්පියෝ අවුරුදු ගණන් ඉස්කෝලවලට ළමයින්ව අරන් ගිහිල්ලා ශිෂ්‍යත්වයට ලකුණු නැහැයි කියලා හුල්ල හුල්ලා පැත්තකට වෙලා ඉන්නවා. නමුත් අපි අසූවට වැඩිය ලකුණු ගත්ත අයට සහතිකය දෙන කොට අප්පුඩි ගැහුවා. අසූවම අප්පුඩි ගැහුවා සහතික දෙන කල්. යූ.එන්.පී. කාරයෝ, ජේ.වී.පී කාරයෝ, ශ්‍රී ලංකා කාරයෝ ඔක්කෝම අප්පුඩි ගහනවා. ඉතින් ඒක වැරැද්දක්ද? මෙය වැරැදිද? 2013 ඉස්කෝල පටන් ගන්න කොට, ඉස්කෝල ශුද්ධ පවිත්‍ර කරලා, තීන්ත ගාලා ලස්සනට තියන එක වැරැදිද? ඉස්කෝල පිළිවෙළට තියන එක වැරැදිද? ඉස්කෝලවල ඉන්න ළමයින්ට කන්න දෙන එක වැරැදිද? ඉස්කෝලවල ටොයිලට් හදලා ළමයින්ට ගඳ ගහන්නේ නැතුව ටොයිලට් යන්න දුන්න එක වැරැදිද? වතුර ටිකක් බොන්න නැතුව ළිංවල එල්ලී එල්ලී අනුන්ගේ වතුවලට පැන පැන වතුර බොන කොට වතුර දුන්නාම වැරැදිද? ඒ නිසා ළමයින්ට සෙල්ලම් කරන්න පිට්ටනියක් නැති කොට අංග සම්පූර්ණ සිහිති උයනක් හදලා දෙන එක වැරැදිද? විද්‍යාගාරයක් නැති කොට ලක්ෂ කෝටි ගණනක් වියදම් කරලා විද්‍යාගාර, Building හදලා දුන්නාම වැරැදිද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හොඳයි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

පාසල් 1000 කින් පාසල් එකසිය හැට ගණනක් තෝරා ගෙන ඒවා ලංකාවේ තියෙන හොඳම ද්විතීයික පාසල් බවට පත් කරන එක වැරැදිද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මහ ඇමතිතුමාටත් වඩා හොඳයි. බැසිල් ඇමතිතුමාටත් වඩා හොඳයි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ඒ නිසා ක්‍රෝධයෙන් වෛරයෙන් කථා කරන්න එපා. ඔයගොල්ලෝ ඇවිල්ලා බලන්න. ඔයගොල්ලෝ ඉස්කෝලවලට ගිහිල්ලා බලන්න. තත්ත්වය මොකක්ද කියලා. දහතුනක් පාස් වුණු තැන මේ පාර ශිෂ්‍යත්වයෙන් විසිපහක් පාස්.

ගරු සභාපතිතුමනි, වත්තල ආසනයේ කැලණි කලාපයේ තියෙන එකම දෙමළ විද්‍යාලය දෙමළ කතෝලික පාසලයි. දෙමළ කතෝලික පාසලේ පළමු වසරට Aplication 240 ක් දාලා තියෙනවා. ගන්න පුළුවන් 120 යි. ඒ නිසා කරුණාකරලා අපට දෙමළ පාසල වෙනුවෙන් වෙනම පාසලක Building එකක් වෙන් කරලා දෙන්න. දෙමළ ජනතාවට යන්න දිහාවක් නැහැ. දෙමළ ජනතාව වෙනුවෙන් මේ අය කථා කරන්නේ නැහැ. ඒවා නොවෙයි මේ අය කථා කරන්නේ. කරුණාකරලා ඒ අයට වෙනම පාසලක් හදලා දෙන්න.

ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතන ගැන. මම දැක්කේ, මෙහි තියෙන්නේ පළාත් පාලන ආයතන සියල්ලක්ම පාලනය කරන්නේ, අධීක්ෂණය කරන්නේ ගරු මහ ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ කියලා. නමුත් මට කියන්න කනගාටුයි. සමහර පළාත් පාලන සභාපතිවරු, මන්ත්‍රීවරු හැසිරෙන්නේ පළාත් සභා මන්ත්‍රීවරුන්ව, පළාත් සභාවේ මහ ඇමතිතුමාව තුට්ටුවකට ගණන් ගන්නේ නැති විධියට. ඒ නිසා කරුණාකරලා අලුත් ප්‍රඥප්තියක් හදලා හරි කමක් නැහැ, පළාත් පාලන ආයතනවල තියෙන බලතල ඔක්කෝම නොවෙයි. වැඩි බලතල අපේ අතට ගන්න ඕනෑ. එසේ අරගෙන අපේ නිලධාරීන් ඒ ස්ථානවලට ගිහිල්ලා පළාත් පාලන ආයතනවල තියෙන අකටයුතුකම් අසාධාරණකම් හොයන්න ඕනෑ. එහෙම නොවුණොත් තමයි ඒවායේ වෙන අකටයුතුකම් නවත්වා ගන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතුව පළාත් පාලන ආයතන ඔහේ දුවන්න ගියොත් කුණු අදින්න විධියක් නැහැ. කුණු ගිහිල්ලා පාරේ දානවා. අනුන්ගේ ඉඩම් කොටස් කරලා විකුණනවා. රජයේ දේපළ විකුණනවා. නගර සභා දේපළ විකුණනවා. ප්‍රාදේශිය සභා දේපළ විකුණනවා. මේවා ගැන අධීක්ෂණය කරන්න පළාත් සභාවේ යම්කිසි ක්‍රමවේදයක් හදලා කමිටුවක් පත් කරලා වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිමින් මට අවස්ථාව ලබා දීම ගැන - ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමතිතුමා විශාල රාජකාරියක් කරන පුද්ගලයෙක්. එතුමා අපහාසයට උපහාසයට ලක් කරන්න බැහැ. එතුමාට අපහාස කරන්න හදන්නේ වහෙන් ඔරෝ උඹව එපා කියන එක තමයි කියන්නේ. නමුත් අපි දන්නවා. ලබන අවුරුද්ද වෙන කොට 2013 එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය දිහා බැලුවාම විශාල වැඩ කොටසක් අධ්‍යාපනය වෙනුවෙන් කරලා ගම්පහ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, බස්නාහිර පළාත් සභාවේම, මුළු ලංකාවේම හොඳම අධ්‍යාපන ක්ෂේත්‍රය බවට පත් වෙන්න වරම් ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේ සුමිත් ද සොයිසා ගරු මන්ත්‍රීතුමා මූලාසනයේ අසුන් ගන්නවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන් සුමිත් විජයමුණිද ද සොයිසා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Sumith Wijayamuni de Soysa M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 03.05 ]

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පළාත් පාලන වැය ශීර්ෂය යටතේ කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. අද මේ සභාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා අධ්‍යාපන විෂය පිළිබඳව කථා කරන වෙලාවේ අපි හොඳට අහගෙන හිටියා. මෙහි නව වෙනස් වීමක්, නව හැඩගැස්මක්, නව පෙරළියක් සිද්ධ වුණාය කියන එක තමයි කථා කළේ. විශේෂයෙන් හැම මන්ත්‍රීවරයෙක්ම, හැම දෙනාම තමන්ගේ කොට්ඨාශ, තමන්ගේ කලාප වෙනස් වීම පිළිබඳව තමයි කථා කළේ. හිතට එකඟව නොවුණත් සියලුම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා පිළිගන්නවා ඇති, පළාත් සභා ඉතිහාසයේ මේ වගේ යුගයක්, මේ වාගේ වැඩ සටහනක්, වැඩ පිළිවෙළක් තිබුණේ නැහැයි කියන එක. මම හිතනවා සියලුම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා පිළිගනීවි කියලා, වර්තමාන ප්‍රධාන අමාත්‍යතුමා තමයි, වර්තමාන පළාත් සභාවෙන් තමයි ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු ඒකරාශී වෙලා තමන්ගේ කලාපය තුළ තමන්ට වුවමනා ආකාරයේ තීන්දු තීරණ ගන්න වැඩ පිළිවෙළක් සකස් කළේ කියලා. අන්න ඒ වැඩ පිළිවෙළ නිසා අපට පුළුවන්කමක් ලැබුණා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු සහ අදාළ විෂය අධ්‍යක්ෂවරු සියල්ලම එකට එකතු වෙලා අපේ කලාපය කොයි ආකාරයෙන්ද නගා සිටුවන්න ඕනෑ කියන එක පිළිබඳව හොඳ තීන්දු ටිකක් අරගන්න. එහෙම තීන්දු අරගත්තා. ඒ නිසා මම මේ සභාවේදී කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපදේශක කාරක සභාවේදී අපේ හොරණ කලාපයේ අපි කවදාක්වත් මතභේද, මත ගැටුම් ඇති වුණේ නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා විතරක් නොවෙයි, නිලධාරී ගත්තත් අපි එක තීන්දුවයි ගත්තේ. එහෙම කරන්න හේතුව තමයි, අපට කලාප කාර්යාල තුළ තියෙන අපේ

[ ගරු යසපාල කෝරළගේ ]

ව්‍යූහ කමිටුවේ දී අපට තීන්දු තීරණ ගන්න පුළුවන්කමක් ලැබීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නේ නැහැ මොන දැක්මක්ද කියලා. මම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුවරයෙක් වශයෙන් අවුරුදු පහළොවක් වැඩ කළා. ඒ කාලසීමාව තුළදී දැකපු අත්දැකීමත් එක්ක මේ වාගේ ප්‍රසන්න පරිසරයක් පාසල තුළ දරුවන්ට - එතුමාගේ නම ඒකට ගැවුණාට මට කරන්න දෙයක් නැහැ. නමුත් ළමයෙකුට ඉගෙන ගන්න පුළුවන් පරිසරයක්, ඉතාමත් පැහැපත් පරිසරයක් අවශ්‍යයි කියන එක නිර්මාණය කරන්න, වර්තමානයේ මේ අධ්‍යාපන වැඩ සටහනින් පුළුවන් වුණා. මම මේ හැම කෙනාම දන්නවා. පෙර පාසල්වල යනවා. පෙර පාසලට දරුවෙක් අවුරුද්දක් ඇතුළත ඒ වාගේ දක්ෂකම් පෙන්වන්න, ඒ වාගේ වේදිකාවල තමන්ගේ හැකියාවන් පෙන්වන්න හුරු වෙන්නේ ඇයි? කොහොමද අකුරු කීමට ඒ ආකාරයෙන් හුරු වෙන්නේ? ඒ පෙර පාසල පුදුමාකාර විධියට ලස්සන කරනවා. පෙර පාසල තුළ ඒ පන්ති කාමර හරිම ලස්සනයි. ඒ ගුරුතුමියත් ලස්සනයි. ගුරුතුමියට හරියට සින්දු කියන්න පුළුවන්. ගුරුතුමියට හරියට නටන්න පුළුවන්. ඒ නිසා දරුවන් පෙර පාසලට පුදුමාකාර ආශාවක් ඇති වෙනවා. ඒ ආශාව නිසා පෙර පාසල තුළ ආශාව දක්වපු දරුවෝ රජයේ පාසලට එන කොට රජයේ පාසල අපායක් බවට පත් වෙලා තිබුණා නම්, දරුවාට එතැනින්ම පාසල එපා වෙනවා. ඒ නිසා තමයි වර්තමාන ගරු අධ්‍යාපන ඇමතිතුමා බස්නාහිර පළාතේ පාසලත් ඊට වඩා හොඳ තත්ත්වයෙන් සකස් කරන්න, ඊට වඩා ප්‍රසන්න තත්ත්වයට පත් කරන්න ඒ වැඩ පිළිවෙළකට ගියේ. අපේ පාසල් පද්ධතියේ හොරණ කොට්ඨාශය තුළ එදා වැහෙන්න ගිය පාසල් 2009 අවුරුද්දේ එකම දරුවෙක්වත් හිටපු නැති පාසල්, අද අපේ කොට්ඨාශයේ ආදර්ශ පාසල් බවට පත් වෙලා තියෙනවා. අද මිනුවන්ගොඩ කලාපයේ සියලුම විදුහල්පතිවරු සහ අධ්‍යක්ෂවරු මෙන්ම වෙනත් පළාත්වලින්ද මේ පාසල් බලන්න එනවා. අද අපි වැහෙන්න ගිය පාසල් ආදර්ශ පාසල් බවට පත් කරලා තියෙනවා. අපේ කොට්ඨාශයක කිසිම පාසලක වැහෙන්න ගිය පාසල් නැහැ. වැහෙන්න තර්ජනයට භාජනය වුණු පාසලුත් නැහැ. ඒ නිසා අපට පුළුවන්කමක් ලැබුණා, අපේ පාසල් පද්ධතිය තුළ සියලු අඩුපාඩුකම් පසුගිය කාලයේදී සකස් කරන්න. ගුරුවරු ලබා දීලා - මම හිතන්නේ, පළාත් සභා ඉතිහාසයේ මේ ආකාරයට ගුරුවරු ලබාදීමේ වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දරුවන් විස්සකට විසි එකකට ගුරුවරයෙක් ඉන්න තත්ත්වයට පත් කරන්න පුළුවන්. සමහරක් පත්වීම් පිළිබඳව සියලු ගරු මන්ත්‍රීතුමන්ලා අද ආඩම්බර වෙන්න ඕනෑ.

ඒ වාගේම සෑම පාසලක වැසිකිළි පද්ධති සියල්ලක්ම සකස් කිරීම පිළිබඳව - ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ සියලු මන්ත්‍රීතුමන්ලා බොහොම කැමැත්තක් ප්‍රකාශ කරනවා. ඒ වගේම කොට්ඨාශ කාර්යාල, කලාප කාර්යාල ඉතාමත් ප්‍රියමනාප ආකාරයෙන් සකස් කරන්න වැඩ පිළිවෙළක් කියා දෙනවා. ඒවා ශක්තිමත් කරන්න වෙනවා. කලාප කාර්යාලවලට අවුරුදු

ගණනක් යන්න එන්න වාහනයක් තිබුණේ නැහැ. ඒවා ලබා දීමේ වැඩ පිළිවෙළක් අද සකස් කරලා දීලා තියෙනවා. ඒ නිසා අප ස්තුතිවන්ත වෙනවා. අපි අද මේ අමාත්‍යාංශ හරහා වැඩ කරන්නේ. මන්ත්‍රීතුමන්ලා ඉතාමත් ආශාවෙන් කැමැත්තෙන් වැඩ කරනවාත් එක්කම, ඒ ආයතනවල ඉන්න කලාප අධ්‍යක්ෂවරු, ඒ වාගේම කොට්ඨාශ අධ්‍යක්ෂවරු සහ ගුරුවරු ඉතාමත් කැමැත්තෙන් වැඩ කරන විෂයයක් බවට අද අධ්‍යාපන අමාත්‍යාංශය පත් වෙලා තියෙනවා කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ වාගේම මම එක දෙයක් පෙන්වා දෙනවා. ගණිත විෂයට දුර්වල දරුවන්ට වෙනම වැඩ පිළිවෙළක් අපේ කොට්ඨාශයේ ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම අකුරු ලියන්න බැරි ළමයි කොටසක් ඉන්නවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ඉතිරිව තියෙන්නේ.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

හැම කොට්ඨාශයකම සෑම පාසලකම අකුරු ලියන්න බැරි ඉතාම සීමිත දරුවෝ පිරිසක් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට මම යොමු කරනවා. අපි අරගෙන යනවා ඒ අයට සිසු මිතු දිරිය කියලා වැඩ සටහනක්. මේ සුපසන් වැඩ සටහන යටතේ අන්න ඒ දරුවන්ටත් වෙන වැඩ පිළිවළක් සකස් කරන්න කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පළාත් පාලන ආයතන ගැන පොඩ්ඩක් කථා කරන්න ඕනැ. අපි දෙවතාවක් අවුරුදු 18 ක් තිස්සේ පළාත් පාලන ආයතනවල ඉඳලා ඒ ආයතනවලින් ආපු අය. ඒ වුණත් මේ ආකාරයෙන් පළාත් පාලන ආයතන ශක්තිමත් කරන කාලයක් මම හිතන්නේ නැහැ ඉතිහාසයේ තිබුණාය කියලා. පළාත් පාලන ආයතනවල සභාපතිවරු වශයෙන් අපි ඉන්න කොට අපට කමිටු රැස්වීමකට අදාළ මන්ත්‍රීවරු ගෙන්වා ගන්න පුදුමාකාර අමාරුකමක් තිබුණේ. නමුත් අද වර්තමාන පළාත් පාලන විෂය සම්බන්ධව දීමනාවක් දෙන්න තීන්දු වුණේ, මේ වර්තමාන පළාත් සභාවෙන් විතරයි. මෙතෙක් ඉතිහාසයේ පැවති කිසිම පළාත් සභාවක ඒ කමිටු රැස්වීමකට එන අයට මුදලක් ගෙවීමට තීන්දු වුණේ නැහැ. අද ඒ තත්ත්වය මත සියලු කමිටු රැස්වීම් ඉතාම සාර්ථකව පවත්වා ගෙන යනවා. 1991 දී මුල්ම පළාත් සභාව පිහිටවූවාට පසුව සභාවලට වාහනයක් ගියා නම් ඒ යන්න කටයුතු කරලා තියෙන්නේ මේ පළාත් සභාවෙන් විතරයි. අද පළාත් සභාවක, ප්‍රාදේශිය සභාවක ප්‍රධාන ආදායම් මාර්ගය වෙලා තියෙන්නේ මුද්දර බදු සහ උසාවි දඩ මුදල්. මේවා අරගන්න ගියාම විශාල කරදර ගොඩක හිටියේ. මේවා අරගන්න ගියාම අවුරුදු ගණනක් ප්‍රමාද වෙලා තිබුණේ. නමුත් ඒවා මේ රජය තුළ අද තීන්දු අරගෙන තියෙනවා, සෘජුවම ඒ මුද්දර බදු, උසාවි දඩ, ඒ මුදල් සභාවට ඒමේ වැඩ පිළිවෙළක් කරා යන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට වෙන්ව ඇති කාලය අවසන් වෙමින් පවතිනවා.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

අන්න ඒ නිසා මේ ආකාරයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය හරහා මම හිතනවා, මේ අවස්ථාව වන විට අනෙක් අමාත්‍යාංශවලටත් ආදර්ශවත් වන ආකාරයෙන් සියලු මන්ත්‍රිතුමන්ලා අවංකව හිත ඇතුළෙන් කථා කළොත් අනේ, අර පැවති සියලු සභාවලට වඩා මේ සභාව තමයි අපට මන්ත්‍රීවරයෙක් වශයෙන් කොන්ද කෙලින් තියා ගෙන සමාජ මෙහෙවරක් කරන්න පුළුවන් කියන විශ්වාසයක් ඇති වෙලා තියෙන්නේ කියලා හිතමින් සිටිනවා ඇතැයි කියලා කියමින් මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොමත්ම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 03.15 ]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ස්තුතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ අධ්‍යාපන අය වැය විවාදයේදී මම මතු කරන්න බලාපොරොත්තු වන ප්‍රශ්න කිහිපයක් තියෙනවා. එහිදී කොළඹ කලාපයේ පාසල්වල හා අනෙකුත් ගැටළු පිළිබඳ යම්කිසි ආකාරයේ කථාවක් හා එහි ගැටළු මතු කරන්න මේ කථාවේදී මා මැදිහත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කොළඹ පාසල්වල කොළඹ කලාපය තුළ උතුරු කොළඹ, මැද කොළඹ වැනි කොට්ඨාශවල තිබෙන පාසල් දිහා බැලුවාම, විශේෂයෙන්ම සිංහල මාධ්‍ය පාසල් දිහා බැලුවාම, ඒ සිංහල මාධ්‍ය පාසල්වල ප්‍රාථමික අංශයේ හැම පාසලකම වාගේ ගුරුවරු තුන් දෙනා, හතර දෙනා බැගින් හිඟයක් තියෙනවා. මම හිතනවා. දරුවෙකුගේ අධ්‍යාපනයේ අඩිතාලම වැටෙන්නේ ප්‍රාථමික අධ්‍යාපනය තුළින්. නමුත් අපි පළාත් සභාව තුළින් හැම මාසයකම වාගේ ගුරු පත්වීම්, අභ්‍යාසලාභී ගුරු පත්වීම් ලබා දුන්නත් සිංහල මාධ්‍ය පාසල් කොළඹ කලාපයේ තියෙන උතුරු කොළඹ හා මැද කොළඹ පාසල්වල ප්‍රාථමික අංශවල පුරප්පාඩු අපට තවම පුරවාගන්න බැරි වෙලා තියෙනවා. මම ප්‍රාථමික අධ්‍යාපන අංශය දිහා බැලුවාම, ඒ පාසල්වල ඉතාම පහළ මට්ටමක තමයි ඒ ප්‍රාථමික අධ්‍යාපනය තියෙන්නේ. මොකද, ඒ ගුරු හිඟකම නිසාම සිංහල මාධ්‍යයේ පාසල්වල, අපි හොයා

ගෙන ගියාම හැම පාසලකම වාගේම, ගුරුවරු තුන්දෙනා හතර දෙනා බැගින් ගුරු හිඟයක් පවතිනවා. විශේෂයෙන් උතුරු කොළඹ හා මැද කොළඹ කලාපවල සිංහල මාධ්‍ය පාසල්වල. අපි දෙමළ මාධ්‍ය පාසල්වල අපට සන්තෝෂ වෙන්න පුළුවන්, ගුරු ප්‍රමාණයක් ඉන්නවා. ඒක අපි පිළිගන්න ඕනෑ. ඒ එක්කම ඒ ගුරු මාරු කිරීම්, දෙමළ මාධ්‍යයේ ගුරු මාරු කිරීම්, අවුරුදු 10 ට එහා මාරු කිරීම් තවමත් ක්‍රමානුකූලව කෙරෙන්නේ නැහැ. එය විශාල අඩුපාඩුවක් හැටියට පවතිනවා. පහුගිය කාලයේ අපි දිගින් දිගටම උපදේශක කාරක සභාවේ මේ ප්‍රශ්නය මතු කළත්, ඒක ක්‍රමවත් විධියට වෙන්නේ නැහැ. තවමත් සමහර විදුහල්වල අවුරුදු විස්ස, විසිපහ උගන්වන දෙමළ මාධ්‍යයේ ගුරුවරු ඉන්නවා. ඒ අයට මාරුවීම් ලැබෙන්නේ නැහැ. මම දන්නේ නැහැ මහ ඇමතිතුමනි, එයට හේතුව මොකක්ද කියලා.

ඒ වාගේම ඊළඟට තියෙන වැදගත්ම කාරණය තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ කොළඹ නගරයේ ඉතාම අඩු ආදායම්ලාභී පවුල්වල ළමයි යන පාසල්වල –

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනය අමතන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

විශේෂයෙන්ම මේ පාසල්වල තියෙන සම්පත් ප්‍රමාණය. මම විශ්වාස කරනවා. අද ඒ වටිනා විශාල ඉඩකඩම් ඩැහැ ගන්න, ඒවා උදුරා ගන්න යම්කිසි ආකාරයේ උත්සාහයක් සමහර ආයතනවලට තියෙනවා කියලා. මොකද, පහුගිය කාලයේ කොළඹ කලාපයේ තියෙන පාසල් අපි දැක්කා, විශේෂයෙන්ම බාරොන් ජයතිලක විද්‍යාලයේ තිබුණු ගොඩනැගිලි බස්නාහිර පළාත් සභාවේ ඉංජිනේරු කාර්යාලය හා ආර්ථික අමාත්‍යාංශයේ මුද්‍රණාලය ගෙන යන්න පාවිච්චි කළා. ඊළඟට ඒ.ඊ. ගුණසිංහ විද්‍යාලයේ තියෙන ගොඩනැගිලි කිහිපයක් යම්කිසි රාජ්‍ය නොවන සංවිධානයකට භාර දෙන්න කියලා මම හිතන්නේ, මධ්‍යම ආණ්ඩුවෙන් නියෝගයක් ආවා. නමුත් අපි මහ ඇමතිතුමාත් සමඟ සාකච්ඡා කළා. දැන් ඒක යම්කිසි ප්‍රමාණයකට නැවතිලා තියෙනවා. මම මෙය මතු කරන්නේ මොකක් හින්දාවත් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඒ කොළඹ කලාපය තුළ තියෙන විශාල වටිනා ඉඩකඩම්. පාසල්වල තියෙන ඉඩ කඩම්. මේ නගරයේ තියෙන ඉඩකඩම් ඒවා ඩැහැගන්න, ඒවා යම් යම් ආකාරයේ කිසියම් පිරිසකගේ වුවමනාවන් මත ඒ පාසල්වලින් ඒවා උදුරා ගන්න වැඩපිළිවෙළක් තියෙන බව අපි දන්නවා. ඒ නිසා මම මහ ඇමතිතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. අද ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා. මේ නගරයේ ජීවත්වන අහිංසක ළමයි යන්න තියෙන පාසල් මේවා. කොළඹ නගරයේ ජනතාව හිටියත්, ඒ ජනතාවට අද මේ නගරයේ තියෙන සුපිරි පාසල් හෝ ඉහළ පාසල්වලට යන්න ලැබෙන්නේ නැහැ. ඒ ජනතාවට ලැබෙන්නේ, තමන්ගේ ප්‍රදේශයේ

[ ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන් ]

තියෙන පළාත් සභාවලට අයිති පාසල් විතරයි. ඒ ළමයින්ට යන්න අද ඉතිරි වෙලා තියෙන්නේ ඒ පාසල්. ඒ නිසා අද පළාත් සභාව හැටියට එහි වගකීමක් තියෙනවා. ඒ පාසල් ටික අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. ඒ පාසල්වල තියෙන ගොඩනැගිලි ටික, භෞතික සම්පත් ප්‍රමාණය, ඉඩකඩම් ආරක්ෂා කිරීමේ වගකීම අද පළාත් සභාවට පැවරිලා තියෙනවා. එහෙම නැතුව, මේ ඉඩකඩම් යම් යම් දේශපාලන වුවමනාවන් මත, යම් යම් බලවතුන්ගේ වුවමනා මත මේවා පළාත් සභාවෙන් බැහැරව දෙන්න ගියොත් අද නගරයේ ඉන්න ඉතා දිළිඳු ජනතාවගේ දරුවන්ට යන්න තියෙන පාසල් ටිකත් අපට නැති වෙලා යන්න පුළුවන් කියලා මම මහ ඇමතිතුමාට කියන්න කැමතියි.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ නගරය තුළ පාසල්වල විශාල තදබදයක් තියෙනවා. අපි දන්නවා ජනප්‍රිය පාසල් කිහිපයක් තිබුණාට, ඒ ජනප්‍රිය පාසල් කිහිපයට හැම කෙනෙකුටම යන්න බැරි ප්‍රශ්නයක් අද මතු වෙලා තියෙනවා. එයට කාරණාව තමයි පහුගිය කාලය පුරාම ඒ ජනප්‍රිය පාසල්වල පන්ති ප්‍රමාණය වැඩි වුණේ නැහැ. එසේ වැඩි වුණේ නැති නිසාම අද ඒකට යන්න බැරි විශාල පිරිසක් ඉවතට විසි වෙනවා. ඒ ඉවතට විසිවීම උඩම අද හුඟාක් දෙනෙක් අපි අද කථා කරන පෞද්ගලික අධ්‍යාපන ආයතනවලට තමන්ගේ ළමයින්ව යවන්න යොමු වෙලා තියෙනවා. මම හිතන්නේ, අධ්‍යාපනය පිළිබඳ අද ප්‍රතිපත්තිමය තීන්දුවකට එන්න ආණ්ඩුවට කාලය ඇවිල්ලා තියෙනවා කියලා මා විශ්වාස කරනවා. පළාත් සභාවක් හැටියටත්, මේ අධ්‍යාපන විවාදයේදී අපි කථා කරන්නේ විශේෂයෙන්ම ජාත්‍යන්තර පාසල් ගැන. අපි දන්නවා. ජාත්‍යන්තර පාසල් මේ රටේ පටන් ගත්තේම විශේෂයෙන්ම මේ රටේ ඉන්න තානාපතිවරුන්ගේ ළමයින්ට යන්න. මේ රටේ රැකියාවල නිරත වෙලා ඉන්න විදේශිකයන්ගේ ළමයන්ට යන්න. ඒ පරමාර්ථය උඩ තමයි මේ ජාත්‍යන්තර පාසල් පටන් ගත්තේ. නමුත් අද ඒක ව්‍යාපාරයක් හැටියට ඔඩු දුවලා, ව්‍යාප්ත වෙලා අද හැම හන්දියක් ගානේම සිල්ලර කඩ වාගේ ජාත්‍යන්තර පාසල් පටන් අරගෙන තියෙනවා. කිසිම ප්‍රමිතියක් නැහැ. කිසිම සුදුසුකමක් නැහැ. ගෙවල් කුළියට අරගෙන, විසිපන්දහසකට, තිස් දහසකට ගෙවල් කුළියට අරගෙන අද ජාත්‍යන්තර පාසල් පටන් අරන් තියෙනවා. අද කොළඹ නගරයේ විතරක් ළමයි පන්දහසකට වඩා වැඩි ප්‍රමාණයක් මේ ඉස්කෝලවල ඉගෙන ගන්නවා. මේක මහ අපරාධයක්. මම හිතනවා, පළාත් සභාව හැටියට අපට වගකීමක් තියෙනවා. මේවා ලියාපදිංචි වෙන්නේ අපේ බස්නාහිර පළාත් සභාවේ සමාගම් හැටියට. බස්නාහිර පළාත් සභාවේ ව්‍යාපාර හැටියට. රුපියල් දහක් ගෙවලා ඒ අය මේ ලියාපදිංචිය අරගෙන තමයි මේ පාසල් පටන් ගන්නේ. එතකොට අපි පළාත් සභාව හැටියට ඒ ව්‍යාපාර ලියාපදිංචිය පිළිගත්තාම ඊට එහා අපට සම්බන්ධයක් නැහැ. මේ අය මොකක්ද මේ කරන ව්‍යාපාරය? මේ අය මොකක්ද මේ කරන අධ්‍යාපනය? මේ ගැන අධ්‍යාපන අමාත්‍යාංශයට සම්බන්ධකමක් නැහැ. ඒ නිසා මේවා අධීක්ෂණය කරන්න, මේවා බලන්න අපට

කාටවත් බලයක් ලැබිලා නැහැ. මම හිතනවා, මෙය අපි කරන ලොකුම ජාතික අපරාධයක්. අද ඉතාම හතු පිපෙනවා වාගේ හැම හන්දියක් ගානේම මුළු පළාත් සභා බල ප්‍රදේශය තුළම මේ පාසල් පටන් අරගෙන තියෙනවා. මේ පාසල්වලට ඉඩ කඩ අපි ලබා දීලා තියෙන්නේ, විශේෂයෙන්ම මේ පළාත් සභාව යටතේ නාම ලියාපදිංචිය පිළිගත්තාම ඔවුන්ට අයිතිය ලැබෙනවා, ඔවුන්ගේ ව්‍යාපාරය පටන් ගන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩියක කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒ නිසා මේ අධ්‍යාපනයේ තියෙන තරගකාරිත්වය උඩම, අද සියලු දෙනාම පෙළඹිලා තියෙනවා, තමන්ගේ ළමයින්ට හොඳ අධ්‍යාපානයක් ලබා දෙන්න. ඒ නිසා අද ව්‍යාපාර බවට පවත්වා ගෙන යන මේ සිල්ලර කඩ වාගේ තියෙන මේ පාසල් ව්‍යාපාරිකයින්ට හොඳ ආදායම් මාර්ගයක් බවට අද පත් වෙලා තියෙනවා. ඒ නිසා අද පළාත් සභාවේ වගකීමක් තියෙනවා, ඒ සියලුම ප්‍රදේශ තුළ තියෙන පාසල්වල දියුණුව, ඒ සංවර්ධනය එක හා සමාන විධියට කරන්න. එහෙම නැත්නම් අද අපට ඉදිරියේදී බිහි කරන්න වෙන්නේ - ඒ දරු පරපුරේ අනාගතය, අපේ දුවා දරුවන්ගේ අනාගතය, අධ්‍යාපනය මේ සිල්ලර කඩ මුදලාලිලාට එහෙම නැත්නම් මේ පෞද්ගලික ආයතනවලට භාර දුන්නොත් අනාගතය ඉතාම අඳුරුයි කියන එක මම මතක් කරන්න කැමතියි.

ඒ වාගේම අවසාන වශයෙන් අපේ මහ ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. සිංහල මාධ්‍ය පාසල්වල පහුගිය කාලය පුරාම විශේෂයෙන්ම අභ්‍යාස පොත් ලබා දෙන කොට ඉස්ලාම් ආගමේ අභ්‍යාස පොත්, ඒ වාගේම හින්දු ආගම, ක්‍රිස්තියානි ආගමේ අභ්‍යාස පොත් ලබා දෙන්නේ නැහැ. කොළඹ කලාපය තුළ තියෙන පාසල්වලට. මම දන්නේ නැහැ ඒකට හේතුව ඇයි කියලා. ඒ වාගේම තමයි ගුරුවරු නැහැ. විශේෂයෙන්ම ඉස්ලාම් ආගම උගන්වන්න, ක්‍රිස්තියානි ආගම උගන්වන්න, හින්දු ආගම උගන්වන්න විශාල ගුරු හිඟයක් තියෙනවා සිංහල මාධ්‍යවල. මම දන්නේ නැහැ ඇයි කියලා. පහුගිය කාලය පුරාම ඒකත් අපට පුරවාගන්න බැරි වෙලා තියෙනවා. ඒ නිසා ගරු මහ ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳ එතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

[ අ.භා. 03.24 ]

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මූලාසනරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මහ ඇමතිතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශයේ විවාදයට සහභාගි වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම මාගේ ගෞරවය පුද කර සිටිනවා. මා හිතන්නේ, මේ අමාත්‍යාංශයේ විවාදයේදී ඇමතිතුමාගේ ඉලක්ක ගැන කථා කරනවාට වඩා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ යම් යම් චෝදනාවලට පිළිතුරු ලබා දීම තමයි මගේ මූලික අරමුණ වන්නේ. එහිදී මා හිතන්නේ, ඉතා ද්වේශ සහගතව අපේ ෆයිරූස් මන්ත්‍රීතුමා කිව්වා, මේ කොළඹ කලාපය දේශපාලනීකරණය වෙලා, කොළඹ කලාපයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු තමයි සියලුම පාසල් පද්ධතිවල ලැගුම් ගෙන ඉන්නේ කියලා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

එයා බිස්නස් කරලා හැන්දෑවට එන්නේ. ඉස්කෝල බලන්න වෙලාවක් නැහැ නේ එයාට.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

කථාව අහන්න දෙන්න කෝ? ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කථා කරනකොටත් හිරිහැර කරනවා.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. ගරු මහ ඇමතිතුමාගේ උපදෙස් පිට සෑම මසකම සඳුදා දිනයක නියත වශයෙන්ම ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ ව්‍යුහ කමිටුව රැස් වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ෆයිරූස් ගරු මන්ත්‍රීතුමා, කථික මන්ත්‍රීතුමාත් මූලාසනයටත්, බාධා වන ආකාරයට පැමිණ අසුන් ගන්න එපා. රීති විරෝධියි.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

ඒ වේලාව මට ලබා දෙන්න මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ලබා දෙනවා.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෑම මසකම අපි ව්‍යුහ කමිටුව රැස් වෙනවා. මම ආඩම්බර වෙනවා, මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා පිළිබඳව. මම හිතුවේ, එතුමා තමයි මේ විවාදයේදී අපි පිළිබඳව යම්කිසි වැරැද්දක් තියෙනවා නම්, ප්‍රකාශ කරන එකම මහජන නියෝජිතයා කියලා. මොකද හේතුව? එතුමා මේ සෑම රැස්වීමකටම සහභාගි වෙලා දේශපාලන භේදයෙන් තොරව මේ ගන්න තීරණවලට සහයෝගය ලබා දෙනවා. විශේෂයෙන්ම

අපි මේ ව්‍යූහ කමිටුවේදී කිසිදු දේශපාලන අරමුණක් ඉලක්කයක් කරා යන්නේ නැහැ. අපි නියෝජනය කරන පළාත් සභා පාසල්වල ඒ තියෙන ගැටළු හඳුනා ගෙන ඒ සියලු ගැටළු උපදේශක කාරක සභාවට යොමු කරලා උපදේශක කාරක සභාව හරහා අපේ පාසල් පද්ධතිය නගා සිටුවන්න අපි විශාල මෙහෙවරක් කරලා තියෙනවා. ඒ එක්කම සඳහන් කරන්න ඕනෑ, ගරු මහ ඇමතිතුමා 2012 වර්ෂ සඳහා ලක්ෂ 1560 කට වැඩිය කොළඹ කලාපයට ලබා දීලා තියෙනවා. මම හිතන්නේ, ඒ ලබා දුන් මුදල පිළිබඳවත් අපේ මන්ත්‍රීවරු දන්නේ නැහැ. අතර මග නැවතිලා තිබුණු පාසල් ගොඩනැගිලි නැවත ආරම්භ කරන්න විශාල මෙහෙයුමක් කරලා තියෙනවා. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවලදී අපි අපේ ව්‍යූහ කමිටුවේදී නිලධාරීන්ට උපදෙස් දුන්නා, ඒ ගෙනාපු මන්ත්‍රීවරයාගේ යෝජනාව මුලින් දලා ඒ මන්ත්‍රීවරයාට ගෞරවය දෙන්න කියලා. ඒ මන්ත්‍රීවරයා ශ්‍රීලංකා ද, යූ.එන්.පී. ද ජේවීපී ද නොවෙයි, ඒ මන්ත්‍රීවරයාගේ ගෞරවය ඒ මන්ත්‍රීවරයාට ලබා දෙන්න කියලා. ඒ නිසා මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවලදී එතුමාට ඒ ගෞරවය අපි ලබා දීලා තියෙනවා. ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජේන්ද්‍රන් ගරු මන්ත්‍රීතුමා කිව්වා රැස්වීම්වලට කැඳවන්නේ නැහැයි කිහලා. සෑම රැස්වීමකටම, සෑම මන්ත්‍රීවරයෙකුටම ලියුමක් යවනවා. දුරකථනයෙන් කථා කරනවා. සමහර මන්ත්‍රීවරුන්ගේ දුරකථන වැඩ කරන්නේ නැහැ. දීලා තියෙන අංකයට ලිපි යන්නේ නැහැ. ඒ පිළිබඳව අපේ දැඩි කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ එක්කම රාජේන්ද්‍රන් ගරු මන්ත්‍රීතුමා කිව්වා සුළු ජාතීන්ට වෙන විධියකට සලකනවා කියලා. මම කනගාටු වෙනවා. කොළඹ නගරයේ සුළු ජාතිය ගැන කථා කරන එක ගැන. අපේ ප්‍රදේශවල ද්‍රවිඩ පාසල්වලට මේ මන්ත්‍රීවරු යන්නේ නැහැ. මේ මන්ත්‍රීවරු ඇස්දෙකෙන් දැකලා නැහැ. වනාතමුල්ලේ ඕවල් එක පිටුපස තියෙන පාසල අන්ත අසරණ පාසලක්. මම නියෝජනය කරන නැගෙනහිර කොළඹ ආසනයේ පරාක්‍රමබාහු විද්‍යාලය ඇතුලේ තිබුණ ද්‍රවිඩ පාසලක්. අයිතියක් නැති, කාත් කවුරුවත් නැති, පිළිගැනීමක් නැති පාසලක්. ඉතාමත් ආඩම්බරයෙන් කියනවා. ඒ ද්‍රවිඩ පාසල අද කුමර උදයන් කියන පාසල බවට පත් කරලා තියෙනවා. ආසනයේ සංවිධායකයා මම. මම ඒ පාසලට අරගෙන ගිහිල්ලා වැහීමේ තර්ජනයට ලක් වෙලා තිබුණු ලංකා සභා විද්‍යාලය -

**ගරු එස්. රාජේන්ද්‍රන්**
Hon. S. Rajandran

ඔබතුමා කියපු පාසලට මම මේ අවුරුද්දේත් ලක්ෂ හතරක් වෙන් කරලා තියෙනවා. ඔබතුමා කියනවා ඒ පාසලට ගියේ නැහැ කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා -

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

ඔබතුමා ඔබතුමාගේ කථාවේදී ඕවා කියන්න. ආපහු සැරයක් වෙන අවස්ථාවක දී කාලය ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කුමර උදයන් පාසලට ගිහිල්ලා තියෙනවාද? මෙතුමා කුමර උදයන් එහෙම පාසලක් දන්නවාද?

**ගරු එස්. රාජේන්ද්‍රන්**
Hon. S. Rajandran

මම දන්නේ නැහැ.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

ඒක තමයි. ඔබතුමාගේ නායකතුමාගේ නම දැම්මේ. මම ආසනයේ සංවිධායකයා විධියට ඒ පාසල ගෙන යන කොට ලංකා සභා විද්‍යාලයට මට විශාල චෝදනාවක් ආවා. ඒ සියල්ල විඳ දරා ගෙන ඒ ප්‍රදේශයේ ඉන්න දෙමළ ජනතාව වෙනුවෙන් ද්‍රවිඩ දරුවා වෙනුවෙන් කුමර කියන නම දැම්මේ. (බාධා කිරීමක්) මන්ත්‍රීතුමා අහගන්න. කුමර කියලා පාසලේ නම දැම්මේ, කුමර ගුරුබරන් ගරු මන්ත්‍රීතුමාගේ නමේ කොටසක් උදයන් කියලා දැම්මේ, අපේ උදය ගම්මන්පිල ගරු ඇමතිතුමාගේ නමේ කොටසක්. එහෙම දාලයි ඒ පාසල හැදුවේ. සිංහල දෙමළ නම් දෙක දාලා. ඔබතුමාලා සුළු ජාතියක් ගැන කථා කරනවා. මේ දේශපාලන ඉතිහාසයේ අපි තරම් ඒ ද්‍රවිඩ ජනතාවට සලකපු ඉතිහාසයක් කොළඹ කලාපයේ නැහැ.

ඒ එක්කම සඳහන් කරන්න ඕනෑ. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කිව්වා, උතුරු කොළඹයි. මැද කොළඹයි විශාල ගුරු පුරප්පාඩුවක් තියෙනවයි කියලා. ගරු මහ ඇමතිතුමාට පිංසිද්ධ වෙන්න එහෙම යුගයක් තිබුණා. හැබැයි, අපි ඒක විසඳා ගත්තා. තොගය පිටින් උතුරු කොළඹටයි, මැද කොළඹටයි උපාධිධාරී පත්වීම් අපට ලබා දුන්නා. මහ ඇමතිතුමා නම්කරලම එව්වේ. අපි ව්‍යූහ කමිටුවෙන් ඉල්ලනු ලැබූ ඒ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව උපදේශක කාරක සභාව හරහා මහ ඇමතිතුමා කෙළින්ම නම් කළා. එක ගුරුවරයෙක් දකුණු කොළඹ කොට්ඨාශයටවත්, බොරැල්ලටවත් නොදී උතුරු කොළඹටයි මැද කොළඹටයි - හැබැයි, අපේ කොට්ඨාශවලත් ඒ ගුරු හිඟය තිබුණා. අපි නිහඬව හිටියා. විශේෂයෙන්ම ගුරු හිඟයක් තියෙන ඒ කොට්ඨාශ දෙකට ගුරුවරු ලබා දීමේදී - ඒ එක්කම සඳහන් කරන්න ඕනෑ. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කිව්වා පළාත් සභා පාසල් ටික එක එක පුද්ගලික ආයතනවලටයි රජයේ කටයුතුවලටයි ලබා දෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ නගරයේ පළාත් සභා පාසල් පද්ධතියේ විශාල පාසල් සංඛ්‍යාවක් වැහීමේ තර්ජනයට ලක් වෙලා තියෙනවා. එසේ ලක් වෙලා තියෙන්නේ, ඒ පාසල් පද්ධතිවලට ළමයි පැමිණෙන්නේ නැති නිසයි. ඒ එක්කම සඳහන් කරන්න ඕනෑ. හිටපු ළමයි සංඛ්‍යාව ශීඝ්‍රයෙන් අඩු වෙලා තියෙනවා. මම නියෝජනය කරන ආසනයේ නැගෙනහිර කොළඹ ආසනයේ තියෙනවා, සද්ධර්මෝදය කියන පාසලක්.

ළමයි 48 කට ආසන්න ප්‍රමාණයක් ඉන්නේ. හැබැයි, ඒ වැහීමේ තර්ජනයට ලක් වෙලා තියෙන පාසල නගා සිටුවන්න උත්සාහ ගත්තත් ඒක අපට කරගන්න හැකියාවක් ලැබුණේ නැහැ. බාරොන් ජයතිලක විද්‍යාලයත් එහෙම පාසලක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු රාජේන්ද්‍රන් මන්ත්‍රීතුමා, ඔබතුමාලාගේ පෞද්ගලික සාකච්ඡාවලින් මන්ත්‍රීතුමාට පොඩ්ඩක් බාධා පැමිණෙනවා.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, බාරොන් ජයතිලක විද්‍යාලය විශාල වශයෙන් පාසල් ශිෂ්‍යයින්ගේ හිඟයකට මුහුණ දීලා තිබුණු පාසලක්. ගරු මහ ඇමතිතුමාගේ උපදෙස් පිට මමයි කලාප අධ්‍යක්ෂතුමියයි, එවකට හිටපු සියලුම නිලධාරීන් ගිහිල්ලා බලන කොට ගොඩනැගිලි දෙකක් පරිහරණයට නුසුදුසු ආකාරයට ඉවත් කරලා තිබුණා. ඒ පාසලේ ළමයින්ට ඉගෙන ගන්න හැකියාවක් තිබුණේ නැහැ. ගරු මහ ඇමතිතුමා මැදිහත් වෙලා අද බාරොන් ජයතිලක විද්‍යාලයට අවශ්‍ය කරන යටිතල පහසුකම් සියල්ල ලබා දීලා තියෙනවා. එක් ගොඩනැගිල්ලක් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ලබා දීලා තියෙනවා. මම හිතන්නේ, ඒ එක්කම සඳහන් කරන්න ඕනෑ, අනෙක් පාසල්වලටත් මගේ පුද්ගලික යෝජනාව ගරු මහ ඇමතිතුමනි, සද්ධර්මෝදය විද්‍යාලය මම නියෝජනය කරන ආසනයේ පාසලක්. අපි හැමදාම පාසලෙන් එළියට එන දරුවාට වෘත්තීය පුහුණුවක් ලබා දෙන්න, දරුවා පාසලෙන් එළියට ආපු ගමන් කියනවා, ගිහිල්ලා ඉගෙන ගන්න. එක්කෝ මේසන් වැඩක්. එක්කෝ වඩු කර්මාන්තය. නැත්නම් වායුසමීකරණ. ඉලෙක්ට්‍රොනික්. ගරු මහ ඇමතිතුමනි, පාසල් පද්ධතියේ ඉන්න දරුවා පාසල් කාලය තුළදී නටන්න, ගයන්න, වයන්න විශේෂ සෞන්දර්ය හැකියාවන් තියෙන දරුවෝ ඉන්නවා. සද්ධර්මෝදය පාසල, පාසලෙන් පිටවන අ.පො.ස. සාමාන්‍ය පෙළ අසමත් වන දරුවන්ට ඒ සෞන්දර්ය ඉගෙන ගන්න තැනක් විධියට පත් කරලා දෙන්නයි කියන ඒ ගෞරවණීය ආයාචනය කරනවා. මොකද, ඒ දරුවාට පාසලේදී හොඳට සින්දු කියන්න පුළුවන්. එක්කෝ ඒ දරුවාට සංගීත භාණ්ඩයක් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ඉතිරිව තිබෙන්නේ.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අඩුම ගණනේ නාට්‍යයක් රඟපාන්න පුළුවන්. පාසලෙන් එළියට ආපු දරුවාට පුළුවන් නම් අර වැහීමේ තර්ජනයට ලක් වෙලා තියෙන පාසලට ඒ දරුවාව යොමු කරලා ඒ දරුවා තුළ උපතින් ගෙනෙන හැකියාවන්, සෞන්දර්ය හැකියාවන් මතු කරගන්න. එය ඒ දරුවාට හොඳ ජීවන මාර්ගයක් වෙනවා. ඒ සඳහා යෝජනා කරමින් අවසානයේ ගරු මහ ඇමතිතුමාගේ ඉලක්ක වන, අපි බලාපොරොත්තු වන්නේ කොළඹ කලාපය තුළ සාක්ෂරතාවය වැඩි කරන්නට. පාසල් යන දරුවන්ගේ ප්‍රමාණය වැඩි කරන්නට. අපි ආඩම්බර වෙනවා, මහ ඇමතිතුමා ඒ සඳහා අපට ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳව. එපමණක් නොවෙයි. අපි කොපමණ උත්සාහ ගත්තත් වැඩක් වන්නේ නැහැ. මේ සියල්ල දෙස දේශපාලන කෝණයකින් බලනවා නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යුහ කමිටුවේදී අපි නිතර සාකච්ඡා කරන කරුණක් තමයි, බලය බෙදා හරින්න ඕනෑ කියන එක. ඔබතුමා අපට දේශපාලන ඉතිහාසයේ පළමුවැනි වතාවට එක කොට්ඨාශයකට මිලියනයක් ලබා දුන්නාම අපේ කොළඹ කලාපයේ කොට්ඨාශ හතරට මිලියන හතරක් ලබා දුන්නා. ඒ කොට්ඨාශ හතර තුළ අද බලය විමධ්‍යගත වෙලා තියෙනවා. කෙළින්ම සෘජුව කලාපයත් එක්ක තියෙන සම්බන්ධතාවය වෙනුවට ඒ කොට්ඨාශයේ ගුරුවරුන්ට කාර්ය භාරයක් කර ගන්න හැකියාව ලැබිලා තියෙනවා. ඒ ගෞරවය ඔබතුමාට හිමි වෙනවා.

එපමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඉතිහාසයේ පළමුවැනි වතාවට අ.පො.ස. සාමාන්‍ය පෙළ සඳහා පෙනී සිටි දරුවන්ගෙන් බහුතරයක් සමත් කරගන්නට කොළඹ කලාපයේ අපේ පළාත් සභා පාසල් පද්ධතියට හැකි වෙලා තියෙනවා. ඒ එක්කම සඳහන් කරන්නට ඕනෑ. අද ජාතික පාසල් මට්ටමට තරග කරන්න පුළුවන් ජනප්‍රිය පාසල් පද්ධතියක් අපි කොළඹ කලාපයේ ඇති කරලා තියෙනවා. අද අපේ පළාත් සභාවේ තියෙන සුළු ප්‍රමාණයක් වන ජනප්‍රිය පාසල් වෙනුවට, තවත් අළුතෙන් ජනප්‍රිය පාසල් පද්ධතියක් අපි එකතු කරලා තියෙනවා. අපේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ජාතික පාසල් එක්ක තරග කරන්නට තියෙන පළාත් සභා පාසල් පද්ධතිය වාගේම තවත් අලුතෙන් පාසල් පද්ධතියක් පළාත් සභාව තුළ ඉතා ජනප්‍රිය බවට පත් කරමින් යනවා. ඒ සඳහා ප්‍රතිපාදන ලබා දීම පිළිබඳව විශේෂයෙන්ම ගරු මහ ඇමතිතුමාට ගෞරවය ප්‍රණාමය පුද කරමින් අපි හැමතිස්සේම කියනවා වාගේ ඉතිහාසයේ මහ ඇමතිවරයා ඉන්න දිස්ත්‍රික්කයට තමයි වැඩියෙන්ම අධ්‍යාපනයේ ප්‍රතිලාභ ගියේ. හැබැයි, පළමු වරට අපේ කොළඹ දිස්ත්‍රික්කයට එවැනි දැවැන්ත ප්‍රතිපාදන ප්‍රමාණයක් ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කළත්, මහ ඇමතිතුමා අපට ලබා දීලා තියෙනවා. ඒ නිසා මගේ අවසාන පැතුම අපට පළාත් සභාවේ මහ ඇමතිවරයා වෙන්න ඕනෑ ප්‍රසන්න රණතුංග මැතිතුමා කියමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[ අ.භා. 03.35 ]

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂය ධාරාව යටතේ අද විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම සතුටක් ලෙස මම සලකනවා. විශේෂයෙන්ම මා නියෝජනය කරන කොලොන්නාව කොට්ඨාශයේ ජනතාවට බලපාන ප්‍රශ්න කිහිපයකුත්, ඒ වාගේම පොදුවේ බස්නාහිර පළාත තුළ අපේ ජනතාවට බලපාන ප්‍රශ්නවලට පිළිතුරු කිහිපයකුත් සොයා ගැනීමට අවශ්‍ය නිසා ඉතාම සාර්ථකව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට ඔබතුමා ගෙන යන පාලනය තුළ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් සොයා ගැනීමට හැකි වෙතැයි මා අපේක්ෂා කරන නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් මා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා.

මේ අයවැය මගින් ඔබතුමා අධ්‍යාපනය සම්බන්ධව, ඔබතුමාගේ පාලන කාලය තුළදී අධ්‍යාපනයේ යම් වෙනස්කමක් කරන්නට, අධ්‍යාපනයේ දියුණුවක් ඇති කරලා අපේ පළාතේ දරුවන්ගේ අධ්‍යාපනය දියුණු කරන්න ඔබතුමා කටයුතු කරනු ලැබුවා. ඒ කටයුත්ත තව තවත් අර්ථවත් කරමින් ඔබතුමාගේ වර්තමාන නිල කාලය අවසන් වීමට ප්‍රථමයෙන් මේ පළාතේ පාසල් දරුවන්ගේ අධ්‍යාපනයත්, ඒ වාගේම පෙර පාසල් දරුවන්ගේ අධ්‍යාපනයත් වාගේම සාමාන්‍ය පෙළ හා උසස් පෙළ අධ්‍යාපනය හැර යන දරුවන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශකත්වයත් ලබා දීම කෙරෙහි ඔබතුමා අවධානය යොමු කර තිබීම නිසා මං හිතනවා, ඔබතුමාගෙන් ඵලදායී සේවාවක් මේ ටික කාලය තුළ අපේ පළාතේ ජනතාවට ලබා ගන්න පුළුවන් වෙයි කියලා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය මම යොමු කරනවා. මීට පෙර අයවැය ලේඛනයන්හිදීත් මා ඉදිරිපත් කළා. පෙර පාසල් අධ්‍යාපනය යම් ප්‍රමාණයකට විධිමත් කරන්නට, පහුගිය කාලසීමාවන් තුළ පෙර පාසල් ප්‍රඥප්ති සකස් කරමින් යම් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න කටයුතු ආරම්භ කළා. අපට පුළුවන්කමක් ලැබුණා, එදා තිබුණාට වඩා හොඳ තැනකට ඒ පෙර පාසල් පද්ධතිය මේ වන කොට ගෙන එන්නට. එහෙත් අපට පුළුවන්කමක් ලැබුණේ නැහැ, පෙර පාසල් ගුරුවරුන්ට විධිමත් පුහුණුවක් සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග සම්පූර්ණයෙන්ම හරියාකාරව ගන්නට. ඒ නිසා දිගින් දිගටම මම යෝජනා කරපු කාරණය පිළිබඳව ඔබතුමා උපදේශක කාරක සභාවේදීත් පැහැදිලි කළා. පෙර පාසල් ගුරුවරුන් සඳහා පුහුණු මධ්‍යස්ථානයක්, විද්‍යා පීඨයක් හා සමාන පෙර පාසල් ගුරුවරුන් සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කරලා ස්ථිර පෙර පාසල් ගුරු පුහුණු වැඩ පිළිවෙළක් අපේ පළාත තුළ ක්‍රියාත්මක කළ යුතුයි කියලා. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. 2013 වර්ෂයේදී ඒ වැඩ පිළිවෙළ ආරම්භ කිරීම සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉතාමත් ගෞරවයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාතේ ප්‍රධාන පළාත් පාලන ආයතනය තමයි කොළඹ මහ නගර සභාව. මේ කොළඹ මහ නගර සභාවේ තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි, කසළ බැහැර කිරීමේ ප්‍රශ්නය. ඔබතුමා මගින් පළාත පාලන විෂය භාර ගරු අමාත්‍යවරයා හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට මම යොමු කරනවා. කොළඹ නගරයේ කසළ බැහැර කිරීම සිද්ධ කරනු ලබන්නේ කොලොන්නාව පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ. අධිකරණ නියෝගයක් මත. ඒ කෙසේ වුණත්, අද ඒ නිසා පීඩාවට පත් වී තිබෙන්නේ, කොලොන්නාවේ අහිංසක ජනතාව. එහි ප්‍රතිඵලය වශයෙන් මේ වන කොට පහු ගිය සතියේ අපට සිද්ධ වුණා, කොලොන්නාව අධ්‍යාපන කොට්ඨාශයේ මීතොටමුල්ල රාහුල විද්‍යාලයේ දරුවන් 128 ක් ඉන්න පාසලක් සම්පූර්ණයෙන්ම තාවකාලිකව වසා දමන්න. ඒ නිසා මේ ප්‍රශ්නයේ බරපතළකම අපට අවබෝධ කර ගන්න මම හිතන්නේ තවත් කාරණා අවශ්‍ය යැයි කියලා මා හිතන්නේ නැහැ. ප්‍රදේශයේ රෝග පීඩා අතිනුත්, ඒ වාගේම මහජනතාවට ඇතිවන පීඩාවන් අතිනුත් ඒ වාගේම ස්වභාවික විපතක් නොවුණත් කුණු කන්ද නිසා ඇති වුණු විපතක් නිසා ප්‍රදේශයේ නිවාස ගණනාවක් මේ වන කොට විනාශයට පත් වෙලා තාවකාලික පිළියම් සපයා තිබෙන්නේ. ඒ නිසා පළාත් පාලන ඇමතිවරයා හැටියට ගරු ප්‍රධාන ඇමතිතුමාගේ මැදිහත් වීමක් මේ අවස්ථාවේදී මම ඉල්ලා සිටිනවා. කොළඹ මහ නගර සභාවේ කසළ බැහැර කිරීමේ වැඩ පිළිවෙළ සම්බන්ධව සෘජු මැදිහත් වීමක් කරන්නය කියලා, ඔබතුමා මගින් මා ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා.

විශේෂයෙන්ම මා ඔබතුමා මගින් ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. පහුගිය වසර ගණනාව තුළ කොළඹ මහ නගර සභාවේ කසළ බැහැර කිරීමේ කටයුත්ත සම්බන්ධව කොළඹ නගර සභාවේ කොතරම් පිරිසක් විදේශ පුහුණුව සඳහා ගිහිල්ලා ඇත්ද කියන කාරණය මේ සභාවට හෙළි කරන්න කියලා. පහුගිය වසර දහයක කාලය තුළ, කොළඹ නගර සභාවේ බදු ගෙවන ජනතාවගේ මුදල්වලින් විදේශ පුහුණුව සඳහා ගොස් තිබෙන පිරිස කවුරුන්ද කියන කාරණය මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. කොතරම් මුදලක් වැය කර තිබෙනවාද? වැය කර ලැබූ පුහුණුව තුළින් කසළ ප්‍රතිචක්‍රීයකරණය හෝ කසළ කළමනාකරණය සඳහා කුමන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද යන කාරණය පිළිබඳව අවධානය යොමු කරන්නය කියලා. විශේෂයෙන් පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා හැටියට පළාත් පාලන ආයතනවල නියෝජිතයින් වශයෙන් වසර ගණනාවක් තිස්සේ කොළඹ නගර සභාවේ ක්‍රියාවලිය පිළිබඳව අපට එකඟතාවයක් පළ කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා පීඩාවට පත් වෙලා සිටින කොලොන්නාවේ නගරවාසීන්ට යම්කිසි සහනයක් ලබා දෙන වැඩ පිළිවෙළකට අවධානය යොමු කරන හැටියට මා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා.

අනෙක් කාරණය තමයි මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කථා කළ ජාත්‍යන්තර පාසල් පද්ධතිය. ජාත්‍යන්තර පාසල් යන පුවරුව යටතේ අද හැම හන්දියකම චයිනීස් හෝටල්, චයිනීස් රෙස්ටුරන්ට් දාන මට්ටමට අද මේ වෙන කොට ජාත්‍යන්තර පාසල් බිහි වෙලා තියෙනවා. මෙය අපි පාලනය කරන්න ගියොත් ජනතා විමක්ති පෙරමුණ කියයි, මේ නිදහස් අධ්‍යාපනය විනාශ කරලා පෞද්ගලික අංශයට දිරිදීමක් කරන්න යනවාය කියලා. හැබැයි, ඔවුන් කවදාවත් ඒ අවිධිමත් ලෙස පවත්වා ගෙන යන ජාත්‍යන්තර පාසල් පිළිබඳව, කථා කරලා නැහැ. මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණ කොයියම් මොහොතකවත් කථා කරලාවත්, ඒ සඳහා විරෝධයක් පළ කරලාවත් නැහැ. යම් විධියකින් මෙය පාලනය කරන්න ගියොත් තමයි, ඔවුන් රජයට විරුද්ධව, පළාත් සභාවට විරුද්ධව ප්‍රතිපත්තිමය කාරණයක් මුල් කර ගෙන නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න යනවයි කියන කාරණය මුල් කර ගෙන ඒ තුළින් යම් විරෝධතාවයක් ඔවුන් ආරම්භ කරයි කියන සැකය කා තුළත් තියෙනවා. හැබැයි මේ බිය නිසා -

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ඒක දෙකක් නේ?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මොකක්ද මන්ත්‍රීතුමා කිව්වේ?

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ඒක දෙකක් නේ? එහෙම ප්‍රශ්නයක් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ශිරාල් ලක්තිලක මන්ත්‍රීතුමා ඔබතුමාට අවස්ථාව තියෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

නැහැ. එතුමා පොඩි පැහැදිලි කිරීමක් කළේ. දිරි ගැන්වීමක්. මගේ මිත්‍රයා. අද පක්ෂයේත් තැනක් නැති නිසා මාත් එක්ක පොඩි සුහදත්වයක් තියෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා ඔබතුමා මගින්, මේ ජාත්‍යන්තර පාසල් සම්බන්ධව යම්කිසි රෙගුලාසි මට්ටමක්, යම් අධීක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් අධ්‍යාපන කොට්ඨාශ මට්ටමින්, අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හරහා පාලනයක් ඇති කිරීම සඳහා අධීක්ෂණය කිරීම සහ නිරීක්ෂණය කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයි කියලා. එහෙම නැත්නම් අපි කොපමණ නිහඬව සිටියත් මේ පාසල්වලින් පිටවන දරුවා අවසානයේ එන්නේ අපේ සමාජයට. ඒ නිසා ඒ සමාජයේදී ඒ දරුවන්ට අත්වන ඉරණම පිළිබඳව අපට ගැටළුවක් තියෙනවා. ඔවුන්ගේ හැදියාව, ඔවුන් ලබන අධ්‍යාපනය මොන මට්ටමකද කියන කාරණය බරපතළ ප්‍රශ්නයක්. ඒ වාගේම ඔවුන්ගේ විනය සම්බන්ධව. අනෙක් පැත්තෙන් තමයි, ඒ දරුවන්ට නිසියාකාර පහසුකම් ඒ පාසල් පද්ධතිය තුළ නැහැ. අපි පෙර පාසල්වලටත් නියම කරලා තියෙනවා, දරුවන් සංඛ්‍යාව - මේ මේ සංඛ්‍යාවක් ගුරුවරු ඉන්නට ඕනෑ, වැසිකිළි පහසුකම් තියෙන්න ඕනෑ කියලා. ඒ වාගේම පිරිසිදු වාත්‍රාශ්‍රය ලබන්න පුළුවන් පන්ති කාමරයක් මේ ආකාරයට සකස් විය යුතුයි කියලා පෙර පාසල් සඳහාත් අපි කියලා තියෙනවා. පෙර පාසල් පවතින්නේත් පෞද්ගලික අංශයේ. ඒ නිසා මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. පෙර පාසල්වලට ප්‍රඥප්තියක් සකස් කළා වාගේ, පෞද්ගලික පාසල් අධීක්ෂණය කිරීම සඳහා, මග පෙන්වීම සඳහා යම් වැඩ පිළිවෙළක්, ප්‍රඥප්තියක් සකස් කරලා ඉදිරියේදී පෞද්ගලික ජාත්‍යන්තර පාසල් නමින් හඳුන්වනු ලබන පාසල්, යම්කිසි ක්‍රමවත් පාලනයක් සඳහා ගෙන ඒමට වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි කියලා මා මේ සභාවට යෝජනා කර සිටිනවා. මට කාලවේලාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, නිහඬව සහයෝගය දීම පිළිබඳව විපක්ෂයටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 03.45 ]

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ මේ අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුව අපේ විපක්ෂයට ස්තුතිවන්ත වෙනවා. කෙසේ නමුත්, මම පළමුව මේ ගරු මහ ඇමතිතුමාගේ විෂය පථය පිළිබඳව කථා කරන්න යන කොට ඊට පෙර යමක් කිව යුතුයි. දැන් ඊයේ දවසේ පොදු සාකච්ඡාව තුළ මම හිතන්නේ, අපි සියලු දෙනාම, විපක්ෂය හා ආණ්ඩු පක්ෂය හැටියට අපේ වගකීම ඉටු කළාදෝ කියන ප්‍රශ්නය අපි කාටත් තියෙනවා. මහජන මන්ත්‍රීවරුන් හැටියට අද ගැන විතරත් නොවෙයි අපි හෙට ගැනත් කථා කළ යුතුයි. ඒක තමයි අපේ යුතුකම. නමුත් ස්තෝත්‍ර ගැයීම සහ දෝෂාරෝපණයෙන් එහාට ගිය සාකච්ඡාවක් අද හෝ ඊයේ මම දැක්කේ නැහැ. මම ඉන්න කෙටි කාලය තුළ අපට දැක ගන්නට ලැබුණේත් නැහැ. අවුරුද්දක වගේ කෙටි කාලයක් නේ හිටියේ. නමුත් මේ ගැන මම හිතන්නේ සභාවක් හැටියට මේ පිළිබඳව දැඩි අවධානය යොමු කළ යුතුව තිබෙනවා. දැන් ඒ ගැන මම පළමුව කියන්නට කැමතියි. මහ ඇමතිතුමාගේ අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව අදහසක් කියනවා නම්, මම පළමුව ස්තුතිවන්ත වෙනවා මහ ඇමතිතුමාගේ අමාත්‍යාංශය විසින් හොඳ වාර්තාවක් පිළියෙල කිරීම පිළිබඳව. සංසංදනාත්මක අධ්‍යයනයක් සඳහා වන තොරතුරු සහ දත්ත ඇතුළත් කර තියෙනවා. අනික් වාර්තාවලට සාපේක්ෂව. ඒ නිසා අපි පළමුව එතුමාට සහ එතුමාගේ කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා. යම්කිසි කාර්යක්ෂමතාවයක් පවතින බව පෙන්නුම් කරන්නට දරන ලද උත්සාහය පිළිබඳව ඒක මම ඔබතුමාගෙන් වාසි

බලාගෙන කියන දෙයක් නොවෙයි. නමුත් එය හොඳයි. හොඳ දෙයට අපි හොඳයි කියන්නට ඕනෑ.

ඒ වාගේම මේ වාර්තාව කියවනකොට අපට හිතනවා, ඔබතුමා ප්‍රාථමික අධ්‍යාපනය ගැන විශාල අවධාරණයක් ලබා දීලා, ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට උත්සාහ කරන බව. එයත් හොඳයි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්ෂේත්‍රය ගැන කථා කරන කොට මෙම අධ්‍යාපනය මිනිස් බල සහ රැකී රක්ෂා කියන ක්ෂේත්‍ර තුනම මහ ඇමතිතුමාගේ විෂය පද්ධතියට වැටෙන නිසා මේ අධ්‍යාපනය පිළිබඳ වාර්තාව කියවන කොට අපට බැලූ බැල්මට පේන ප්‍රශ්නය තමයි, ද්විතීයික අධ්‍යාපනය පිළිබඳව පළාත් සභාවේ දක්වන අවධාරණය ඉතාමත්ම අඩු බව.

අපි දන්නවා, රටක් හැටියට අපි බරපතළ අභියෝගයක ඉන්නවා. ඉදිරි වසර 10 තුළ අපේ ශ්‍රම බලකාය පල්ලෙහාට යමින් පවතිනවා. වැඩිහිටි ජනගහනය වැඩි වෙනවා. තරුණ ජනගහනය අඩු වෙනවා. ඒ නිසා සංඛ්‍යා ලේඛනාත්මකව කිව්වොත්, 1981 දී 6.6 වුණු වැඩිහිටි ජනගහනය 2010 වන කොට 11.9 බවට වර්ධනය වෙලා තිබෙනවා. දැන් සංඛ්‍යා ලේඛනාත්මකව පූර්වේක්ෂණය කරලා තිබෙනවා, 2050 වන කොට ලංකාවේ වැඩිහිටි ජනගහනය 20% ක් දක්වා වැඩිවීමක් සහ කාර්යක්ෂම ශ්‍රම බලකායේ ප්‍රමාණය අඩුවීමක් සිදු වෙනවා කියලා. දැන් හුඟක් ජාතිවාදීන් කියනවා මුස්ලිම් ජනගහනය වැඩි වෙනවා. දෙමළ ජනගහනය වැඩි වෙනවා කියලා. එහෙම දෙයක් නොවෙයි වෙන්නේ. සමස්ත ලංකාවේ ශ්‍රම බලකාය අඩුවීමක් වෙලා වැඩිහිටි ජනගහනය වැඩිවීමේ තත්ත්වයක අභියෝගයට අපි මුහුණ දෙනවා. මම හිතන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, LTTE එකට වැඩිය භයානකයි. ඒ නිසා මම හිතන්නේ, අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩ කරන අය මේ පිළිබඳව දැන් ඉඳන්ම අවධානය යොමු කොට ඒ සඳහා අවශ්‍ය ආයෝජනයන් කිරීම ආරම්භ කළ යුතු වෙනවා. මොකද 2020 දී මේවා කරලා හරියන්නේ නැහැ. 2010, 2012 දීම කරන්නට ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා විනාඩි දෙකක කාලයක් තමයි තව ඉතිරිව තිබෙන්නේ.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

දැන් උදාහරණයට ගත්තොතින් බස්නාහිර පළාතේ 01 A B ශ්‍රේණියේ පාසල් තියෙන්නේ 94 යි. ලංකාවේම ගත්තොතින් ඒක 713 යි. මෙය බරපතළ අඩුපාඩුවක්. විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යාපනයට අපි අවධානය යොමු කරනකොට රේඛීය අමාත්‍යාංශය හැටියට ද්විතීයික පාසල් සංවර්ධනයටත් දැනට පාසල් 31 ක් තෝරාගෙන තිබෙනවා. තව 15 ක්, මේ අවුරුද්දේ දියුණු කරන්න විද්‍යාගාර හදන්න කියනවා. ඒක බස්නාහිර

[ ගරු ශිරාල් ලක්තිලක ]

පළාතේ ප්‍රමාණයෙන් ගත්තත් 32% ක්. එය ඉතාමත්ම අඩු අවධානයක් කියලා මම මහ ඇමතිතුමාගේ අවධානයට ලක් කරනවා. වහ වහා 01 A B ශ්‍රේණියේ පාසල් ප්‍රමාණය වැඩි කරලා විද්‍යා අධ්‍යාපනය නංවන්න මීට වඩා වැඩ පිළිවෙළක් බස්නාහිර පළාතටම නොවෙයි, ලංකාවටම අවශ්‍යයි. ප්‍රාථමික අධ්‍යාපනය වර්ධනය කරන එක හොඳයි. නමුත් අත්‍යවශ්‍ය වෙලා තිබෙන්නේ, අපි ඉදිරියේදී මුහුණ දෙන මේ කාර්යක්ෂමතාවය සඵලදායකත්වය සඳහා මුහුණ දෙන එකයි. ඒ නිසා විද්‍යා නොවන ක්ෂේත්‍රයන්හි අධ්‍යාපනය හොඳයි. ඒ නිසා මෙන්න මේ අවශ්‍යතාවය ගැන අවධානය යොමු කරන්න. ඒ වාගේම මේක ඉබි ගමනෙන් යන්න පුළුවන් දෙයකුත් නොවෙයි. මේ සඳහා වූ වැඩ පිළිවෙළක් අපි දකින්නට ඕනෑ. මම හිතන්නේ මහ ඇමතිතුමාගේ අයවැය කථාවේදීත් කිව්වා, අපි ළඟ පූර්ව සැලසුම් නැහැයි කියලා. ඒකාබද්ධ සැලසුම.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය -

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

තත්පර 30 කින් අවසන් කරනවා. පසුව්පරම් ණය කියලයි. මෙන්න මේ දුර්වලතාවය තමයි මෙහේ තියෙන ප්‍රශ්නය. අද අපේ අධ්‍යාපනය පෙළපොත්වල තිබෙන දුර්වලතා, අධ්‍යාපනික පර්යේෂණ නොමැති වීම, අඛණ්ඩ ගුරු අධ්‍යාපනය නොමැති වීම බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මෙන්න මේවා ගැන අවධානය යොමු කරමින් ඊළඟ වසරේ මීට වඩා ප්‍රතිපත්තිමය වෙනසක් සඳහා අධ්‍යාපනය ගෙනියන්න කියලා කියමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 03.53 ]

**ගරු ආනන්ද රංජිත් රූපසිංහ**
Hon. Ananda Ranjith Rupasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම් මිනිස්බල හා රැකී රක්ෂා, විදුලි බල, බලශක්ති අමාත්‍යාංශය වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මුලින්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මෙම අමාත්‍යාංශය පිළිබඳව ඉතාමත්ම සන්තෝෂයෙන් කථා කරන්න පුළුවන්. පුරා අවුරුදු විස්සක් තුළ ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමතිතුමා මන්ත්‍රීවරයෙක් හැටියට විවිධ ඇමති ධූර දරලා, මහ ඇමති ධූරය දරලා විශාල සේවයක් මේ අවුරුදු තුන තුළ කරලා තිබෙනවා. විශේෂයෙන්ම අද පළාත් සභාව සුදු අලියෙක් කියන තැනක ඉන්නකොට එතුමා අපට විශේෂ ශක්තියක් ලබා දීලා තිබෙනවා. පළාත් සභාවෙන් විශාල සේවයක් කරන්න පුළුවන් කියන දේ එතුමා පෙන්නලා දීලා තිබෙනවා. අපේ කොට්ඨාශය ගත්තත්, ගම්පහ කලාපය ගත්තත් විශේෂයෙන්ම මහ ඇමතිතුමාගේ, "සුපසන් නිම්තෙර" වැඩ

සටහන යටතේ නොවැම්බර් මාස 10 වැනිදා පවිත්‍රතා දිනය - පවිත්‍රතා දිනය කියන්නේ, පිරිසිදු කිරීමේ දිනයයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා, එතුමාට බාධා කරන්න එපා.

**ගරු ආනන්ද රංජිත් රූපසිංහ**
Hon. Ananda Ranjith Rupasinghe

එදා විදුහල්පතිවරු අපට කියපු දෙයක් තමයි එතුමන්ලාගේ විදුහල්පති ජීවිතය තුළම දෙමාපිය සහභාගීත්වයෙන් මෙවැනි දිනයක් පැවැත්තුවේ නැහැයි කියලා. විශේෂයෙන්ම, ඒක ඉතාමත්ම හොඳ දෙයක්. ඒ වාගේම වර්ණාලේප කිරීම සඳහා රුපියල් එක්ලක්ෂ පනස්දාහක්, ලක්ෂය, පනස්දාහ බැගින් විවිධ පාසල්වලට වර්ණාලේපය සඳහා ලබා දීම සම්බන්ධව විශේෂයෙන්ම අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම ලකුණු 100 ට වැඩි 5 ශිෂ්‍යත්ව දරුවන්ට සහතික ලබා දීම. මොකද, අද අපේ ලංකාවේ 5 ශිෂ්‍යත්වය තුන්ලක්ෂ තිස් අටදාහක් දරුවෝ ලියලා තිබෙනවා. මෙයින් පාස් වෙලා තියෙන්නේ, තිස් තුන්දාහයි. අතික අපේ ආදරණීය දරුවෝ, අර ළමයින් ඇහයීමකට ලක් කළාට පස්සේ අර දරුවෝ අඩනවා. අපි දැක්කා හොඳාකාරවම. නමුත් මේ ලකුණු 100 කට වැඩි දරුවන්ව ඇගයීමකට ලක් කිරීමට ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා ගත්ත ඒ ප්‍රයත්නය ඉතාමත්ම අගය කරන්න ඕනෑ. මොකද, විශේෂයෙන්ම මම ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ පළාත් සභා ඉතිහාසයේ කිසිම මහ ඇමැති කෙනෙක් කොට්ඨාශ මට්ටමෙන් ඇවිදින් ප්‍රතිඵල විශ්ලේෂණයක් කළේ නැහැ. 5 ශිෂ්‍යත්වය. සාමාන්‍ය පෙළ. උසස් පෙළ. එතුමා බලාපොරොත්තු වුණා, 10% ක ප්‍රතිඵල වැඩි කිරීමක්. දැන් උදාහරණයක් හැටියට ගත්තොත් එතුමා 2009 මහ ඇමැති ධූරය භාර ගන්නකොට සාමාන්‍ය පෙළ ප්‍රතිඵල තිබුණේ 58% යි. මේ වනකොට ඒක 67% දක්වා ඉහළ ගොස් තිබෙනවා. එතුමා 10% ක වර්ධනයක් තමයි බලාපොරොත්තු වුණේ. එතුමාට ඒ ගැන මම විශේෂ ස්තුතියක් පුද කරනවා. ඒ වාගේම දහම් පාසල් අධ්‍යාපනය. අපි ඇත්තටම ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමාට විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. හොඳ දෙයක් ගැන - එතුමා විපක්ෂයේ ඉඳලා වුණත් හොඳ දෙයට හොඳයි කිව්වා. හැබැයි, විපක්ෂයේ හිටපු එක් මන්ත්‍රීවරයෙක්. මගේ කෙට්ඨාශයම නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. එතුමා කිව්වා, දහම් අධ්‍යාපනය නොවෙයි කරන්න ඕනෑ. දහම් පාසල් යන දරුවන්ට 5 ශිෂ්‍යත්වය අයින් කරන්න කියලා. මම කියන්න කනගාටුයි. මේ රටේ හතලිස් පන් ලක්ෂයක් ජනතාවගෙන් විසි ලක්ෂයයි දහම් පාසල් අධ්‍යාපනය කරන්නේ. හැබැයි, මෙතුමාගේ දහම් පාසල් වැඩ සටහන යටතේ මේ බස්නාහිර පළාතේ තිබෙනවා, දහම් පාසල් 2439 ක්. බෞද්ධ දහම් පාසල් 1894 ක්. කතෝලික 282 ක්. ඉස්ලාම් 154 ක්. හින්දු 96 ක්. මේ කෙටි කාලය තුළ මේ වැඩ සටහන යටතේ එතුමා විසි හතරදාහක්, විසි පන්දාහක් දහම් අධ්‍යාපනය සඳහා යොමු කරලා තියෙනවා. අපි දන්නවා. අද මේ රටේ නැණවත් පුද්ගලයෝ අනන්ත අප්‍රමාණ ඉන්නවා. හැබැයි, ගුණවත් කමින් අඩුයි. අද සාක්ෂරතාවය ගත්තොත් 94% ක් වෙලා තිබෙනවා. 1950 දී සාක්ෂරතාවය තිබුණේ, 50% යි, 52% යි. මම දකින්නේ, විශේෂයෙන්ම මෙතුමා මේ කාලය තුළ කරපු මේ විශේෂ සේවාවන් අපි ඉතාමත්ම අගය කරන්න ඕනෑ. කොට්ඨාශ කලාප කාර්යාල බලගැන්වීම, ඒ වාගේම පාසල් ඒකාබද්ධ කිරීම. දැන් මගේ අත්තනගල්ල ආසනය ගත්තොත් වැසීගෙන යන පාසල් කිහිපයක් ඒකාබද්ධ කළා. විශේෂයෙන්ම සංඝබෝධි මහ විද්‍යාල වැනි පාසලක්, රනිස්සල විද්‍යාලය, යටියන විද්‍යාලය, උදම්මිට ඉන්ද්‍රසාර විද්‍යාලය වාගේ පාසලවලට ඒකාබද්ධ කරලා අද පණ ගන්නලා තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා විනාඩියක් පමණයි ඉතුරුවෙලා තියෙන්නේ.

**ගරු ආනන්ද රංජිත් රූපසිංහ**
Hon. Ananda Ranjith Rupasinghe

මම තව එක දෙයක් කියන්න ඕනෑ. මොකද, විශේෂයෙන්ම විනාඩි දෙකක් ඔබතුමා දෙනවා නම් ගොඩාක් ස්තුතිවන්ත වෙනවා. 5 ශිෂ්‍යත්වය සඳහා අපේ දේශපාලන අධිකාරිය සම්මන්ත්‍රණ පවත්වනවා. විශේෂයෙන්ම මේක ඇත්තටම මම නම් දකින්නේ, තම තමන්ගේ ජනප්‍රියතාවය සඳහා කරන්නක් කියලා. නමුත් මෙතැන 5 ශිෂ්‍යත්වයට ඉස්සෙල්ලා අපි ප්‍රශ්න පත්‍ර දෙනවා. මම දන්නවා, අපේ අත්තනගල්ල ආසනයේ හතර දෙනෙක් විතර එහෙම ප්‍රශ්න පත්‍ර දෙනවා. 5 ශිෂ්‍යත්ව විභාගයට ඉස්සෙල්ලා දෙන හැම ප්‍රතිඵලයක්ම දෙන්නේ, 150 එහා ලකුණු. අම්මලා මහා බලාපොරොත්තුවක් තියාගෙන ඉන්නවා. හැබැයි, ශිෂ්‍යත්ව විභාගය ලියලා ළමයා Fail වුණාට පස්සේ අර අහිංසක අසරණ දරුවා අඩනවා. මේ දේශපාලන වාසි තකා කවුරුහරි එහෙම කරනවා නම්, ඉතාමත්ම වැරැදියි. ඒත් එක්කම තව එක දෙයක් කියලා මගේ කථාව අවසන් කරනවා.

විශේෂයෙන්ම ක්‍රීඩා තරග සඳහා පාසල්වලින් අපේ දරුවෝ පිටරටට යවනවා. ක්‍රිකට් කියමුකෝ. දැන් ගියාම, ඒ අම්මලා තාත්තලා දන්නේ නැහැ, මේ දුප්පත් දරුවෝ යන්නේ ක්‍රිකට්වලට ඉන්දියාවේ, එක් එක් පාසල්වලට පාසල් තරග සඳහා කියලා. නමුත් විශේෂයෙන්ම එහෙට ගියාට පස්සේ අහිංසක අම්මලාට තාත්තලාට සිද්ධ වෙනවා, තමන්ගේ කන කර පවා උකස් කරන්න. එහෙම උකස් කරලා තමයි ඒ Team එකත් එක්ක අරින්නේ. මේවා වහාම අපි කලාප කාර්යාලය මගින් නවත්වන්න ඕනෑ. මේවා මහා ගසා කෑම්. මහා දූෂණ. මෙපමණ හොඳ වැඩ සටහනක් යනකොට ඒ වාගේ දේවල් අපි නතර කරන්න ඕනෑ. අවසාන වශයෙන් අපේ කලාප කාර්යාලයේ කලාප අධ්‍යක්ෂතුමා, කොට්ඨාශ අධ්‍යක්ෂතුමා ඇතුළු සියලුම නිලධාරීන්ටත් ගෞරවනිය ස්තුතිය පුද කරමින් ලබන වතාවෙත් බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයටම අපේම ප්‍රසන්න රණතුංග

ඇමතිතුමාටම මහ ඇමතිකම ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 04.03 ]

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රය යටතේ මට කථා කරන්න ලැබීම ගැන මම ඔබතුමා ඇතුළු මහ ඇමතිතුමාට, සංවිධායකතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙතෙක් වෙලා මම අහගෙන සිටියා, අධ්‍යාපනය සම්බන්ධව විපක්ෂයෙන් නගපු සෑම චෝදනාවක්ම. ඒ චෝදනා ගැන තමයි මම විශේෂයෙන්ම කථා කරන්න ඕනෑ. කොළඹ සම්බන්ධව කථා කරනවා නම්, අද අපේ මහ ඇමතිතුමා කොළඹ මුස්ලිම් පාසල්වලට විශාල සේවාවක් ලබා දීලා තිබෙනවා. ඉතිහාසයේම පළමු වතාවට දෙමළ මාධ්‍ය ගුරුවරුන් 280 ක් පත් කළා, මෑතකදී. එය ඉතිහාස ගත වෙනවා. බස්නාහිර පළාත් සභාවේ එවන් මහත්මා ගති තිබුණු මහත්මා මහ ඇමැති කෙනෙකුට මෙවන් ආකාරයට කීම ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. අපේ මන්ත්‍රීවරුන් කලාප රැස්වීම්වලට පවා එන්නේ නැහැ. අධීක්ෂණ මන්ත්‍රීවරුන් වශයෙන් කියනවා. මේ මන්ත්‍රීවරුන් අධීක්ෂණය කියලා කිව්වාට අධීක්ෂණය නොව කිසිම දෙයකට පාසල්වලටවත් යන්නේ නැහැ. පාසලේ ඉන්න විදුහල්පතිවරු මොනවාද කරන්නේ? පාසල්වලට එන මන්ත්‍රීවරුන්ව තමයි උත්සවවලට අඬගහන්නේ. ඒ උත්සවවලට අඬගහලා ඒ මන්ත්‍රීවරුන් ලවා චෙක්පත ලබා දෙනවා. ඉතින් පාසල්වලට යන්නේ නැතුව මෙතැනට ඇවිල්ලා කෑගහලා වැඩක් නැහැ. කලාපයේ රැස්වීමට පවා මන්ත්‍රීවරු එන්නෙත් නැහැ. මෙතැනට ඇවිල්ලා කියනවා, කලාප රැස්වීමේ ලියුම් අපිට ලිඛිතව හම්බ වෙන්නේ නැහැ. දුරකථන මාර්ගයෙන් අපට දැනුම් දෙන්නේ නැහැයි කියලා. මම පෞද්ගලිකව මන්ත්‍රීවරුන්ට කියලා තිබෙනවා. මේ කලාපේ රැස්වීම මේ දවසට තිබෙනවා, අනිවාර්යයෙන්ම එන්න කියලා. නමුත් ඒ රැස්වීමට පවා මේ මන්ත්‍රීවරුන් එන්නේ නැහැ. ඒ වාගේ එන්නේ නැතුව මෙතැනට ඇවිල්ලා කියනවා, දේශපාලන වාසිය ගන්න මෙවන් කථා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවන් ආකාරයට කථා කිරීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ඒ වාගේම අපේ මහ ඇමතිතුමා අධ්‍යාපනය වෙනුවෙන් ලබන අවුරුද්දේ විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ විශාල මුදල් වෙන් කරලා තිබෙන්නේ, කිසිම ජාති භේදයෙන් තොරව. සෑම ළමයෙකුටම සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන සෑම ළමයෙකුටම ඒ මුදල ලැබීම සඳහා තමයි ඒ මුදල වෙන් කරලා තියෙන්නේ. ඒ වාගේම සෑම ප්‍රදේශයකම ඉන්න ළමයින්ට ඒ මුදල ලැබෙනවා. කොළඹ විතරක් නොව ගම්පහ, කළුතර - ගම්පහ ඉන්න අපේ ෂාෆි රහීම් මන්ත්‍රීතුමා, අපේ මහ ඇමතිතුමා මුස්ලිම් පාසල සඳහා වෙන් කරලා තිබුණු මුදල් ගැන මා සමඟ කියලා තිබෙනවා. ඒ වාගේම කොළඹ ගත්තොත් අල්-ඉක්බාල් පාසලට මහ ඇමතිතුමා මේ අවුරුද්දේ පවා කෝටි

[ ගරු අර්ෂාද් නිසාම්ඩීන් ]

එකහමාරක මුදලක් වෙන් කරලා ගොඩනැගිලි හදලා තිබෙනවා. එවන් ආකාරයට අධ්‍යාපනය සඳහා අපේ පළාත් සභාවේ මහ ඇමතිතුමා මුදල් වෙන් කර දීලා තිබෙනවා. මුදල් විතරක් නොව අද කොළඹ ප්‍රදේශයේ මුස්ලිම් පාසල් අතර තරගකාරීත්වයක් ඇති කරලා තියෙනවා. අධ්‍යාපනය සඳහා මෙතෙක් කල් ඔවුන් නිදාගෙන සිටී කාලය ඉවර කරලා ළමුන් අතර තරගකාරීත්වයක් උදාවෙලා තිබෙන බව මම ප්‍රකාශ කරනවා. ඒ වාගේම අපේ පළාතේ දූදරුවන්ට, දුප්පත් ළමයින්ට ක්‍රීඩා සඳහා ඔවුන්ගේ සංස්කෘතික වැනි වැඩ පිළිවෙළ සඳහා වෙනම වැඩ සටහන් සකස් කරලා ඒ අයට ඒ ඒ ළමයින්ට සුදුසු පරිදි ක්‍රියා කිරීමට උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ දරුවන් අද හොඳ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මම දන්නවා අපේ කොම්පඤ්ඤ වීදියේ ටී බී ජයා, සහිරා වැනි පාසල්වල ළමයින් මෑතකදී ක්‍රිකට් තරග සඳහා ඉන්දියාව බලා ගියා. ඔවුන්ගේ පෞද්ගලික මුදල් නොවෙයි. දානපතියන්ගේ මුදල් යොදවලා ඔවුන් ගියා. ඒ යෑමට කාරණාව කුමක්ද ? මෙතෙක් කල් අවුරුදු ගණනාවක් නැති දෙයක් අද වුණේ කොහොමද ? ඒ දියුණුව ලැබුණේ කොහොමද ? ඒ දියුණුව ලැබුණේ මේ බස්නාහිර පළාත් සභාවේ මහ ඇමතිතුමාගේ මග පෙන්වීම යටතේ කියලා මම ප්‍රකාශ කරනවා.

ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අධ්‍යාපන තත්ත්වය මෙසේ ඉහළ නගිද්දී අපේ ප්‍රජාව මුස්ලිම් ජනගහනය කොළොන්නාව, වැල්ලම්පිටිය වැනි ප්‍රදේශවලට අද විශාල වශයෙන් සංක්‍රමණය වෙලා තිබෙනවා. ඒ මුස්ලිම් ජනතාවට ද්විතීයික පාසලක් ආරම්භ කිරීම සඳහා ඒ මුස්ලිම් ප්‍රජාව මහ ඇමතිතුමා සමඟ සාකච්ඡා කරලා තියෙනවා. මහ ඇමතිතුමා එදා ඔවුන්ට පොරොන්දු වුණා. අපි ඉඩමක් සොයලා ඔබතුමන්ලාට පාසලක් ලබා දෙන බවට. නමුත් රජයේ ඉඩමක් නැති නිසා, ඒ මිනිස්සුන්ට කිව්වා මට ඉඩමක් ලබා දෙන්න මම පාසලක් හදා දෙන්නම් කියලා. ඒ අනුව ඒ ජනතාව කොළොන්නාව Education Federation කියලා සාදාගෙන මහ ඇමතිතුමා හමුවෙලා, මහ ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කර ඉඩමක් ලබා ගෙන තියෙනවා. ඉඩමට සල්ලි දැන් කෝටි තුනහමාරක් වැනි මුදලක් උවමනා වෙනවා. ඒ මුදල ඒ පරිත්‍යාගශීලීන් මඟින් ඔවුන් ලබා ගෙන, ඒ ඉඩම ලබා ගත්තාට පස්සේ මහ ඇමතිතුමා ඔවුන්ට පොරොන්දු වුණා, අනිවාර්යයෙන්ම ඔවුන් ඒ ඉඩමේ පාසල් ගොඩනැගිලි සාදා දෙන බව. ඒ ජනතාවට ඒ පාසල ලබා ගැනීමට. එහෙම කළේ ඇයි? අපි කථා කළා. අපි කථා කරලා කිව්වා, මේ ප්‍රදේශයේ සිටින ජනතාව ජාත්‍යන්තර වැනි පාසල්වලට යොමු වෙලා තියෙනවා. ජාත්‍යන්තර පාසල් කඩ වාගේ පත්වෙලා තිබෙන නිසා තමයි මේ ජනතාව මේ වාගේ ක්‍රියාවලට ගිහිල්ලා තියෙන්නේ. ඒ නිසා මහ ඇමතිතුමා එදත් පොරොන්දු වුණා, ඔවුන්ට ඒ ගොඩනැගිලි ලබා දෙන බවට. එවන් ආකාරට මේ මහ ඇමතිතුමා විශාල සේවාවක් අපට ලබා දීලා තිබෙනවා. මුස්ලිම් ජනතාව කොළඹ, ගම්පහ කියලා වෙන් කරලා නැහැ. සෑම ජන කොටසකටම සෑම

විධියටම මහ ඇමතිතුමා වැඩ කටයුතු කරලා තියෙනවා. අපි ඒක ප්‍රායෝගිකවම දැකලා, අපි සන්තෝෂයට පත් වෙනවා. එතුමාට තවත් මෙවන් දේවල් කිරීමට දීර්ඝායුෂ හා ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 04.06 ]

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධ මම ස්තුතිවන්ත වෙනවා. මෙතැනදී මම හිතන්නේ, මෙම අයවැය ඉදිරිපත් කරමින් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉතාමත් සුවපහසු ලීලාවෙන් මේ කටයුත්ත කරගෙන යන්නේ. 2011 වර්ෂය වන විට වෙන් කරන ලද මුදල්වලින් 95% ක 98% ක ප්‍රමාණයක මූල්‍ය ප්‍රගතිය, භෞතික ප්‍රගතිය අත්පත් කර ගනිමිනුයි. ඒ කියන්නේ, කළ හැකි දෙයක් තමයි එතුමාගේ මේ සංවර්ධන කටයුත්තේ තියෙන්නේ. හැබැයි, මේ අයවැය ඉදිරිපත් කරගෙන යනකොට මේ අයවැයේදී එතුමාට ප්‍රසාදය පළ කරපු ආකාරය බලනකොට, කොළඹ දිස්ත්‍රික්කයේ, කළුතර දිස්ත්‍රික්කයෙන්, ගම්පහ දිස්ත්‍රික්කයෙන්, ඊළඟ මහ ඇමැති වෙන්න කවුරුහරි මන්ත්‍රීවරයෙක් හිතාගෙන ඉන්නවා නම් එතුමා ඒක හිතෙන් අයින් කර ගත්තාට කමක් නැහැ. කොහොම වුණත් විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ අදහස් පළ කරන කොට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා මෙහොතකට රීති අංක 68 (4) (ආ) රීතිය වෙත, මම සභාවේ අවධානය යොමු කරනවා. ගරු මන්ත්‍රීතුමන්ලා අමතමින් තිබියදී ඒ හරහා බොහෝම වගකිව යුතු ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරු ඇමතිවරු ගමන් කරනවා. ඔබතුමාට අවස්ථාව.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ අදහස් දක්වන වෙලාවේ නිසි වැටහීමකින් තොරව කියන්න බැහැ. සමහර අදහස් දක්වන කොට මම පුංචි මතක් කිරීමක් කරන්න ඕනෑ. මගේ හිතවත් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඊර්ෂ්‍යාව.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

පොඩ්ඩක් සද්ද නැතුව ඉන්නවාද ඔබතුමිය. එතුමියට එක්කෝ වෙලාව දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා මූලාසනය අමතන්න ගරු මන්ත්‍රීතුමා

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ෆයිරුස් ගරු මන්ත්‍රීතුමා තමන්ගේ අදහස් පළ කරන කොට කිව්වා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් අතින් අපේ පාසල අපේ දෑතින් සුරකිමු කියන සංකල්පයට අදාළ ඒ චෙක්පත් ලබා දීම සම්බන්ධයෙන් ඒක ඉතාමත් නීති විරෝධියි. ඒ සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරු කැඳවන්නේ නැහැයි කියලා. අංක එකට අපි පැහැදිලි කරගන්න ඕනෑ දෙයක් තමයි, මේ අයවැය තුළින් තමයි මේ මුදල් වෙන් කරන්නේ. මේ අයවැය තුළින් තමයි මේ යෝජනා ඉදිරිපත් කරන්නේ. වැය ශීර්ෂයට විරුද්ධයි. අයවැයට විරුද්ධයි. ඒ සියල්ලට විරුද්ධයි. හැබැයි, ප්‍රතිපාදනය බෙදන කොට විතරක් විපක්ෂය යායුතුයි. එහෙම සම්ප්‍රදායක් වෙන්නේ නැහැ. එදා තිබ්බා නම්, ඒ වැරැද්දම අපි නිවැරදි කර ගන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමා එදා කරලා තිබ්බා නම්, ඒක වැරදියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරු වැය ශීර්ෂයට විරුද්ධ වෙලා - ඔවුන්ගේ ජවනිකාව හරි. ඔවුන් අපව නිවැරදි කළ යුතු නම්, ඔවුන් විරුද්ධ වෙනවා නම්, ඔවුන් සිටිය යුත්තේ වර්ණාලේපය සඳහා මුදල් ලබා දියව් කියන තැනයි. අපි දෙන්නම්. ඒ නිසා ඔවුන් අපේ කටයුත්ත කරන්න ආවොත් විපක්ෂයේ කටයුතු කරන්න කවුරුත් නැතිව යනවා. අපේ ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමා අදහස් දක්වන කොට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කිව්වා, ඉබිගමනින් ගිහිල්ලා හරියන්නේ නැහැ. මේ අධ්‍යාපන කටයුතු කරන කොට ඉතාමත් වේගයෙන් යන්න කියලා. ගරු මන්ත්‍රීතුමා ඒ පක්ෂයේ නායකත්වයට යන ගමන වේගයෙන් යන්න ගිහිල්ල වුණු දේ අපි දැක්කා. අඩුම ගානෙන් 337 න් බේරුණා. ඒ නිසා දැන් අවසානයේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පක්ෂ කීයක් මාරුකළාද ?

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

337 ක් එහෙම කථා කරන්න කොට භාරදහස් ගාණක් ඉබි ගමනේ යමු කිව්වා. ඒ විතරක් නොවෙයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔයා විවිධ ගමන් යනවා. ඔයාට විවිධ ගමන් ස්වරූප තියෙනවා

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මෙතැන කථා කරන කොට ඇත්තටම හෘද සාක්ෂියට එකඟව එතුමා කථා කළාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. එතුමා ප්‍රකාශ කරනකොට එතුමාගෙන් සියළු දේ සම්බන්ධයෙන් ගැටළුවක් ඇති කරගන්න මම සූදානම් වෙන්නේ නැහැ. හැබැයි, එක දෙයක් ප්‍රකාශ කළ යුතුයි. මෙය හැන්සාඩ් ගත වුණු දෙයක්. එතුමා කිව්වා, ජා-ඇළ බටුවත්ත මහ විද්‍යාලයට එතුමා විසින් රුපියල් ලක්ෂයක මුදලක් ප්‍රතිපාදන මගින් නිකුත් කළාය කියලා. එතුමා ෆොටෝ කොපි යන්ත්‍රයකුත් ලබා දුන්නා කියලා. ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීමට ඔබතුමා හරහා මම ඉදිරිපත් කරනවා. එතුමා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කුමන හෝ අමාත්‍යාංශයකට මුදල් වෙන් කළා නම්, වෙන් කළේ පළාත් පාලන කොටසට රුපියල් පනස් පන්දාහක් පමණයි. අනික් කිසිම සත පහක මුදලක් වෙන් කරලා නැහැ. බටුවත්ත මහ විද්‍යාලයට මේ වනතුරු ඡායා පිටපත් යන්ත්‍රයක් නැහැ. තියෙන්නේ බටුවත්ත කනිෂ්ට විද්‍යාලයට විතරයි. ඒකත් අවුරුදු පහක් පරණ ඡායා පිටපත් යන්ත්‍රයක්. ඒ නිසා මෙවැනි දේ සභාගත කරනකොට මෙවැනි පට්ටපල් බොරු මාධ්‍ය ඉස්සරහා, ඒ වාගේම අනිකුත් නිලධාරීන් ඉස්සරහා ප්‍රකාශ කරනකොට එතුමා ඒ ගලලා තියෙන්නේ - එතුමාට ආත්ම ගෞරවයක් නැති වෙන්න පුළුවන්. අපිට ආත්ම ගෞරවයක් තියෙනවා. එතුමා බොරු කියන කොට අපිත් බොරු කියන්නෝ බවට පත් වෙනවා. ඒ නිසා කරුණාකරලා එතුමාගේ ප්‍රකාශය සම්බන්ධයෙන් මූලාසනයෙන් විමසීමක් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. අපි කථා කරන මෙම වැය ශීර්ෂයේදී අපේ පැත්තෙන් ප්‍රධාන අමාත්‍යතුමාගේ සෘජු මැදිහත්වීම උඩ 2012 වර්ෂය වන විට 6106 දෙනෙක් ගුරුවරු බඳවාගෙන තියෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මෙතැනදී එතුමාගේ නව යෝජනාවක් තියෙනවා. 2013 වර්ෂයේ අධ්‍යාපන යෝජනාවල අංක 14 යෝජනාව උපාධිධාරී ගුරුවරුන්ට පශ්චාත් අධ්‍යාපනය ලබා දීම. අද අපි දකිනවා හුඟක් වෙලාවට පුහුණු ගුරුවරයෙක් වන කොට ගුරු විද්‍යාලයකින් පිටවෙන ගුරුවරයෙක් මනා ශික්ෂණයකින් යුතුව මනා හික්මීමෙන් යුතුව පාසලේ වටපිටාව හා සියල්ල -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

සියල්ල අවබෝධ කරගෙනයි ගුරු විද්‍යාලයෙන් පිට වෙන්නේ. නමුත් උපාධිධාරියා ශාස්ත්‍රඥයෙක් පමණයි. නමුත් උපාධිධාරියා ගුරුවරයෙක් බවට පත් කිරීමේ ක්‍රියාවලියට එතුමා අද අතගහලා තියෙනවා. ඒ ක්‍රියාවලිය කරද්දී, ඊට අමතරව උපාධිධාරී ගුරුවරයා පාසලට අනුගත කරන්න, විදුහල්පතිවරයාට කීකරු

[ ගරු නෙලුක් මල්ලව ]

කරන්න, පාසල කියන දෙමව්පියෝ, දරුවෝ හා ගුරුවරු එකතු වුණු පවුල සමඟ එකට ගොඩනැගෙන්න, කාල වේලාවකින් තොරව අර කෝස් මේ කෝස් ඒ ඒ පාඨමාලාවලට දුවන්නේ නැතුව පාසල කියන පවුලත් එක්ක වැඩෙන්න මේ වැඩ පිළිවෙළ තුළ උගන්වනවා නම් හොඳයි කියලා මම යෝජනා කරනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පෙර පාසල් අධ්‍යාපනය තුළ ප්‍රතිපාදන වෙන් කිරීමේදී සීමාසහිත ප්‍රමාණයකටයි ඩෙස් පුටු බංකු දීලා තියෙන්නේ. ඒ වාගේ දේවල්වලට විතරයි. ඔබතුමා මගින් ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. මේ ප්‍රතිපාදන යොමු කරද්දී පෙර පාසලේ අවශ්‍යතාවය අනුව ප්‍රතිපාදන වෙන් කරන්න බලන්න. පෙර පාසලේ අවශ්‍යතාවය අනුව ප්‍රතිපාදන වෙන් නොකළොත් වෙන්නේ, ඒ මුදල අපතේ යාම පමණයි. ඒ නිසා මෙන්න මෙතැන්දී තව කාරණයක් මම අවසාන වශයෙන් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපදේශක සේවාව අපේ පාසල්වලට පැහැදිලිවම අවශ්‍යයි අද අපේ ගුරුවරු ඉන්නවා උපදේශනය ලබා ගත්ත, පුහුණුව ලබා ගත්ත අය. ඒ උපදේශන සේවාවලට අනුගත වුණු ගුරුවරු ඒ සඳහා යොදවන්න. අද අපි බොහොම පැහැදිලිව අපචාර හා අපයෝජන ක්‍රියාවන් දකිනවා. දරුවා මුලින්ම අපයෝජනයට ලක් වෙන්නේ, තමන්ගේ පියාගෙන්. පුතාට මුලින්ම බූරුවා කියලා කථා කරන්නේ තාත්තා. ඊට පස්සේ තමයි අල්ලපු ගෙදර මිනිහා බූරුවාගේ පුතා හරි මොනවා හරි කියන්නේ. ඒ නිසා මෙන්න මේ තත්ත්වය දෙමව්පියන්ට අවබෝධ කර දිය යුතුයි. දෙමව්පියෝ මගින් දරුවන්ට ඒ රැකවරණය ලැබිය යුතුයි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හුදෙකලා නොවූ පරිසරයක දරුවන් ගොඩනැගිය යුතුයි. හුදෙකලා වූ පරිසරයක වැඩෙන දරුවා සමාජයට වෛර කරනවා. සමාජයෙන් පලා යනවා. සමාජය ඉදිරියේ පෞරුෂයක් සහිත නැගිටින දරුවා වෙනුවෙන් ඒ වැඩ පිළිවෙළ නිර්මාණය කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමා මගින් ඉදිරිපත් කරන ලද මේ අයවැයේ එතුමා බලාපොරොත්තු වුණු දේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ලබාගෙන ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අධීක්ෂණය හා මැදිහත්වීම ලබාගෙන වැඩ කටයුතු කරගෙන යන්න එතුමාට ධෛර්ය, ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා ස්තුතියි.

[ අ.භා. 04.15 ]

**îæóõô ÎÛë°Ý° ç°èðë°ùÝ° îæèÝ°êè**
ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි. දමිළ භාෂාවෙන් වචන ස්වල්පයක් කථා කරන්න මම අවසර ඉල්ලා සිටිනවා. ¡ä°× öñ°æÓéìÁ ôõÔ-îòùÔê°êðì°ìê°êðÎù êëðïðù° øÕ òðù ôèˆê°éêæó° ÎçÒë°çâ öä°ÄéìÁ åÈçˆæóèä ã×ç°çðäˆæó° Îæì°Ìæ° îæèÈìê÷°Æ ¡úñ°æ êëðïðÎù øÕ òðù ôèˆê°éêæéóç° Îçò

åèä° åðéäæ°æðä°Î÷ä°. öñ°æÓéìÁ Ëêùéëò°ò˜ íô˜æÓéìÁ æù°ôð òë°ëå°êëèä Îòéôæéó öêð˜æ°æì°òð, ÍÓñ°æì°òð öä°÷ Îçêë° ¡ù°ùèëù° öù°ÎùèÕë° çèõèì°âäè˜æó°. ÍÓñ°æì°òðéÁò° Îò˜å°ê òðù ã×ç°çðä˜æó°, öêð˜æ°æì°òðÎÁ ôðë˜òäñ°æéó Ëä°éôê°êêèæ îòèä°äè˜æó°. ãÈéëÁèæÎô ÍÓñ°æì°òðÁðä° Æé÷çèÌæéó Òì°âæ° æèì°Ìôê÷°Æê°êèä°. öêð˜æ°æì°òð öä°÷ øä°× ¡Õæ°æðä°÷Ê. åÐñ°æó° Ëç°çÊ ¡ùì°òëèæ çä°Ëæç°çÌê°êç°çì°ì åðêðéÁ ôïñ°æðäèÙë° òèð íéê Éë°çÊ ¡ùì°òëèæ°æðäèÙë° òèð íÊ œ× ¡ùì°òëèæ ëè÷ðäèÙë° òèð öêð˜æ°æì°òð òèðÁèä Ëé÷Áðù° îòÁù°çì ÎôÈÌë° öä°çÊ êèä° öä°ÄéìÁ æÕê°Ê. ÍæÎô ÍÓñ°æì°òðéÁò° Îò˜å°ê øÕ òðù ã×ç°çðä˜æó° öêð˜æ°æì°òðæ°Æ ôïñ°æð ¡Õæ°Æë° ¡å°ê Ëç°çê°Ê Éå°Ê ¡ùì°ò ‡çè ÎçèÊëèäÊ öä°× îòèä°äè˜æó°. åèä° öêð˜æ°æì°òðæ°Æ, ÍÓñ°æì°òðæ°Æ öä°× Îô×çèìèæ Îæèèðæ°éæ îòÁ°Áôðù°éù ¡ä°× ãó°ó îòùÔæéó òÌê°Êç° çè˜æ°Æë° ÎçèÊ ¡å°ê Ëç°çê°Ê Éå°Ê ¡ùì°òë° ÎçèêèÊ öä°×êèä° …÷ðÎää°. ÍæÎô ¡éê íêðæèðæ°æ ÎôÈÌë° öä°× …÷ðÁÊ åèä°, öå°ê íõòðÁù° Îô×çèÌë° ¡ù°ùèëù° öù°ùè ã×ç°çðä˜æÓæ°Æë° ¡Ê òëëèæ íêðæèðê°Ê ôïñ°æç°çì ÎôÈÌë°, öä°×êèä° åèä° …÷ðÎää°. íÎê Îçèù° ¡å°ê ôÕìë° öä°ÄéìÁ çä°Ëæç°çÌê°êç°çì°ì åðêðÁðÎù Çäðê íä°äëèó° çèìòèéùæ°Æ ¡õÈÌ ¡ùì°òë° ‡çèÔë°, íô˜æÓéìÁ ëùòù…ì åð˜ëèúê°êð÷°æèæ øÕ ¡ùì°òê°Ê öÏçê°êð Éå°êèÁðõë° ‡çèÔë°, ôðÎôæèäå°êè ëæè ôðê°êðÁèùÁê°êð÷°Æ ¡õÈÌ ¡ùì°ò ‡çèÔë°, Çäðê ÙýòðÁèù° æù°Ùýèðæ°Æ øÕ ¡ùì°òë° ‡çèÔë° íÎê Îçèù° ôÕëèäë° Æé÷å°ê ëèúô˜æÓæ°Æ æù°ôðæ°Æ ÎêéôÁèä

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ඉතිරිව තිබෙනවා.

**îæóõô ÎÛë°Ý° ç°èðë°ùÝ° îæèÝ°êè**
ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා

îçèÕì°æéóç° îç÷°×æ° îæèó°ôê÷°æèæ øÕ çðó°éóæ°Æ 1000 ‡çè ôÐêëèæ 500 ëèúô˜æÓæ°Æ Éå°Ê ¡ùì°òë° ‡çèÔëèæ, æù°ôðæ°æèæ 12 ¡ùì°òê°Ê Éë°çêèÁðõë° ‡çèéô åèä° ¡å°ê ôÕìë° øÊæ°æð ¡Õæ°æðä°Î÷ä° öä°çéêÁðì°Ì. åèä° …÷ðæ° îæèó°ó îçÕéëç°çÌæðä°Î÷ä°. Öîää°× îòèä°äèù° Ëêùéëò°ò˜ íô˜æó° öô°ôóÔ Êýõë° ¡å°ê ôõÕ-îòùÔê°êðì°ìê°êðÎù æù°ôðæ°Æ çúë° íêðæëèæ øÊæ°æð ¡Õæ°æðä°÷èÎõè íÎê Îçèù° åèÄë° êäðç°çì°ì Ëé÷ÁðÎù æù°ôðæ°æèæ ÎôÈâ íêðæóÔ çúê°éê øÊæ°æð ¡Õæ°æðÎ÷ä°. íÎê Îåõê°êðù° ¡ç°çâ çèìòèéùæ°Æ æèÎòèéùæéóò° îæèÈÌ îòä°× îæèÌç°çêèù° êñ°æÓéìÁ ôèæ°Ææéó íêðæèðê°Êæ° îæèó°óùèë° öä°×, òðù˜ åðéäæ°æð÷è˜æó°. íéê åèä° òèð öä°× …÷ ëèì°Îìä°. Öîää°× îòèä°äèù° çèìòèéùæóðÎù ÎçèÁ° åèñ°æó° ôèæ°Ææ° Îæì°çêðù°éù, åèñ°æó° ôèæ°Ææ° Îæì°çÊ îçèÊ ëæ°æóðìÎëÁèÆë°. ÍæÎô ¡å°ê æù°ôð åìôâæ°éæææ°Æó° åðò°òÁëèæ íõòðÁù° êéùÁÐÌ ¡Õæ°æèëù° ¡Õå°êèù°êèä° æù°ôð ¡ä°Äë° …Ìêùèæ öñ°æÓéìÁ ëèæèúê°êðÎù Ëä°Îä×ë° öä°çÎê öä°ÄéìÁ êèï°ôèä æÕê°Ê. íÎê Îçèù° êëðï° çèìòèéùæóðÎù çù°Îô× Æé÷çèÌæó° æèúç°çÌæðä°÷ä, öä°ÄéìÁ åÈç˜ êÁèæèå°ê îçÎõõè îòèä°äÊ Îçèù° öñ°æó° öù°ÎùèÕéìÁ æÕê°Êæ°æéóæ° Îæì°Ìê°êèä° íô˜ ¡å°ê æù°ôðç° çúðç°çèó˜ …ì°ìê°êðÎù ËâÔæéó öÌæ°æðä°÷è˜. ÍæÎô íôÕæ°Æë° åèä° åä°÷ð …÷æ° æìéëç°çÌæðä°Î÷ä°. íÎê Îçèù° åèä° Îå÷°× õèÛæðèðÁ Îõèëä° æê°Îêèùðæ°æ êëðï° çèìòèéùæ°Æ îòä°÷ðÕå°Îêä° íñ°Îæ íå°ê çðó°éóæÓæ°Æ æì°ìì ôòêð ëðæÔë° Æé÷ôèæ ¡Õæ°æð÷Ê. Îå÷°× ôÕéæ êå°êðÕå°ê öñ°æÓéìÁ ëàðå°ê ÆÕôðì°ì ã×ç°çðä˜ íô˜æÓë° íå°ê çèìòèéùæ°æèæ ÎôÈâ çù ËÁ÷°òðæéó òÌê°Êó°è˜. íç° çèìòèéùæ°Æ íú°éëÁðù° ãó°ó øÕ æì°âìë° íô˜æÓæ°Æ ôïñ°æç°çÌë° öä°× Òòðù° çðÎõë ÛÁå°ê Ëä°éä åèó° Ëêùéëò°ò˜ íô˜æó° ôèæ°Æ×êð íóðê°Êë° ¡ä°× ôéõ íå°ê çèìòèéùæ°Æ, æì°ìì ë° ôïñ°æç°çìôðù°éù. ÍæÎô Ëêùéëò°ò˜ íô˜æó° ¡å°ê êëðï° çèìòèéùæÓéìÁ çðõò°òéäæéóüë° êÁÔ îòÁ°Ê æôäê°êðù° òÌê°Ê

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්

**îæóõô ÎÛë°Ý° ç°èðë°ùÝ° îæèÝ°êè**
ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා

¡å°ê êëðï° ã×ç°çðä˜æÓë° íô˜æÓéìÁ çèìòèéùæÓæ°æèæ ãêôð îòÁ°Á ÎôÈÌë°. åèä° öù°ùè ¡ä çèìòèéùæÓæ°Æë° ãêôð îòÁ°Êó°Îóä°. æù°ôðæ°Æ åèë° Îçêë° çè˜æ°æ° …ìèÊ öäæ° …÷ð ¡å°ê Îåõê°éê øÊæ°æð ê°å°êéëæ°æèæ ãñ°æó° íéäôÕæ°Æë° åä°÷ð …×æðä°Î÷ä° åä°÷ð.

[ අ.භා. 04.20 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ශීර්ෂ අංක 104, 109, 110, 111, 112, 113, 114, 115 යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව සලසා දීම ගැන. විශේෂයෙන්ම මහපොළව තේරුම් අරගෙන, අවශ්‍යතාවය තේරුම් අරගෙන, ඉතාම නිවැරදිව සම්පත් කළමනාකරණය

කරමින් ඉතාම ප්‍රායෝගිකව වැඩ කරන නායකයෙක් යටතේ මේ විෂයයන් ඇතුළත් වී තිබීම ගැනත් මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. ඒ වාගේම මම පෞද්ගලිකව සතුටු වෙනවා, ඔබතුමා මූලාසනයේ ඉන්න වේලාවේ මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන. විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ රටේ ජාතික අධ්‍යාපනයේ විෂය භාර නියෝජ්‍ය ඇමතිවරයාගේ සහෝදරයා. ඒ වාගේම අපි දෙන්නා එක බඩවැල කඩාගෙන එළියට ආවේ නියුන් සහෝදරයෝ වාගේ. එකම කොට්ඨාශය සංවර්ධනය කරන්න දිවා රෑ වෙහෙසන දෙන්නෙක් විධියට ඔබතුමා මූලාසනයේ ඉන්නකොට කථා කරන්න ලැබීම ගැනත් මම ඉතාමත්ම සතුටු වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යහළු තරහකාරයෝ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ කථාව කරන්න ඉස්සෙල්ලා මට මේ වේලාවේ උවමනා වෙනවා, ජනතා විමුක්ති පෙරමුණේ ළදරු චලිප්පුවට යම් උත්තරයක් දෙන්න. විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණ උත්සාහ කළා, මේ විවාදය ඇතුලේ මේ රටේ ජාතික අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාට යම් මඩ ගැසීමක් කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෝමාගම පැවතුණු බස් නැවතුම් පොළ විවෘත කිරීමේ උත්සවයේ අධ්‍යාපන ඇමතිතුමා ආරාධිත අමුත්තෙක් වුණා මිසක, කිසි වෙලාවක ඒ උත්සවයේ සංවිධායකයා වුණේ නැහැ. ඒ උත්සවයට දරුවෝ සම්බන්ධ වුණා නම් ඒ අය සම්බන්ධ වුණේ, අධ්‍යාපන ඇමැතිතුමාගේ අනුමැතිය, නිර්දේශ මත නොවෙයි. ඒ නිසා ඒවාට යම් වගකීමක් කරන්න තියෙනවා නම් වගකිව යුත්තේ අධ්‍යාපන බලධාරීන් මිසක, අධ්‍යාපන අමාත්‍යවරයා නොවෙයි කියන කාරණය මතක් කරනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත්ම වගකීමෙන් කියනවා. එදා ඒ උත්සවයට සහභාගී වුණු කිසිම දරුවෙකුට තමන්ගේ විභාග සම්බන්ධයෙන් කිසිම ගැටළුවක් මතු වුණේ නැහැ. ඒ විභාගයට ඒ ආකාරයෙන්ම ඒ අයට මුහුණ දෙන්න පුළුවන් අවස්ථාව නිර්මාණය වෙලා තිබුණා. ඒ නිසා ඒ ගත්ත උත්සාහය ගැන අපි විශේෂයෙන් කනගාටු වෙනවා.

ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණ මතු කරපු මූලික තර්කය තමයි අද පාසල් වසා දමමින් යනවා කියලා. ඒ අය විවිධ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරමින්, විවිධ තර්ක මතු කරන්න හැදුවා පාසල් වසා දමමින් යනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් වසා දැමීම විද්‍යානුකූල පදනම් යටතේ සිද්ධ වෙන්නට පුළුවන් කාරණයක් කියන එක අපි මතක් කරනවා. විශේෂයෙන්ම, ඔබතුමා දන්නවා. අපි නියෝජනය කරන මැතිවරණ බල ප්‍රදේශයේ, එදා කුසුමා ගුණවර්ධන මැතිනිය රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කරන වේලාවේ අපේ ආසනය පුරා තිබුණු සංස්කෘතික පදනම් මත, විවිධ තත්ත්වයන් මත පාසල් ගණනාවක් නිර්මාණය කළ බව. අද සිදු වන විශේෂ සංවර්ධන තත්ත්වයන් යටතේ මෙහි ගම්වල පාසල්වලට දරුවෝ යන්නේ නැහැ. මෙම සංස්කෘතික බෙදීම් අද සලකන්නේ නැහැ. ඒ නිසා දරුවෝ ඒ සංවර්ධනය පාවිච්චි කරලා නගරයේ පාසල්වලට එනවා. ඒ නිසා ස්වභාවික තත්ත්වයන් යටතේ පාසල් වැසීගෙන යනවා. පාසල් වැසීයාම විද්‍යානුකූල පදනම් යටතේ සිද්ධ විය හැකි එකක්. ඒක තේරුම් ගන්න බැරි නම් ජනතා විමුක්ති පෙරමුණට මම හිතන්නේ, එතැනින් එහාට දේශපාලනය කරන්න පුළුවන් කමක් නැහැ. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණට එහෙම කථා කරන්න සාදාචාරාත්මක අයිතියකුත් නැහැ. මට මතකයි, මගේ තාත්තා විදුහල්පතිවරයෙක් වෙලා ඉන්න කාලයේ, එතුමා වැඩ කරපු පාසලේ අහිංසක ගුරුවරයෙකුට ජනතා විමුක්ති පෙරමුණ වෙඩි තියලා මැරුවා. එක ගුරුවරයෙක් නොවෙයි. රට ඇතුලේ ගුරුවරු ගණනාවක්, විදුහල්පතිවරු ගණනාවක් මරා දාපු දේශපාලන පක්ෂයකට අද මෙහෙම කථා කරන්න සදාචාර අයිතියක් තියෙනවාද කියන ප්‍රශ්නය අපට තියෙනවා.

[ ගරු මහේෂ් අල්මේදා ]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දකින්නට ඇති අපේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් බස්නාහිර පළාතේ ඉතාම කරුණු ඇතුව විධිමත් පොතක් මුද්‍රණය කරලා අපට භාර දුන්නා. මෙහි සුවිශාල අඩුපාඩුවක් තියෙනවා. මම මේ කාරණය ගරු ප්‍රධාන ඇමැතිතුමාට පෞද්ගලිකව මතක් කළා. මේ පොත ඇතුලේ ද්‍රවිඩ මාධ්‍ය පාසල් ගැන අබමල් රේණුවක සඳහනක් කරලා නැහැ. මේක බරපතළ වැරැද්දක්. මේකෙන් බරපතළම අසාධාරණය වුණේ, අපේ ප්‍රධාන අමාත්‍යතුමාට. මොකද, එතුමා තරම් ඉතිහාසයේ ද්‍රවිඩ මාධ්‍ය පාසල් සංවර්ධනය කරන්න වැඩ කරපු නායකයෙක් පළාත් සභාව තුළ හිටියේ නැහැයි කියන කාරණය එතුමාට ගෞරවයක් විධියට අපි මතක් කරන්නට ඕනෑ. ඒක අපි කියන්නේ, නිකම්ම නිකන් නොවෙයි. ඒකට සුවිශේෂ කාරණාවක් තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ද්‍රවිඩ මාධ්‍ය පාසල් කීයක් අපේ ආසනය ඇතුළත තියෙනවාද කියලා ඔබතුමා දන්නවා. අපි පාසලකට ගියාම මුහුණ දෙන ගැටළුව මොකක්ද කියලා ඔබතුමා දන්නවා. සමහර ද්‍රවිඩ මාධ්‍ය පාසල්වල, ගුරුවරු තිහක් ඉන්න ඕනෑ තැන්වල, ගුරුවරු දොළහක්වත් නැහැ. ඒ නිසා ඒ ප්‍රදේශවල බරපතළ අසහනයක් නිර්මාණය වෙමින් තිබුණා. අවසානයේ ජාතික ගැටළුවක් බවට පත් වෙන්නේ මේ කාරණා තමයි. ඒ නිසා ද්‍රවිඩ මාධ්‍ය පාසල්වල ගුරු හිඟය අයින් කරන්නේ නැතුව ජාතික සමගියට තියෙන බරපතළම තර්ජනය අයින් කරන්න බැහැයි කියන විශ්වාසයේ අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉන්නවා ඇතියි කියන විශ්වාසය මට තියෙනවා. එතුමා ඉතිහාසයේ පළමුවැනි වතාවට අපේ බස්නාහිර පළාතේ හිටිය ද්‍රවිඩ මාධ්‍ය උපාධිධාරීන් සියලු දෙනාට රැකියා දෙන්න කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංඛ්‍යාව කිව්වොත් තුන්සිය එකයි. ගුරුවරු තුන්සිය එකකට රස්සාව දෙන්න එතුමා

කටයුතු කළා. ඒ අය ද්‍රවිඩ මාධ්‍ය පාසල්වල ගිහිල්ලා සේවය කරනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතු පාසල් ගුරු හිඟයකට පිළියමක් විධියට එතුමා ගුරු සහයකයෝ බඳවා ගනු ලැබුවා. අද වනකොට එතුමා කටයුතු කරලා තියෙනවා, මේ ගුරු සහයකයෝ ගුරු සේවා ව්‍යවස්ථාවට අන්තර් ග්‍රහණය කරන්න. විශේෂයෙන් දෙක, තුන ශ්‍රේණියට ඇතුළත් කරලා, ඒ අයට පත්වීම් දෙන්න අවශ්‍ය කටයුතු ගරු ප්‍රධාන ඇමැතිතුමා කරලා තියෙනවා. ඒ නිසා ඉදිරි කාලයේ ද්‍රවිඩ මාධ්‍ය පාසල්වල එකම ගුරු හිඟයක්වත් තියෙන්න පුළුවන් කමක් නැහැ. සීයට සීයක් ගුරු හිඟය නැති කරන්න එතුමා කටයුතු කරලා තියෙනවා කියලා අපි බොහෝම ගෞරවයෙන් මේ වේලාවේදී මතක් කරනවා. ඒක මම හිතන්නේ, මේ රටේ ජාතික සමගිය ගොඩනගන්න ගත්ත දැවන්ත උත්සාහයක්. ඒ වාගේම ද්‍රවිඩ දරුවන්ගේ අධ්‍යාපනය සංවර්ධනය කරන්න ගත්ත දැවන්තම උත්සාහයක් බව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මතක් කරන්න ඕනැ. මේ අතපසුවීම තමයි සිද්ධ වෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩියක කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ද්‍රවිඩ මාධ්‍ය පාසල් විෂය භාරව ඉන්න බස්නාහිර පළාතේ අධ්‍යක්ෂවරයාගේ තියෙන දුර්වලකමින්. ඒ අධ්‍යක්ෂවරයන්ට උවමනාවක් නැහැ, ද්‍රවිඩ මාධ්‍ය ගුරු තුලනය සිද්ධ කරන්න. ද්‍රවිඩ මාධ්‍ය පාසල්වල තිබෙන අඩුපාඩුව සම්පූර්ණ කරන්න. ද්‍රවිඩ මාධ්‍ය පාසල්වල පවතින තත්ත්වයන් අවසන් කරලා දාලා, ඒවා සංවර්ධනය කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක්, ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් එක්වෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම ඔබතුමාව මුලින්ම බොහොම පැසසුම් කළේ, මට විනාඩි කිහිපයක් වැඩියෙන් දෙයි කියලා හිතාගෙන. ඒ අධ්‍යක්ෂවරයාගේ තිබෙන දුර්වලකම නිසා තමයි මේ තත්ත්වය නිර්මාණය වෙන්නේ කියන එක අපි කියනවා. ඒ නිසා ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ තත්ත්වය ගැන සලකා බැලීම සිද්ධ කරන්න කියලා. මේ අසාධාරණය ඔබතුමා නැති කරන්න උත්සාහ ගත්තාට මේ පොතට ද්‍රවිඩ මාධ්‍ය පාසල් ගැන අවශ්‍ය තොරතුරු ටික ආවේ නැත්තේ මේ අධ්‍යක්ෂවරයාගේ තිබෙන දුර්වලකම නිසා. ඒ නිසා ඒ තත්ත්වය නැති කරලා දැම්මොත් මම හිතන්නේ, ද්‍රවිඩ මාධ්‍ය පාසල්වලට මීට වඩා සංවර්ධනයක් එයි කියන විශ්වාසය අපට තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අයවැය විවාදය විතරක් නොවෙයි, අධ්‍යාපනය ගැන කථා කරන හැම වේලාවේම අපි හැමදාම කිව්වා අපේ රටේ අධ්‍යාපනයේ පන්ති පරතරය පුළුල් වෙමින් තියෙනවා කියලා. මේ රටේ ඉතාම පහසුකම් සහිත පිරිසකට, බලය තියෙන පිරිසකට තමන්ගේ දරුවන්ට අධ්‍යාපනය දෙන්න පුළුවන් සුපිරි පාසල් ප්‍රමාණයක් තියෙද්දී, මේ රටේ සමහර අයට පාසල්වලට ඇතුළත් වන්නට බැරිව තියෙනවා. අපේ රටේ එක වසර පන්තියට දරුවන් ඇතුළත් කිරීමේ ප්‍රතිපත්තිය නිර්මාණය කරන්නේ, ජාතික අධ්‍යාපන තලය. ඒ නිර්මාණය කිරීමේ තිබුණු දුර්වලතාවයක් නිසා අදත් බස්නාහිර පළාත විතරක් නොවෙයි, මුළු රටේම පාසල් පටන් අරගෙන මාස හයක් විතර යනකල් මේ රටේ දරුවන්ගෙන් 15% ක් පාසලක් නැතුව ගෙවල්වල ඉන්නේ. එක එක තැන්වල රස්තියාදු වෙන දෙමව්පියෝ ඉන්නේ. දරුවා ඇතුළත් කර ගන්න තැන් තැන්වල රස්තියාදු වන අය ඉන්නේ. ඒ නිසා එක වසරට දරුවා ඇතුළත් කිරීමේ චක්‍රලේඛය වෙනස් විය යුතුව තියෙනවා. අපේ බස්නාහිර පළාත් මහ ඇමැතිතුමාට මේ වගකීම දුන්නා නම් අපි දන්නවා, අද වනකොට මේ තත්ත්වය අවසන් කරලා ඉවරයි කියලා. ඒ නිසා චක්‍රලේඛය නැවත සංශෝධනය කරලා, දරුවන් ඇතුළත් කිරීමේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය වෙනස් කළ යුතුව තිබෙනවා. ඒ නිසා අපි යෝජනා කරනවා ප්‍රධාන ඇමැතිතුමාට, මහාමාත්‍ය සම්මේලනයේ දී මේ කටයුත්ත අරගෙන දරුවන් ඇතුළත් කිරීමේ දුර්වලකම නැත්නම් දරුවන් ඇතුළත් කිරීමේ තියෙන අඩුපාඩුව අයින් කරන්න. එහෙම නැත්නම් මේ රටේ ඊළඟ කැරැල්ල නිර්මාණය වන්නේ, පාසල් දරුවන්ව ඇතුළත් කිරීමේ ප්‍රශ්නය මත කියන කාරණය අපි මේ වේලාවේ මතක් කරන්න ඕනැ.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පාසල් පද්ධතියේ තිබෙන බරපතළ අඩුවක් තමයි ක්‍රීඩාව සඳහා දරුවන් උනන්දු නොකරන එක. අපේ රටේ ක්‍රීඩාව ඉතාම පහළ මට්ටමක අද තියෙන්නේ. ලෝක ක්‍රීඩා උළෙලකට අපේ රට නියෝජනය කරන්න ගිය බොහෝ වේලාවකට අපට පදක්කම් නැතුව තමයි ක්‍රීඩා උළෙලවල් නියෝජනය කරලා ආපහු ලංකාවට එන්නේ. ඒකට ප්‍රධාන හේතුව තමයි පාසල් පද්ධතිය තුළ අංකුර ක්‍රීඩකයෝ හොයා ගන්න පුළුවන් පහසුකම අපට නැහැ. ඒ නිසා අපි ස්තුතිවන්ත වෙනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. එතුමාගේ අයවැය යෝජනාවේ එතුමා කියලා තියෙනවා හැම කලාපකටම නව ක්‍රීඩා පාසලක් ඇති කරන්න අවශ්‍ය පහසුකම සලසා දෙනවා කියලා. එතුමා කිව්වා, මූලික අදියරේදි රුපියල් ලක්ෂ දහයක මුදලක් ක්‍රීඩා පාසලක් ආරම්භ කරන්න දෙනවා කියලා. මේක ඉතාම හොඳ පියවරක්. පාසල් මට්ටමෙන් අංකුර ක්‍රීඩකයෝ හොයලා, මේ රටේ ජාතික ක්‍රීඩා තලයට ක්‍රීඩකයෝ සොයාගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තේරෙනවා, මට තියෙන වේලාව අවසන් වෙලා තියෙනවා කියලා. ඒ නිසා

ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව හමාර කරනවා ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

*ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සුමිත් විජයමුණි ද සොයිසා මහතා] මූලාසනයෙන් ඉවත් වුයෙන් ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.*

*Accordingly Hon. Presiding Member [Mr. Sumith Wijayamuni de Soysa] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් නියමිතව තිබෙනවා

[ අ.භා. 04.30 ]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, මට ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා නම් කිව්වේ විනාඩි 15 ක් තියෙනවා කියලා. සමහරවිට මම කරන්න යන කථාව ගැන මොකක් හරි ඉවක් වැටිලාද දන්නේ නැහැ, ඒ වේලාව අඩු කරනු ලැබුවේ. ගරු සභාපතිතුමනි, ශ්‍රේෂ්ට ඔක්තෝබර් විප්ලවය නිමාවීමෙන් පසුව වී.අයි. ලෙනින් සහෝදරයා අමතා එක්තරා මාධ්‍යවේදියෙක් මෙන්න මේ වාගේ ප්‍රශ්නයක් අහනවා. සහෝදරයා, රුසියාවේ ඊළඟ බලාපොරොත්තුව කුමක්ද? ලෙනින් දෙන පිළිතුර, අපේ බලාපොරොත්තුව අධ්‍යාපනයයි. ඊළඟට, ඒ විශිෂ්ට මාධ්‍යවේදියා නැවත අසනවා ලෙනින් සහෝදරයාගෙන්. ඔබේ ඊළඟ බලාපොරොත්තුව කුමක්ද ? එයත් අධ්‍යාපනයයි. ඉන්පසුව ඔහු නැවත වතාවක් අහනවා ලෙනින් සහෝදරයාගෙන්. ඊළඟට, මොකද්ද රුසියාවේ බලාපොරොත්තුව? ඔහු කියන්නේ, ඒත් අධ්‍යාපනය කියලා. මේ විධියට තමයි ලෙනින් උත්තර දෙන්නේ.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

මොන පොතේද?

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මම කනගාටු වන්නේ, අපි කුසාග්‍ර බුද්ධිමතෙක් යැයි සලකන මගේම මිතුරාම මට බාධා කිරීම් පිළිබඳව. වී.අයි. ලෙනින්, රුසියාව ගොඩනැගූ ඒ ශ්‍රේෂ්ට නායකයා අධ්‍යාපනය සම්බන්ධයෙන් දැරූ ඒ මතය තුළින්ම, එහි වටිනාකම අපි සියලු දෙනාටම ගම්‍ය වෙනවා. අද දවසේ මා අදහස් කරන්නේ, මගේ උගත් මිත්‍රයා කිව්ව පරිදිම අනවශ්‍ය ප්‍රශස්ති ගී ගැයීමට හෝ පටු නිර්ධය විවේචනයකින් තොරව යම්කිසි සංවර්ධනාත්මක අදහස් කිහිපයක් ගෙන හැර දැක්වීමටයි. ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය යටතේ අපට තිබෙන ප්‍රධානම විෂය තමයි අධ්‍යාපනය. මේ අධ්‍යාපනයේ සිදුවිය යුතු ප්‍රධාන වෙනස්කම් දෙකක් ගැන මම අපේ අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා එතුමාගේ මහින්ද චින්තනය තුළ මෙන්න මේ විධියට කියනවා.

*සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන් ඉගැන් වීම පදනම් කර ගත් භාෂා මධ්‍යස්ථාන, පරිගණකාගාර, පුස්තකාල, ක්‍රීඩා ඇතුළු සියලු පහසුකම් ලබා දී පරිපූරණ පාසල් වශයෙන් ඒවා උසස් තත්ත්වයකට ළඟා වුණා.*

අපේ මිත්‍ර මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා බොහෝම දැඩි ආත්ම විශ්වාසකින් යුතුව ද්‍රවිඩ පාසල් ගැන කථා කළා. ඒ වාගේම අපේ උගත් මුස්ලිම් මන්ත්‍රීවරු මුස්ලිම් පාසල් ගැන කථා කළා. නමුත් අපි තාමත් නියම ලක්ෂය කරා ගොස් නැහැ.

[ ගරු කීර්ති උඩවත්ත ]

මා විශ්වාස කරනවා. නැවත වතාවක් අපි මේ ත්‍රෛභාෂික පාසල් කරා යා යුතුයි කියලා. ඉතිහාසයේ මේ රට තුළ එවැනි පාසල් තිබුණා. යාපනයේ ශාන්ත ජෝෂප් විද්‍යාලය. මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ඉතාමත් බුද්ධිමත් සිංහල, දෙමළ, මුස්ලිම් නායකයන් බිහි කරපු පාසලක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ශාන්ත ජෝන් විද්‍යාලය.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ශාන්ත ජෝන් විද්‍යාලය. එවැනි විශිෂ්ට පාසල්වලින් ඉටු කළ කාර්ය භාර්ය පසු කාලීනව අපි පටු ජාතිවාදී ලෙස සිංහල, බෞද්ධ, මුස්ලිම් සහ දෙමළ කියා පාසල් කඩලා, වෙන් කරලා ඒ ජාතීන් අතර තිබුණු සුහදතාවය අපි නැති කළා. ඒ නිසා ගරු සභාපතිතුමා මගින් ගරු ප්‍රධාන ඇමැතිතුමාට මම යෝජනා කරනවා මහින්ද චින්තනයට අනුගත වෙමින් අපි පුරෝගාමී නායකත්වය දිය යුතුයි මේ ත්‍රෛභාෂික පාසල් බිහි කිරීම සඳහා. ඔබතුමා ඉංග්‍රීසි මාධ්‍ය පාසල් හැම කොට්ඨාශයකටම ගේන්න යෝජනා කරනවා. අපට එපමණ කරන්න අමාරුයි. අපි එක කලාපයකට එක ත්‍රෛභාෂා පාසලක් ඇති කළොත් දෙමළ දරුවෝ, සිංහල දරුවෝ, මුස්ලිම් දරුවෝ එකට ඉගෙන ගන්න පාසලක් අපි ප්‍රතිනිර්මාණය කළොත් නැවත වතාවක් ඒක මුළු ජාතියටම ලොකු පිනක් වෙනවා.

ඊළඟට මම යෝජනා කරන්නේ, මේ අධ්‍යාපන ව්‍යුහය තුළ තිබෙන්නා වූ වරදක් වහාම නිවැරැදි කර ගැනීමේ අවශ්‍යතාවය මතු කරන්නයි. මගේ මිතුරා ඊට අවශ්‍ය ප්‍රවේශය ලබා දුන්නත් කාලය ඔහුට හරස් වුණා ගරු සභාපතිතුමනි. ඒ නිසා මම ඔහු පටන් ගත්ත තැනින් පටන් ගන්න කැමැතියි. අපි ආශ්චර්යයේ යෝධ පිම්ම පනිනවා නම්, ඒක නිකම්ම වචන හරඹයකින් පනින්න පුළුවන් කමක් නැහැ. අපේ අධ්‍යාපන ව්‍යුහය අපි වහාම වෙනස් කළ යුතුයි. අද මේ රටේ විද්‍යා අධ්‍යාපනයට සහ වාණිජ අධ්‍යාපනයට තිබෙන සැලකිල්ල මම විශ්වාස කරනවා ප්‍රමාණවත් නැහැයි කියලා. අපි බස්නාහිර පළාත විධියට අනිකුත් පළාත්වලට ආදර්ශයක් දෙන විධියට අපේ විද්‍යා අධ්‍යාපනය සහ වාණිජ අධ්‍යාපනය දියුණු කළ යුතුයි. අද විශ්ව විද්‍යාලයට යන සංඛ්‍යාව පිළිබඳව මම ඔබේ අවධානය යොමු කරන්න කැමැතියි. මහ බැංකු වාර්තාව අනුව - සමාවෙන්න පිටුව පොඩ්ඩක් එහාට මෙහාට වෙලා - (බාධා කිරීම්) හරි, හරි මම කියන්නම් ඉන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ශිරාල් මන්ත්‍රීතුමාගෙන් කොළය ගන්න අමතක වුණාද ?

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි 2011 මහ බැංකු වාර්තාවේ තිබෙනවා. මට මේ අදාළ පිටුව මේ අවස්ථාවේදී හොයා ගන්නයි බැරි වෙලා තිබුණේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මන්ත්‍රීතුමා මොකද ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් දෙනවා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මම මේ කියන්නේ, 2011 මහ බැංකු වාර්තාව අනුව අපේ විශ්ව විද්‍යාලයෙන් බිහිවන උපාධිධාරීන් සංඛ්‍යාව පිළිබඳව මම ඔබට ඉදිරිපත් කරන්න කැමතියි. ඉංජිනේරු විද්‍යාවෙන් අපි විද්‍යාර්ථයින් නිෂ්පාදනය කරන්නේ, 1307 යි. වෛද්‍ය විද්‍යාවෙන් අපි 797 ක් නිෂ්පාදනය කරනවා. විද්‍යා අංශයෙන් 2028 ක් අපි සමාජයට බිහි කරන කොට, කලා හා සෞන්දර්ය අධ්‍යාපනයෙන් අපි 4432 බිහි කරනවා. මෙම සංඛ්‍යා වහාම වෙනස් විය යුතුව තිබෙනවා. 2010 - 2016 ට ගරු ප්‍රධාන අමාත්‍ය හොඳ ඉලක්ක, අපට හොඳ අභියෝග දීලා තිබෙනවා. ඔබතුමාගේ අභියෝග අතරට 2016 දී බස්නාහිර පළාතෙන් විද්‍යා අංශයෙන් උසස් අධ්‍යාපනය ලබන සංඛ්‍යාව 50% ක් විය යුතුයි කියන එකයි මම විශ්වාස කරන්නේ. කලා සහ වාණිජ අංශවලින් තමයි ඉතුරු 50% වෙන්න ඕනෑ. අපි එහෙම කියන්නේ, විද්‍යා අධ්‍යාපනය තුළින් අපේ රටට අවශ්‍ය කරන අර්ථවත් ශ්‍රම බලකාය නිර්මාණය වෙනවා. මේ ඊයේ පෙරේදා අපේ වාරිමාර්ග ඇමතිතුමා ප්‍රසිද්ධ රැස්වීමකදී කියනවා. ඔහුට අවශ්‍ය කරනවා කාර්මික නිලධාරීන් 300 ක්. නමුත් සම්මුඛ පරීක්ෂණයට එන්නේ 30 දෙනයි. ඒකට හේතුව විද්‍යා අධ්‍යාපනය තුළ ඒ අවශ්‍ය කරන ශ්‍රම බලකායට අවශ්‍ය කරන කාර්මික තාක්‍ෂණික ඥානය තිබෙන පුද්ගලයන්ගේ හිඟතාවය. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, විද්‍යා අධ්‍යාපනය දියුණු කිරීම සඳහා ඔබතුමාගේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමා ගණිතය සහ විද්‍යා විෂය සිසුන් අතර ජනප්‍රිය කරවීමට විශාල පරිශ්‍රමයක් දරනවා. මේ පරිශ්‍රමය තවදුරටත් වර්ධනය කරමින් 50% ඉලක්කම සඳහා ලබන 2016 වර්ෂයේදී අපව ගමන් කරවන්නට ඔබතුමාට ශක්තිය, ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා ස්තුතියි.

[ අ.භා. 04.39 ]

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ ඉතාමත් වැදගත් අමාත්‍යාංශය වාගේම ඉතාම විශාල මුදල් වෙන්වීමක් වන අමාත්‍යාංශය පිළිබඳව සාකච්ඡා කරන්න ලැබීම පිළිබඳව මම ඉතාමත් සන්තෝෂයට පත් වෙනවා. සමස්ත අයවැය ලේඛනය දිහා බැලුවොත් ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ඒ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය 71% ක මුදල් ප්‍රමාණයක්. අධ්‍යාපනය දිහා බැලුවහම 54% ක් වෙන් වෙලා තියෙනවා. ඒ නිසා මම හිතන්නේ, මේ රටේ ඉතාමත් වැදගත් වූත් මේ රටට අද අවශ්‍ය වූත් මේ රටේ නැවත වරක් දෙවරක් සිතා බැලිය යුතු වාගේම වර්තමාන කාලයට ගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් සකස් විය යුතු යුගයක් හා ඉදිරියට තල්ලු කරගෙන යෑමේ වගකීම පළාත් සභාවේ ප්‍රධාන ඇමැතිවරයා හැටියට වර්තමාන පළාත් සභාවේ අධ්‍යාපන ඇමැතිවරයාට තියෙනවා. දැන් මම මෙතැන ඉන්නකොට කල්පනා කරපු එක දෙයක් ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ ආයු කාලය අවුරුදු 25 ක් වෙනවා. ඒ අවුරුදු 25 න් අවුරුදු හතරක් තමයි එක්සත් ජාතික පක්‍ෂ මහ ඇමැතිවරයෙක් සිටියේ. අවුරුදු විස්සම පොදුජන එක්සත් පෙරමුණේ හරි සන්ධානයේ හරි ඇමැතිවරු තමයි මහ ඇමැතිවරු හැටියට හිටියේ. කැබිනට් මණ්ඩලයේ ඉඳලා. ප්‍රසන්න රණතුංග මහ ඇමැතිවරයා යටතේ මම මේ පළමුවෙනි අවස්ථාවේ ඉන්නේ. ඒ නිසා මම එතුමාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳව අවබෝධයකින් කටයුතු කරනවා. හැබැයි, මම මේ කල්පනා කළේ, මෙතැන ඉන්න ආණ්ඩු පක්‍ෂයේ මන්ත්‍රීවරු සමහර කාරණා කියනකොට ඉතිහාසයේ පළමුවැනි වතාවට කියලා කියන කොට, අර හිටපු මහ ඇමැතිවරු පොල් ගැහුවද කියලා තමයි මට අහන්න වී තියෙන්නේ. (බාධා කිරීම්) ඒක තමයි, මේ මහ ඇමැතිතුමාටත් ඔහොම නොකියන්න ලබන සැරේත් මහ ඇමැතිතුමා වේවා කියලා මාත් ප්‍රාර්ථනා කරනවා. (බාධා කිරීම්) ඒකට හේතුව, බලය ලබා ගන්නවාද ? නැද්ද ? කියන එක වෙනම දෙයක්. මම

මේ කියන්නේ, නැත්නම් ඊළඟ සැරේ වෙන මහ ඇමැති කෙනෙක් හිටියොත්, මෙතුමාටත් හිටවලා මේ කට්ටිය පස් ගහනවා. අන්න ඒක තමයි කරන්නේ. මරන්න් නැතුව. මේකට කියන්නේ ගරු සභාපතිතුමනි, මරන් නැතුව මරනවා කියලා. අර හිටපු මහ ඇමැතිවරයාගෙන් පුළුවන් තරම් ප්‍රයෝජන ගත්තු උදවිය අද කථා කරන හැටි මෙතැන දැක්කාම අපිට කනගාටු වෙනවා. ඒක වෙනම කාරණයක්.

ඒ නිසා අද දවසේ විශේෂයෙන්ම මම මතක් කරන්න කැමැතියි ගරු සභාපතිතුමනි, ප්‍රධාන ඇමැතිතුමා තමන් ඉදිරිපත් කරන ලද අයවැය කථාවේදීත් විශේෂයෙන්ම අමාත්‍යාංශය පිළිබඳව කරුණු දක්වලා තියෙන කාරණයේදීත් ක්‍රියාත්මක විය යුතු විධිමත් වූ කරුණු ගණනාවක් පිළිබඳව ප්‍රධාන ඇමැතිතුමා මතක් කරලා කියනවා. ඒක හොඳයි. ඒක නිවැරදි කර ගන්න සාකච්ඡා කරන එකත් හොඳයි. ව්‍යාපෘති අවිච්ඡේද නොවීමට වග බලාගන්න එක, ව්‍යාපෘති වාර්තා පිළියෙල කර නොමැති වීම, ඒ වාගේම ඇස්තමේන්තු තාත්වික නොවීම, පූර්ව සැලසුම් නොමැතිකම, ඒකාබද්ධ සැලසුම් නොමැතිකම, පසුවිපරම් නිසි ලෙස ක්‍රියාත්මක නොවීම, ව්‍යාපෘති යෝජනා පිළිබඳව කලින් බලධාරීන් දැනුවත් නොවීම යන කාරණ පිළිබඳව විධිමත්ව කටයුතු වෙනවා නම් අපට භෞතික ප්‍රගතිය වාගේම මූල්‍ය ප්‍රගතියත් හරි විධියට සන්සන්දනාත්මකව ගෙනියන්න පුළුවන් කමක් තියෙනවයි කියන එක මම මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම මම මතක් කරන්නට ඕනෑ. පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳව. විශේෂයෙන්ම පෙර පාසල්වලට මීට වඩා ශක්තියක් අපට ලබලා දෙන්න පුළුවන් නම්, මීට වඩා ධෛර්යයක් අපට ලබලා දෙන්න පුළුවන් නම් හෙට දවසේ පාසලට ඇතුළත් වන දරුවාට මීට වඩා ක්‍රම වේදයක් සකස් කරන්න පුළුවන්කම තියෙනවා. අපි දන්නවා පෙර පාසල් 2528 ක් මේ පළාත තුළ තියෙනවා. ඒ නිසා පෙර පාසල්වල ක්‍රමවත් වැඩ පිළිවෙළක් වාගේම, පෙර පාසල් ගුරුවරුන්ගේ ආකල්ප, කුසලතාවයන්, දැනුම වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසනවා වාගේම, පෙර පාසල් ගුරු අභ්‍යාස විද්‍යාලයක් ආරම්භ කළොත් මම හිතන්නේ ඒක වඩා වැදගත් වෙයි කියලා අපි කල්පනා කරනවා. ඒ වගේම මම මතක් කරන්න කැමැතියි. ඒකේ මූලිකම පදනම හැටියට වෙන්නේ. විශේෂයෙන්ම, පාසලට ඇතුළු වන දරුවාට අවශ්‍ය නිර්මාණ ශක්තිය, අවශ්‍ය පදනම, පාසලේ ඉගෙන ගැනීමට තියෙන රුචිකත්ත්වය වැඩි කිරීම ඒ තුළින් අපට ලබා දෙන්න පුළුවන්කම තියෙනවා. ඒ වාගේම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියපු කාරණයට මම එකඟ වෙනවා. පාසල් දරුවන් පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමේ චක්‍රලේඛය සම්පූර්ණයෙන්ම නිවැරදි විය යුතු තත්ත්වයට අද පත් වෙලා තියෙනවා. නමුත් මම පුද්ගලිකව දන්නවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඒ වෙනුවෙන් අදාළ බලධාරීන්ට උපදෙස් දීලා තිබුණත් ඒවා හරි විධියට සමහර තැන්වල ක්‍රියාත්මක නොවීම නිසාම දෙමව්පියෝ විශාල ගැටළු ගණනාවකට මුහුණ දෙනවා. මම දන්නවා. මගේ ගමේ පාසලේ අල්ලපු වැටේ ඉන්න පුද්ගලයාගේ දරුවන්ට තමන්ගේ වැටේ එහා පැත්තේ තියෙන ඉස්කෝලෙට යන්න බැරි වෙලා තියෙනවා. සීයා ඉගෙන ගත්තේ ඒ විද්‍යාලයේ. පියා ඉගෙන ගත්තේ ඒ විද්‍යාලයේ. මුනුපුරාට ඒ විද්‍යාලයට යන්න බැරිවෙලා තියෙනවා. උපන් දවසේ ඉඳලා ඡන්ද ලේඛන තිබුණත්, ඒ ඉඩම්වල අයිතියක්, ඔප්පුවක් නොමැති නිසා අද ඒ විද්‍යාලයට ඇතුළත් වෙන්න බැරිකමක් තියෙනවා. ඒ වාගේම විවිධ තැන්වලින් ඇවිල්ලා ඉඩම් අරගෙන ඔවුන් පදිංචිවෙලා ඉන්න කොට සමහර වේලාවකට දරුවා වයස අවුරුදු 6 දී ඒ විද්‍යාලයට ඇතුළත් කරන්නට ඕනෑ වුණාම, ඒ දරුවාව ඒ විද්‍යාලයට ඇතුළත් කර ගන්න බැරි තත්ත්වය ඇති වෙලා තියෙනවා.

ඒ නිසා මාගේ කාලය අනුව මම ඊළඟට පළාත් පාලන ආයතන පිළිබඳව මතක් කරන්නේ. විශේෂයෙන්ම අද සමහර පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් කටයුතු කරන්නේ තමන්ගේ පළාත් පාලන ආයතනවලට උඩින් ප්‍රධාන ඇමැතිවරයෙක් නොමැතියි කියන ගාණට. ඒ නිසා ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතන පිළිබඳව මීට වඩා විධිමත් ක්‍රමයක්, මීට වඩා ක්‍රමවත් ක්‍රමයක් හැදුවේ නැත්නම්, මේ රටේ තියෙන දූෂිතම ආයතන බවට අපේ පළාත් පාලන ආයතන පත් වෙනවායි කියන එකත් මතක් කරන්න කැමැතියි. හැබැයි, ඒවායේ අවංක ගරු මන්ත්‍රීවරු

[ ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා ]

ඉන්නවා. තමන් උපරිම වශයෙන් ඒවායේ සේවයට ලැදිව කටයුතු කරන ගරු මන්ත්‍රීවරුන් ඉන්නවා. ඒ නිසා පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට මේ දෙන සොච්චම් දීමනාවට වඩා හොඳ දීමනාවක් ඔවුන්ගේ ශක්තිය වර්ධනය කරන්න ලබා දිය යුතුයි කියන එකත් මම මේ අවස්ථාවේදී යෝජනා කරන්න කැමැතියි. ඒ නිසා විශේෂයෙන්ම අද දවසේ මේ තත්ත්වය පිළිබඳව මම මතක් කරමින්,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක් තියෙනවා

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අද දවසේ පාසල් 91 වැසී යාමේ තර්ජනයකට ලක් වෙමින් තිබෙන බවත්, ඒවා ඒ තත්ත්වයෙන් වළක්වා ගන්නට අවශ්‍ය කටයුතු කරන බවත් අපට දැනුම් දීලා තිබෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපි අද දැනුවත් කළා මේ වන කොට විශාල වාහන තොගයක් ඇවිල්ලා තියෙනවා. ඒවා පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට ලබලා දෙනවාද, එහෙම නැත්නම් කාටද ලබලා දෙන්නේ කියන එක මම දන්නේ නැහැ. මාව දැනුවත් කරලා තිබෙනවා. ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් අපි විමසීමක් කරනවා, මේ වාහන කාට ලබා දෙන්නද කටයුතු කරන්නේ කියන එක.

පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට ලබා දෙනවා නම් ඒකට අනුගමනය කරන ක්‍රමවේදය මොකද්ද කියන එකත් පැහැදිලි කරන්න කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මම මීට වැඩිය දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අද දවසේ මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 04.49 ]

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ශීර්ෂ අංක 104, 109, 110, 111, 112, 113, 114, 115 යන වැය ශීර්ෂය සම්බන්ධව අදහස් ඉදිරිපත් කරපු ආණ්ඩු පක්ෂ හා විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පළමුවෙන්ම පුද කරනවා. ගරු මන්ත්‍රීවරු 28 දෙනෙක් මේ සාකච්ඡාවට සම්බන්ධ වෙලා තියෙනවා. ඒ සියලුම ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරපු අදහස් හා ඒ අයගේ යෝජනා ඉදිරි කාලයේදී උපදේශක කාරක සභාවට යොමු කරලා ඒ පිළිබඳව කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවායි කියන කාරණාව පළමුවෙන්ම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම හැම තිස්සේම කල්පනා කරන්නේ, අඩුවෙන් කථා කරලා වැඩියෙන් වැඩ කරන්නේ කොහොමද කියලා. මම මේ අමාත්‍යාංශය භාර අරගෙන පළමුවැනි අයවැයේදී කිව්වේ, ප්‍රායෝගික ප්‍රධාන ඇමැතිවරයෙක් හැටියට පත්වෙන්නයි මම බලාපොරොත්තු වෙන්නේ කියලා. වැඩිය න්‍යායික නැතුව ක්‍රියාවෙන් පෙන්වීම තමයි බලාපොරොත්තු වුණේ. මම මේ අමාත්‍යාංශය භාර අරගෙන ක්‍රියාත්මක වනකොට ආරම්භයේදී යම් යම් ගැටළු තත්ත්වයන් මතු වුණත් මම හිතන්නේ, අද වනකොට සියලුම ගරු මන්ත්‍රීවරු අවබෝධ කරගෙන තියෙනවා, එදා ගත්තා වූ තීන්දුවල ප්‍රතිඵල අද අපි ලබාගෙන යනවා කියලා. ගරු සභාපතිතුමනි, මම හැමදාම කියන එකක් - මේ ප්‍රතිපාදන වෙන් කරන කොට ක්‍රමවේද අපි වෙනස් කළා. මහ ඇමැතිවරයා හෝ විෂය භාර ඇමැතිවරයා හැටියට ඒ ප්‍රතිපාදන දීම පවා මධ්‍යගත කරන්නේ නැතුව ඒවාවල වගකීම පළාත් කලාප මට්ටමෙන් විශේෂයෙන්ම අධ්‍යාපනය කටයුතු කරද්දී ව්‍යුහ කමිටුවලට යොමු කරලා ඒ ව්‍යුහ කමිටුවලින් ශිෂ්‍ය අනුපාතය අනුව මුදල් ප්‍රතිපාදන වෙන් කරලා ඒ කලාප අනුව ඒ යෝජනා ඉදිරිපත් කිරීමේ ප්‍රමුඛතා අනුව හඳුනාගෙන ප්‍රතිපාදන වෙන් කිරීමයි මම කළේ. ඒ නිසා මෙතැන කථා කරපු ගරු මන්ත්‍රීවරු ඒ ඒ පළාත්වල යම් යම් අඩුපාඩු කථා කරන කොට මම හිතන්නේ, ඒකේ වගකීමත් ඒ මන්ත්‍රීවරුන්ටම තියෙනවා, තමන් නියෝජනය කරන ව්‍යුහ කමිටුවේදී සාකච්ඡා නොකිරීම පිළිබඳව. ඒ වාගේම මෙතැන මන්ත්‍රීවරු අදහස් කරපු දේවල්වලට පිළිතුරු ලබා දෙන්න ගියොත් කාලය මදි වෙන නිසා ඉතාමත්ම කෙටියෙන් - විශේෂයෙන්ම කථා කරපු මන්ත්‍රීවරුන්ගෙන් වැඩි ප්‍රමාණයක් කථා කළේ, අධ්‍යාපනය පිළිබඳව. ඊළඟට කිහිප දෙනෙක් පළාත් පාලනය පිළිබඳව කථා කළා. අනික් අය කථා කළා ඝන අපද්‍රව්‍ය කළමනාකරන අධිකාරිය පිළිබඳව. ඒ ආකාරයට තමයි මේ අමාත්‍යාංශයේ විවාදය ගියේ.

අපේ ගරු මන්ත්‍රීවරු අධ්‍යාපනයට යොමු කරලා තියෙන අවධානය පිළිබඳව මම බොහෝම සන්තෝෂ වෙනවා. මොකද පළාත් සභා ප්‍රතිපාදන වෙන් කරද්දී වැඩිම මුදලක් වෙන් කරලා තියෙන්නේ, අධ්‍යාපනයට නිසා. ගරු සභාපතිතුමනි, අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී පාසල් වැසීයාම, ජනගහනය වැඩිවීම පිළිබඳව එතුමා අදහසක් ඉදිරිපත් කළා. එතුමා අපේ උපදේශක කාරක සභාවට ඉතාමත්ම හොඳින්, ඒ කියන්නේ වෛරයකින් තොරව අදහස් ඉදිරිපත් කරලා, තොරතුරු ලබා දීලා කටයුතු කරන මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාගේ දැන ගැනීමට කියන්නේ, අපේ පද්ධතිය තුළ ශිෂ්‍ය ජනගහනය වැඩි වනකොට පාසල් යම් ප්‍රමාණයක් වැහුනත්, පාසල් ප්‍රමාණයෙන් පන්ති කාමරයක් වැඩිවීම හරහා, අපි වැසුනු පාසල්වල පන්ති කාමරවලට වඩා සංවර්ධනය කරපු පන්ති කාමරයේ ප්‍රමාණය වැඩිවෙලා තිබෙනවා. ඒ නිසා ඒක ගැටළුවක් බවට පත්වෙලා නැහැ. අපි බලාපොරොත්තු වන්නේ, ජනප්‍රිය පාසල්, ජනප්‍රිය නොවන පාසල් කියලා දේ වෙන් කරන්නේ නැතුව සියලුම පාසල් එක මට්ටමට ගේන්නයි. එවැනි වැඩ පිළිවෙළකට යා යුතුයි කියන එක මම පෞද්ගලිකව විශ්වාස කරනවා. අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ඉතා හොඳට අදහස් කිහිපයක් ඉදිරිපත් කළා. මම හිතන්නේ, ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය මේ පොතට ගියා නම්, මේ පොත බලලා ආවා නම් කථා කරපු දේවල්වලට පිළිතුරු මේකේම තියෙනවා. මම මුලින්ම කිව්වා වාගේ පහුගිය කාලයේ අපේ අමාත්‍යාංශය කටයුතු කරද්දී අධ්‍යාපනය ක්‍රම වේද හතරකින් මුදල් ප්‍රවේයන් හතරකින් අපි ඉලක්කගත කරුණු හයක් අරගෙන ඒක දීර්ඝ කාලීන හා කෙටි කාලීන විධියට අංශ පහළොවකින් හඳුන්වලා දීලා මේක ක්‍රියාත්මක කරන ආකාරයෙන් තමයි කථා කළේ. මම බලාපොරොත්තු වුණේ, අද මේ සාකච්ඡාවේදී මේකට අදාළව ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරන අදහස් ඉදිරි කාලයේ 2013 වසරේ යාත්මක කරනකොට මට ශක්තියක් වෙයි කියලා. කෙසේ වෙතත්, මේ ඉලක්ක ගත සැලසුම්වලට යනකොට මම විශ්වාස කරනවා. ගරු මන්ත්‍රීවරු මේ පොතේ මුල් කරුණු කාරණා ටික දිහා බලලා, අපි මේ කාරණා ක්‍රියාත්මක කරන්න මොන ආකාරයෙන් කටයුතු කළ යුතු ද කියන කාරණාවත් - ඒ වාගේම අපි ඉලක්ක ගත සැලසුම් 2017 දක්වා හදලා තියෙනවා. ප්‍රතිඵල සංවර්ධනය කිරීම සම්බන්ධව ඒ ඉලක්කගතවලට යන වැඩ පිළිවෙළට අවශ්‍ය කරන පසුබිම ගරු සභාපතිතුමනි, අපි මේ වන කොට හදලා ඉවරයි. ඉස්සෙල්ලාම අපි කළේ, පන්ති කාමරයකට ළමුන්ගේ සීමාව සීමා කිරීමයි. සමහර පාසල්

තිබුණා, පෙළක් පන්ති කාමරවල ළමයින් 56, 60 යි. අපි ඒ පන්ති කාමරයේ හිටිය ළමයි ප්‍රමාණය සීමා කරලා පන්ති කාමර වැඩි කරලා, ඒවායේ සිටි ළමයි බෙදලා පන්ති කාමරවල ළමයි සීමාව 42 සීමාවට ගේන්න කටයුතු කළා. මම විශ්වාස කරන දෙයක් තමයි ගුරුවරයෙකුට උගන්වන්න පුළුවන් සීමාව තුළ දරුවෝ සීමා කළ යුතුයි කියන කාරණාව. ඒ වාගේම අපේ පාසල් පද්ධතිය තුළ තිබුණු ගුරු පුරප්පාඩු ප්‍රමාණය. ඒ ගුරු පුරප්පාඩු නැති කරන්නත්, ඉදිරියේදී ඇති වන ගුරු පුරප්පාඩු සඳහා අවශ්‍ය ගුරුවරු බඳවා ගන්නත් අපි කටයුතු කරලා තියෙනවා. මේ දෙසැම්බර් මාසය වනකොට අපි තවත් ගුරුවරු 350 ක් මේ පළාත් සභාවේ අධ්‍යාපන පද්ධතියට ඇතුළත් කරන්න කටයුතු කරලා තිබෙනවා. ලබන අවුරුද්දේ අලුත් පන්ති පටන් ගන්න කොට ඒ කටයුත්ත සිද්ධ වෙනවා.

ඒ වාගේම කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ඉතාමත්ම වැදගත් අදහසක් ඉදිරිපත් කරලා කිව්වා, විද්‍යා හා ගණිත විෂයයන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න කියලා. මේ ද්වීතීයික පාසල් වැඩ සටහන යටතේ අපි කරන කරුණු කාරණා පිළිබඳව මේකේ දැනුවත් කරලා තියෙනවා. ඒ වගේම ඒ ආකාරයට අපි විශේෂයෙන්ම විද්‍යා හා ගණිතය කියන විෂයන් දෙක සංවර්ධනය කරන්න ඉලක්කගත වැඩ සටහනක් අපි හදලා තියෙනවා. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු අද මෙතැනට සම්බන්ධ වෙනවා. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ ඉඳලා සියලු නිලධාරීන්. මම හිතන්නේ, ඒ අයත් අවධානය යොමු කරලා ඒ සඳහා කලාප මට්ටමින් ද්වීතියික පාසල් වැඩ සටහන, මධ්‍යම රජයට සමගාමීව යන වැඩ පිළිවෙළක් පළාත් සභාව තුළත් අපි දියත් කරන්න කටයුතු කරගෙන යනවා.

ගරු සභාපතිතුමනි, අපි අධ්‍යාපනයට කටයුතු කරන කොට පසුගිය උපදේශක කාරක සභාවේදී අපි තීන්දු කළා එක කලාපයකට ඉංග්‍රීසි මාධ්‍ය පාසලක් අලුතින් ඇති කරලා ජාතික පාසල් එක්ක තරගකාරීත්වයක් ඇති කරන්න නැය කියලා. ඒ ආකාරයටම අපි බලාපොරොත්තු වෙනවා, හැම කලාපයකටම හැම කොට්ඨාශයකටම සීමාවන විධියට ද්වීතියික පාසල් සංවර්ධනය කරලා, එහිදි ගණිතය හා විද්‍යා විෂය සම්බන්ධ වැඩි අවධානයක් යොමු කරන්න. අද අපි උපාධිධාරී ගුරුවරු හැටියට බඳවා ගෙන යනකොට ඒ ගුරුවරුන්ගෙන් වැඩි ප්‍රමාණයක් කලා උපාධි ගුරුවරු තමයි බඳවා ගන්නේ. අපේ අනික් විෂයයන් සම්බන්ධව කටයුතු කරන්න මේ වන කොට අපි වැඩ පිළිවෙළක් සකස් කරලා දීලා තියෙනවා. ලබන අවුරුද්දේ අවසාන වනකොට මම විශ්වාස කරනවා, 2017 වන කොට ගුරු විභාගයෙන් සමත් වුණු සියලුම ගුරුවරුන්ට පත්වීම් ලබා දෙන්න අපට පුළුවන්කම ලැබෙයි. ඒ සඳහා ඉලක්ක ගත වැඩ පිළිවෙළ - මම මේ අමාත්‍යාංශය භාර ගන්න කොට දරුවන් 24 ටත් 25 ටත් එක ගුරුවරයෙක් සිටියේ. අද ඒ ප්‍රමාණය දරුවන් 20 ටත් 22 ටත් එක ගුරුවරයෙක් දක්වා අඩු කරන්න අපට පුළුවන්කම ලැබිලා තියෙනවා. ඒ වාගේම ඉදිරි ඉලක්ක අනුව ළමයි 18 දෙනෙකුට එක ගුරුවරයෙක් බැගින් ලබා දෙන්න තමයි අපේ සැලැස්ම තියෙන්නේ ගරු සභාපතිතුමනි. ඒ ඉලක්ක ගත සැලැස්මට යනකොට අපට අවශ්‍ය කරන ගුරුවරු බඳවා ගැනීමට අවශ්‍ය කරන ක්‍රමවේදයක් මේ වන කොට අපි හදලා ඉවරයි. ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවේදී ඉල්ලීමක් කළා. සුපසන් නිමිතර වැඩ සටහන ක්‍රියාත්මක කරන කොට "අපේ පාසල අපේ දැතින් සුරකිමු" කියන වැඩ සටහන ක්‍රියාත්මක කරන කොට ඒක ආණ්ඩු පක්ෂයට සීමා කරලා කටයුතු කළා කියලා. අපි එහෙම කටයුතු කරලා නැහැ. ගරු සභාපතිතුමනි, අපි උපදෙස් දීලා තියනවා. සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ව්‍යුහ කමිටුවට සම්බන්ධ වෙන්න පුළුවන්. අපි දැක්කා ප්‍රතිපක්ෂයේ මන්ත්‍රීවරු අපේ ව්‍යුහ කමිටුවට සම්බන්ධ වෙලා ඉතාමත්ම හොඳින් ඒ කලාප කළමනාකරණය කිරීමක් කරනවා. ඒක දේශපාලන ඇහිලි ගැහීමක් නොවෙයි. එතැනදී නිලධාරීන් හා දේශපාලන අධිකාරිය සම්බන්ධවෙලා වඩා නිවැරදි තීන්දු ගැනීමයි සිදු කරන්නේ. මම හිතන්නේ, ජනතා පරිමාධිපත්‍ය පිළිබඳ කථා කරන කොට අපේ දේශපාලන අධිකාරියට වගකීමක් තියෙනවා, තමන්ගේ පළාතේ කටයුතු කිරීම පිළිබඳව සොයා බලන්න. එතැනින් මන්ත්‍රීවරු එක්කහු වෙලා සියලුම දේශපාලන අධිකාරිය සම්බන්ධ වෙලා ගන්නා වූ තීන්දුව තමයි ක්‍රියාත්මක කරන්නේ. ඒ වාගේම මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරද්දි අපි පැහැදිලිව උපදෙස් දීලා තිබුණා, සියලුම මන්ත්‍රීවරුන්ට සහභාගී වෙන්න පුළුවන්. හැබැයි,

[ ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා ]

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රධානත්වයෙන් මේ කටයුත්ත කරන්න කියලා. මම දකින්නේ නැහැ ඒකේ වැරැද්දක් තියෙනවා කියලා. එතැන ඇවිල්ලා විවේචනය කරලා, ඒක කඩාකප්පල් කරනවාට වඩා අපි විශ්වාස කරනවා. එතැනට ඇවිල්ලා, ඒ අයගේ සහයෝගය දීලා අධ්‍යාපනය නගා සිටුවන්න කටයුතු කරයි කියලා. මේකට දේශපාලනයක් නැහැ. මැතිවරණ කාලයට විතරයි දේශපාලනය තියෙන්නේ. ඊට පස්සේ අපි සියලු දෙනා මන්ත්‍රීවරුන් වුණාට පස්සේ අපේ වගකීමක් තියෙනවා. ආණ්ඩු පක්ෂයේ වගකීම තමයි සංවර්ධන කටයුතු කරලා ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කරන එක. සමාවෙන්න. විරුද්ධ පක්ෂයේ වගකීම තමයි ඒකේ අඩුපාඩු බලලා ඒක නිවැරදි මාර්ගයට යොමු කිරීම. එතැනදී ප්‍රතිපාදන පිළිබඳව වැඩිම මුදල් ප්‍රමාණයක් ආණ්ඩු පක්ෂයට ලැබිය යුතුයි කියන විශ්වාසය තියෙනවා. ඔබතුමන්ලාගේ වගකීම තියෙන්නේ, ඒකේ අඩුපාඩු තියෙනවා නම් කියන එකයි. ඒකට අපි ඉඩ දීලා තිබෙනවා. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ඔබතුමාට තව විනාඩියයි තියෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මෙතැනදී අපි ඔබතුමන්ලාගේ සහයෝගය බලාපොරොත්තු වෙන්නේ, මේක නිවැරදි මාර්ගයකට යොමු කරන්න. අපි ප්‍රතිපාදන වෙන් කරන - අපි මේ කටයුතු කරද්දී මම

විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, මගේ කාලය පිළිබඳව ප්‍රමාණවත් නොවන නිසා මම මේ අවස්ථාවේදී අපේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න සහයෝග ලබා දෙන්න කැබිනට් මණ්ඩලය, විශේෂයෙන්ම සමහර මන්ත්‍රීවරු කථා කරන කොට කිව්වා මට ඉන්නේ දුර්වලම කැබිනට් මණ්ඩලයක් කියලා. මම මේ පළාත් සභාවේ අවුරුදු විසි ගාණක් හිටියා. මම මෙතැනදී කියන්න ඕනැ. මේ පළාත් සභාවේ හිටපු හොඳම අමාත්‍ය මණ්ඩලය මේ අමාත්‍ය මණ්ඩලය කියලා මම ප්‍රකාශ කරනවා.

ඒ වාගේම මේ කටයුතු කරද්දී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු මට ලබා දෙන සහයෝගය, ඒ වාගේම විරුද්ධ පක්ෂ නායකතුමා ඇතුළු මන්ත්‍රීවරු මට ලබා දෙන සහයෝගය විශේෂයෙන්ම උපදේශක කාරක සභාවට ඇවිල්ලා අපි ගන්නා වූ තීන්දුවලදී ඒ අය ලබා දෙන සහයෝගය පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම ප්‍රධාන අමාත්‍ය ලේකම්තුමිය ඇතුළු සියලුම පළාත් දෙපාර්තමේන්තුවල මගේ අමාත්‍යාංශයේ සියලුම ආයතනවල ප්‍රධාන නිලධාරීන්ට ඒ වාගේම සියලුම සේවකයින්ට, මේ කටයුතු කරද්දී ඒ අය ලබා දෙන සහයෝගය පිළිබඳව මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරමින් තමුන්නාන්සේලා සියලු දෙනාගේ සහයෝගයෙන් ඉදිරි 2013 වර්ෂයේ පළාත් සභාව සාර්ථක කර ගන්න සහාය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා ස්තුතියි.

***අ.භා. 04.58 ට පොදු සාකච්ඡාව අවසන් විය.***
*General discussion came to a close at 04.58 p.m*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියිවන්ත වෙනවා. ප්‍රධාන අමාත්‍ය මුදල් ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම් අධ්‍යාපන පළාත් පාලන හා පළාත් පරිපාලන මිනිස් බල හා රැකී රක්ෂා ආර්ථික ප්‍රවර්ධන හා විදුලි බල හා බලශක්ති වෙළඳ විෂය භාර අමාත්‍යාංශ වැය ශීර්ෂයන් පිළිබඳ අංක 104, 109, 110, 111, 112, 113, 114, 115 යන වැය ශීර්ෂයන් පිළිබඳව විවාදය මෙයින් අවසන් වෙනවා, ඒ පිළිබඳව මේ සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුනාකර සීනුව නාදකරන්න.

***ඊට අනුකූලව***

***ශීර්ෂ අංක 104 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 67 යි, විපක්ෂව 18 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***
*The question that the amount indicated in the Head No. 104 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 67 for, 18 against and 0 decliners.*

***ශීර්ෂ අංක 109 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 67 යි, විපක්ෂව 18 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***
*The question that the amount indicated in the Head No. 109 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 67 for, 18 against and 0 decliners.*

***ශීර්ෂ අංක 110 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 67 යි, විපක්ෂව 18 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***
*The question that the amount indicated in the Head No. 110 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 67 for, 18 against and 0 decliners.*

***ශීර්ෂ අංක 111 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 67 යි, විපක්ෂව 18 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***
*The question that the amount indicated in the Head No. 111 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 67 for, 18 against and 0 decliners.*

***ශීර්ෂ අංක 112 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 67 යි, විපක්ෂව 18 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***
*The question that the amount indicated in the Head No. 112 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 67 for, 18 against and 0 decliners.*

***ශීර්ෂ අංක 113 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 67 යි, විපක්ෂව 18 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***
*The question that the amount indicated in the Head No. 113 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 67 for, 18 against and 0 decliners.*

***ශීර්ෂ අංක 114 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 67 යි, විපක්ෂව 18 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***
*The question that the amount indicated in the Head No. 114 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 67 for, 18 against and 0 decliners.*

***ශීර්ෂ අංක 115 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 67 යි, විපක්ෂව 18 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***

*The question that the amount indicated in the Head No. 115 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 67 for, 18 against and 0 decliners.*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශීර්ෂ අංක, 104, 109, 110, 111, 112, 113, 114 සහ 115 යන වැය ශීර්ෂයන්ට අදාළ විවාදය අවසන් වූ බැවින් මේ අවස්ථාවේදී මෙම සභාව පූර්ණ කාරක සභා තත්ත්වයෙන් මිදී පළාත් සභා තත්ත්වයට පත් වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 05.09 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***

*Accordingly at 05.09 p.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව ප්‍රධාන අමාත්‍ය මුදල් ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම් අධ්‍යාපන පළාත් පාලන හා පළාත් පරිපාලන මිනිස් බල හා රැකී රක්ෂා ආර්ථික ප්‍රවර්ධන හා විදුලි බල හා බලශක්ති වෙළඳ විෂය භාර අමාත්‍යාංශ වැය ශීර්ෂයන් පිළිබඳ ශීර්ෂ අංක 104,109,110, 111, 112,113,114,115 යන වැය ශීර්ෂයන්ට පක්ෂව 67 ක්ද, විපක්ෂව 18 ක්ද, වැළැකුණු 00 ක් වූ අතර එකී වැය ශිර්ෂයන් වැඩි ඡන්ද 49 කින් සභා සම්මත බව මම මේ අවස්ථාවේදි ප්‍රකාශ කර සිටිනවා.

# කල් තැබීමේ යෝජනාව
# ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාවකල් තැබිය යුතු යැයි."* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 05.12 ට, 2012 දෙසැම්බර් මස 07 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

*Aaccordingly, the Provincial Council was adjourned at 05.12 p.m. till 09.00 a.m, on 07.12.2012.*